269 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 269 - இல. 5
Volume 269 - No. 5

2019 මාර්තු 09 වන සෙනසුරාදා
2019 மார்ச் 09, சனிக்கிழமை
Saturday, 09th March, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**මුලතිව් ප්‍රදේශය තුළ ප්‍රදීපාගාරයක් ඉදිකිරීම:**
වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**විසර්ජන පනත් කෙටුම්පත, 2019 - හතරවන වෙන් කළ දිනය:**
දෙවනවර කියවීම - විවාදය කල් තබන ලදී.

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**முல்லைத்தீவுப் பிரதேசத்தில் வெளிச்சவீடு அமைத்தல்:**
துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சரினது கூற்று

**ஒதுக்கீட்டுச் சட்டமூலம் , 2019 - [ஒதுக்கப்பட்ட நான்காம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

CONSTRUCTION OF A LIGHTHOUSE IN MULLAITIVU AREA :
Statement by Minister of Ports and Shipping and Southern Development

APPROPRIATION BILL, 2019- [Fourth Allotted Day] :
Second Reading – Debate Adjourned

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2019 මාර්තු 09 වන සෙනසුරාදා***
*2019 மார்ச் 09, சனிக்கிழமை*
*Saturday, 09th March, 2019*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 09.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය කැබිනට් නොවන අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

එම වාර්තා නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලසන්ත අලගියවන්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*



## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ගොඩකවෙල නගර ක්‍රීඩාංගණය: සංවර්ධනය
### கொடக்கவெல நகர விளையாட்டு மைதானம்: அபிவிருத்தி
### GODAKAWELA URBAN STADIUM: DEVELOPMENT

14/'18

**1. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගොඩකවෙල නගර ක්‍රීඩාංගණය අයත් රාජ්‍ය ආයතනය කවරේද;
(ii) එම ක්‍රීඩාංගණයේ විශාලත්වය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම ක්‍රීඩාංගණය විවිධ ක්‍රීඩා තරග, පළාත්/ ජාතික මට්ටමින් පැවැත්වීම සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණයකින් යුතු බවත්;
(ii) ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ සහ රක්වාන මැතිවරණ කොට්ඨාසය තුළ ඇති මීටර් 400 ධාවන පථයක් සකස් කළ හැකි එකම ක්‍රීඩාංගණය බවත්;

එතුමා පිළිගන්නේද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම සඳහා අදාළ ඇස්තමේන්තු හා සැලැස්ම සමඟින් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත යොමු කළද මෙතෙක් අදාළ ප්‍රතිපාදන වෙන් කර නොමැති බව පිළිගන්නේද;
(ii) මෙම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொடக்கவெல நகர விளையாட்டு மைதானம் உரித்தாகின்ற அரச நிறுவனம் யாது என்பதையும்;
(ii) மேற்படி விளையாட்டு மைதானத்தின் பரப்பளவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி விளையாட்டு மைதானமானது பல்வேறுபட்ட விளையாட்டுப் போட்டிகளை, மாகாண / தேசிய மட்டத்தில் நடத்துவதற்குத் தேவையான இடவசதியைக் கொண்டுள்ளது என்பதையும்;
(ii) கொடக்கவெல பிரதேச செயலாளர் ஆளுகைப் பிரதேசத்தினுள்ளும் ரக்வான தேர்தல் தொகுதியினுள்ளும் அமைந்துள்ள 400 மீற்றர் ஓடு பாதையை அமைக்கக் கூடிய ஒரேயொரு விளையாட்டு மைதானம் இது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

[ගරු හේෂා විතානගේ මහතා]

(இ) (i) இந்த விளையாட்டு மைதானத்தை அபிவிருத்தி செய்வதற்கான ஏற்புடைய மதிப்பீடுகள் மற்றும் திட்டத்துடன் விளையாட்டுத்துறை அமைச்சுக்கு ஆற்றுப்படுத்தப்பட்ட போதிலும், இதுவரையில் உரிய நிதி ஏற்பாடுகள் ஒதுக்கப்படவில்லை என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) இப்பிரச்சினையை தீர்ப்பதற்காக மேற்கொள் ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House-

(i) the name of the government institution to which the Godakawela Urban Stadium belongs; and

(ii) the extent of the aforementioned stadium?

(b) Will he admit that-

(i) the aforesaid stadium has sufficient space to hold various sports meets at provincial/ national level; and

(ii) within the Godakawela Divisional Secretary'a Division and in the Rakwana Electorate, this is the only stadium in which a 400m running track can be built?

(c) Will he also inform this House-

(i) whether he admits that no action has been taken to allocate the required funds although the respective estimates together with plans for developing the aforesaid stadium have been sent to the Ministry of Sports; and

(ii) the steps that will be taken to resolve this issue?

(d) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
( மாண்புமிகு வஜிர அபேவர்தன - உள்ளக, ள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ගොඩකවෙල ප්‍රාදේශීය සභාව

(ii) අක්කර 03, රූඩ 03, පර්චස් 4.1යි.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(ඇ) (i) ක්‍රීඩා අමාත්‍යවරයාට යොමු කර පිළිතුරු ලබා ගන්නා ලෙස යෝජනා කරමි.

(ii) (ඇ) (i) පිළිතුර අදාළයි.

(ඈ) අදාළ නොවේ.

පසුබිම් වාර්තාවේ පොඩි කරුණක් ගැන සඳහන් කරන්න කැමැතියි. ගොඩකවෙල නගර සභා ක්‍රීඩාංගණය රත්නපුර දිස්ත්‍රික්කයට අයත් පළාත් පාලන ආයතනයක් වන ගොඩකවෙල ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාංගණයක් වන අතර, එම ක්‍රීඩාපිටිය අක්කර තුනයි, රූඩ 3යි, පර්චස් 4.1ක විශාලත්වයකින් යුක්ත වේ.

ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් රක්වාන මැතිවරණ කොට්ඨාසය තුළ පිහිටා ඇති මෙම ක්‍රීඩාංගණයෙහි පාසල්, පළාත් හා ජාතික මට්ටමේ තරග පවත්වන බැවින්, දැනට සංවර්ධනය කළ යුතු තත්ත්වයේ පවතින බව සබරගමුව පළාතේ ප්‍රධාන ලේකම් විසින් ද නිර්දේශ කොට එවා ඇත.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට සාධාරණ උත්තරයක් ලබා දුන්නාට මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමාගේ අවධානයට මම මේ කාරණයත් යොමු කරවන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, මීට පෙර අපේ ගරු දයාසිරි ජයසේකර මැතිතුමා ක්‍රීඩා අමාත්‍යවරයා වශයෙන් සිටියදීත් මම මේ ගැටලුව එතුමාට ඉදිරිපත් කළා. එතුමා මේ වෙනුවෙන් සාධාරණ පිළිතුරක් ලබා දීලා, ගොඩකවෙල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණය නවීකරණය කරන්න අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කළා. ඒ වෙන් කිරීම කළාට, යම් කාලසීමාවක් පළාත් සභාවේ කටයුතු අවසන් වෙන්නේ නැතිව තිබූ නිසා, ක්‍රමවත්ව මේ කටයුත්ත සිදු වුණේ නැහැ. ඊට පස්සේ මම වර්තමාන ක්‍රීඩා අමාත්‍ය අපේ ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමාටත් මේ ප්‍රශ්නය යොමු කරමින් කියා සිටියා, "ඒ සඳහා අවශ්‍ය මුදල් වෙන් කරලා තිබෙන්නේ, මේ කටයුතු ඉදිරියට ගෙනියන්න." කියලා. ගරු ඇමතිතුමනි, දැන් වෙන ප්‍රශ්නයක් තිබෙන්නේ. ඒ තමයි, මේ ක්‍රීඩාංගණය සංවර්ධනය කරන්න ප්‍රාදේශීය සභාවේ කැමැත්තක් නැති එක. මේක විතරක් නොවෙයි, මට තවත් ප්‍රශ්නයක් තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුමත් එක්කම, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විශාල මුදලක් වෙන් කළා, ගොඩකවෙල පොළ සංවර්ධනය කරන්න. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ඇතුළු කණ්ඩායම ඒකට විරුද්ධ වෙලා ඒක කරගන්න බැරි වුණා. ගොඩකවෙල පොළ හදන එක එහෙමම නැවතුණා. මේ ක්‍රීඩාංගණයටත් දැන් මුදල් වෙන් වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. ප්‍රාදේශීය සභාවේ දේශපාලනික අරමුණක් හින්දා මම හිතනවා, ඇඹිලිපිටිය ප්‍රදේශයේ,-[බාධා කිරීමක්]-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අදාළ ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය මහවැලි ක්‍රීඩාංගණය ඇරුණාට පස්සේ ග්‍රාමීයව තිබෙන එකම ක්‍රීඩාංගණය මෙයයි, ගරු ඇමතිතුමනි. රක්වාන ආසනය කඳුකර ප්‍රදේශයක්. ක්‍රීඩාංගණයක් ඉදි කරන්න වෙන තැනක් නැහැ. මේ ක්‍රීඩාංගණය නිවැරැදිව හදා නොගැනීම නිසා රක්වාන මැතිවරණ කොට්ඨාසයට, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක දරුවන්ට, තරුණ - තරුණියන්ට අවශ්‍ය ක්‍රීඩා උත්සවයක් පවත්වන්න තැනක් නැහැ. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මුදල් ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙන මොහොතක පළාත් පාලන ආයතනයේ එකඟතාව නොමැතිවීම නිසා මේ කාරණය ඉදිරියට ගෙන යන්න බැරි වෙලා තිබෙනවා. මොකක්ද ඒකට කරන්නේ?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, මේක ජාතික ප්‍රශ්නයක් හැටියට පැන නැඟිලා තිබුණු නිසා, අපේ අමාත්‍යාංශය විසින් නීතිපතිවරයා වෙත ලිපියක් යවලා තිබෙනවා, ඉඩම්වල භුක්තිය සහ අයිතිය සම්බන්ධයෙන් නිරාකරණය කර ගැනීමේ ක්‍රියාවලියක් සඳහා. ඒ ගැන දැනට නීතිපති දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටිනවා. ඒ අනුව රජය යන්නෙන් සඳහන් වන්නේ අයිතියයි. භුක්තිය කියන්නේ වෙනත් කාරණයක්. භුක්තිය අනුව රජයේ කටයුතුවලට බාධා කිරීම සම්බන්ධයෙන් ළඟදීම අපට ලැබෙන ප්‍රතිචාරය අනුව ප්‍රධාන ලේකම්වරුන් හරහා සියලුම පළාත් පාලන කොමසාරිස්වරු දැනුවත් කිරීමට පියවර ගැනීමට කටයුතු කරමින් ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක වැදගත් ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමනි, තවත් අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මම ගරු ඇමතිතුමාට ඒ හා සම්බන්ධ ප්‍රශ්නයක් යොමු කරනවා. ගරු ඇමතිතුමනි, පළාත් පාලන අමාත්‍යවරයා විධියට ඔබතුමාට තමයි මේ ප්‍රාදේශීය සභාවල පාලනය පිළිබඳව මැදිහත් වීමක් කරන්න පුළුවන් වන්නේ. මමත් පළාත් පාලන ආයතනයක හිටපු සභාපතිවරයෙක්. යම් යම් කාරණාවලදී පළාත් පාලන අමාත්‍යවරයාගේ නිර්දේශය අවශ්‍ය වෙනවා. පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයකුත් මේ වන විට සබරගමුව පළාත් සභාවට නැහැ. ලේකම්වරයායි මැදිහත් වෙන්නේ. විපක්ෂයේ, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විරුද්ධ වුණත් ආණ්ඩුකාරවරු හිතුණු හිතුණු විධියට මුදල් වෙන් කර ගන්නවා. නිලූකා ඒකනායක ආණ්ඩුකාරතුමිය හිටියා. හිතෙන හිතෙන විධියට පළාත් පාලන ආයතනවල මුදල් වෙන් කර ගෙන වියදම් කරනවා.

උසාවියෙන් ලැබෙන දඩ මුදල් ටික වෙන්න පුළුවන්, මුද්දර ගාස්තු වෙන්න පුළුවන්, ඒවා වියදම් කිරීමේදී පළාත් පාලන ආයතනවලට වඩා ආණ්ඩුකාරවරයා නිර්දේශ කරනවා.

මේ වනකොට ආණ්ඩුකාරවරුන්ගේ ප්‍රමිතිය පිළිබඳව, ඔවුන් ඒ තනතුරට සුදුසුද, නැද්ද කියලාත් රටේ මිනිසුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. මේ ප්‍රශ්නය අද ජාතික ප්‍රශ්නයක් විධියට පැන නැඟිලා තිබෙනවා. පළාත් පාලන ආයතනවල වැඩ ටික කරගෙන යෑමේදී සහ පළාත් සභාවේ මුදල් පරිහරණයේදී ආණ්ඩුකාරවරුන්ගේ මැදිහත් වීම හරහා සුදුසු නැති, කිසි ඵලදායිතාවක් නැති යෝජනා ක්‍රියාත්මක වෙනවා. ඒ වෙනුවෙන් ගන්නා පියවර මොකක්ද, ඔබතුමාට එවැනි පියවරක් ගන්න පුළුවන්ද, එහෙම නැත්නම් බේදනීය ලෙස මේ මාස කිහිපයත් ගතවෙයිද කියලා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයත් දැනට ජාතික වශයෙන් පැන නැඟී තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ. ව්‍යවස්ථාව අනුව තමයි ආණ්ඩුකාරවරුන් කටයුතු කළ යුතුව තිබෙන්නේ. දැනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ. ව්‍යවස්ථාවෙන් පිට ආණ්ඩුකාරවරු කටයුතු කරමින් සිටිනවා. එසේ කිරීම නීත්‍යනුකූල නොවෙයි. ඒ නිසා ඒ පිළිබඳව දැනුවත් කිරීමට දැනට ප්‍රධාන ලේකම්වරුන් කැඳවා තිබෙනවා. ඒ අවස්ථාවේදී අපි බලාපොරොත්තු වෙනවා, ආණ්ඩුකාර ධුරය ceremonial බවත්, අභිමතය පරිදි ක්‍රියා කරන්න ආණ්ඩුකාරවරුන්ට පුළුවන්කමක් නැහැයි කියලා ඔවුන් දැනුවත් කරන්න. මන්ත්‍රීතුමා කියන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සටහන් වී තිබෙන කරුණුවලට හැර, ආණ්ඩුකාරවරුන්ගේ අභිමතය පරිදි බලයක් නැති දේවල් කරමින් සිටිනවා. ඒ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කිරීමට අපි කටයුතු කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ. ව්‍යවස්ථාව අනුව ආණ්ඩුකාරවරුන් කටයුතු කළ යුතුව තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -75/'18- (1), ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 - 126/'18- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

## ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය: විස්තර

ஊவா மாகாண வீதிப் பயணிகள் போக்குவரத்து அதிகாரசபை: விபரம்

UVA PROVINCE ROAD PASSENGER TRANSPORT AUTHORITY: DETAILS

126/'18

**3. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පාලනය යටතේ ධාවනය වන බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එහි දැනට සේවයේ නියුතු නිලධාරින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා එම අධිකාරියේ ලබාදී ඇති රැකියා සංඛ්‍යාව හා එම රැකියාලාභීන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව ලබාදී ඇති බස්රථ අවසර පත්‍ර (Permits) හා එම අවසර පත් ලබාදුන් මාර්ග හා පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු චමින්ද විජේසිරි මහතා]

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊவா மாகாண வீதிப் பயணிகள் போக்குவரத்து அதிகாரசபையின் கட்டுப்பாட்டின் கீழ் ஓட்டத்தில் ஈடுபடுத்தப்பட்டுள்ள பஸ் வண்டிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) இன்றளவில் வீதிப் பயணிகள் போக்குவரத்து அதிகாரசபையில் கடமையாற்றும் பணியாளர் களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அங்கு இன்றளவில் கடமையாற்றும் அலுவலர் களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

(iv) ஊவா மாகாணத்தின் தற்போதைய முதலமைச்சர் அப்பதவிக்குத் நியமிக்கப்பட்டதன் பின்னர், இற்றைவரை குறித்த அதிகாரசபையில் வழங்கப் பட்டுள்ள தொழில் வாய்ப்புகளின் எண்ணிக்கை மற்றும் அந்த தொழில்பெறுநர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

(v) தற்போதைய முதலமைச்சர் அப்பதவிக்கு நியமிக்கப்பட்டதன் பின்னர் வழங்கியுள்ள பஸ் வண்டி அனுமதிப்பத்திரங்கள் (Permits) மற்றும் அந்த அனுமதிப்பத்திரங்கள் வழங்கப்பட்டுள்ள வீதிகள் மற்றும் நபர்களின் பெயர்கள் தனித்தனியாக யாது என்பதையும்;

(vi) அதற்கென பின்பற்றப்பட்ட முறையியல் யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of buses operated under the Uva Province Road Passenger Transport Authority;

(ii) the number of people working at the Road Passenger Transport Authority at present;

(iii) the names and addresses of the officers employed there at present;

(iv) the number of jobs given after the present Chief Minister of the Uva Province was appointed to the post of Chief Minister and the names and addresses of the recipients of those jobs;

(v) the number of bus permits given after the present Chief Minister of the Uva Province was appointed to the post of Chief Minister and the routes and names of the recipients of those permits separately; and

(vi) the methodology adopted for the above?

(b) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පාලනය යටතේ ධාවනය වන බස් රථ සංඛ්‍යාව 1,163කි.

(ii) දැනට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව 114කි.

(iii) එහි දැනට සේවයේ නියුතු නිලධාරින්ගේ නම් හා ලිපිනයන් ඇමුණුම් අංක 01 මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iv) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා එම අධිකාරියේ ලබා දී ඇති රැකියා සංඛ්‍යාව 07කි. එම රැකියාලාභීන්ගේ නම් හා ලිපිනයන් ඇමුණුම් අංක 02 මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(v) වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව ලබා දී ඇති බස් රථ අවසර පත්‍ර හා එම අවසර පත් ලබා දුන් මාර්ග හා පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් ඇමුණුම් අංක 03 මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(vi) පෙර පැවති ක්‍රමවේදය තුළම, මාර්ග පරීක්ෂණය කොට මගී අවශ්‍යතාව මත අදාළ මාර්ග බලපත්‍ර ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, පිළිතුර ලබාදීම වෙනුවෙන්.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම (v) වෙනි පිළිතුරට අදාළ නම් සඳහන් ලේඛනය ඔබතුමා සතුව තිබුණත්, එම නාම ලේඛනය පිළිබඳ යම්කිසි විමර්ශනයක් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට ඒ සඳහා මැදිහත්වීමට හැකියාවක් ඇති කියලා මා විශ්වාස කරනවා. ඒ සියලු අවසර පත්‍ර ලබා දීලා තිබෙන්නේ අත යට මුදලට.

විශේෂයෙන්ම එම ධාවන බලපත්‍ර ලබා දී තිබෙන්නේ මධ්‍යම රජයේ ශ්‍රීලංගම බස් ධාවනය වන විශාල ආදායමක් තිබෙන මාර්ග සඳහායි. ගරු අමාත්‍යතුමනි, ඒවා කුඩා නගරයකින් ධාවනය පටන් අරගෙන ප්‍රධාන මාර්ගයකට එනවා. ගරු ඇමතිතුමනි, මෙහි තිබෙන ප්‍රධාන ගැටලුව මේකයි. මේ අත යට ගනු දෙනුව සිද්ධ වුණා වාගේම බස් අතර විශාල තරගයක් ඇති වෙලා තිබෙනවා. ඒ තුළින් තමයි, මාර්ග අනතුරු සංඛ්‍යාව වැඩි වෙන්නේ සහ ජනතාවට විශාල පීඩාවක්ක් ඇති වෙන්නේ. එම නිසා, ඔබතුමා පළමුවැනි කාරණය ගැන සොයා බැලුවා වාගේම, මේ කාරණය ගැනත් සොයා බලන්න කියා මා ඉල්ලා සිටිනවා. පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ශ්‍රීලංගමත් එක්ක සම්බන්ධ කරලා route permits ලබා දීමේ ක්‍රමය නියාමනය කිරීම සඳහා

---

** ඇමුණුම් පුස්තකාලයේ තබා ඇත.*

** இணைப்புகள் நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளன.*

** Annexes placed in the Library.*

විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම තමයි පළමුවැනි අවශ්‍යතාව. ගරු ඇමතිතුමනි, අමාත්‍යාංශයට ඒ සඳහා වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්ද?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම පළාත් සභාවෙන්, පළාත් සභාවට විවිධ ආකාරයට බලපත්‍ර නිකුත් කිරීම් සිදු වෙමින් පවතිනවා. පසුගිය අවුරුදු 25ක පමණ කාල සීමාව බැලුවොත්, මේ සම්බන්ධ බරපතළ බෙදවාවකයක් තිබෙනවා. අපේ ප්‍රවාහන ඇමතිතුමාත් දැන් මෙතැන ඉන්නවා. එතුමා මධ්‍යම රජය යටතේ තිබෙන කොමිෂන් සභාව වෙනස් කරලා කටයුතු කරන්න දැන් ක්‍රියා කරගෙන යනවා. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණය සම්පූර්ණ සත්‍යයක්. ගරු මන්ත්‍රීතුමාට මේ පිළිතුරේ තිබෙන නාමලේඛනයත් භාර දෙන්න මට පුළුවන්. ඔබතුමන්ලාගේ අදහස් ආවාට පස්සේ කැඳවීමක් කරලා, ඒ ගැන කටයුතු කරන්න මට පුළුවන්. ඇත්ත වශයෙන් මුළු මහත් රටේම බස් ධාවන බලපත්‍ර සම්බන්ධයෙන් බරපතළ ගැටලුවක් තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, බස් රථවල ප්‍රමිතිය පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒවායේ ප්‍රමිතිය පිළිබඳව සොයා බැලීම සඳහා ආයතනයක් පිහිටුවා තිබුණත්, ලොග් සටහන් එකතු කිරීමේ කාර්යය මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට දීලා තිබෙනවා.

ඒ මුදල එන්න ඕනෑ, මධ්‍යම රජයට හෝ පළාත් සභාවට. හැබැයි, මම දන්නා විධියට ඌව පළාත තුළ මේ ලොග් සටහන් එකතු කිරීම සඳහා ලබා දීලා තිබෙන්නේ පෞද්ගලික බස් සමාගමකට. අපි දිගින් දිගටම මේ ගැන කථා කළා; මේ තත්ත්වය පැහැදිලි කළා. නමුත්, මේ වෙනකොටත් ඒක ක්‍රියාත්මක වෙන්නේ ඒ පෞද්ගලික බස් සමාගමෙන්. ප්‍රධාන ඇමතිවරයාගේ හිතවතෙකු තමයි මේ කටයුත්ත කර ගෙන යන්නේ. මේ ගැන කථා කරන, හොරු අල්ලනවා යයි කියන කණ්ඩායම්, හොරකම් කරන්න එක් කණ්ඩායමකට අවස්ථාව දීලා, තවත් කණ්ඩායමක් හොරකම් නොකළත් "හොරා" යයි කියන තැනට පත්වෙලා තිබෙනවා. ඔබතුමා වගකිව යුතු, බුද්ධිමත් අමාත්‍යවරයෙකු විධියට සැමට සාධාරණයක් වන විධියට මේ සම්බන්ධයෙන් කටයුතු කරයි කියලා මා හිතනවා. "පොඩි හොරා; ලොකු හොරා" යයි කියන කාරණය පැත්තක තබා මේ හොරකම; වංචාව මැඩපවත්වන්න පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයා හැටියට ඔබතුමා යම් කිසි පියවරක් ගන්න සූදානම්ව සිටිනවාද?

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද අදහස සම්බන්ධයෙන් මුළුමහත් රටේම ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා Central Government එකත්, අපිත් මේ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයකට යන්න බලනවා. මොකද, දැන් මේක practice එකක් විධියට අවුරුදු 25ක් තිස්සේ සිදුවී තිබෙනවා. එතුමා කියන එක ඇත්ත. එක් එක් පළාත්වල සුඛෝපභෝගී බස් රථ සහ සාමාන්‍ය බස් රථ ධාවනය කිරීමේ දී ඒවායේ නියමිත standard එක නැතිව තමයි ධාවනය වෙන්නේ. ඒ ගැන මන්ත්‍රීතුමා ප්‍රශ්නය මතු කරපු එක හොඳයි. ඒ ගැන අපේ අමාත්‍යාංශයේ අවධානය යොමු කර ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා.

## මාතලේ දිස්ත්‍රික්කයේ ගව කුර රෝගය ව්‍යාප්තවීම: පාලනය

## மாத்தளை மாவட்டத்தில் மாடுகளில் குளம்பு நோய் பரவுதல்: கட்டுப்பாடு

## SPREAD OF BOVINE HOOF DISEASE IN MATALE DISTRICT: CONTROL

238/'18

**4. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මේ දිනවල මාතලේ දිස්ත්‍රික්කයේ ගව කුර රෝගය බහුල ලෙස ව්‍යාප්ත වෙමින් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය පාලනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது மாத்தளை மாவட்டத்தில் மாடுகளின் குளம்பு நோய் பரவலாக விரிவடைந்து வருகின்றதென்பதை அறிவாரா;

(ii) ஆமெனில், இந்நிலைமையைக் கட்டுப்படுத்த அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) whether he is aware that the bovine hoof disease is spreading rapidly in the Matale District; and

(ii) if so, what steps the Ministry will take to control the situation?

(b) If not, why?

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා (කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன் - கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமியப் பொருளாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. Ameer Ali Shihabdeen - State Minister of Agriculture, Irrigation and Rural Economic Affairs)

Sir, the answer is as follows:

(a) (i) Food and mouth disease has been reported in Rattota, Galewela and Dambulla veterinary ranges and disease was not reported after 2019.02.06.

[ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා]

(ii) Animals have been vaccinated in Matale, Galewela, Ambanganga, Ukuwela, Naula, Dambulla and Rattota veterinary ranges of Matale District to control the disease.

(b) Not relevant.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනකොට ගව කුර රෝගය ව්‍යාප්තවෙලා තිබුණා. ප්‍රශ්නය ඉදිරිපත් කරලා දැන් කාලයක් ගතවෙලා තිබෙනවා. ඒ, ඒ කාලයට ඇතිවෙලා තිබෙන තත්ත්වයන් ගැනයි අපි ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ. පහුවෙලා මේ ප්‍රශ්න අහන නිසායි මේ තත්ත්වය උදා වන්නේ. මේ වන කොට එම රෝගී තත්ත්වය නතර වී තිබෙනවා නම් අපි ඒ ගැන සතුටු වෙනවා. එම තත්ත්වය පාලනය කර ගැනීමට සහ ඉදිරියේ දී ඒ තත්ත්වය වළක්වා ගැනීමට ගන්නා ක්‍රියා මාර්ග මොනවාද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)

අපි දැනටමත් මේ සම්බන්ධව veterinary surgeonsලාට උපදෙස් දී තිබෙනවා. මේ රෝගය සම්බන්ධයෙන් පෙර සූදානමින් ඉන්න කියා දැනුවත් කර තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

දෙවන අතුරු ප්‍රශ්නය ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයට අදාළව වර්තමානයට වැදගත් වන ප්‍රශ්නයක් ගැනයි මා අහන්නේ. මේ වනවිට රට පුරාම වී ගොවිතැනෙහි අස්වැන්න නෙළන කාලයයි. වී මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය හරහා වැඩ පිළිවෙළක් නිර්මාණය කර තිබෙනවා. නමුත් මාධ්‍ය හරහා විශේෂයෙන් විපක්ෂයෙන් යම් යම් චෝදනා එල්ල වන බව අපි දකිනවා. ඒ සම්බන්ධයෙන් වී අළෙවි මණ්ඩලයේ නිලධාරින් යම් යම් කරුණු කාරණා ඉදිරිපත් කරනවා. ඒ වෙනුවෙන් ගෙන තිබෙන නිශ්චිත ක්‍රියා මාර්ගය කුමක්ද, එය ගැටලුවක් නොවී මේ කන්නය අවසන් වනතෙක් කරගෙන යන්න පුළුවන් පරිසරයක් අමාත්‍යාංශය නිර්මාණය කරගෙන තිබෙනවාද කියලා රටේ ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රකාශ කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා, ඔබතුමාට පිළිතුරු ලබා දෙන්න පුළුවන්ද, නැත්නම් පසුව පිළිතුරු ලබා දෙනවාද?

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)

සොයා බලා පසුව පිළිතුරු ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එය වැදගත් ප්‍රශ්නයක් නිසා ඒ සඳහා දීර්ඝ පිළිතුරක් ලබා දෙන්න වේවි.

ප්‍රශ්න අංක 5 - 255/'18 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 330/'18 - (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 - 407/'18 - (1), ගරු වාසුදේව නානායක්කාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 - 513/'19 - (1), ගරු විමලවීර දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 - 514/'19 - (1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 - 525/'19 - (1), ගරු මයන්ත දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11 - 529/'19 - (1), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 12 - 547/'19 - (1), ගරු එස්. ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13 - 563/'19 - (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 14 - 582/'19 - (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 15 - 596/'19 - (1), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 2 - 75/'18, - (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 - 255/'18 - ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කලාවැව, පරණ යෝධ ඇළ තුළ ජලජ පැළෑටි වර්ධනය: විසඳුම්
### கலாவெவ மற்றும் பழைய யோதஎல நீர்வாழ் தாவரங்களால் மூடப்படல்: தீர்வு
### GROWTH OF WATER HYACINTH IN KALAWEWA, OLD YODA ELA: SOLUTIONS

330/'18

**6. ගරු හේෂා විතානගේ මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹேசா விதானகே - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. Hesha Withanage on behalf of the Hon. Ishak Rahuman)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කලාවැව සිට අනුරාධපුර තිසාවැව දක්වා ජලය ලබා දෙන කලාවැව, පරණ යෝධ ඇළ, ජපන් ජබර වැනි ජලජ පැළෑටිවලින් වැසී ඇති බැවින් ජලය අපතේ යන බවත්;

(ii) ගොවිතැන් කටයුතු සඳහා ජලය ලබා දීමේදී මෙම ජලජ පැළෑටි නිසා ජලය ගලා යාමේ ප්‍රමාදයක් පවතින බවත්;

(iii) අදාළ බලධාරීන් දැනුවත් කළද මෙතෙක් විසඳුමක් නොලැබුණු බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මහ කන්නයේ ගොවිතැන් සඳහා ජලය මුදා හැරීමට පෙර මෙම ජලජ පැළෑටි ඉවත් කිරීමට සැලැස්මක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி, தொழிற் பயிற்சி, திறன்கள் அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கலா வாவியிலிருந்து அனுராதபுரம் திஸாவாவிக்கு தண்ணீரை வழங்குகின்ற கலா வாவி, பழைய யோதஎல கால்வாய், ஐக்கோனியா போன்ற நீர்வாழ் தாவரங்களால் மூடப்பட்டிருப்பதால் தண்ணீர் விரயமாகின்றது என்பதையும்;

(ii) பயிர்செய்கைக்காக தண்ணீர் வழங்கும் போது மேற்படி நீர்வாழ் தாவரங்களின் காரணமாக தண்ணீர் பாய்ச்சப்படுவதில் தாமதம் ஏற்படுத்துகின்றதென்பதையும்;

(iii) சம்பந்தப்பட்ட அதிகாரிகளை அறிவுறுத்தியுள்ள போதிலும் இதுவரை தீர்வொன்று கிடைக்கவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) பெரும்போகத்தில் பயிர்ச்செய்கைக்காக தண்ணீரை திறந்துவிடுவதற்கு முன் மேற்படி நீர்வாழ் தாவரங்களை அகற்றுவதற்கான திட்டமொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அது செயற்படுத்தப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development, Vocational Training and Skills Development and Youth Affairs :

(a) Is he aware that-

(i) water is wasted as a result of the dense colonies of water hyacinth found in Kalawewa and the old Yodha Ela carrying water from Kalawewa to the Thisa Wewa;

(ii) the flow of water in conveying water for cultivation activities is delayed due to these aquatic plants; and

(iii) a solution has not been provided so far despite officials being made aware of this problem?

(b) Will he inform this House-

(i) whether there is a plan for the removal of these aquatic plants before releasing water for the cultivation activities of the Maha season; and

(ii) if so, the date on which it will be implemented?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කලාවැව සිට ජලය සපයන පැරණි යෝධ ඇල සෘජුවම මහඉලුප්පල්ලම කොට්ඨාසය දක්වා කොටස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයක් වන, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පාලනය යටතේ පවතින වාරි ඉඩම් සඳහා ජලය සැපයීමට යොදා ගැනෙන අතර, ඇළෙහි ජලය ගෙන යාමට බාධා ඇති වන ජලජ පැළෑටි හා රොන්මඩ ඉවත් කිරීම විටින් විට අවස්ථානුකූලව සිදු කර, ජලය අපතේ යාම වැළැක්වීම සඳහා කටයුතු කරන බව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වාර්තා කර ඇත.

(ii) පවතින ප්‍රතිපාදන සීමාවන් තුළ ජලජ පැළෑටි ඉවත් කරමින් ගොවිතැන් කටයුතු සඳහා ජලය ගලා යාමේ ප්‍රමාදයන් හැකිතාක් වැළැක්වීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය කටයුතු කරනු ලැබේ.

(iii) ලැබෙන ප්‍රතිපාදන අනුව මහවැලි අධිකාරි බලප්‍රදේශ සීමාව තුළ මෙම ගැටලු විසඳීම සඳහා කටයුතු කරනු ලැබේ.

(ආ) (i) ඉහත (අ) (i) අනුව කටයුතු කරනු ලැබේ.

(ii) ප්‍රතිපාදන සීමා සහ අවශ්‍යතාවය අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

## අම්බලන්ගොඩ ධම්ම කුසල විදුහලේ වැඩ බලන විදුහල්පති: සේවයෙන් පහකිරීම

## அம்பலாங்கொட தம்ம குசல வித்தியாலய பதில் அதிபர்: சேவை நீக்கம்

## ACTING PRINCIPAL OF AMBALANGODA DAMMAKUSALA VIDYALAYA: DISMISSAL

407/'18

**7. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා (ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா - மாண்புமிகு வாசுதேவ நாணாயக்கார சார்பாக)
(The Hon. T. Ranjith De Zoysa on behalf of the Hon. Vasudeva Nanayakkara)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුදැනුම මත අම්බලන්ගොඩ ධම්ම කුසල විදුහලේ තිබූ රුපියල් කෝටියක පමණ වටිනා නවීනතම ගොඩනැඟිල්ලක් අනවසරයෙන් කඩා ඉවත් කර ඇති බව දන්නේද;

(ii) එම සිද්ධිය වසන් කිරීම සඳහා එවකට එම විදුහලේ වැඩබලන ලද විදුහල්පති, සේවයෙන් පහකර ඇති බව පිළිගන්නේද;

(iii) සේවයෙන් පහකිරීම සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කරන මෙන් ඉල්ලීමක් කර ඇතත්, මෙතෙක් එවැනි පරීක්ෂණයක් සිදු කර නොමැති බව දන්නේද;

(iv) එසේ සේවයෙන් පහකිරීමට විරුද්ධව හා නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා අදාළ විදුහල්පතිවරයා විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති පැමිණිල්ල පිළිබඳව සොයා බලා ඔහු නැවත සේවයේ පිහිටුවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைச் கேட்ட வினா:

(அ) (i) தென் மாகாண முதலமைச்சர் அறிந்திருந்த நிலையில் அம்பலாங்கொட தம்ம குசல வித்தியாலயத்திலிருந்த சுமார் ஒரு கோடி ரூபா பெறுமதியான மிக நவீனமான கட்டிடமொன்று சட்டவிரோதமாக உடைத்து அகற்றப்பட்டுள்ளதென்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி சம்பவத்தை மூடி மறைப்பதற்காக அச்சந்தர்ப்பத்தில் பதிற் கடமையாற்றிய அதிபர், சேவையிலிருந்து நீக்கப்பட்டுள்ளார் என்பதையும்;

(iii) சேவையிலிருந்து நீக்கப்பட்டமை சம்பந்தமாக பக்கச்சார்பற்ற விசாரணை ஒன்றை நடாத்துமாறு வேண்டுகோள் விடுக்கப்பட்டுள்ளதெனினும் இற்றைவரை அவ்வாறானதொரு விசாரணை இடம்பெறவில்லையென்பதை அறிவாரா என்பதையும்;

(iv) அவ்வாறு சேவையிலிருந்து அகற்றப்பட்டமைக்கு எதிராகவும் மீண்டும் சேவையில் அமர்த்துமாறும் கோரி சம்பந்தப்பட்ட அதிபர் தென் மாகாண அரச சேவைகள் ஆணைக்குழுவிற்கு சமர்ப்பித்துள்ள முறைப்பாட்டினை ஆராய்ந்து இவரை மீண்டும் சேவையில் அமர்த்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he inform this House,-

(i) whether he is aware that a newly built building in Dammakusala Vidyalaya in Ambalangoda which was worth about one crore of rupees has been demolished and removed from the school premises without permission, with the knowledge of the Chief Minister of the Southern Province;

(ii) whether it is admitted that the acting principal who was serving at that time has been dismissed from service in order to cover up the aforesaid incident;

(iii) whether he is aware that an impartial inquiry has not yet been conducted into the aforesaid dismissal notwithstanding the request made to that effect; and

(iv) whether steps will be taken to reinstate the aforesaid principal having investigated into the complaint submitted by him to the Southern Province Public Service Commission against his dismissal requesting that he be reinstated ?

(b) If not , why ?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

ගාල්ල අම්බලන්ගොඩ ධම්ම කුසල විද්‍යාලයේ ගොඩනැගිල්ල කඩා දැමීම සම්බන්ධව මූලික පරීක්ෂණයක් සිදු කරමින් පවතින බවත්, මූලික පරීක්ෂණ වාර්තාව සැලකිල්ලට ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බවත්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් වාර්තා කර ඇත.

(ii) නැත.

එම වැඩ බැලූ විදුහල්පති සේවයෙන් පහකර ඇත්තේ **ඇමුණුම්*** 01හි සඳහන් චෝදනා පත්‍රය අනුව පවත්වන ලද විධිමත් පරීක්ෂණයේ වාර්තා මත පදනම්ව බව දකුණු පළාත් අධ්‍යාපන ලේකම් විසින් වාර්තා කර ඇත.

(iii) එවැනි ඉල්ලීමක් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොමැති බව එම අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇත.

(iv) අයි.ජී.එල්. ජයවීර මහතා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, එකී අභියාචනය සලකා බැලීම සඳහා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP-PSC/06/04/අභියාචනා (255) හා 2018.01.24 දිනැති ලිපිය මඟින් තොරතුරු විමසා ඇති බවත්, ඒ අනුව දකුණු පළාත් අධ්‍යාපන ලේකම් විසින් දපස/අ/20/විනය/09/2012 අංක හා 2018.03.29 දිනැති ලිපිය මඟින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත තොරතුරු ඉදිරිපත් කර ඇති බවත් දකුණු පළාත් අධ්‍යාපන ලේකම් විසින් වාර්තා කර ඇත.

එසේම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP-PSC/06/04/අභියාචනා/04 (61) හා 2018.09.07 දිනැති තීරණය අනුව, අයි.ජී.එල්. ජයවීර මහතා සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් වශයෙන් සේවයෙන් පහ කළ දින සිට අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම ලෙස සංශෝධනය කිරීමටත්, වැඩ තහනම්ව සිටි කාලය වැටුප් රහිත කාලයක් සේ සලකා කටයුතු කිරීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කළ බව දකුණු පළාත් අධ්‍යාපන ලේකම්ට ද පිටපත් සහිතව අයි.ජී.එල්. ජයවීර මහතා වෙත දන්වා ඇති බවත්, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන ලෙස දපස/අ/20/විනය/09/2012 අංක හා 2018.09.21 දිනැති ලිපියෙන් අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්වා ඇති බවත් දකුණු පළාත් අධ්‍යාපන ලේකම් විසින් වාර්තා කර ඇත.

(ආ) අදාළ නොවේ.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## කංසා වගාව : නීතිමය අනුමැතිය
கஞ்சா பயிர்ச்செய்கை: சட்டரீதியான அனுமதி
CANNABIS CULTIVATION: LEGAL APPROVAL

513/'19

**8. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා (ගරු විමලවීර දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா - மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க சார்பாக)
(The Hon. T. Ranjith De Zoysa on behalf of the Hon. D.T.W. Wimalaweera Dissanayaka)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ කංසා වැවීම සඳහා රජය තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම තීරණය ගැනීමට හේතු වූ පදනම කවරේද;

(iii) කංසා මත්ද්‍රව්‍යයක් බව පිළිගන්නේද;

(iv) කංසා භාවිතය හේතුවෙන් ශාරීරික හා මානසික සෞඛ්‍ය පිරිහෙන බව පිළිගන්නේද;

(v) දැනට කංසා වැවීම සඳහා නීත්‍යානුකූලව අවසර ලබා ගත් පුද්ගලයන් හා ආයතන තිබේද;

(vi) එසේ නම්, නීත්‍යානුකූලව කංසා වගා කර ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரிடம் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் கஞ்சா பயிரிடுவதற்கு அரசாங்கம் தீர்மானம் மேற்கொண்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத்தீர்மானத்தினை மேற்கொள்வதற்கு காரணமாகவிருந்த அடிப்படை யாதென்பதையும்;

(iii) கஞ்சா ஒரு போதைப்பொருள் என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) கஞ்சா பாவனையின் காரணமாக உடல் மற்றும் உள சுகாதாரத்தில் சீர்கேடு ஏற்படும் என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(v) தற்போது கஞ்சா பயிரிடுவதற்காக சட்டரீதியாக அனுமதி கிடைத்துள்ள ஆட்கள் மற்றும் நிறுவனங்கள் உள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், அவ்வாறு சட்டபூர்வமாக கஞ்சா பயிரிடப்பட்டுள்ள இடங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine :

(a) Will he inform this House-

(i) whether the Government has taken any decision to grow cannabis in Sri Lanka;

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

(ii) if so, the basis of this decision;

(iii) whether it is admitted that cannabis is a narcotic;

(iv) whether it is admitted that the use of cannabis could weaken physical and mental health;

(v) whether there are persons and institutions that obtained legal approval to grow cannabis at present; and

(vi) if so, the places where cannabis have been grown legally ?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) පැන නොනඟී.

(iii) ඔව්. එහෙත් දේශීය වෛද්‍ය ක්‍රමයේදී මෙන්ම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේදී ද රසායන හා වාජීකරණ චිකිත්සාවේදී ප්‍රමුඛතම ඖෂධයක් ලෙස භාවිතා කරයි. එසේ භාවිතා කළ හැක්කේ කංසාවල පවතින මත්වන ගතිය හරණය කිරීම සඳහා කරනු ලබන ශෝධන හා මාරණ ක්‍රම භාවිතා කිරීමෙන් පසුවය.

(iv) නැත. නිසි පරිදි සංස්කරණය කරන ලද කංසා අන්තර්ගත ඖෂධ භාවිතයෙන් ශාරීරික හෝ මානසික සෞඛ්‍ය පිරිහීමක් සිදු නොවේ.

(v) නැත.

(vi) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

## දුම් කොළ හා සිගරට් නිෂ්පාදනය මත බදු : 2016 තුළ ආදායම
## புகையிலை மற்றும் சிகரட் உற்பத்திமீதான வரி: 2016 இல் வருமானம்
## TAXES ON PRODUCTION OF TOBACCO AND CIGARETTS: INCOME IN 2016

514/'19

**9. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා (ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා වෙනුවට)**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா - மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் சார்பாக)
(The Hon. T. Ranjith De Zoysa on behalf of the Hon. Indika Anuruddha Herath)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 වර්ෂයේ සුරාබදු ආදායම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) 2016 වර්ෂයේ දුම් කොළ හා සිගරට් නිෂ්පාදනය මත පනවන ලද බදු මඟින් උපයා ගත් ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) පසුගිය වර්ෂයට සාපේක්ෂව, ඉහත (i) සහ (ii) හි ආදායම පිළිවෙළින් රුපියල් මිලියන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) 2016 වර්ෂයේ මෝල්ට් මද්‍යසාර නිෂ්පාදනය ලීටර් කොපමණද;

(ii) 2016 වර්ෂය සඳහා මත්පැන් නිෂ්පාදනය අලුතින් ආරම්භ කිරීමට සමාගම්වලට නව බලපත්‍ර නිකුත් කර තිබේද;

(iii) එසේ නම්, එම බලපත්‍ර සංඛ්‍යාව සහ එම සමාගම්වල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) සුරාබදු නීතිය යටතේ වැටලීම් සිදු කිරීමට බලය ඇති ආයතනය හා එහි අධිකාරි බලය ඇත්තේ කා හටද;

(ii) අත්අඩංගුවට පත් නීත්‍යානුකූල නොවන සුරා සම්බන්ධයෙන් නීති කටයුතු කිරීම සඳහා අධිකාරි බලය ඇත්තේ කා හටද;

(iii) ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 ஆம் ஆண்டில் மதுவரி வருமானம் மொத்த உள்நாட்டு உற்பத்தியின் சதவீதமாக எவ்வளவென்பதையும்;

(ii) 2016 ஆம் ஆண்டில் புகையிலை மற்றும் சிகரட் உற்பத்தி மீது விதிக்கப்பட்ட வரியின் மூலம் ஈட்டிக்கொண்ட வருமானம் மொத்த உள்நாட்டு உற்பத்தியின் சதவீதமாக எவ்வளவென்பதையும்;

(iii) கடந்த வருடத்துடன் ஒப்பிடுகையில், மேற்படி (i) மற்றும் (ii) இன் வருமானம் முறையே ரூபா மில்லியன்களில் எவ்வளவென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2016 ஆம் ஆண்டு மோல்ட் மதுசார உற்பத்தி எத்தனை லீற்றர்கள் என்பதையும்;

(ii) 2016 ஆம் ஆண்டுக்காக மதுசார உற்பத்தியை புதிதாக ஆரம்பிப்பதற்கு கம்பனிகளுக்கு புதிய உரிமப்பத்திரங்கள் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அவ்வாறான உரிமப்பத்திரங்களின் எண்ணிக்கை மற்றும் அக்கம்பனிகளின் பெயர்கள் யாவையென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மதுவரிச் சட்டத்தின் கீழ் சுற்றிவளைப்பு நடவடிக்கைகளை மேற்கொள்வதற்கான தத்துவமுள்ள நிறுவனங்கள் யாவை என்பதையும் அதற்கான அதிகார தத்துவம் யாருக்கு உள்ளதென்பதையும்;

(ii) கைப்பற்றப்படுகின்ற சட்டவிரோதமான மதுபானம் சம்பந்தமாக சட்ட நடவடிக்கை மேற்கொள்வதற்கு யாருக்கு அதிகார தத்துவம் உள்ளதென்பதையும்;

(iii) அவர்களின் கடமைப்பொறுப்பு யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance :

(a) Will he state-

(i) the Excise Income of the year 2016 as a percentage of the Gross Domestic Production;

(ii) the income earned through the taxes imposed on the production of tobacco and cigarettes in the year 2016 as a percentage of the Gross Domestic Production; and

(iii) the income of (i) and (ii) above respectively in rupees millions in comparison with the figures of the previous year?

(b) Will he also state-

(i) the malt alcohol production of the year 2016 in liters;

(ii) whether new permits have been issued for companies for the year 2016 to initiate liquor production; and

(iii) if so, of the number of aforesaid permits and the names of the said companies?

(c) Will he inform this House-

(i) the institution and the authority that is vested with the power for conducting raids under the Excise Law;

(ii) as to who is vested with the authority to take legal measures with pertinence to illicit liquor raided; and

(iii) the duties entrusted to them?

(b) If not, why?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) **දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස -** 1.0%

2016 සුරාබදු ආදායම (රු.බිලියන) - රු.120.2

2016 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව දළ දේශීය නිෂ්පාදිතය (රු.බිලියන) - සංශෝධිත - රු.11,907

(ii) **දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස - 0.74%**

2016 වර්ෂයේ දුම්කොළ මත බදු ආදායම (රු.මිලියන)- 39.8

2016 වර්ෂයේ සිගරට් ආදායම (රු.මිලියන) - 88,752

2016 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව දළ දේශීය නිෂ්පාදිතය (රු.මිලියන) - 11,906.752

(iii)

| | 2015 (රු.මිලියන) | 2016 (රු.මිලියන) |
|---|---|---|
| සුරාබදු ආදායම | 105,234 | 120,238 |
| දුම්කොළ බදු ආදායම | 34.0 | 39.8 |
| සිගරට් බදු ආදායම | 79,981 | 88.752 |

(ආ) (i) තොග ලීටර් (මිලියන) - 52.2

(ii) නැත.

(iii) නැත.

(ඇ) (i) සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත.

සුරාබදු ආඥා පනතේ 8 වගන්තිය හා සුරාබදු නිවේදන 509 අනුව වැටලීමට බලය ඇත්තේ සුරාබදු දෙපාර්තමේන්තුවටය. සුරාබදු ආඥා පනතේ 33, 35 හා 48 (a) වගන්ති යටතේ වැටලීම් කිරීමට සුරාබදු නිවේදන 509 යටතේ පොලිස් නිලධාරින්ට බලය ලබා දී ඇත.

(ii) ඉහත (ඇ) (i) පිළිතුර අදාළ වේ.

(iii) සුරාබදු ස්ථාන අධීක්ෂණය, පාලනය හා ඒවායින් ලැබිය යුතු ආදායම එකතු කිරීම.

සුරාබදු ආඥා පනත සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම.

දුම්කොළ කර්මාන්තයේ අධීක්ෂණය හා පාලනය ඇතුළුව දුම්කොළ බදු පනත බලාත්මක කිරීම.

වස විෂ, අබිං හා අන්තරායකර ඖෂධ ආඥා පනත බලාත්මක කිරීමේ නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම.

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම.

සුරාබදු ආඥා පනත අනුව පොලිස් නිලධාරින්ගේ කාර්ය භාරය:

සුරාබදු ආඥා පනතේ 8 (ආ) වගන්තිය සහ සුරාබදු නිවේදන 509 යටතේ පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම.

(ඈ) පැන නොනඟී.

## වී වගාව වැඩි දියුණු කිරීම : සැලසුම්
## நெற்செய்கையை மேம்படுத்தல்: திட்டங்கள்
## UPLIFTMENT OF PADDY CULTIVATION: PLANS

525/'19

**10. ගරු හේෂා විතානගේ මහතා (ගරු මයන්ත දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹேசா விதானகே - மாண்புமிகு மயந்த திசாநாயக்க சார்பாக)
(The Hon. Hesha Withanage on behalf of the Hon. Mayantha Dissanayake)

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති අස්වද්දන ලද මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට වී වගා කර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ තිබෙන පුරන් කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

[ගරු හේෂා විතානගේ මහතා]

(iv) එම ඉඩම් වගා කිරීම සඳහා කඩිනම් සැලැස්මක් ක්‍රියාත්මක වන්නේද;

(v) වී වගාව සඳහා අවශ්‍ය බීජ හා පොහොර නිසි පරිදි අප්‍රමාදව සැපයීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(vi) වී මිලදී ගැනීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වී වගාව සඳහා තරුණ පරපුර ඉදිරිපත් නොවීම හේතුවෙන් සිදු වන ශ්‍රම බලකාය අඩුවීම සම්බන්ධයෙන් කිසියම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(ii) වගාවට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර පහසු හා සහන මිල ක්‍රමයකට ලබා දීමට සැලසුම් කර තිබේද ;

(iii) තරුණ පරපුර කෘෂි කර්මාන්තයට යොමු කිරීම සඳහා ආකර්ෂණීය සැලැස්මක් ක්‍රියාත්මක වන්නේ නම්, එය කවරේද;

(iv) ගොවීන්ගේ දරුවන්ට කෘෂිකර්ම අංශයේ රැකියා අවස්ථා ලබා දීම සඳහා වූ විශේෂ සැලැස්මක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள நெற்செய்கை மேற்கொள்ளப் பட்டும் மொத்த வயல் காணிகளின் பரப்பளவு யாதென்பதையும்;

(ii) அவற்றில் தற்போது நெற்செய்கை மேற்கொள் ளப்பட்டுள்ள வயல் காணிகளின் பரப்பளவு யாதென்பதையும்;

(iii) இலங்கையிலுள்ள கைவிடப்பட்டுள்ள வயல் காணிகளின் பரப்பளவு யாதென்பதையும்;

(iv) அக்காணிகளில் பயிர் செய்கைக்கான துரித திட்டங்கள் செயற்படுத்தப்படுகின்றனவா என் பதையும்;

(v) நெற் செய்கைக்குத் தேவையான விதை மற்றும் உரம் உரிய முறையில் தாமதமின்றி வழங்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளனவா என் பதையும்;

(vi) நெல் கொள்வனவுக்காக தயாரிக்கப்பட்டுள்ள திட்டங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) நெற் செய்கைக்காக இளம் சந்ததியினர் முன்வராமையினால் நிலவுகின்ற தொழிற்படை பற்றாக்குறை தொடர்பாக ஏதேனும் நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) நெற் செய்கைக்கு தேவைப்படும் இயந்திர சாதனங்கள் வசதியாக சலுகை விலைக்கு பெற்றுத்தர திட்டமிடப்பட்டுள்ளதா என் பதையும்;

(iii) இளம் சந்ததியினரை கமத்தொழிலில் ஈடுபடுத்த கவர்ச்சியான திட்டமொன்று செயற்படுத்தப் படுமெனில், அது யாதென்பதையும்;

(iv) கமத்தொழிலாளரின் பிள்ளைகளுக்கு கமத் தொழில் துறையில் வேலை வாய்ப்புகள் பெற்றுத்தர விசேட திட்டமொன்று செயற் படுத்தப்படுகின்றதா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development :

(a) Will he inform this House-

(i) total area of paddy lands brought under cultivation in Sri Lanka;

(ii) out of it, total land area where paddy cultivation is being carried out;

(iii) the extent of fallow paddy lands in Sri Lanka;

(iv) whether an expedited plan is being implemented to cultivate those lands;

(v) whether measures have been taken to adequately provide seeds and fertilizers required for paddy cultivation promptly; and

(vi) the plans that have been prepared to purchase paddy?

(b) Will he state that-

(i) whether any action has been taken with regard to the diminishing work force as a result of youth not engaging in paddy cultivation;

(ii) whether plans are underway to provide machinery required for cultivation at convenient and concessionary rate;

(iii) if a programme is in progress to attract the youth to agriculture, its details; and

(iv) whether a special programme is being implemented to provide job opportunities in the agricultural sector to the children of farmers ?

(c ) If not, why?

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)

Sir, on behalf of the Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources, I **table*** the answer.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) 1,943,316 (One million nine hundred and forty-three thousand three hundred and sixteen acres.)

(ii) 1, 895,829 acres (One million eight hundred and ninety -five thousand eight hundred and twenty-nine acres.)

(iii) 47,487 acres (Forty-seven thousand four hundred and eighty-seven)

(iv) Yes.

(v) Yes.

(vi) At a time when a Cabinet Memorandum was submitted to get the approved provisions required for purchasing paddy during "Maha" Season 2018/2019, the Cabinet Memorandum -No.19/0137/118/007 dated 23.01.2019 was submitted by the General Treasury. Accordingly, the responsibility of paddy purchasing has been entrusted to District Secretaries. For this purpose, Rs. 1000 million has already been released to District Secretaries through the Ministry of Agriculture. Accordingly, necessary action has been taken to purchase 'Nadu' variety of paddy in due standard at Rs.38 per 1 Kg and 'Samba' variety at Rs.41 per 1Kg subject to a maximum of 2000kg of paddy from each farmer.

(b) (i) Yes.

(ii) Yes, details of which are as follows;

- Exemption of agricultural tractors, agricultural machinery, mammoties, forks, seeds and planting materials from VAT.
- Provisions of agricultural machinery under farmers' contribution of 50 per cent for projects being implemented under Food Production National Programme and many other projects.
- Provisions of green houses, polythene huts, spraying and drip irrigation systems free of charge under Agriculture Sector Modernization Project.
- Exemption of agricultural inputs such as green houses, polythene huts, spraying and drip irrigation systems to be used in agriculture from duty and Cess tax.

(iii) Yes, details of which are as follows;

- Conducting training programmes on modern agriculture technologies free of charge at In-service Training Institutes of the Department of Agriculture and District Agriculture Training Centres, to attract youths towards agriculture.
- Conducting agricultural training courses free of charge, at the levels of NVQ 5 and NVQ 6 at Agricultural Schools of the Department of Agriculture for the benefit of school leavers.
- Encouraging youths by offering project proposals under which they are being provided with knowledge on modern agri-technologies and facilities for obtaining loans from financial institutions.
- Providing agricultural inputs such as green houses, polythene huts, micro-irrigation systems under 50 per cent financial contributions.
- Resorting to agriculture productions under Forward Sale Agreements with local exporters targeting export market by using modern technology in selected Districts under Phase 1 of "Agriculture Sector Modernization Project" which is being implemented under the World Bank assistance.

(iv) Such a programme is not implemented.

(c) Employment opportunities in the agricultural sector are open not only to children of farmers but also to any child in this country.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 -529/'19- (1), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කිලිනොච්චි තමිල්චෝලෙ විද්‍යාලය : නම වෙනස් කිරීම
## கிளிநொச்சி தமிழ்ச் சோலைப் பாடசாலை: பெயர் மாற்றம்
KILINOCHCHI THAMILCHOLAI VIDYALAYA : CHANGE OF NAME

547/'19

**12.ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා (ගරු එස්. ශ්‍රීතරන් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன் - மாண்புமிகு சி. சிறீதரன் சார்பாக)
(The Hon. Gnanamuthu Srineshan on behalf of the Hon. S. Shritharan)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, තමිල්චෝලෙ යන නමින් යුත් පාසලක් පැවති බව දන්නේද;

(ii) එසේ නම්, එම පාසල ආරම්භ කළ දිනය කවරේද;

(iii) එම විදුහලේ අධ්‍යාපනය ලැබූ සිසුන් අවසන් වරට පහ වසර ශිෂ්‍යත්ව විභාගයට සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිට ප්‍රතිඵල නිකුත් කළ වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වර්තමානයේ මෙම පාසල හඳුන්වනු ලබන නම කවරේද;

(ii) මෙම පාසල නම් කරනු ලැබුවේ කවුරුන් විසින්ද;

(iii) එලෙස නම වෙනස් කරන ලද දිනය කවරේද;

(iv) පාසලේ නම වෙනස් කිරීම තුළින් මෙම පාසලේ නිර්මාතෘ, නැතහොත්, ආදිකර්තෘ යන නම කවරෙකුට හෝ ලබාගත හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி மாவட்டத்தின் தமிழ்ச் சோலை என்ற பெயரில் பாடசாலையொன்று இயங்கியதென்பதையும்;

(ii) ஆமெனில், அப்பாடசாலை ஆரம்பிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

(iii) அப்பாடசாலையில் கல்வி கற்ற மாணவர்கள் இறுதியாக தரம் ஐந்து புலமைப் பரிசில் பரீட்சைக்கும் க.பொ.த.(சா/த) பரீட்சைக்கும் தோற்றி பெறுபேறுகள் வெளியிடப்பட்ட ஆண்டுகள் வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவாரா?

(ஆ) (i) தற்பொழுது இப்பாடசாலை அழைக்கப்படும் பெயர் யாதென்பதையும்;

(ii) இப்பாடசாலைக்கு யாரினால் பெயரிடப்பட்டது என்பதையும்;

(iii) அவ்வாறு பெயர் மாற்றப்பட்ட தினம் யாதென்பதையும்;

(iv) பாடசாலையின் பெயரினை மாற்றுவதன் மூலம் இப்பாடசாலையின் ஸ்தாபகர் அல்லது நிறுவுனர் என்ற அந்தஸ்த்தினை வேறு யாரும் பெற்றுக்கொள்ள முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minster of Education:

(a) Will he inform this House -

(i) whether he is aware that there was a school by the name Thamilcholai in Kilinochchi District;

(ii) if so, the date on which the aforesaid school was commenced; and

(iii) the year in which results of the students of the aforesaid school, who sat for the grade five scholarship examination and the GCE (O/L) examination for the last time, were issued, separately?

(b) Will he also inform this House -

(i) the name by which the aforesaid school is known at present;

(ii) the person who named this school;

(iii) the date on which the aforesaid name was changed; and

(iv) whether anyone can obtain the appellation of the founder or the predecessor of this school by changing the name of the school?

(c ) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) උක්ත පාසල ආරම්භ කළ දිනය නිවැරදිව දැන ගැනීමට නොහැකි බවත්, 2007.10.01 ලෙස සඳහන්ව ඇති බවත්, නමුත් දැනට එම ස්ථානයේ එම පාසල ක්‍රියාත්මකව නොමැති බවත් උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් වාර්තා කර ඇත.

(iii) ඔව්.

පහ වසර ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල නිකුත් කළ වර්ෂය: 2018

ඉදිරිපත් වූ සිසුන් ගණන: සිසුන් 71කි.

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත් කළ වර්ෂය: 2017

ඉදිරිපත් වූ සිසුන් ගණන: සිසුන් 60කි.

(ආ) (i) කිලි/විවේකානන්ද විද්‍යාලය.

(ii) පාසල් සංවර්ධන සමිතියේ පොදු රැස්වීම් වාර්තාව අනුව දෙමව්පියන් විසින් නම් කර ඇති බව උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දී ඇත.

(iii) 2010.11.22.

(iv) නැවත පදිංචි කිරීමෙන් පසු පාසල් ප්‍රජාවගේ ඉල්ලීම අනුව, කලාප අධ්‍යාපන කාර්යාලයේ නිර්දේශය යටතේ හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු කමිටුව පවත්වනු ලැබූ පරීක්ෂණ අනුව ලබාදුන් තීරණය පදනම් කර ගනිමින් උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් මේ සඳහා අනුමැතිය ලබා දී ඇති බවත්,

තවද රජයට අයත් මෙම ඉඩමේ පාසල් ගොඩනැගිලි යුනිසෙෆ් ආධාර මඟින් ඉදිකර ඇති බවත් මේ සඳහා නිර්මාතෘ හෝ ආදිකර්තෘ ලෙස කිසිවෙකුගේ නම් සඳහන් කළ නොහැකි බවත් උතුරු පළාත් අධ්‍යාපන ලේකම් විසින් වාර්තා කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 13 -563/'19- (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රත්‍රන් ආනයනය : බලපත්‍ර
### தங்க இறக்குமதி: உரிமப்பத்திரங்கள்
### IMPORT OF GOLD: LICENCES

582/'19

**14.ගරු ටී. රංජිත් ද සොයිසා මහතා (ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා වෙනුවට)**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா - மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன சார்பாக)
(The Hon. T. Ranjith De Zoysa on behalf of the Hon. (Dr.) Bandula Gunawardane)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 181ට අනුව, රත්‍රන් ආනයනය සඳහා බලපත්‍ර 50ක් නිකුත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එකී බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් විසින් ගෙවූ බලපත්‍ර ගාස්තු පිළිබඳ විස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) වර්ෂ 1977 සිට මේ දක්වා ලෝක වෙළෙඳ පොළෙහි රත්‍රන් මිල හැසිරීම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iv) බදු රහිතව ශ්‍රී ලංකාවට රත්‍රන් ආනයනය කරනු ලබන තැනැත්තන්ගේ නම් කවරේද;

(v) ශ්‍රී ලංකාව රත්‍රන් ආනයනය කරනු ලබන ප්‍රධාන සැපයුම්කරුවන් සහ රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட பிரேரணை 181 இற்கேற்ப தங்கம் இறக்குமதி செய்வதற்காக 50 உரிமப்பத்திரங்கள் வழங்கப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத்தகைய உரிமப்பத்திரங்களை பெற்றுக்கொண்டவர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் அவர்களினால் செலுத்தப் பட்ட உரிமப்பத்திரக் கட்டணங்கள் பற்றிய விபரங்கள் அடங்கிய அறிக்கையொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) 1977 ஆம் ஆண்டு முதல் இற்றைவரை உலக சந்தையில் தங்கத்தின் விலையிலான போக்குகளைப் பற்றிய அறிக்கையொன்றை சமர்ப்பிப்பாரா என்பைதையும்;

(iv) வரி இன்றி இலங்கைக்கு தங்கம் இறக்குமதி செய்கின்ற ஆட்களின் பெயர்கள் யாவையென் பதையும்;

(v) இலங்கை தங்கம் இறக்குமதி செய்யும் பிரதான வழங்குனர்கள் மற்றும் நாடுகள் யாவையென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House-

(i) whether 50 licenses were issued for the import of gold as per Proposal No.181 of the 2016 budget;

(ii) if so, whether a detailed report containing the names and addresses of licensees and the license fees paid by them;

(iii) whether he will submit a report on the price of gold in the world market from 1977 up to now;

(iv) the names of persons who import gold to Sri Lanka free of duties; and

(v) the names of major suppliers and countries from whom gold is imported by Sri Lanka?

(b) If not, why?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) ඉහත ප්‍රශ්න අංක (i)ට අනුව මෙය අදාළ නොවේ.

(iii) 1977 වසරේ සිට ලෝක රත්‍රන් මිල හැසිරීමෙහි සුවිශේෂී අවස්ථාවන්

1977-2018 අතර කාල සීමාව තුළ සමස්තයක් වශයෙන් ගත්කළ, රත්‍රන් මිලෙහි දිගු කාලීන විචලනය, ඉහළ යාමක් පෙන්වයි. කෙසේ වෙතත් මෙම අවුරුදු 40ක කාල පරාසය තුළ රත්‍රන් මිලෙහි කෙටි කාලීන ඉහළ යාම් මෙන්ම පහළ යාම් ද දක්නට ලැබේ.

1979-80 කාලයේ සිදු වූ රත්‍රන් මිල ඉහළ යාමට හේතු ලෙස තෙල් මිලෙහි ඉහළ යාම මෙන්ම සෝවියට් සංගමය විසින් සිදු කරන ලද ඇෆ්ඝනිස්තාන ආක්‍රමණය සහ ඉරාන විප්ලවය නිසා ඇති වූ දේශපාලනික අස්ථාවරභාවය සහ ඉහළ ගිය උද්ධමනය ද දැක්විය හැක. 1980-82 කාලයේ, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ නැංවීමේ ක්‍රියාවලියත් සමඟ මෙම මිල ඉහළ යාමේ ප්‍රවණතාවයේ හැරීමක් දක්නට ලැබුණි.

1982-2005 කාලය තුළ රත්‍රන් මිල ට්‍රෝයි අවුන්සයට එක්සත් ජනපද ඩොලර් 300ත්, 500ත් අතර පැවතුණු අතර, සැලකිය යුතු තරමේ විචලනයක් නොපෙන්වන ලදී.

වසර 2006දී රත්‍රන් මිල විශාල ලෙස ඉහළ යාමට පටන් ගන්නා ලද්දේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ නිවාස වෙළෙඳ පොළ තුළ ඇති වූ මූල්‍ය අර්බුදය හේතුවෙන් එවක ගෝලීය ආර්ථිකයේ ඇති වූ අර්බුදකාරී තත්ත්වය හමුවේ එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුවේ ප්‍රමාණාත්මක ලිහිල් කිරීම් හා සමගාමීව පැවැති දිගු කාලීන අඩු පොලී අනුපාත වාතාවරණය හේතුවෙනි.

ඉහළ යමින් පැවති ගෝලීය මූල්‍ය වෙළෙඳ පොළ අස්ථාවරත්වය හමුවේ රත්‍රන් මිල තවදුරටත් ඉහළ ගිය අතර, විශාල ලෙස මිල උච්චාවචනයන් දක්නට ලැබුණි. වසර 2010දී ඇති වූ යුරෝපා කලාපයේ ණය අර්බුදය ද මෙම තත්ත්වය දිගටම පැවතීමට හේතුවක් විය.

ලෝක මූල්‍ය වෙළෙඳ පොළේ අස්ථාවරභාවය උත්සන්නවීමත් සමඟම 2011 සැප්තැම්බරයේදී රත්‍රන් මිලෙහි වර්තාගත ඉහළම අගය වන එක්සත් ජනපද ඩොලර් 1900 (ට්‍රෝයි අවුන්සයකට) සනිටුහන් වූ අතර මෙම අගය 2000 වර්ෂාවසාන රත්‍රන් මිල සමඟ සැසඳීමේදී සියයට 574ක ඉහළ යාමක් විය.

2013 වසරේ අවසන් කාලයේදී එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුවේ ප්‍රමාණාත්මක ලිහිල් කිරීම් අවසන් කරන බවට වූ නිවේදනයත් සමඟ මෙකී මිල ඉහළ යාමේ ප්‍රවණතාවේ ආපසු හැරීමක් දක්නට ලැබුණි. මෑත කාලීනව ඇරඹුණු ෆෙඩරල් පොලී අනුපාත ඉහළ දැමීමේ ක්‍රියාවලියත් සමඟ රත්‍රන් මිල තවදුරටත් පහළ යන ලදී.

කෙසේ වුවද, බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත්වීමට තීරණය කිරීම, එක්සත් ජනපද ජනාධිපතිවරණය, මැද පෙරදිග කලාපයේ මෙන්ම උතුරු කොරියානු තත්ත්වය සහ එක්සත් ජනපදය සහ චීනය අතර වෙළෙඳාම සම්බන්ධයෙන් ඇති වූ අවිනිශ්චිත බව හේතුකොටගත් ගෝලීය දේශපාලනයේ අවදානම හමුවේ වසර 2016දී රත්‍රන් මිලෙහි සුළු ඉහළ යාමක් දක්නට ලැබුණි.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

රත්‍රන් මිලෙහි හැසිරීම පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පහත ඇමුණුමෙහි දැක්වේ.

කාර්තුමය වශයෙන් රත්‍රං මිලෙහි හැසිරීම (1977 -2018)

ඇ.එ.ජ.ඩොලර් /ට්‍රෝයි අවුන්ස්

| වර්ෂය | කාර්තු1 | කාර්තු2 | කාර්තු3 | කාර්තු4 |
|---|---|---|---|---|
| 1977 | 148.9 | 143 | 154.05 | 164.95 |
| 1978 | 181.6 | 183.05 | 217.1 | 226 |
| 1979 | 240.1 | 277.5 | 397.25 | 512 |
| 1980 | 494.5 | 653.5 | 666.75 | 589.75 |
| 1981 | 513.75 | 426 | 428.75 | 397.5 |
| 1982 | 320 | 317.5 | 397 | 456.9 |
| 1983 | 414.75 | 416 | 405 | 382.4 |
| 1984 | 388.5 | 373.05 | 343.75 | 309 |
| 1985 | 329.25 | 317.75 | 326.5 | 326.8 |
| 1986 | 344 | 345.5 | 423.2 | 388.75 |
| 1987 | 420.32 | 447.3 | 459.5 | 484.1 |
| 1988 | 456.95 | 436.55 | 397.7 | 410.25 |
| 1989 | 383.2 | 373 | 366.5 | 401.25 |
| 1990 | 368.5 | 352.2 | 408.4 | 382.8 |
| 1991 | 355.65 | 368.35 | 354.9 | 353.15 |
| 1992 | 341.7 | 343.4 | 350 | 334.5 |
| 1993 | 339 | 378.1 | 355.4 | 390.7 |
| 1994 | 391 | 386.3 | 394.25 | 383.2 |
| 1995 | 391.4 | 384.6 | 384 | 387.1 |
| 1996 | 395.45 | 380.45 | 378.4 | 367.7 |
| 1997 | 351.25 | 333.95 | 334.45 | 289.05 |
| 1998 | 300.95 | 296.95 | 296.95 | 288.25 |
| 1999 | 280.05 | 262.5 | 298.75 | 288 |
| 2000 | 279.08 | 289.53 | 274.25 | 272.25 |
| 2001 | 257.95 | 270.85 | 293.25 | 278.95 |
| 2002 | 302.65 | 314.45 | 323.55 | 348.05 |
| 2003 | 337.45 | 346.4 | 385.35 | 415.45 |
| 2004 | 426.45 | 394.25 | 418.25 | 438.45 |
| 2005 | 428.35 | 435.5 | 469.3 | 517 |
| 2006 | 583.65 | 615.85 | 598.3 | 636.7 |
| 2007 | 663.8 | 649.65 | 743.6 | 833.7 |
| 2008 | 916.9 | 925.4 | 870.95 | 882.05 |
| 2009 | 919.35 | 926.5 | 1007.7 | 1096.98 |
| 2010 | 1113.25 | 1242.38 | 1308.54 | 1421.4 |
| 2011 | 1432.2 | 1500.18 | 1623.79 | 1564.91 |
| 2012 | 1668.15 | 1597.45 | 1772.25 | 1675.35 |
| 2013 | 1597.5 | 1234.53 | 1329.03 | 1201.64 |
| 2014 | 1284.01 | 1327.33 | 1208.15 | 1184.37 |
| 2015 | 1183.57 | 1172.35 | 1115.09 | 1061.1 |
| 2016 | 1232.75 | 1321.9 | 1315.87 | 1147.5 |
| 2017 | 1249.2 | 1249.2 | 1279.75 | 1302.8 |
| 2018 | 1325.48 | | | |

මූලාශ්‍රය: බ්ලූම්බර්ග්

** [මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]*
** [இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
** [This annex is also placed in the Library.]*

(iv) තීරුබදු රහිතව රත්‍රන් ආනයනය කිරීම සඳහා පහත සඳහන් ආකාර 02 මගින් පමණක් අවස්ථාව ලබා දී ඇත.

ආයෝජන මණ්ඩලය යටතේ

1. සිලෝන් ජුවලරි මැනුෆැක්චරිස් (පෞද්) සමාගම,

   (අලංකාර SKR ලෙස කලින් හඳුන්වන ලද)

   33, මෝදරවිල කර්මාන්තපුරය,

   පානදුර.

   ප්‍රතිඅපනයනය කිරීමේ අරමුණින් තාවකාලිකව කරනු ලබන ආනයන වරප්‍රසාදය යටතේ [temporary Importation for Export Purpose - (TIEP)]

2. ඩබ්ලිව්.එම්. ද සිල්වා ජුවලර්ස්,

   3, විහාර වීදිය,

   මහනුවර.

3. ජේ.ඒ. ද සිල්වා සහ සමාගම,

   ග්‍රෑන්ඩ් හොටෙල්,

   නුවරඑළිය.

4. එන්.ජේ. එක්ස්පෝට්ස්,

   541- 3/1 ගාලු පාර,

   කොළඹ 06.

   මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

(v) සැපයුම්කරුවන්:

1. අල් බොගාරි අයිජීඑල් ඩීඑම්සීසී 24-05-410 ජුවෙලරි සහ ජෙම්ප්ලෙක්ස්, ඩීඑම්සීසී

   තැ.පෙ. 4048, ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය.

2. සී/ස මහේෂ් සහ පුද්ගලික සමාගම, 36, කෆ් පාර (Cuff Road), සිංගප්පූරුව.

3. සී/ස අල් රැවිස් ජුවෙලරි එල්එල්සී, තැ.පෙ. 251582, කල්ෆාන් බින් ජැකෝ .

(ආ) පැන නොනඟී.

## වතුකරයේ රෝහල් රජයට පවරා ගැනීම : විස්තර
## பெருந்தோட்ட வைத்தியசாலைகளை அரசாங்கம் பொறுப்பேற்றல்: விபரம்
## ACQUISITION OF ESTATE HOSPITALS BY GOVERNMENT: DETAILS

596/'19

**15.ගරු ටී. රංජිත් ද සොයිසා මහතා (ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවට)**

(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா - மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே சார்பாக)

(The Hon. T. Ranjith De Zoysa on behalf of the Hon. Ananda Aluthgamage)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වතුකරයේ ජීවත්වන ලක්ෂ 08කට ආසන්න ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් වතුකරයේ රෝහල් රජයට පවරා ගැනීමේ වැඩ පිළිවෙළක් පසුගිය රජය විසින් ක්‍රියාත්මක කළ බව පිළිගන්නේද;

(ii) එම වැඩ පිළිවෙළ අනුව, 2014 වර්ෂය අවසන් වනවිට එලෙස රජයට පවරාගෙන ඇති වතු රෝහල් සංඛ්‍යාව, රෝහලේ නම සහ පවරාගත් කාලවකවානුව කවරේද;

(iii) මේ වනවිට එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන බව පිළිගන්නේද;

(iv) මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය වාර්ෂිකව වැය කළ මුදල ඉදිරිපත් කරන්නේද;

(v) වතුකරයේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමට මෙම ව්‍යාපෘතිය මඟින් විශාල පිටුවහලක් වූ බැවින් එය කඩිනමින් නැවත ආරම්භ කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பெருந்தோட்டங்களில் வாழும் ஏறத்தாழ 08 இலட்சம் மக்களின் சுகாதார நிலைமையை மேம்படுத்தும் நோக்கத்தில் பெருந்தோட்ட வைத்தியசாலைகளை அரசாங்கம் பொறுப்

பேற்கும் நிகழ்ச்சித்திட்டமொன்று கடந்த அரசாங்கத்தினால் நடைமுறைப்படுத்தப் பட்டதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii ) மேற்படி நிகழ்ச்சித்திட்டத்திற்கேற்ப 2014 ஆம் ஆண்டு நிறைவுபெறும் போது அவ்வாறு அரசிற்கு பொறுப்பேற்றுக்கொள்ளப்பட்ட பெருந் தோட்ட வைத்தியசாலைகளின் எண்ணிக்கை, வைத்தியசாலையின் பெயர் மற்றும் பொறுப் பேற்றுக்கொள்ளப்பட்ட காலகட்டம் யாதென் பதையும்;

(iii ) தற்போது இக்கருத்திட்டம் நடைமுறையிலில்லை என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv ) இக்கருத்திட்டத்திற்காக அமைச்சினால் செலவிடப்பட்ட பணத்தொகை வருடாந்தம் எவ்வளவென்பதை சமர்ப்பிப்பாரா என்பதையும்;

(v ) பெருந்தோட்ட சுகாதார நிலைமையை மேம் படுத்துவதற்கு இக்கருத்திட்டம் பெரும் உந்துசக்தியாக இருந்ததால் அதனை துரிதமாக மீள ஆரம்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition & Indigenous Medicine:

(a) Will he inform this House-

(i) whether it is admitted that a programme was implemented by the previous government to acquire estate hospitals to the government, in order to uplift the health of nearly 08 lakhs people living in the estates;

(ii) the number of estate hospitals acquired by the end of year 2014, under the said programme, their names and the time period;

(iii) whether it is admitted that the programme has now come to a standstill;

(iv) whether the amount spent annually for this programme by the Ministry is presented; and

(v) whether measures will be taken to restart the project again, since it was pivotal in uplifting the health of the people living in estates?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(ආ) (i) ඔව්.

(ii) පහත ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම

44 කි. (හතලිස් හතර)

| අනු අංක | රෝහලේ නම | පවරාගත් වර්ෂය |
|---|---|---|
| 01 | ප්‍රාදේශීය රෝහල. මඩොල්කැලේ | අවුරුදු පනහකට පෙර |
| 02 | ප්‍රාදේශීය රෝහල. ස්ප්‍රින්වැලි | 1994 |
| 03 | ප්‍රාදේශීය රෝහල. ආගරපතන | 1996 |
| 04 | ප්‍රාදේශීය රෝහල. රොබරි | 1997 |
| 05 | ප්‍රාදේශීය රෝහල. ඌරි | 1999 |
| 06 | ප්‍රාදේශීය රෝහල. ග්ලෙනොරේ | 2000 |
| 07 | ප්‍රාදේශීය රෝහල. හොප්ටන් | 2000 |
| 08 | ප්‍රාදේශීය රෝහල .මීදුම්පිටිය | 2000 |
| 09 | ප්‍රාදේශීය රෝහල. දෙමෝදර | 2003 |
| 10 | ප්‍රාදේශීය රෝහල. දියගම බස්නාහිර | 2007 |
| 11 | ප්‍රාදේශීය වෛද්‍ය සත්කාර ඒකකය. ප්‍රොටොෆ් | 2007 |
| 12 | ප්‍රාදේශීය රෝහල. ගෝනපිටිය | 2007 |
| 13 | ප්‍රාදේශීය රෝහල. හයිෆොරස්ට් | 2007 |
| 14 | ප්‍රාදේශීය රෝහල. මඩකුඹුර උතුර | 2007 |
| 15 | ප්‍රාදේශීය රෝහල. මූලඔය | 2007 |
| 16 | ප්‍රාදේශීය රෝහල. කතවැරල්ල | 2007 |
| 17 | ප්‍රාදේශීය රෝහල. දඹතැන්න | 2007 |
| 18 | ප්‍රාදේශීය රෝහල. ඩවුන් සයිඩ් | 2007 |
| 19 | ප්‍රාදේශීය රෝහල. හග්ගල | 2007 |
| 20 | ප්‍රාදේශීය රෝහල. මහදෝව | 2007 |
| 21 | ප්‍රාදේශීය රෝහල. පූනගල | 2007 |
| 22 | ප්‍රාදේශීය රෝහල. සරනිය | 2007 |
| 23 | ප්‍රාදේශීය රෝහල. තෙල්බැද්ද | 2007 |
| 24 | ප්‍රාදේශීය රෝහල. ක්‍රික්ලීස් | 2007 |
| 25 | ප්‍රාදේශීය රෝහල. උණුගල්ල | 2007 |
| 26 | ප්‍රාදේශීය රෝහල. උඩවරිය | 2007 |
| 27 | ප්‍රාදේශීය රෝහල. ඌව හයිලන්ඩ් | 2007 |
| 28 | ප්‍රාදේශීය රෝහල. හල්ගොල්ල | 2007 |
| 29 | ප්‍රාදේශීය රෝහල. කිරිපෝරුව | 2007 |
| 30 | ප්‍රාදේශීය රෝහල. සපුමල්කන්ද· | 2007 |
| 31 | ප්‍රාදේශීය රෝහල. අලූපොල | 2007 |
| 32 | ප්‍රාදේශීය රෝහල. එන්දන | 2007 |
| 33 | ප්‍රාදේශීය රෝහල. හුණුවල | 2007 |
| 34 | ප්‍රාදේශීය රෝහල. රාස්සගල | 2007 |
| 35 | ප්‍රාදේශීය රෝහල. මාදම්පේ | 2007 |
| 36 | ප්‍රාදේශීය රෝහල. දුම්බර | 2007 |
| 37 | ප්‍රාදේශීය රෝහල. කිරිබත්ගල | 2007 |
| 38 | ප්‍රාදේශීය රෝහල. සූරියකන්ද | 2007 |
| 39 | ප්‍රාදේශීය රෝහල. පාලම්කෝට්ටේ | 2007 |
| 40 | ප්‍රාදේශීය රෝහල. මාරතැන්න | 2007 |
| 41 | ප්‍රාදේශීය රෝහල. තිව් කැට්ල් | 2007 |
| 42 | ප්‍රාදේශීය රෝහල. ගිකියානකන්ද | 2007 |
| 43 | ප්‍රාදේශීය රෝහල. රයිගම | 2007 |
| 44 | ප්‍රාදේශීය රෝහල. වෙස්තාල් | 2007 |

***[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This annex is also placed in the Library.]*

(iii) නැත.

(iv) ඔව්.

| වර්ෂය | වතු රෝහල් සංවර්ධනය සඳහා වැය කළ මුදල (රුපියල් මිලියන) | රෝග නිවාරණ සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම සඳහා වැය කළ මුදල (රුපියල් මිලියන) |
|---|---|---|
| 2011 | 13 | 9.7 |
| 2012 | 19.6 | 18.1 |
| 2013 | 3.4 | 13 |
| 2014 | 20 | 3.68 |
| 2015 | 10 | 8 |
| 2016 | 237 | 18.35 |
| 2017 | 229.5 | 12.6 |
| 2018 | 100 | 2.1 |

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

(v) රජයට පවරා නොගත් සියලුම වතු රෝහල් රජයට පවරා ගෙන සංවර්ධනය කළ යුතු වතු රෝහල් ප්‍රමුඛතා ලැයිස්තුගත කිරීම 2017 වර්ෂයේදී සිදු කර ඇත. එම වතු රෝහල් රජයට පවරා ගැනීම සඳහා 2018 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ද ලැබී ඇත. එමෙන්ම රෝහල් නවීකරණය සඳහා සැලසුම් සකස් කර ඇති අතර, සංවර්ධනය කළ යුතු සෞඛ්‍ය සේවාවන් ඊට අවශ්‍ය මානව සම්පත් හා එම රෝහල් සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් මේ වනවිට හඳුනාගෙන ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

අමාත්‍යාංශ නිවේදන. වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමා.

## මුලතිව් ප්‍රදේශය තුළ ප්‍රදීපාගාරයක් ඉදිකිරීම: වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## முல்லைத்தீவுப் பிரதேசத்தில் வெளிச்சவீடு அமைத்தல்: துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சரினது கூற்று
## CONSTRUCTION OF A LIGHTHOUSE IN MULLAITIVU AREA : STATEMENT BY MINISTER OF PORTS AND SHIPPING AND SOUTHERN DEVELOPMENT

**ගරු සාගල රත්නායක මහතා (වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாகல ரத்நாயக்க - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Ports and Shipping and Southern Development)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 (2) යටතේ අපේ ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයකට තමයි මා මේ පිළිතුර සපයන්නේ. එතුමා එම ප්‍රශ්නය අසා තිබුණේ වෙනත් අමාත්‍යාංශයකින්. නමුත් එම අමාත්‍යාංශයෙන් අපිට එම ප්‍රශ්නය ලබා දුන්නා. එයට අදාළ පිළිතුර තමයි මා ඉදිරිපත් කරන්නේ, ගරු කථානායකතුමනි. ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා අසා තිබුණේ උතුරු හා නැඟෙනහිර පළාත්වල පවතින ප්‍රදීපාගාර සම්බන්ධ ප්‍රශ්නයක්.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද උතුරු හා නැඟෙනහිර පළාත්වල ප්‍රදීපාගාර ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ, මේ වනවිට ප්‍රදීපාගාර 06ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඉන් සාම්පූර් සහ පුන්කුඩුතිව් යන ප්‍රදේශවල පිහිටි ප්‍රදීපාගාරයන්හි අලුත්වැඩියා කටයුතු අවසන් අදියරෙහි පවතී. පේදුරුතුඩුව, කෝවිලාන්, කන්කසන්තුරේ සහ මඩකලපුව යන ප්‍රදේශයන්හි පිහිටි ප්‍රදීපාගාරයන්හි ප්‍රතිසංස්කරණ කටයුතු ඉන් අනතුරුව සිදු කරනු ලැබේ. මේ සියල්ල මේ වර්ෂය තුළ සිදු කරනු ලබනවා.

ඊළඟට එතුමා මුලතිව් ප්‍රදේශයේ පිහිටි ප්‍රදීපාගාරය පිළිබඳව අසා තිබෙනවා, ගරු කථානායකතුමනි.

මුලතිව්හි පිහිටි ප්‍රදීපාගාරය පසුගිය යුද සමයේදී මුළුමනින්ම විනාශ විය. එය අලුතින්ම නැවත ඉදිකළ යුතු අතර, ඒ සඳහා විශාල අරමුදලක් අවශ්‍ය කෙරේ. එම නිසා, එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2019 වසර සඳහා ප්‍රදීපාගාර ප්‍රතිසංස්කරණ වැඩසටහනට ඇතුළත් නොකරන ලදී. නව ප්‍රදීපාගාර ඉදිකිරීම සඳහා 2019 වසර තුළ ප්‍රතිපාදන ලබා දීම පිළිබඳව සලකා බැලිය යුතුව ඇත.

කෙසේ වුවද, ජනයාට සිදු වන බලපෑම් සහ ප්‍රශ්න අවධානයට යොමු වී ඇති අතර, මෙම ගැටලුව පිළිබඳව කුමන ආකාරයේ සැලසුම් සහ ආයෝජන සිදු කළ හැකිද යන්න ශ්‍රී ලංකා වරාය අධිකාරියට සලකා බලන ලෙස මා විසින් දන්වා ඇත.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)
Sir, I move,

"That March 13th Wednesday, 14th Thursday, 15th Friday, 16th Saturday, 18th Monday, 19th Tuesday, 21st Thursday, 22nd Friday, 23rd Saturday, 25th Monday, 26th Tuesday, 27th Wednesday, 28th Thursday, 29th Friday, 2019 and April 01st Monday, 02nd Tuesday, 03rd Wednesday, 04th Thursday, 05th Friday, 2019 be allotted days for consideration of the "Appropriation Bill (2019)"."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

### I

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of the motions agreed by Parliament on 21.02.2019, the hours of Sitting of Parliament on

Saturday 09th March and Monday 11th March 2019 shall be 9.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 7.00 p.m.. At 7.00 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order 75(2) of the Parliament, the hours of sittings of Parliament on allotted days for consideration of the "Appropriation Bill (2019)" from March 13th Wednesday 2019 to April 04th Thursday, 2019 shall be 9.30 a.m. to 12.30 p.m. and 1.00 p.m. to 7.30 p.m.:

Provided that, at 7.00 p.m. the Standing Order 8(5) and (6) of the Parliament shall operate."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order 75(2) of the Parliament, the hours of sitting of Parliament on Friday, 05th April, 2019 allotted for consideration of the "Appropriation Bill (2019)" shall be 9.30 a.m. to 12.30 p.m. and 1.00 p.m. to 5.00 p.m.

At 5.00 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ දිනට නියමිත වැඩකටයුතු යටතේ විෂයය අංක 01, විසර්ජන පනත් කෙටුම්පත, 2019 දෙවැනි වර කියවීමේ විවාදය - සිව්වැනි වෙන් කළ දිනය. විවාදය ආරම්භ කිරීමට, ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා.

# විසර්ජන පනත් කෙටුම්පත, 2019
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2019
## APPROPRIATION BILL, 2019

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.*
*ඊට අදාළ ප්‍රශ්නය [මාර්තු 05]*
*"පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය" [ගරු මංගල සමරවීර මහතා]*
*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*
*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [மார்ச் 05]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு மங்கள சமரவீர]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Order read for resuming Adjourned Debate on Question - [05th March]*
*"That the Bill be now read a Second time".- [The Hon. Mangala Samaraweera]*
*Question again proposed.*

[පූ. භා. 9.53]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, අපේ හිතවත් මුදල් ඇමතිතුමා මෙම අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙන යෝජනා පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට මම බලාපොරොත්තු වෙනවා. එතුමා අපේ හිතවතෙක්. එතුමාගේ අවුරුදු 30ක දේශපාලන සේවය පිළිබඳව පසුගිය දා උත්සවයක් පැවැත්වුණා. අපිත් එයට සහභාගි වුණා. මේ අවස්ථාවේ දී මම එතුමාට සුබ පතනවා. හැබැයි, එතුමා ඉදිරිපත් කර තිබෙන මේ අය වැය දිහා බැලුවාම, ඒ ගැන නම් අපට නොයෙක් විවේචන ඉදිරිපත් කරන්න සිදු වෙනවා. අපේ මුදල් ඇමතිතුමා ඉතාම නිර්මාණශීලී පුද්ගලයෙක්. මෙම අය වැය ලේඛනයේ සඳහන් කර ඇති එක එක ව්‍යාපෘතිවලට එතුමා නම් දීලා තිබුණා. ඉන් එක ව්‍යාපෘතියක් තමයි, "සිහින මාළිගා" කියන එක. ඒ නම ව්‍යාපෘතියකට පමණක් නොවෙයි, මේ මුළු අය වැයටම හොඳ නමක් කියා මට හිතෙනවා. මොකද මෙය යථාවාදී අය වැයක් නොවෙයි. එහි ලස්සන වචන තිබෙනවා; ලස්සන අදහස් තිබෙනවා. එතුමා ඉතාම නිර්මාණශීලියි. නමුත්, අපි මේකේ අභ්‍යන්තරය විග්‍රහ කර බලනකොට, සංඛ්‍යාලේඛන විග්‍රහ කර බලනකොට එය සිහින මාළිගාවක් පමණයි කියා අපට පෙනෙනවා. ඇයි, අපි එහෙම කියන්නේ? ගිය අවුරුද්දේ ඒ ක්‍රියාමාර්ග, තීරණ ක්‍රියාත්මක වෙලා තිබිලා තිබෙන්නේ කොයි විධියටද කියා තමුන්නාන්සේලා බලන්න.

අපි මේ රටේ ආදායම අරගෙන බලමු. මුදල් ඇමතිතුමා පසු ගිය අවුරුද්දේ කරපු යෝජනා සහ යථාර්ථය මොකක්ද කියා හොයලා බලන්න. පසු ගිය අවුරුද්දේ බලාපොරොත්තු වුණා, සම්පූර්ණ ආදායම රුපියල් බිලියන 2,015ක්. නමුත්, අවසාන ප්‍රතිඵලය මොකක්ද? ලැබිලා තිබෙන්නේ රුපියල් බිලියන 1,771යි. ඒ කියන්නේ, රුපියල් බිලියන 244ක් ලැබිලා නැහැ. ඒ සම්පූර්ණ ඉලක්කවලට යන්න බැරි වෙලා තිබෙනවා. ආදායම් මාර්ග හැම එකක්ම අසාර්ථකයි. ඊළඟට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දුන්නු ඉලක්කය මොකක්ද? රුපියල් බිලියන 344ක් හම්බ කරන්න කියා ඉලක්කයක් දුන්නා. වර්ෂය අවසානයේ කීයද එකතු කර තිබෙන්නේ? රුපියල් බිලියන 287යි. රුපියල් බිලියන 57ක් අය කර ගන්න බැරි වෙලා ඒ ඉලක්කය අසාර්ථක වෙලා තිබෙනවා. ඒවා එකින් එක අරගෙන බලන්න පුළුවන්.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

Income Tax එක ගත්තොත්, රුපියල් බිලියන 57ක් අඩුයි. වැට් එක ගත්තොත් රුපියල් බිලියන 45ක් අඩුයි. Nation Building Tax එක ගත්තොත් රුපියල් බිලියන 10ක් අඩුයි. සමස්තයක් වශයෙන් ගත්තාම, දේශීය ආදායම් දෙපාර්තමේතුවේ ආදායම්වලින් රුපියල් බිලියන 121ක් අඩුයි.

ඊළඟට, බලමු ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ තත්ත්වය. රේගු දෙපාර්තමේන්තුවේ ඉලක්කය මොකක්ද? Import duty ඉලක්කය රුපියල් බිලියන 158යි. හම්බ වුණේ කීයද? රුපියල් බිලියන 89යි. ඒ කියන්නේ, රුපියල් බිලියන 69ක රික්තයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙයික්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you may continue your speech.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, VAT එක බලන්න. රුපියල් බිලියන 188ක් බලාපොරොත්තු වුණා. රුපියල් බිලියන 161යි හම්බ වුණේ. මේ විධියට ගත්තාම මුළු ඉලක්කයෙන්ම රුපියල් බිලියන 964ක් බලාපොරොත්තු වෙලා අන්තිමට ලැබුණේ රුපියල් බිලියන 841යි. ඊළඟට, සුරාබදු බලන්න. සුරාබදුවලින් රුපියල් බිලියන 115ක් බලාපොරොත්තු වෙනවා. නමුත් බිලියන 104යි ලැබුණේ. මේ රටේ ආදායම කොයි විධියට ප්‍රක්ෂේපණ කළත්, කොයි විධියට බලාපොරොත්තු වුණත්, ඉතිහාසයේ අපට පෙනෙන්න තිබෙන්නේ ඒ ඉලක්කවලට යන්න බැරි වෙලා තිබෙනවා කියන කාරණයයි. මේවා මගේ සංඛ්‍යා ලේඛන නොවෙයි, තමුන්නාන්සේලා විසින්ම මේ අය වැයට ඉදිරිපත් කරන ලද සංඛ්‍යා ලේඛන. කරුණාකරලා බලන්න, Fiscal Management Report - 2019. එකම ආදායම් ඉලක්කයකටවත් ගිහිල්ලා නැහැ. අපේ හිතවත් ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා මේ ගැන දන්නවා. මොකද, ඒ ඉලක්කවලට ගියේ නැත්නම් ඒ භාරගත්ත වැඩවලට අපට ගෙවන්න බැහැ. තමුන්නාන්සේ හොඳට දන්නවා, "මේ කරපු වැඩවලට අපට සල්ලි ගෙවන්න." කියාගෙන හැමදාම කොන්ත්‍රාත්කාරයෝ එන බව. ඒකට මුදල් නැහැ. ඒක, පසු ගිය අවුරුද්දේ අපේ ආර්ථික ක්‍රියාවලිය පිළිබඳ විමර්ශනයේ පෙනෙන්න තිබෙනවා. සම්පූර්ණයෙන් ඉදි කිරීමේ ක්ෂේත්‍රය - construction sector එක- බැහැලා තිබෙනවා. ඉදි කිරීමේ ක්ෂේත්‍රයෙන් අපේ ආර්ථිකයට දිය යුතු ඒ සේවය, දිය යුතු ඒ අයගේ සලාකය දෙන්න බැරි වෙලා තිබෙනවා. මොකද, ඒ ආදායම ලැබෙන්නේ නැහැ. ආදායම ලැබුණේ නැති වුණාම ඇමතිවරුන්ට ඒ ප්‍රතිපාදන හරියට හසුරුවා ගන්න බැහැ. ඊට පස්සේ මොකද වෙන්නේ? ඒ ක්ෂේත්‍රය කඩා වැටෙනවා. ඒකයි වෙලා තිබෙන්නේ, ඒකයි ඇත්ත. ඒකට හේතුවක් තිබෙනවා. ඔබතුමන්ලා පිළිගන්න ඕනෑ, ඒ හේතුව. හේතුව තමයි, ඒ ආර්ථික ක්ෂේත්‍රයේ සිටින සියලු දෙනාම එකට වැඩ කරන්නේ නැහැ. ජනාධිපතිතුමා, අගමැතිතුමා, අදාළ ඇමතිතුමා, භාණ්ඩාගාරයේ ලේකම්තුමා, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ලේකම්වරුන්, රජයේ සේවකයන් එකට වැඩ කරන්නේ නැහැ. මේ වාගේ ආර්ථික අර්බුදයක් තිබෙන අවස්ථාවේ එරී ගොල්ලෝ එකට අත්වැල් බැඳගෙන වැඩ කරන්න ඕනෑ. පසුගිය අවුරුදු හතර තුළම එහෙම වාතාවරණයක් නොතිබුණු බව මම කියන්නේ කනගාටුවෙන්. මේ රජයට එවැනි ආකාරයට ක්‍රියා කරන්න බැරි වුණා. අපි වෙනත් මත දැරුවත් කියන්න ඕනෑ, පසුගිය රජය තුළ ඒ අංශයන් එකට වැඩ කළ බව. ජනාධිපතිතුමා, අගමැතිතුමා, මුදල් ඇමතිතුමා, විශේෂයෙන් භාණ්ඩාගාරයේ ලේකම්තුමාට -පී.බී. ජයසුන්දර මැතිතුමාට- ඒ කාර්ය භාරය හරියට පවරා තිබුණා. ඇමතිවරු එකට වැඩ කළා. අන්තිමට ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්. මේ රජයේ තිබෙන ලොකුම දුර්වලතාවය තමයි, එක එක්කෙනා එක එක පැත්තට අදින එක. එතකොට හරියට වැඩ කරන්න බැහැ.

මගේ මිත්‍ර දිනේෂ් ගුණවර්ධන මැතිතුමා දැන් මේ ගරු සභාවට පැමිණියා. කොල්වින් ආර්. ද සිල්වා තමයි කිව්වේ, මේක "ඔළු තුනේ බුරුවන්ගේ වැඩ කටයුතු." කියා.

අපේ හිතවත් ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා බලන්න. එක වෙලාවක එතුමාට ඒ බලතල දෙනවා. එතුමා ක්‍රියාත්මක කරගෙන යනකොට තව කෙනෙකුට දෙනවා. එයා කරගෙන යනකොට ඒ බලතල තව කෙනෙකුට දෙනවා. ඔහොම කරන්න පුළුවන්ද? මම මේ අවංකව තමයි කථා කරන්නේ. මොකද, අපිත් ඒ කැබිනට් මණ්ඩලවල හිටියා.

මම මේ වගකීමෙන් මිදෙන්න කියනවා නොවෙයි. අපේ රට ගැන කල්පනා කරලායි මම කියන්නේ. මම මුදල් ඇමති හැටියටත් හිටියා. ගීතයක් ගයන කණ්ඩායමක් ඒ ගීතය එක ස්වරයකින් ගායනා කළේ නැත්නම් ඉතාම අමිහිරි සංගීතයක් තමයි නිපදවෙන්නේ. ඒක තමුන්නාන්සේලා දන්නවා. එක්කෙනෙක් එක ස්වරයකට කියනවා, තව කෙනෙක් තව ස්වරයකට කියනවා, තව කෙනෙක් තව තාලයකට කියනවා. අන්තිමට තොවිලයක් නටනවා වාගේ එකක් තමයි අපට ඇහෙන්නේ. මේක නවත්වන්න ඕනෑ. ඔබතුමා අවංකව කල්පනා කරලා බලන්න, ඔබතුමාට වැඩක් කරන්න ඉඩ දුන්නාද? දැන් බලන්න, ඔබතුමායි, මමයි, එස්.බී. මන්ත්‍රීතුමායි ආදරය කරන කොළඹ-නුවර මාර්ගය. අවුරුදු පහක හැන්සාඩ් වාර්තා බැලුවොත් පෙනේවි, මෙතුමා විරුද්ධ පක්ෂයේ ඉන්දැද්දී වැඩියම කියලා තිබෙන්නේ මේ මාර්ගය ගැන; "මේ මාර්ගය කරන්නේ නැත්තේ ඇයි, ඉක්මන් කරන්න; ප්‍රමාද කරන්න එපා" කියලායි. එහෙම නේද ලක්ෂ්මන් ඇමතිතුමා? අද මොකද වෙලා තිබෙන්නේ? ඔබතුමාට මේක පරිපාලනය කරන්න දුන්නාද? ඔබතුමා කරගෙන යනකොට වෙන කෙනෙකුට දුන්නා. එතුමා ඒක කරගෙන යනකොට වෙන අදහසක් දමනවා. අද තුන්වැනි අදියර ගැන නැවත විමර්ශනය කරනවා. පාර හදලා නැහැ. ඔබතුමාගේ ඔටුන්නේ තිබුණු ප්‍රධාන මාණික්‍ය තමයි මේ උඩරට පාර. ඔබතුමාට ඒ ඔටුන්න පළඳා ගන්න දුන්නේ නැහැ නේ. බොරුද මම කියන්නේ? දුන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We have statrted the second phase from Mirigama to Kurunegala. This is just to brief you. දෙවැනි අදියර වන

මීරිගම සිට කුරුණෑගල දක්වා මාර්ගය මේ අවුරුද්දේ අගෝස්තු මාසය වෙද්දී ඉවර කරනවා. ඒක එහෙම වුණේ, අපි ඒක දේශීය කොන්ත්‍රාත්කරුවන්ට දුන්නා-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔව්. මම දන්නවා. නමුත් මම කියන්නේ තවම වැඩේ වෙලා නැහැ කියන එක.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අගෝස්තු මාසයේ නුවර යන්න අලුත් පාරක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක දන්නවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දකුණු අධිවේගී මාර්ගය හදන්න අවුරුදු දහයක් ගත්තා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක ඔබතුමාගේ වෙලාවෙදී කියන්න. හෘදය සාක්ෂියට අනුකූලව කථා කරන්න. ඔබතුමාට ගහන්න card pack එක දීලා තිබෙනවා නේ. බැලුවාම කාඩ් සියල්ලේම ඉන්නේ බූරුවෝ; රජවරු නැහැ; ආසියා නැහැ. සියල්ලෙම ඉන්නේ හාරත බූරුවෝ. ඉතින් කොහොමද, හොඳට කාඩ් ගහන්නේ? කුට්ටම කොච්චර ඇනුවත් අන්තිමට ඉන්නේ බූරුවෝ. ඉතින්, මොකද කරන්නේ? අන්න ඒක තමයි තත්ත්වය.

ඊළඟට, බලන්න මේ OCH -Outer Circular Highway- එක ගැන. ඒක ප්‍රතිපත්ති වැරැද්දක්. එහෙම නේද දිනේෂ් මන්ත්‍රීතුමා? ඒක කරපු මිනිසුන්ටම පළවෙනි stage එක භාර දුන්නා.

ඔබතුමාට කිව්වේ නැහැ නේද, බාර දෙනකොට? ඔබතුමාට කියන්නේ නැතිව බාර දුන්නා. අපි දන්නවා, කවුද ඒ තීරණ ගත්තේ කියලා. ඉතින් ඒ මිනිස්සු මොකද කරන්නේ? OCH එක ඉවර කරලා බලාගෙන ඉන්නවා, දෙවැනි පියවරට යන්න. ඒ ගොල්ලන්ගේ උපකරණ ගේන්නේ නැහැ. OCH එකේ එතැන හිර කරගෙන ඉන්නවා. ඒකත් වෙලාවට දුන්නේ නැහැ. වැරැදි ප්‍රතිපත්ති. ඇමතිතුමාගෙන් ඇහුවේ නැහැ. ඕනෑ ඕනෑ අයට කොමිටි දාලා ඒකේ පළමුවැනි පියවර දුන්නා. OCH එක කරපු මිනිසුන්ටම පළමුවැනි පියවර දුන්නා. එතකොට ප්‍රමාද වුණා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
අවුරුදු 4ක් ගියා, ඒකට.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක කරගන්න බැරි වුණා. මම තව කියන්නම් තමුන්නාන්සේලාට. කරුණාකරලා මේ වර්ෂයේ අය වැය දිහා බලන්න. බලන්න අය වැය පරතරය දෙස. මේ සංඛ්‍යාලේඛන තමුන්නාන්සේලාගේ අහස් මාළිගාවේ සංඛ්‍යාලේඛන කියලා මම දැන් පෙන්නුවා. අහස් මාළිගාවේ සංඛ්‍යාලේඛන කියලා මම ගියවර අය වැයේ සංඛ්‍යාලේඛනත් එක්ක පෙන්නුවා. දැන් මේ අවුරුද්දේ මේ ව්‍යාජ සංඛ්‍යාලේඛන යටතේ වුණත්, විශාල පරතරයක් තිබෙනවා. දැන් බලන්න, මේ අවුරුද්දේ තමුන්නාන්සේලාගේ සම්පූර්ණ ආදායම රුපියල් බිලියන 2,464යි. එතකොට වියදම කීයද? වියදම රුපියල් බිලියන 3,149යි. ඇත්ත වශයෙන්ම මේ සංඛ්‍යාලේඛන දිහා බලපුවාම අපේ සම්පූර්ණ ආදායම යන්නේ පුනරාවර්තන වියදම් හැටියටයි. පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 2,415යි. එතකොට සම්පූර්ණ ආදායම රුපියල් බිලියන 2,464යි. පුනරාවර්තන වියදම් හැටියට, පඩි නඩි ගෙවන්න, pension ගෙවන්න, පළාත් සභාවලට ගෙවන්න, ණය පොලී ගෙවන්න සහ subsidies and transfers කියන මේවාට වෙන් කළාම, සංවර්ධනයට සතයක්වත් ඉතිරි වෙලා නැහැ.

සංවර්ධනය සඳහා වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය කොපමණ ද කියලා අපි බලමු. Public investment සඳහා රුපියල් බිලියන 756ක් වෙන් කරලා තිබෙනවා. අපේ පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 2,415යි. මේකෙන්ම ඒ බව පේනවා නේ. මේක සාමාන්‍ය care and maintenance ආණ්ඩුවක්. එදානෙදා වැඩ කරගන්න තමයි මේ සල්ලි වෙන් කරලා තිබෙන්නේ. සංවර්ධනයට මුදල් නැහැ. අපේ සම්පූර්ණ ආදායම වැඩියෙනුත් තක්සේරු කරලා, ඒ ආදායමෙන් අපට වියදම් කරන්න පුළුවන් වන්නේ පුනරාවර්තන වැඩවලට විතරක් නම්, ඉතිරි වැඩ කරන්න ණයට ගන්න ඕනෑ. තමුන්නාන්සේලා හොඳට දන්නවා; මට වඩා හොඳට ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා දන්නවා, ණය ගන්න කොයි තරම් අමාරුද කියලා. ඔවුන් එක්ක අවුරුදු ගණනක් කථා කරන්න වෙනවා. ඒ ඒ රටවල් තම තමන්ගේ කොම්පැනිවලට දෙන්න කියලා බලපෑම් කරනවා. මේ ප්‍රක්ෂේපණය කරපු -මේ හිතපු- සංඛ්‍යා ලේඛන අපට ලැබෙයි කියලා හිතාගන්න අමාරුයි. අන්තිමට වෙන්නේ ඒ සල්ලි ඔක්කෝම යන්නම් එදිනෙදා නඩත්තු කටයුතුවලට විතරයි යොදා ගන්න වෙන්නේ. මම තමුන්නාන්සේලාට විතරක් වැරැද්දක් කියන්නේ නැහැ. මේක අපේ ආර්ථිකයේ තිබෙන නිධන්ගත ප්‍රශ්නයක්. අපි සල්ලි ඔක්කෝම එකතු කළත්, අන්තිමට එදිනෙදා නඩත්තු කරන්න විතරයි ඒ සල්ලිවල වටිනාකම තිබෙන්නේ.

ඒ පැත්ත, මේ පැත්ත කියලා හිතන්නේ නැතුව, අපි ඔක්කෝම එකතු වෙලා මේ සඳහා යම් කිසි විසඳුමකට යන්න ඕනෑ. මේ පැත්තෙන් ඇවිල්ලා ඔය පැත්තේ ඉඳගත්තත් ඔය ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. නමුත් එකක් මම කියන්න ඕනෑ. රටේ අස්ථාවරභාවයක් තිබෙනවා නම්, මතභේද තිබෙනවා නම් ආයෝජන හම්බ වෙන්නේත් නැහැ; ඒ වාගේම ණය ගන්නත් අමාරුයි. අපි ඇත්ත කථාව බලමු. අද බලන්න, චීන ණය. දැන් ඔක්කෝමලා කියනවා, "චීන උගුලට හිරවෙලා. චීන ණය" කියලා. ඇත්ත වශයෙන්ම අපි වැඩියෙන්ම ණය වෙලා තිබෙන්නේ, ජපානයට; චීනයට නොවෙයි. එහෙම වුණත්, දැන් අලුත් ණය දෙන්නේ නැහැ නේද? It is very slow. අලුත් ව්‍යාපෘතිවලට චීනය පවා ණය දෙන්නේ නැහැ. මමත් මුදල් ඇමති වෙලා හිටියා. දීර්ඝ කාලයක් මුදල් අමාත්‍යාංශයේ හිටියා. පසු ගිය කාලයේ අපට මාස දෙකෙන්, තුනෙන් ඒ ණය ගන්න පුළුවන් වුණා.

හැම දාම ඒ ගොල්ලන්ට බණිනවා නම්, හැම දාම ඒ ගොල්ලන් හොරු කියලා කියනවා නම්, දූෂණය කළා කියනවා නම් ඒ මිනිස්සු ඒ ආණ්ඩුවටම ණය දෙයිද? දෙන්නේ නැහැ. ජාත්‍යන්තර මුදල් පරිහරණය කියන එක නිකම් ආචාට ගියාට ප්‍රාදේශීය සභාවක මුදල් පරිහරණය කරනවා වාගේ කරන්න බැහැ. ඒක එක්තරා ගැඹුරු දෙයක්. අද ලෝක ආර්ථිකය ඉතාම අමාරු තත්ත්වයකට ඇවිල්ලා තිබෙන්නේ. තමුන්නාන්සේලා කොච්චර විවේචනය කළත් අපි එකට ඉන්න කාලයේ ලංකාවේ ආර්ථික

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

වර්ධන වේගය කලාපයේ රටවල් අතරින් අංක එකට නැත්නම් දෙකට තිබුණා. අද අපට පල්ලෙහායින් ඉන්නේ ඇෆ්ගනිස්ථානය විතරයි. දකුණු ආසියාවේ තිබෙන රටවල් අතුරින් පහළම මට්ටමට ලංකාවේ ආර්ථිකය වැටිලා තිබෙනවා. මේකයි යථාර්ථය. මොකද, එකමුතුභාවයක් නැහැ.

විශේෂයෙන්ම දැන් අපි උදාහරණයක් ගෙන බලමු. විදුලිබල ඇමතිතුමා තීරණයක් අරගෙන එළියට එනකොට එතුමාගේ තීරණයත් එක්ක දැනුම් දෙන්නේ මොකක්ද? ආණ්ඩුවේම ප්‍රබල ඇමතිවරයෙක් කියනවා, "මෙය වැරැදි වැඩක්. මා මෙයට වෙනම කැබිනට් පත්‍රිකාවක් දැම්මා"යි කියලා. එතකොට ආයෝජකයෝ එයිද? දැන් තමුන්නාන්සේලාට අර්බුදයක් තිබෙනවා. විශේෂයෙන්ම LNG බලාගාරය ගැන තවම තීරණය කරලා නැහැ. කඩදාසි කුට්ටමෙන් කොයි බුරුවා එළියට අදියිද කියලා තවම තීරණය කරලා නැහැ. දැන් මේක අවුරුදු හතරක් තිස්සේ සිද්ධ වෙනවා. තමුන්නාන්සේලාට මේ රටේ එකම බලාගාරයක්වත් හදන්න බැරිවුණා. අපේ විදුලිය නිෂ්පාදනය වැඩි කරගන්න බැරි වුණා. මට කියන්න, තමුන්නාන්සේලා හදපු එක බලාගාරයක්. මට කියන්න, තමුන්නාන්සේලා හදපු විදුලිය නිෂ්පාදනය කරන එක ආයතනයක්. පෞද්ගලික අංශයෙන් හැදුවේත් නැහැ, රජයෙන් හැදුවේත් නැහැ. එතකොට මේවාට මුහුණ දෙන්නේ කොහොමද? දැන් නියහයක් එනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තව විනාඩි 5යි මා ගන්නේ. දැන් නියහයක් එනවා. ඒ නිසා කරුණාකරලා -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාගෙන් හෝ වෙලාව ගන්න පුළුවන්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තව විනාඩි 5ක් දෙන්නකෝ.

දැන් බලන්න, අපේ ආර්ථිකය සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේම සංඛ්‍යා ලේඛනවල තිබෙන පරස්පරතාව. 2017 වාර්තාවේ කියනවා, "අපේ ආර්ථිකය පහළට බැස්සේ කෘෂිකර්මය පහළට ගිය නිසා"යි කියලා. අපිත් එය පිළිගන්නවා. 2017දී නියහයක් තිබුණා. ඒ නිසා වී නිෂ්පාදනය පහළටම බැස්සා. ඒ කටින්ම දැන් කියනවා, "2018 නම් බොහොම හොඳයි. අපට වාර්තාගත අස්වැන්නක් ලැබුණා"යි කියලා. අපේ හිතවත් ඇමතිතුමාත් එහෙම කියා තිබෙනවා. එහෙම නම් අපේ ආර්ථික ක්‍රියාවලිය - performance එක - තව ඉහළට යන්න ඕනෑ නේ. 2017 අවුරුද්දේ අපේ ආර්ථිකය පහළට බහින්න හේතුව කෘෂිකර්මය පහළට බැස්ස එක නම්, මෙවර කෘෂිකර්මය ඉහළට නඟිනකොට අපේ ආර්ථික වර්ධන වේගයත් ඉහළට නඟින්න ඕනෑ නේ. එහෙම නැත්නම් මෙතැන සංඛ්‍යා ලේඛනවල ප්‍රශ්නයක් තිබෙනවා. එහෙමත් නැත්නම් ක්‍රියාශීලීභාවයේ ප්‍රශ්නයක් තිබෙනවා. මේ අවුරුද්දේ හොඳයි. අපි දන්නවා, මේ මහ කන්නයේ හොඳ අස්වැන්නක් ලැබෙනවාය කියලා. නමුත් ගොවියාට සාධාරණ මිලක් ගෙවලා ඒ අස්වැන්න හරිහැටි මිලදී ගෙන බෙදා හරින්න පුළුවන් තත්ත්වයක් තවම ඇතිවෙලා නැහැ නේ.

අපේ රට දැන් වට්ටක්කා ගෙඩියක්වත් විකුණා ගන්න බැරි රටක්. අද දඹුල්ලට ගිහින් බලන්න. තමුන්නාන්සේලාගේ රාජ්‍ය ඇමතිතුමා ඉන්නේත් දඹුල්ලේ. වට්ටක්කා ගොඩ ගහලා, වට්ටක්කා ටික විකුණා ගන්න බැහැ. ගොවියාගේ වැරැද්ද මොකක්ද? ඒ මිනිස්සු වවලා තිබෙනවා. ඒ මිනිස්සු කැකිරි වවලා තිබෙනවා; වට්ටක්කා වවලා තිබෙනවා; පිපිඤ්ඤා වවලා තිබෙනවා. අද වියළි කලාපයේ ඉතාම හොඳට එළවලු වවලා තිබෙනවා. නමුත් බෙදා හරින්නට විධියක් නැහැ. මේ වාගේ ප්‍රශ්න ඇද ඇද ඉන්නට බැහැ. කොමිටි පත් කරලා, අරවා මේවා කරලා හරියන්නේ නැහැ. තීන්දු ගන්න ඕනෑනේ.

මේ අය වැයෙන් මේ ආහාර මිලදී ගැනීම සහ බෙදා හැරීම පිළිබඳව මොනවාද කරලා තිබෙන්නේ? කිසි දෙයක් කරලා නැහැ. මේ විධියට, පරණ විධියට මේ කටයුතු කරන්නට බැහැ. ඒ පැත්තටත් බැහැ, මේ පැත්තටත් බැහැ. ආණ්ඩුව පැත්තට විතරක් නොවෙයි අපේ විපක්ෂය පැත්තටත් අපි ඒක කියන්නට ඕනෑ.

හැම අවුරුද්දේම අපේ පුනරාවර්තන වියදම් වැඩි කරනවා. රාජ්‍ය ආයතනවලට දිගට හරහට සේවකයන්ව බඳවා ගන්නවා. ඡන්ද දිනන්න කියලා හිතාගෙන තව තව ප්‍රදානයන් දෙනවා. ඉන් පසුව, වෙනත් රටවලින් ණය ගන්නට යනවා. ඒ රටවලින් ඒ ගණන්වලට ණය දෙන්නේ නැහැ; එතකොට පොලී අනුපාතය වැඩි වෙනවා. සමහරවිට ණය හම්බ වෙන්නේම නැහැ. මේ සියලු දේ නිසා රට අවුරුද්දෙන් අවුරුද්ද අර්බුදයට යනවා.

ලංකාවේ ඉන්න ඉතාම ප්‍රායෝගික, දක්ෂ අර්ථ ශාස්ත්‍රඥයෙකු වන ආචාර්ය ඩබ්ලිව්.ඒ. විජේවර්ධනගේ ලිපියක උපුටා ගැනීමක් මම සඳහන් කරන්නම්. එතුමා මේ ලිපිය අවසානයේ මොකක්ද කියන්නේ? ඔබතුමන්ලා මේක ලියා ගන්න.

"Thus offering free goodies is a poor way of helping the poor. But, it brings in the adverse consequence of misallocating resources from investment to unproductive consumption. Studies on growth dynamics in Sri Lanka have revealed that the main driver of economic growth in the country has been the accumulation of capital arising from high investments, supported by increases in productivity. A budget aiming at winning elections by offering free goodies to people will impede both capital formation and improvement in productivity."

Sir, I recommend that to my Friend, the Hon. Minister of Finance, while wishing him all the best! He has made a good contribution to this country for the last 30 years. I wish he would read Dr. W.A. Wijewardena's views and try to take this economy on a sensible path.

Thank you.

[පූ. භා. 10.16]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මුදල් ඇමතිතුමා දින කිහිපයකට පෙර ඉදිරිපත් කළ අය වැය ලේඛනය පිළිබඳව

මේ උත්තරීතර සභාව පක්ෂ විපක්ෂ අදහස්වලින් උණුසුම්ව පවතිද්දී, අද දවස ආරම්භයේදීම ආණ්ඩු පක්ෂය වෙනුවෙන් විවාදයට ප්‍රතිචාර දැක්වීමට මට අවස්ථාවක් ලැබීම ගැනත්, හිටපු මුදල් ඇමතිවරයෙක් වුණු අපේ ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමාගේ කථාවෙන් පසුව අදහස් ස්වල්පයක් ප්‍රකාශ කිරීමට ලැබීම ගැනත් මම අතිශයින් සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා ඉදිරිපත් කළ මේ අය වැය පුරාම මංගල කාරණා, සුබ කාරණා රැසක්ම ඇතුළත් කර තිබීම ගැන අපි එතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දක්ෂිණ ලංකාවෙන් බිහි වුණු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ මේ අය වැය මුළු මහත් ජන සමාජයම වෙලාගත් ඉතා තීක්ෂණ සහ සූක්ෂ්ම අය වැයක් කියලා මම භය නැතුව ප්‍රකාශ කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහරු කියනවා, එතුමා ඉදිරිපත් කළ මේ අය වැය ඡන්ද දිනන්න හදපු, ඡන්ද අය වැයක් කියලා. මම කියනවා, එක පැත්තකින් ඒක 'ඔව්' කියලා. රටත් දිනවන, ඡන්දත් දිනන, මුළු මහත් ජන සමාජයම ජයග්‍රහණය කරවන අය වැයක් තමයි මංගල සමරවීර ඇමතිතුමා මෙවර ඉදිරිපත් කර තිබෙන්නේ. ඉදිරි කාලයේදී ඒක තමුන්නාන්සේලා-අපි කාටත් දැකගන්න ලැබෙයි. එක්සත් ජාතික පෙරමුණේ අපි වචනවලට සීමා වුණේ නැති, ඒ වාගේම පම්පෝරිවලට සීමා නොවූ අය වැය ඉදිරිපත් කරන්න බොහෝ අවස්ථාවල වග බලාගෙන තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, සමහර උදවිය මේ යෝජනා 'සිහින' හැටියටම පෙන්වන්න හදනවා. නමුත්, අපේ ආණ්ඩුව එහෙම ආණ්ඩුවක් නොවෙයි. අපේ ආණ්ඩුව අවුරුදු 4කට ඉස්සෙල්ලා රාජ්‍ය සේවකයාගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කර පෙන්වූ ආණ්ඩුවක්. අවුරුදු 4කට පස්සේ දැන් ඒ ආණ්ඩුව විසින්ම නැවත වතාවක් රාජ්‍ය සේවකයාගේ වැටුප රුපියල් 2,500කින් වැඩි කරන්න යෝජනා කරලා තිබෙනවා. එතකොට ප්‍රායෝගිකව පඩි වැඩි කරලා පෙන්වපු ආණ්ඩුවක් තමයි මේ අය වැය මඟින් මේ යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ. දැන් මේවා අහනකොට සමහරු කියන්න පටන් අරගෙන තිබෙනවා, එදා රාජපක්ෂ පාලන සමයේදී පාලකයෝ සවලෙන් බෙදාගෙන පුංචි මිනිහාට කන් හැන්දෙන් බෙදුවා කියන කථාව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා මේක ජනතාවගේ සකල සර්වාංගයටම දැනෙන අය වැයක් බවට පත්වෙලා තිබෙනවා.

ඒ වාගේම, ජාතික ආර්ථික දේහයට වැලඳුණු රෝගවලට විශේෂඥ ප්‍රතිකාර ලබා දෙන්න සමත් වූ අය වැයක් හැටියටත් අපි මේ අය වැය දකිනවා. මේ ඔක්කෝම කරද්දී විරුද්ධ පක්ෂයට අපි යම් යම් දේවල් සිහි කැඳවීමටත් මේ විවාදය අවස්ථාවක් කර ගත යුතුව තිබෙනවා. බොහෝ දෙනෙකුට ඒ කාලය අමතක වෙලා වාගේ දැන් කථා කරනවා. අපි 2015දී භාර ගත්තේ මොන වාගේ රටක්ද කියන එකත් දැන් මතක් කර දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගිනි පොලී ණය උගුලකට මුළු රටම හිර කරලා, ඊනියා ආශ්චර්ය සංවර්ධනයේ මාෆියාවෙන් මුළු රටම හිර කරලා, හරියටම කියනවා නම්, බ්ලූමැන්ඩල් කුණු කන්ද වාගේ දුගඳ හමන, කඩා වැටෙන්න ඔන්න මෙන්න තිබුණු ආර්ථිකයක් සහිත රටක් තමයි අපි භාර ගත්තේ කියන එක අපට අමතක කරන්න බැහැ. එදා GSP plus සහනයත් අහිමි වූ රටක් තමයි අපි භාර ගත්තේ. අද මේ විවිධ චෝදනා පෙන්වා දෙන උදවියට ඒවා මතක නැහැ. ඇඟලුම් කර්මාන්තශාලා එකින් එක - එකින් එක වැහීගෙන යන කාලයක් එදා තිබුණේ. ඇඟලුම් කම්හල්වල සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට තට්ටු කරන්න හදන කොට, ඊට විරුද්ධව ඔවුන් පාරට බැස්සාම යකඩ පොලුවලින් පහර දීපු හැටි, රොෂෙන් චානකලා වාගේ අය වෙඩි උණ්ඩවලට ජීවිත පූජා කරපු හැටි අපට තවම මතකයි. ඉන්ධන සහනාධාර ඉල්ලා පාරට බැස්සාම වෙඩි තියලා ධීවරයන් ඝාතනය කරපු කාලයක් තමයි එදා තිබුණේ. බොන්න වතුර ඉල්ලා රතුපස්වල මිනිසුන් පාරට බැස්සාම විභාගය ලියන්න සිටි අහිංසක පාසල් දරුවන්ට පවා වෙඩි තැබුවා. ඒ විධියට ජීවිත දෙක තුනක් උදුරා ගත් ආණ්ඩුවක් තිබුණු කාලයකයි අපි මේ රට භාර ගත්තේ කියන එකත් මට මතක් කරන්න වනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, GSP plus සහනම පමණක් නොවෙයි, මත්ස්‍ය තහනම කියන තොණ්ඩුවත් අපේ රටට වැටිලායි තිබුණේ. අපි ඒවා ඉවත් කර ගත් නිසා අද ධීවරයන්ට, බෝට්ටු හිමියන්ට, ඒ වාගේ විවිධ පුද්ගලයන්ට විශාල ප්‍රතිලාභ අත්කර දෙන්නත් මේ කෙටි කාලය ඇතුළත අපේ රජය සමත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණා අතරේ මම තවත් සුවිශේෂ කාරණයක් මතක් කරන්න කැමැතියි. ඒ කාලයේ දේශපාලන වේදිකාවල අපට නිතර ඇසුණු කතන්දර තිබුණා. වේදිකාවක් - වේදිකාවක් ගණනේ ජාත්‍යන්තර විදුලිපුටුවක් ගැන කථා කළා. ඔන්න විදුලිපුටුවට ගෙන යන්න හදනවා; මෙන්න ගෙන යන්න හදනවා කියලා බිල්ලෝ මවා පෙන්වූවා. අපට මතකයි, විදුලිපුටුවට යන්න වෙනවා කියලා සමහර නායකයෝ පපුවට ගහගත්තා.

හැබැයි මා කියන්න කැමැතියි, අප ඒ අය සියලුදෙනාත්, අපේ රණ විරුවනුත් විදුලිපුටු කතන්දරය ඇතුළු සියල්ලෙන්ම බේරා ගත් බව. එපමණක් නොවෙයි. අද වන කොට "විදුලි පුටුව" කියන වචනය අපේ දේශපාලන ශබ්දකෝෂයෙන් මුළුමනින් ඉවත් කරන්න කටයුතු කර තිබෙනවාය කියන එකත් මා කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය යෝජනා මඟින් ගරු මුදල් අමාත්‍යතුමා රණ විරුවන් කෙරේ සුවිශේෂ අවධානයක් යොමු කර තිබීම ගැන එතුමාට අපේ විශේෂ ගෞරවය පුද කරන්න ඕනෑ. අපට මතකයි එදා රණ විරුවන්ට සලකපු හැටි. යුද්ධය අවසන් කරපු මහා රණ විරුවා කුදලගෙන ගිහින් සිරගත කරපු හැටි අපට මතකයි. නමුත්, අද කිඹුල් කඳුළු හෙළනවා. එදාත් රණ විරුවන් පෙන්න පෙන්නා තමන්ගේ දේශපාලන නොහැකියා ඔක්කෝම ඒ රණ විරුවන්ගෙන් වසා ගන්න උත්සාහ කළා. බලයට එන්න හැදුවේ රණ විරුවන් මාර්ගයෙන්. හැබැයි රණ විරුවන් සම්බන්ධයෙන් ඒ අයට නොපෙනුණු තැන් ගැන අපේ ගරු මුදල් අමාත්‍යතුමාත්, අපේ රජයත් බලා තිබීම ගැන අපි විශේෂයෙන් සන්තෝෂ වෙනවා. රණ විරුවන්ගේ ආත්ම ගෞරවය වෙනුවෙන් කටයුතු කර තිබෙන ආණ්ඩුවක්, මේක. ත්‍රිවිධ හමුදාවට, පොලීසියට තෘප්තිමත් වෙන්න පුළුවන් විධියට වැටුප් වැඩි කරපු, අවුරුදු ගණනක් විසඳන්න බැරි වූ ඔවුන්ගේ දීමනා පිළිබඳ ප්‍රශ්න ගැන බලපු අය වැයක් මෙවර ඉදිරිපත් කරන්න ලැබීම ගැන අපි විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා. මෙම අය වැයෙන් සෑම ක්ෂේත්‍රයක් දිහාම බලා තිබෙනවා. රණ විරුවන් පෙන්වමින් දේශපාලන වාසි ගන්න නොවෙයි, අපේ ආණ්ඩුව කටයුතු කළේ. රණ විරුවන්ගේ වැටුප, දීමනා, පොලීසියේ සේවකයන්ගේ වැටුප, දීමනා වැඩි කිරීම ගැන, සුබසාධනය වෙනුවෙන් අපේ ආණ්ඩුව කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාසල් දරුවන් දිහා ද මේ අය වැයෙන් බලා තිබෙනවා. "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ රුපියල් කෝටි ගණන් වැය කරලා හැම ප්‍රදේශයකම දෙමහල්, තෙමහල් ගොඩනැඟිලි හදන හැටි, අද විවිධ දේවල් පාසල්වලට ලැබෙන හැටි හැම සතියකම අපට දකින්න ලැබෙනවා. මා සතියකට මගේ මැතිවරණ බල ප්‍රදේශය තුළ පාසල් ගොඩනැඟිලි දෙකතුන විවෘත කරනවා. ඒවායේ ප්‍රතිඵල අපි දැන් දකිනවා. පාසල් දරුවාට "සුරක්ෂා" රක්ෂණ ක්‍රමය හඳුන්වා දුන් ආණ්ඩුවක්, මේක. පාසල් දරුවාට කිරි වීදුරුවක් ලබා දෙන්න අවධානය යොමු කරපු අය වැයක්, මේක. වසර 13 දක්වා පාසල් අධ්‍යාපනය අනිවාර්ය කරපු ආණ්ඩුවක්, අපේ ආණ්ඩුව. ඉස්සර වාගේ ගණිතය අසමත් නම් එතැනින් ඒ දරුවා හැළෙන්නේ නැහැ. ගණිතය බැරි දරුවාට වෙනත් විෂයයන්වලින් තවත් හැකියා තිබෙනවා නම් ඉහළටම යන්න පාර කපා දීපු ආණ්ඩුවක්, මේ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ආණ්ඩුව. ඒ වාගේම, මේ ආණ්ඩුව පාසල් දරුවන්ට ටැබ් පරිගණකයක් ලබා දීම ගැන දැඩි ලෙස අවධානය යොමු කළ ආණ්ඩුවක්ය කියන එක මා කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ රටේ හැම පළාතකම දක්ෂ දරුවන්ට මෙවර අය වැයෙන් හොඳ පාරක් කපලා තිබෙනවා. අපේ ගම්බද පළාත්වල සුවිශේෂ දක්ෂතා තිබෙන දරුවන් අද හොඳ ප්‍රතිඵල පෙන්වනවා. ශිෂ්‍යත්ව විභාගයේ ඉඳලා සාමාන්‍ය පෙළ, උසස් පෙළ හැම විභාගයකම ප්‍රතිඵල දෙස බැලුවාම ගමේ දරුවන්ගේ හැකියාව අද පෙනෙනවා. ඒ නිසා හැම පළාතකම සිටින දක්ෂ දරුවන්ට ලෝකයේ තිබෙන ඉහළම විශ්වවිද්‍යාලයකට වුණත් යන්නට පුළුවන් වන විධියට අතහිත දෙන අය වැයක් බවට මේ අය වැය මුදල් ඇමතිතුමා විසින් පරිවර්තනය කරලා තිබෙනවා.

"ගම්පෙරළිය" වැඩසටහන ගැනත් කථා කරන්නට ඕනෑ. මේ ඔක්කොම සිහින හැටියට දකින්න විපක්ෂය උත්සාහ කරනවා. ඒ අයට හිත හදා ගන්න, මේවා හීන හැටියටම දැක දැක ඉන්න පුළුවන්. නමුත් අද "ගම්පෙරළිය" වැඩසටහන යථාර්ථයක් කරන හැටි බලන්න. හැම බල ප්‍රදේශයකටම රුපියල් ලක්ෂ 2,000ක්, රුපියල් ලක්ෂ 3,000ක් දෙනවා. දැන් යෝජනා අනුමතයි; වැඩ පටන් ගන්නවා. පසුගිය කාලයේ නීති විරෝධී විධියට බලයට ආපු අය ඉස්සෙල්ලාම බැලුවේ "ගම්පෙරළිය" වැඩසටහන නතර කරන්නයි. අපි යළි බලයට ආවාට පසුව මෙතැනින් තමයි පටන් ගත්තේ. අද ගමේ පන්සලේ හාමුදුරුවරු කථා කරන හැටි බලන්න. සරත් අමුණුගම ඇමතිතුමනි, මහනුවරට ගියාම හාමුදුරුවරුන් කථා කරන්නේ මොනවාද? ගමේ පන්සලේ නායක හාමුදුරුවන්, දායක සභාවේ මහත්වරු අහනවා, මේ වාගේ පන්සල්වල දියුණුව වෙනුවෙන්, දේවස්ථාන වෙනුවෙන් වියදම් කරන්න රුපියල් ලක්ෂ 10 ගණනේ දෙන්න කටයුතු කළේ කොයි ආණ්ඩුවද කියලා. අද "ගම්පෙරළිය" වැඩසටහන යටතේ රුපියල් ලක්ෂ 10 ගණනේ පන්සල්වලට දෙන්න පුළුවන්.

මෙවර අය වැයෙන් මේ හැම අංශයක් ගැනම බලලා තිබෙනවා. පන්සල ගැන බැලුවා; පාර ගැන බැලුවා; දරුවන් ගැන බැලුවා. ඒ විතරක් නොවෙයි, වැඩිහිටියන් ගැනත් බලලා තිබෙනවා. දැන් අපේ ආණ්ඩුව අත්‍යවශ්‍ය බෙහෙත් වර්ග 48ක මිල අඩු කළා. දියවැඩියාවට බෙහෙත් ගන්න; blood pressureවලට බෙහෙත් ගන්න; කොලෙස්ටරොල්වලට බෙහෙත් ගන්න මනුෂ්‍යයාට ඒකෙන් විශාල සහනයක් අත් වුණා. බෙහෙත්වලට මාසයකට වියදම් කරපු මුදල භාගයට භාගයකින් අඩු වුණා. එතැනින් නවතින්නේ නැතිව, අපේ රටට සේවාවක් ඉටු කරපු විශ්‍රාමික වැඩිහිටියන් ගැන ඉතාම සානුකම්පිත විධියට බලලා, ඔවුන්ගේ විශ්‍රාම වැටුපේ තිබුණු විවිධ විෂමතාවන් ඉවත් කරන්නත් කටයුතු කරමින් මේ අය වැය ඉදිරිපත් කරන්න මුදල් ඇමතිතුමාට පුළුවන්කමක් ලැබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැම පැත්තෙන්ම ජනතාවට දැනෙන, රටට හොඳ අනාගතයක් උදා කරන, ඊළඟ මැතිවරණවලටත් බලපාන අය වැයක් මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරලා තිබෙනවාය කියලා අපට බය නැතිව කියන්න පුළුවන්.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. මේ අය වැය ගැන විවිධ උදවිය කියන කතන්දර අපි අහලා තිබෙනවා.

මේ සභාවේ දේශපාලන කෝණයෙන් බලා කරන කථාවලට වඩා, මේකේ හොඳම විචාරය ගැන අහන්නට ඕනෑ නම් මම හිතන විධියට මේ දවස්වල ඒකට හොඳම තැන තමයි ගමේ කඩපිළ. ගමේ කඩපිළේ මේ අය වැය ගැන ලස්සන, ලස්සන කථා කියනවා. මිනිස්සුන්ගේ අව්‍යාජ අදහස් කථා වෙන තැනක් තමයි ගමේ කඩපිළ. විශේෂයෙන්ම ගමේ කඩපිළට හැන්දෑවට, හැන්දෑවට එකතු වෙන අය මේ දවස්වල නිතරම කියන කථාව තමයි, "මංගල මහත්තයා ඉදිරිපත් කරලා තිබෙන්නේ අතිවිශේෂ අය වැයක්" කියන එක. ඔවුන් බොහොම සන්තෝෂයෙන් ඒ ගැන කථා කරනවා. ඒ විතරක් නොවෙයි. වැඩබිම්වල සේවය කරන අයත් එක්ක කථා කරනකොට ඔවුන් මොකක්ද කියන්නේ? ගත්කටටම බොහෝ දෙනෙක් කියන්නේ, "නිකම් එළකිරි වාගේ අය වැයක් තමයි මංගල මහත්තයා මේ පාර අපට දීලා තිබෙන්නේ" කියලායි. විවාහ වෙන්න සිටින තරුණ-තරුණියන් එක්ක කථා කළොත්; අලුත විවාහ වුණු තරුණ යුවලක් එක්ක කථා කළොත් ඒ අය කියන්නේ, "අපේ වාසනාවට මංගල ගෙනැත් තිබෙන 'මංගල කිංකිණි' අය වැයක් තමයි අපට ලැබී තිබෙන්නේ" කියලායි. ඒ අය බොහොම සන්තෝෂයෙන් ඒ ගැන කථා කරන හැටි අපට දකින්න පුළුවන්. ඊළඟට, තම දරුවන් මෙරට දමා, පවුල් ජීවිත අතහැරගෙන, පිට රට ගිහින් නොයෙකුත් දුක්ගැහැට විඳමින් තම පවුල නඟාසිටුවීම සඳහා ශ්‍රමය වැය කරන අපේ අහිංසක මිනිසුන් ලංකාවට කථා කරනකොට මේ අය වැය ගැන ගෙවල්වල අයට කියන්නේ මොකක්ද? "අපි ගැනත් හිතලා හදපු ටිප්ටොප් අය වැයක් තමයි මංගල මහත්තයා මේ පාර දීලා තිබෙන්නේ" කියලා ඔවුන් බලාපොරොත්තු ඇතිව කථා කරනවා. ඒ නිසා මේ අය වැය හැම පැත්තක් ගැනම හිතලා ඉදිරිපත් කරපු සාර්ථක අය වැයක් කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය ගැන කථා කරද්දී අපේ අමුණුගම මැතිතුමා දේශපාලන විචාරකයින්ගේ අදහස් සැලකිල්ලට භාජන කළා. විවිධ දේශපාලන අදහස් ප්‍රකාශ වෙනවා. නමුත් දේශපාලන විචාරකයෝ වැනි මහලොකු දේශපාලන දැනුමක් තිබෙන අය විතරක් නොවෙයි, ගමේ සාමාන්‍ය ඡන්ද රටාව පිළිබඳව, ආණ්ඩු පෙරළෙන විධිය, ඡන්ද පෙරළෙන විධිය, මධ්‍යස්ථ ඡන්ද හැරෙන විධිය ගැන හොඳ අවබෝධයක් තිබෙන ගමේ සාමාන්‍ය මිනිසුන් ඕනෑ තරම් ඉන්නවා. ඒ මිනිසුන්ගේ කියමන් හැම දාම සනාථ වෙලා තිබෙනවා. ඉදිරියේ දී සිද්ධ වෙන දෙයක් ගැන අවුරුදු ගණනකට කලින් කියන්න පුළුවන් දේශපාලන ඉවක් තිබෙන මිනිසුන් ගම්වල ඉන්නවා. අද දේශපාලනය පිළිබඳව අවබෝධයක් තිබෙන විචාරකයෝ විතරක් නොවෙයි, දේශපාලන අවබෝධය තිබෙන මිනිසුන් පවා කියන්න පටන් ගෙන තිබෙනවා, "මේ අය වැය රට පුරා ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තාම, ඒකාබද්ධයේ කුඩා කල්ලියට සුදු කොඩි එසවෙන, මුළු රටේම කොළ කොඩි ලෙළ දෙන අය වැයක් බවට මේක පත් වෙයි" කියලා. එය අද බොහෝ දෙනෙකුගේ මතය බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම වැඩි වේලාවක් ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මෑත කාලයේ අපට දකින්නට ලැබුණු ඉතාම සමබර, හැම ක්ෂේත්‍රයක් දිහාම බලා හදපු සාර්ථකම අය වැයක් තමයි ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන්නේ කියන එක එතුමාට ගෞරවයක් හැටියට මේ අවස්ථාවේ දී මා ප්‍රකාශ කරනවා. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයෙන් මුදල් ඇමතිවරු පත් වුණාම හැම දාමත් ඉතා සාර්ථක අය වැය වාර්තා ඉදිරිපත් කළ බව අපට මතකයි. ගරු මංගල සමරවීර මැතිතුමාත් දකුණු පළාත නියෝජනය කරන ඇමතිවරයෙක් විධියට ඒ ගණයට එකතුවෙමින් මුදල් ඇමතිවරයා හැටියට ඉතාම සාර්ථක අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව අපි එතුමාට සුබපතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ පළාත්වලට බලපාන කාරණා රාශියක් ගැන කථා කරන්න තිබුණත්, කාරක සභා අවස්ථාව ඒ සඳහා ප්‍රයෝජනයට ගන්නා බලාපොරොත්තුව ඇතිව, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. கௌரவ ஞானமுத்து ஸ்ரீநேசன் அவர்கள்!

[மு.ப. 10.32]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் வாசிப்புமீதான விவாதத்தில் எனது கருத்துக்களையும் முன்வைப்பதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்காக நன்றியைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். 73ஆவது வரவு செலவுத்திட்டம் என்று கூறப்படுகின்ற இந்த வரவு செலவுத்திட்டத்தில் மொத்தத் தேசிய வருமானமாக 2,464 பில்லியன் ரூபாயும் மொத்தச் செலவினமாக 3,149 பில்லியன் ரூபாயும் துண்டுவிழும் தொகையாக 685 பில்லியன் ரூபாயும் குறிப்பிடப்பட்டிருக்கின்றது. இந்தத் துண்டுவிழும் தொகையென்பது இந்த நாட்டில் எப்போது இல்லாமல் போகும் என்பதுதான் எங்களுடைய எதிர்பார்ப்பாக இருக்கின்றது. கடந்த ஆண்டில் மொத்தத் தேசிய வருமானத்தில் 5.3 வீதமாக இருந்த துண்டுவிழும் தொகையானது இந்த ஆண்டில் 4.5 வீதமாக அதாவது, 0.8 வீதத்தினால் குறைக்கப்பட்டிருக்கின்றது என்பது வரவேற்கத்தக்க விடயமாகும். நாட்டில் யுத்தம் நின்றுவிட்டது. யுத்த காண்டத்தில் குண்டுவிழும் தொகை பூச்சியமாகிவிட்டாலும், வரவு செலவுத்திட்டத்தில் துண்டுவிழும் தொகை ஏன் இன்னும் பூச்சியமாகவில்லை? அதாவது, நமது நாடு வரவுக்கு விஞ்சிய செலவினைச் செய்து கொண்டிருக்கின்றது என்ற விடயம் இங்கு சுட்டிக்காட்டப்படுகின்றது. கடுமையான யுத்தம் நடைபெற்ற காலத்தில் பல குண்டுகள் வீசப்பட்டன; யுத்தச் செலவினங்கள் அதிகரித்துக் காணப்பட்டன. அந்தநேரத்தில், துண்டுவிழும் தொகை எப்படி இருந்தது, போருக்காக - பாதுகாப்புக்காகச் செலவிடப்பட்ட செலவினங்கள் எப்படியிருந்தன என்பதைப் பற்றி நாங்கள் ஒப்பிட்டு நோக்க வேண்டியிருக்கின்றது. அந்த வகையில், 2009ஆம் ஆண்டில் செலவு செய்யப்பட்ட பாதுகாப்புக்கான செலவினம் 17,706 கோடி ரூபாயாகவும் 2008ஆம் ஆண்டில் பாதுகாப்புக்காக செலவு செய்யப்பட்ட செலவினம் 20,483 கோடி ரூபாயாகவும் அமைந்திருந்தன. அது யுத்தம் உக்கிரமாக நடைபெற்ற காலப் பகுதியாகும்.

தற்போது, 2019ஆம் ஆண்டில் இந்தப் பாதுகாப்புச் செலவினம் 39,307 கோடி ரூபாயாக அதிகரித்திருக்கின்றது. இதனைச் சற்று ஒப்பிட்டு பார்த்தால், 2009ஆம் ஆண்டைவிட 2019ஆம் ஆண்டுக்கான பாதுகாப்புச் செலவினம் 121 வீதத்தினால் அதிகரித்திருக்கின்றது. இந்தப் பாதுகாப்புக்கான செலவினம் யுத்த காலத்தில் குறைந்திருந்தும், யுத்தம் முடிந்து பத்து ஆண்டுகள் கடந்த பின்னர், இந்தச் செலவினம் 2009ஆம் ஆண்டுடன் ஒப்பிடுகின்றபோது தற்போது 121 வீதத்தினால் அதிகரித்திருப்பதை ஏற்றுக்கொள்ள முடியாது. யுத்தத்திற்கான வரவு செலவுத்திட்டத்தில் - அந்தக் காலகட்டத்தில் அதிக ஒதுக்கீடு செய்வதை நியாயப்படுத்த முடியும். ஆனால், தற்போது பாதுகாப்புச் செலவினம் 39,307 கோடி ரூபாயாக அதிகரித்திருக்கின்றவேளையில், வரவுசெலவுத்திட்டத்தில் துண்டுவிழும் தொகையினைக் குறைக்கக்கூடிய விதத்தில் என்ன செய்திருக்க வேண்டுமென்பதைப் பற்றிச் சிந்திக்க வேண்டும். துண்டுவிழும் தொகை 685 பில்லியன், அதாவது 68,500 கோடி ரூபாயாகும். பாதுகாப்புச் செலவினத்தைக் குறைத்திருந்தால் துண்டுவிழும் தொகையினை குறைத்திருக்க முடியும். இருந்தபோதிலும் இந்தத் துண்டுவிழும் தொகை சென்ற முறையைவிட 0.8 வீதத்தினால் குறைக்கப்பட்டிருப்பதை நான் பாராட்டுகின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்தில் அரச அலுவலர்களுக்கான சம்பள அதிகரிப்பு 2,500 ரூபாய்; ஓய்வூதியக்காரர்களுக்கான சம்பள அதிகரிப்பு 1,600 ரூபாய். இது அவர்களுக்கு ஓரளவுக்கு மகிழ்ச்சியை ஏற்படுத்தலாம். ஆனால், இந்தச் சம்பள அதிகரிப்பை விஞ்சியதாகப் பொருட்கள், சேவைகளின் விலை அதிகரிப்பு கூடிச் செல்லுமாக இருந்தால், அந்தச் சம்பள அதிகரிப்பு என்பது அர்த்தபுஷ்டியுடையதாக அமைவதற்கு வாய்ப்பில்லை. எனவே, நாங்கள் சம்ளத்தை அதிகரிக்கின்ற விடயத்தோடு பொருட்கள், சேவைகளின் விலை அதிகரிப்பையும் கட்டுப்படுத்துவதற்கு ஒரு முறையான பொறிமுறையைக் கையாளவேண்டிய தேவை இருக்கின்றது.

இன்னுமொரு விடயத்தையும் நாங்கள் பார்க்கவேண்டும். அதாவது, தலா வருமானம் பற்றிக் குறிப்பிடுகின்ற அதேவேளையில், தலா கடன் என்ற விடயமும் முக்கியமானதாக இருக்கின்றது. பத்திரிகையினூடாகக் கிடைத்த செய்தியின்படி, ஒரு குடிமகனுக்கு 6,64,684 ரூபாய் கடன் இருப்பதாகச் சொல்லப்படுகின்றது. இதில் திருத்தங்கள் இருந்தால் சொல்லாம்! இந்தக் கடன் தொகை கடந்த காலம் முதல் இருந்து வருவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. எனவே, அதாவது, இனிப் பிறக்கப்போகின்ற சந்ததிகளின் தலையிலும் கடன் சுமையைக் கட்டிவிடுகின்ற ஒரு நிலைமையே காணப்படுகின்றது. இந்தக் கடன் தொகையினை நாம் எவ்வாறு குறைப்பது? அதற்கு நாங்கள் என்ன செய்யப்போகின்றோம், கடனில்லாத எதிர்காலச் சந்ததிகளை உருவாக்குவதற்கு என்ன செய்யப்போகின்றோம் என்பது பற்றி நாம் விஞ்ஞானபூர்வமாக ஆராயவேண்டும். கடந்த ஆண்டுகளில் கிட்டத்தட்ட மூன்று இலட்சம் ரூபாயாக இருந்த தலா கடனானது, திடீரென அதிகரித்தமைக்கான காரணத்தை பற்றி நாங்கள் சிந்திக்க வேண்டியிருக்கின்றது.

அதேவேளை, இன்னுமொரு விடயம் இருக்கின்றது. அதாவது, வரவுக்கு விஞ்சிய செலவு இருக்கின்றபடியால்தான், துண்டுவிழும் தொகை என்பது தொடர்ந்து அதிகரித்துக்கொண்டே செல்கின்றது. நாங்கள் செலவை விஞ்சிய வருமானத்தை எப்போது அடையப் போகின்றோம்? நாடு சுதந்திரமடைந்து 73 ஆண்டுகள் கடந்திருக்கின்றது. நாங்கள் செலவை விஞ்சிய வரவினைப் பெறக்கூடிய ஆண்டு எந்த ஆண்டாக இருக்கும்? அதை எப்படி அடையப் போகின்றோம் என்ற விடயத்தில் நாங்கள் அக்கறை செலுத்தவேண்டி இருக்கின்றது.

ஏழு நீர்ப்பாசனத் திட்டங்களை உருவாக்குதல், புதிய துறைமுகங்களை உருவாக்குதல் மற்றும் விசேட தேவையுள்ளவர்களுக்கான கொடுப்பனவை அதிகரித்தல் போன்ற விடயங்களை நான் சாதகமான விடயங்களாகவே பார்க்கின்றேன். உண்மையில் இந்த விடயங்களை மேற்கொள்வது வரவேற்கத்தக்கது. நீர்ப்பாசனத் திட்டங்கள், துறைமுகங்கள் அபிவிருத்தி என்கின்ற விடயங்களை நடைமுறைப்படுத்தும்போது, யுத்தத்தால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள மக்களது வாழ்வாதாரத்தைக் கட்டியெழுப்புதல், அந்தப் பிரதேசத்தின் வருவாயை அதிகரித்தல் என்பவற்றுக்கும் முக்கியத்துவம் அளிக்கவேண்டிய தேவை இருக்கின்றது. அங்குள்ள பதுளை

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

வீதியை எடுத்துக்கொண்டால், அந்த வீதியை அண்டி கித்துள், உறுகாமம் போன்ற குளங்கள் காணப்படுகின்றன. ஆனால், அந்தக் குளங்களை அபிவிருத்தி செய்வதற்குரிய வேலைத்திட்டங்கள் இன்னும் ஆரம்பிக்கப்படவில்லை.

விசேட தேவையுடையவர்களுக்குரிய கொடுப்பனவு 3,000 ரூபாயிலிருந்து 5,000 ரூபாயாக உயர்த்தப்பட்டிருப்பதாகச் சொல்லப்படுகின்றது. இந்த விசேட தேவைக்குரியவர்கள், இயற்கையான விசேட தேவையுடையவர்கள், செயற்கையாக விசேட தேவைகளுக்கு உள்ளாக்கப்பட்டவர்கள், யுத்தத்தின்போது பாதிக்கப்பட்ட விசேட தேவைகளுக்குரியவர்கள் என்ற வகையில் காணப்படுகின்றார்கள். இந்த விசேட தேவைக்குரியவர்களைப் பராமரிக்கவேண்டிய தேவை இருக்கின்றது. நிறையுடலிகளாகப் பிறந்த எமது மக்கள், கடந்த 30 வருட கால யுத்தத்தில் கால் கைகளை இழந்து, கண்களை இழந்து, உடல் அங்கங்களை இழந்து காணப்படுகின்றார்கள். எனவே, இந்த மீள்குடியேற்றம், புனர்வாழ்வு போன்ற விடயங்களுக்கு அதிகமான நிதியினை ஒதுக்கினால், இப்படியான பாதிக்கப்பட்டவர்களுக்கு ஒரு மீள்வாழ்க்கையை - புனர்வாழ்வை அளிக்கக்கூடியதாக இருக்கும்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் இருக்கின்றன.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
உங்களுடைய நேரத்தையும் எனக்குத் தந்தால் உதவியாக இருக்கும்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் தரலாம்.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
இந்த இடத்தில் புனர்வாழ்வு அளித்தல், மீள்குடியேற்றம், சமூக அபிவிருத்தியை ஏற்படுத்துவதற்கான தேவைகள் என்பன வலியுறுத்தப்படுகின்றன. அதாவது, சுகாதாரம், கல்வி, வீடமைப்பு மற்றும் அவர்களுடைய வாழ்வாதாரத்தைக் கட்டியெழுப்புவதற்கான தொழில்வாய்ப்புகள் போன்றவற்றை வழங்குவதற்குக் கூடுதலான முக்கியத்துவத்தினை அளிக்கவேண்டிய தேவை இருக்கின்றது.

சிறுநீரக நோயாளர்களுக்குரிய சிகிச்சைகளை அளிப்பதற்கான வசதிகள் ஏற்படுத்தப்பட்டிருப்பதாகச் சொல்லப்பட்டிருக்கின்றது. சிறுநீரக நோயாளர்களின் எண்ணிக்கையைக் குறைப்பதற்கு என்ன செய்யலாம் என்பதைப் பற்றிச் சிந்திக்க வேண்டும். சுத்தமான குடிநீரை எல்லா இடங்களுக்கும் வழங்குகின்றபோது அநேகமாக சிறுநீரக நோய்கள் உருவாகாமல் தடுக்க முடியும். சிறுநீரக நோய்கள் உருவாவதற்குச் சுத்தமான குடிநீர் இல்லாமை ஒரு காரணமாக அமைகின்றது. ஆகவே, நீர்வழங்கல் அமைச்சு கூடுமானவரைக்கும் சுத்தமான குடிநீரை வழங்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டிய அவசியம் உணரப்படுகின்றது.

கிராமிய வீதிகள், உட்கட்டமைப்பு வசதிகளை ஏற்படுத்துகின்ற விடயத்தில் கூடியளவு செலவு செய்ய வேண்டிய தேவையிருக்கின்றது. இன்று போக்குவரத்துப் பாதிப்பினால் பல்வேறுபட்ட விளைவுகள் ஏற்பட்டுக்கொண்டிருக்கின்றன.

இலஞ்சம், ஊழல் ஒழிப்பை முக்கியமான ஒரு விடயமாக நான் பார்க்கின்றேன். எமது நாட்டில் அபிவிருத்திக்காகச் செலவு செய்ய வேண்டிய பணம் அதிகமாக இலஞ்சம், ஊழல்கள் மூலமாகவும் அல்லது தரகுப் பணம் மூலமாகவும் ஒரு வகையில் அபகரிக்கப்படுகின்றன. எனவே, இலஞ்சம், ஊழல்களை முற்றிலும் ஒழிக்கக்கூடிய விதத்தில் இந்த அரசாங்கம் செயற்படுமாகவிருந்தால் நிச்சயமாக அதனை நாங்கள் வரவேற்போம்.

நிலையான அபிவிருத்தி என்பது மிக முக்கியமான ஒரு விடயமாகும். வடக்கு, கிழக்குப் பிரதேசங்களில் நிலையான அபிவிருத்தியை ஏற்படுத்துவதற்கான தொழிற்சாலைகளை அமைக்க வேண்டும். கடந்த வரவு செலவுத் திட்டங்களின்போது இந்தத் தொழிற்சாலைகளை அமைப்பதாக உத்தரவாதமளிக்கப்பட்டது. குறிப்பாக கிழக்கு, வடக்கு மாகாணங்களில் இயங்கி வந்த இந்தத் தொழிற்சாலைகள் மீள இயக்கப்பட வேண்டும். 2016ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தில் இந்தத் தொழிற்சாலைகளை அமைப்பதற்கும் அதேபோன்று பாலங்களை அமைப்பதற்குமான உத்தரவாதங்கள் அளிக்கப்பட்டன. ஆனால், இந்த வரவு செலவுத் திட்டத்தில் அவற்றைப் பற்றித் தெளிவான நிலைப்பாடுகள் இல்லாமல் இருக்கின்றன. இந்தச் சந்தர்ப்பத்திலே நான் நிச்சயமாக ஒரு விடயத்தைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அதாவது, நிலையான அபிவிருத்தி இல்லாதவரைக்கும் எமது மக்கள் கடனாளிகளாக இருக்கின்றவரைக்கும் நிச்சயமாக எமது இறையாண்மையைப் பாதுகாத்துக்கொள்ள முடியாது. நவ காலனித்துவத்தின் கைதிகளாகத்தான் வாழவேண்டிய ஒரு நிலைமை ஏற்படும். ஆகவே, இறையாண்மையைப் பாதுகாப்பதாக இருந்தால், நிச்சயமாக நிலையான அபிவிருத்தி வேண்டும். நிலையான அபிவிருத்திக்கு நிலையான அரசியல்தீர்வு அவசியம். நிலையான அரசியல் தீர்வு இல்லாமல் நிலையான அபிவிருத்தியை அடையமுடியாது. எனவே, இந்த வரவு செலவுத் திட்டத்தின்மூலமாக நிலையான அபிவிருத்தியை ஏற்படுத்தக்கூடிய தொழில்முயற்சிகளையும் மற்றும் தொழிற்சாலைகளையும் ஏற்படுத்துவதோடு, அபிவிருத்தியில் புறக்கணிக்கப்பட்டிருக்கின்ற, வளப் பகிர்வில் வஞ்சிக்கப்பட்டிருக்கின்ற பிரதேசங்களுக்கு வளப் பகிர்வுகளை அளிக்க வேண்டும்.

இறுதியாக ஒரு விடயத்தைத் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன். கல்முனை வடக்குப் பிரதேசச் செயலாளர் பிரிவை அமைப்பது பற்றி மிக நீண்ட காலமாக, அதாவது 1988ஆம் ஆண்டு காலத்திலிருந்து கூறப்பட்டு வருகின்றது. அந்த விடயத்தில் தமிழ் மக்கள் மிகவும் ஆர்வமாக இருக்கிறார்கள். நிச்சயமாக இந்த வரவு செலவுத்திட்டத்திற்கு முன்பாக கல்முனை வடக்குப் பிரதேசச் செயலகத்தை அமைப்பதற்குரிய வழிவகைகளைப் பிரதம மந்திரி உத்தரவாதமளித்ததுபோன்று இந்த அரசாங்கம் செய்துகொடுக்க வேண்டும். பாதிக்கப்பட்ட ஓர் இனத்திற்கு அந்த நிர்வாக அலகு கிடைக்கின்ற விடயத்தில் எந்தப்

பிரிவினரும் ஆட்சேபனை தெரிவிக்கவோ எதிர்க்கவோகூடாது என்பதையும் கூறி, எனது உரையினை நிறைவு செய்கின்றேன். நன்றி.

[පූ.භා. 10.45]

**ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries and Social Empowerment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මංගල සමරවීර ඇමතිතුමා 2019 වසර සඳහා ඉදිරිපත් කළ එක්සත් ජාතික පක්ෂ රජයේ මංගල අය වැය පිළිබඳව කථා කරන්න මට අවස්ථාවක් ලැබීම ගැන පළමුවෙන්ම සතුටු වෙනවා.

දැනට ටික වෙලාවකට කලින් කථා කළ, මුදල් අමාත්‍යාංශය භාරව සිටි ඇමතිවරයකු වන අපේ ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා හොඳ කථා ටිකක් කිව්වා. අය වැයක් සකස් කරනකොට කොයි තරම් අමාරු කාර්යයක්ද කරන්න තිබෙන්නේ කියා එතුමා දන්නවා. විශේෂයෙන්ම ආදායම, බලාපොරොත්තු වුණු ප්‍රමාණයට වඩා රුපියල් බිලියන 250ක් අඩුවෙනුයි හම්බ වෙලා තිබෙන්නේ කියා එතුමා කිව්වා. ඔව්, ඒක ඇත්ත. මොකක්ද වුණේ? ඇත්ත වශයෙන්ම කියනවා නම්, අපි වැඩ කටයුතු ටික ඉතාම ශීඝ්‍රයෙන් කරගෙන යනකොට මහින්ද රාජපක්ෂ මැතිතුමා කල්පනා කළා, "මේ විධියට ගියොත්, මගේ ජීවිත කාලයේ ආයේ කවදාකවත් මට ආණ්ඩුවක් ගන්න ලැබෙන්නේ නැහැ" කියා. ඒ නිසා අපට කකුල් මාට්ටුවක් දමලා අපිව වට්ටන්න එතුමා කල්පනා කළා. එතුමා ජනාධිපතිතුමාව රවටලා එතුමාට කිව්වා, "මට පාර්ලිමේන්තුවේ බහුතරයක් තිබෙනවා" කියා. එහෙම කියලා අන්තිමට බලෙන් අගමැති පුටුවේ වාඩි වෙලා දවස් 52ක් තිස්සේ මේ රට අකර්මණ්‍ය කළා. ඒකෙන් වුණු හානිය තමයි, රට අවුරුද්දක් ආපස්සට ගිය එක. අපි කරගෙන යන වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම නවත්වන්න එතුමා කටයුතු කළා. අවසානයේ එතුමා උසාවියකින් බලයෙන් පහ කළ අගමැතිවරයකු විධියට ලෝක ඉතිහාසයට එක් වුණා. අපට කොයි තරම් කකුල් මාට්ටු දැම්මත්- [බාධා කිරීමක්] ගරු ගාමිණී ලොකුගේ හිටපු ඇමතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ හිටපු ඇමතිවරයකු හැටියට, ඒ වාගේම හොඳ ව්‍යාපාරිකයකු හැටියට ඔබතුමා දන්නවා, මොකක්ද වුණේ කියන එක. ඔබතුමා වැරදි පැත්තේයි වාඩි වෙලා ඉන්නේ. හරි විධියට නම් ඔබතුමා ඉන්න ඕනෑ ආණ්ඩුව පැත්තේයි.

ඔබතුමා මේ පැත්තේ හිටියා නම්, අනිවාර්යයෙන්ම අපේ රට වෙනුවෙන් මීට වඩා ලොකු සේවයක් ඔබතුමාට කරන්න තිබුණා. ඒ ගැන මම කනගාටු වනවා. මොකද, මගේ මිත්‍රයා වැරදි වෙලාවක වැරදි තීරණයක් ගත්තේ. අද ඔබතුමා මෙතැන හිටියා නම්, රට වෙනුවෙන් විශාල සේවයක් කරන්න තිබුණා. ගාමිණී ලොකුගේ හිටපු ඇමතිතුමනි, තවමත් ඔබතුමා පරක්කු නැහැ. ඔබතුමාට මේ පැත්තට එන්න පුළුවන්. අපි ඔබතුමාව පිළිගන්න ලෑස්තියි. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය කාලයේ අපි මොනවාද කළේ කියා සමහරු අහනවා. එදා යුරෝපයට මත්ස්‍ය අපනයනය තහනම් වෙලා තිබුණා. GSP Plus සහනය අපට අහිමි වෙලා තිබුණා. අපේ රට පිළිනොගන්නා තත්ත්වයක් තිබුණා. අපි මත්ස්‍ය තහනම ඉවත් කර ගත්තා. සියයට 25ක කාන්තා නියෝජනය ලබා දුන්නා. සුදු වෑන් සංස්කෘතිය අපි සම්පූර්ණයෙන්ම නැති කළා. මත් ද්‍රව්‍ය වැටලීම් අපි පුළුවන් තරම් කඩිනම් කළා. පාතාලේ නායකයින්ව අපි මර්දනය කළා. මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005දී මේ රට භාර ගන්නකොට අපේ අපනයන ආදායම සියයට 38ක තිබුණේ. නමුත්, අපේ අපනයන ආදායම සියයට 12 දක්වා වැට්ටුවා. ඩොලර්වලින් ණය අරගෙන, ඩොලරයේ රුපියලේ අගය 110ට තියාගෙන, අපනයන කර්මාන්තය සම්පූර්ණයෙන්ම නැති කර දැම්මා. ගරු ගාමිණී ලොකුගේ හිටපු ඇමතිතුමනි, ඔබතුමා ව්‍යාපාර පටන් ගත්තේ ඇඟලුම් කර්මාන්තයෙන්.

ඔබතුමා ඒ ගැන දන්නවා. හිටපු ජනාධිපති ආර්.ප්‍රේමදාස මැතිතුමා ඇඟලුම් කර්මාන්ත වැඩ පිළිවෙළ පටන් ගන්නකොට එදා ඔබතුමා තමයි එතුමාගේ පැත්තේ හිටියේ. එතකොට ඔය විරුද්ධ පක්ෂයේ හිටපු උදවිය මොකක්ද කිව්වේ? ඒ උදවිය කිව්වා, "සුද්දියන්ට ජංගි මහනවා." කියා. අද අපට සතුටින් කියන්න පුළුවන් ඇඟලුම් කර්මාන්තය තුළින් සියයට 54ක අපේ අපනයන ආදායම වැඩි කළා විතරක් නොව අදත් අපේ රටේ අපනයන ආදායමෙන් සියයට 43ක් ගෙනෙන්නේ ඇඟලුම් කර්මාන්තය තුළින් බව. ඒ වාගේම අපට කියන්නට පුළුවන්, ලෝකයේ හොඳම ජංගිය නිෂ්පාදනය කරන්නේ ලංකාවේ කියා. මුළු ලෝකයේ කෝටිපති කාන්තාවෝ ඔක්කෝම අඳින්නේ ලංකාවේ නිෂ්පාදනය කරන ජංගි කියන එකත් අපට කියන්න පුළුවන්. ඒ ඇඟළුම් ක්ෂේත්‍රයේ අහිංසක කාන්තාවන්ගේ රැකියාවේ අභිමානය නැති කරන්න එදා ඔය විරුද්ධ පක්ෂයේ හිටපු උදවිය කෑ ගැහුවා. නමුත් යුද්ධයට ආයුධ ගන්න මුදල් ටික හොයලා දුන්නේ ඒ ගම්වල සිටින අහිංසක තරුණියෝ කියන එකත් විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අපි ගෙනාවා. අද ඕනෑ කෙනෙකුට "සුව සැරිය" ගිලන් රථ සේවය පාවිච්චි කරන්න පුළුවන්. එක පාරටම හෘදය වස්තුවේ මොකක් හෝ ප්‍රශ්නයක් ආවොත් මෙම ගිලන් රථයක් ගෙන්වා ගන්නට පුළුවන්. මේ ගිලන් රථ සේවයටත් බැන්නා. නමුත් එහෙම බැණපු උදවියම ඒ "සුව සැරිය" ගිලන් රථ සේවය පාවිච්චි කරනවා. ඖෂධ වර්ග 48ක මිල අඩු කළා. හෘදය රෝගීන්ට නොමිලේ stents ලබා දුන්නා. නිවාස වැඩ පිළිවෙළ ගනිමු. අපි ගම්පෙරළිය වැඩසටහන කරගෙන යනකොට මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇවිල්ලා ඒ වැඩසටහන සම්පූර්ණයෙන්ම නවත්වලා දැම්මා. අපේ වැඩ කටයුත්ත සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය කළා. අද අපි බලනවා, "Enterprise Sri Lanka" Programme එක තුළින් දේශීය ව්‍යවසායකයන් දියුණු කරන්නේ කොහොමද කියා. අපට බණිනවා, පෞද්ගලීකරණය කරනවා කියා. නමුත් අපි මොනවාවත් කාටවත් විකුණලා නැහැ. එදා රාජපක්ෂ ආණ්ඩුව තමයි ගෝල්ෆේස් එක ඉස්සරහා ඉඩම -හමුදා මූලස්ථානයට අයිති ඉඩම- ෂැන්ග්‍රි-ලා හෝටලයට විකුණුවේ. ෂැන්ග්‍රි-ලා හෝටලයට සින්නක්කරව දුන්නා. අපට ඒක බේරා ගන්නට පුළුවන්කමක් නැහැ. නමුත් Port City එක සින්නක්කරව දුන්නා. අපි ඒක නැවැත්තුවා. නවත්වලා අපි ඒක බද්දකට යටත් කර ගත්තා.

අක්කර 500ක් දුන්නා. අක්කර 500ක් කියන්නේ පොඩි ගණනක් නොවෙයි. කොළඹ-කොටුව හා සමානයි. කොළඹ-කොටුවයි Port City එකයි දෙකම එක හා සමානයි. චීන ආයෝජකයන් මෙහි හදන්නේ තට්ටු තුනේ හතරේ ගොඩනැඟිලි නොවෙයි. මෙහි තට්ටු 40, 50 ගොඩනැඟිලි හදනකොට එම අක්කර 500 අක්කර 5,000ක් හැටියට ප්‍රසාරණය වෙනවා. එතකොට අපි අපේ රටේ ව්‍යාපාරිකයන් ශක්තිමත් කළේ නැත්නම්, අපේ ව්‍යවසායකයන්ව ශක්තිමත් කර ඒ චීන ව්‍යාපාරිකයන් සමඟ එහෙම නැත්නම් අනෙක් රටවලින් එන ව්‍යාපාරිකයන් සමඟ තරග කරන්න පුළුවන් තත්ත්වයකට පත් කරන්න බැරි වුණොත්, අපි අපේ රට සම්පූර්ණයෙන්ම දීලා ඉවරයි. මේවා ඔක්කොම අපට නවත්වන්න සිද්ධ වුණා. දැන් අපට කරන්නට පුළුවන් දේ තමයි අපේ රටේ සිටින ව්‍යවසායකයන් දිරිමත් කිරීම. ඒ අනුව, එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය අපි ඉදිරිපත් කර අද අපේ ව්‍යවසායකයන් ශක්තිමත් කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා. රාජගිරියේ ගුවන් පාලම, මොරගහකන්ද ජලාශය, කළුගඟ

[ගරු දයා ගමගේ මහතා]

ව්‍යාපෘතිය සහ පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන යටතේ ව්‍යාපෘති 180ක් ස්ථාපිත කළා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා කිව්වා, "එතුමාට මහවැලි අමාත්‍යාංශය භාර දුන්නත් මුදල් දුන්නේ නැහැ." කියා. කවුරුත් දන්නවා, මහවැලිය අවුරුදු 30කින් මෙහා කරන්න බැහැයි කියා කිව්වා. නමුත් එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා බලයට පත් වෙලා ගාමිණී දිසානායක තරුණ ඇමතිවරයාට කථා කර කිව්වා, "මට අවුරුදු තිහක් බලාගෙන ඉන්න පුළුවන් කමක් නැහැ ගාමිණී. මට මේක අවුරුදු 5කින් ඉවර කර දෙන්න." කියා. එතුමා මහවැලිය පස්ගොඩකින් හරස් කර මහවැලියේ වතුරෙන් විදුලිබලය නිෂ්පාදනය කළා. එතකොට කොළඹ අවට තිබුණු ගම්වලටත් විදුලිය තිබුණේ නැහැ. හුඟක් උදවිය කුප්පි ලාම්පුවෙන් තමයි ඉගෙන ගත්තේ, පොත පත කියෙව්වේ. ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් කර, එයින් නිෂ්පාදනය කරන විදුලිබලය රට පුරා බෙදා හැරියා. අදත් හැම කෙනෙකුගේම ගෙවල්වල "බල්බ්ස්" 5ක් පත්තු වෙනවා නම්, එයින් 3ක් පත්තු වෙන්නේ මහවැලියේ වතුරෙන් නිෂ්පාදනය කරන විදුලිබලයෙන් කියා එක්සත් ජාතික පාක්ෂිකයෙක් හැටියට අපට බොහොම ආඩම්බරයෙන් කියන්න පුළුවන්. එදා ඒ වතුර ටික දෙහිඅත්තකණ්ඩියට ගෙන ගියා. B කලාපය, C කලාපය ඇති කළා. එදා ඩී.එස්. සේනානායක අගමැතිවරයා ගල් ඔය ව්‍යාපෘතිය ආරම්භ කළා. ඒ ව්‍යාපෘතිය පටන්ගන්නකොටත් විරුද්ධ පක්ෂයේ උදවිය කිව්වේ, "යන්න එපා ගල්ඔයට. මෙන්න මෙපමණ විතර මදුරුවෝ සිටිනවා. මදුරුවෝ කාලා මැරෙයි." කියා. අපේ තාත්තලා ගෙන ගිහින් එහේ පදිංචි කර, ගල් ඔය ව්‍යාපෘතිය ඇති කළා වාගේම ඒ ගොවි බිම් සම්පූර්ණයෙන්ම සරු කළා. දෙහිඅත්තකණ්ඩිය, ඒ ඔක්කොම එකතු වුණාම දිගාමඩුල්ලෙන් සියයට 23ක් රටට බත සපයනවා කියා අද අපට සතුටින් කියන්න පුළුවන්, ආඩම්බරයෙන් කියන්න පුළුවන්.

ඒ දවස්වල ටෙලිවිෂන් එකේ සමහර වෙලාවට පෙන්නුවා, මහින්ද රාජපක්ෂ මැතිතුමා බොහොම ලස්සනට නියර දිගේ ඇවිදිනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා කුඹුර ළඟට ඇවිල්ලා බලාගෙන ඉන්නවා; කල්පනා කරනවා. ඒ විධියට ටෙලිවිෂන් එකේ පෙන්නුවේ, "අන්න මහින්දට නියර දිගේ යන්න පුළුවන්. රනිල්ට නියර දිගේ යන්න බැහැ" කියලා. නමුත්, පරාක්‍රමබාහු රජ්ජුරුවන්ට පසුව 2002දී රට සහලින් ස්වයංපෝෂිත කරන්න රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට පුළුවන් වුණා.

ඒ වාගේම, පසුගිය අවුරුදු තුන ඇතුළත ඇති වූ නියඟය නිසා අපට බිලියන 300ක විතර පාඩුවක් සිදු වුණු බව කියන්න ඕනෑ. එලෙස පාඩුවක් සිදු වුණත්, මෙවර විශාල අස්වැන්නක් ලැබෙනවා. මෙවර ලැබෙන අස්වැන්නෙන් අපි සහලින් රට ස්වයංපෝෂිත කරනවා. ඒ විතරක් නොවෙයි, මංගල සමරවීර මැතිතුමා ඉදිරිපත් කළ අය වැය තුළින් ලබා දී තිබෙන සහන ප්‍රයෝජනයට අරගෙන අපි සහල් නොවෙයි පිටරට අරින්නේ; සහල් පිටි කරලා, පිටිවලින් නිෂ්පාදනය කරන noodles සහ cereal වැනි දේ පිටරට යවන තත්ත්වයක් අපි ඇති කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවුරුදු පහළොවකට පසුව අපි බිංගිරිය කර්මාන්ත සංකීර්ණය ආරම්භ කළා. එදා කටුනායක, බියගම වැනි සියලුම කර්මාන්තපුර ඇති කළේ එක්සත් ජාතික පක්ෂ රජය යටතේයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා කර්මාන්ත අමාත්‍යවරයා හැටියට, එදා තරුණ ඇමතිවරයෙක් හැටියට ඒ ගෙන ගිය වැඩ පිළිවෙළ තුළින් රැකියා ඇති කරලා, තරුණයින් දස දහස් ගණනකට රැකියා කිරීමට පුරුදු-පුහුණු කරලා අපේ අපනයන ආදායම අපි වැඩි කළා. එහෙම කිරීමෙන් තමයි අපේ ආර්ථිකය වැඩි දියුණු කර, සියයට 38ක් දක්වා අපනයන ආදායමක් ලබා ගන්න අපට පුළුවන් වුණේ.

නමුත්, පසුගිය රජය කර්මාන්ත ඇති කළේ නැහැ. ඒ වන විට කරගෙන ගිය කර්මාන්ත එකින් එක වහලා, අන්තිමට අපේ කාන්තාවන් ටික පිටරට ඇරියා. ලේ කිරි කර දරුවන්ට පෙවීමට තිබෙන අවස්ථාව කාන්තාවට නැති කර, අපේ රටේ කාන්තාවන් පිටරට පටවා, ලේ ඩොලර් කර එවන තත්ත්වයකට පත් කළා. අද අපි ඒ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් කර තිබෙනවා. නැවත බිංගිරිය කර්මාන්තපුරය ඇති කිරීම විතරක් නොවෙයි අපි කරන්නේ; මගේ අමාත්‍යාංශය යටතේ අද අපි, කෘෂි අධි කලාප 23ක් රට පුරා ඇති කරන්නට සැලසුම් කරලා තිබෙනවා.

එයින් කලාප තුනක් ලබන මාසය වෙනකොට, ඇල්පිටියේ එක කෘෂි කලාපයකුත්, අම්පාරේ දිස්ත්‍රික්කයේ උහන තව කෘෂි කලාපයකුත්, මාතලේ ලග්ගල තව කෘෂි කලාපයකුත් වශයෙන් ඇති කරන්න සැලසුම් කර, දැනටම ඉඩම් සියල්ලම සකස් කර ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙනවාය කියන එක විශේෂයෙන් මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

මොනවා ද අපි කළේ කියා අහන ප්‍රශ්නයට මෙසේ පිළිතුරු දිය හැකියි. එහිදී රජයේ සේවකයන්ගේ වැටුප ගැන කියන්නට ඕනෑ. එදා ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා මැතිවරණයට ඉදිරිපත් වුණු වෙලාවේ එතුමා කිව්වා, රජයේ සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කරනවාය කියා. එතකොට මහින්ද මැතිතුමා කිව්වා, "අනේ! හාමුදුරුවනේ, මට නම් ඔය බොරු කියන්න පුළුවන්කමක් නැහැ. මොකද මේ ගොල්ලෝ මේ ආර්ථිකය ගැන කිසි දෙයක් දන්නේ නැහැ. එයා හිටියේ යුද පිටියේ. එයාට ඕක තේරෙන්නේ නැහැ. මම රුපියල් 2,500 ක් වැඩි කරන්නම්" කියා. අන්තිමට එතුමා බලයට පත් වෙලා ඇවිත් ඒ රුපියල් 2,500 වැඩි කළේත් නැහැ.

2015 වර්ෂයේදී රජයේ සේවයේ කාර්යාල කාර්ය සහායකයෙකුට වැටුප තිබුණේ රුපියල් 11,730යි. මේ වැටුප 2020 වෙනකොට රුපියල් 24,250යි; රුපියල් 12,520 වැඩි වෙලා තිබෙනවා. හෙදියකට වැටුප රුපියල් 15,620යි තිබුණේ. එය රුපියල් 32,525ක් වෙලා තිබෙනවා; රුපියල් 16,905පහකින් වැඩි වෙලා තිබෙනවා. පොලිස් කොස්තාපල්වරයෙකුට 14,280ක වැටුපක් තිබුණේ. මෙය අද රුපියල් 29,540ක් වෙලා තිබෙනවා: රුපියල් 15,260කින් වැඩි වෙලා තිබෙනවා. උපාධිධාරි ගුරුවරයෙකුට රුපියල් 16,100 තිබුණේ. අද මෙම වැටුප රුපියල් 33,300යි; එය රුපියල් 17,200කින් වැඩි වෙලා තිබෙනවා. අමාත්‍යාංශ ලේකම්වරයෙකුට වැටුප රුපියල් 47,515යි තිබුණේ. දැනට එය රුපියල් 98,650ක් වෙලා තිබෙනවා; ඒ අනුව රුපියල් 51,135කින් වැඩි වෙලා තිබෙනවා. සමස්තයක් වශයෙන් ගත්තොත් රජයේ සේවකයන්ගේ වැටුප රුපියල් සියයට 107කින් වැඩි කර තිබෙනවා. ඊට අමතරව මෙවර අයවැයෙන් තව රුපියල් බිලියන 40ක් වෙන් කර තිබෙනවා, රුපියල් 2,500ක දීමනාවකට. එදා රජයේ සේවයේ සිටියේ ලක්ෂ පහයි. අද එය ලක්ෂ 16ක් වෙලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා සියලුම රැකියා ඇති කර තිබෙන්නේ රජයේ කන්තෝරුවල. අපේ ජාතික ආර්ථිකයට ඔවුන්ගෙන් එකතු වෙන්නේ සියයට 6යි. ඔවුගේ කාර්යක්ෂමතාව වැඩි කර, ඔවුන්ගෙන් ජාතික ආර්ථිකයට ඒ වැඩි වන ප්‍රමාණය වැඩි කරන්න අපි කල්පනා කරනවා. ඒ එක්කම අපි පෞද්ගලික අංශයට අපට දෙන්නට පුළුවන් හැම සහනයක් ලබා දී රටේ ආදායම වැඩි කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කවුරු මොනවා කිව්වත්, 2015 වර්ෂයේ අපි ආණ්ඩුව භාර ගන්නකොට මේ වැට් බදු මේ හැම එකක්ම එකතු කර අපට ලැබෙන ආදායමෙන් ණය පොලී විතරයි අපි ගෙවන්නට පුළුවන්කම තිබුණේ. ඒ, අපි ගත් ණය නොවෙයි; මහින්ද රාජපක්ෂ මැතිතුමා ගත් ණය. ඒ ණයවලින් පොලිය විතරයි අපට ගෙවන්නට පුළුවන් වුණේ. අද වෙනකොට රජයේ ආදායම වැඩි කර ගෙන වාරිකයකුත්

ගෙවන්න පුළුවන් තරමට අපි ආදායම වැඩි කර ගෙන තිබෙනවා. නමුත් අපි මේ හැම දෙයක්ම ණයට මුදල් අරගෙන තමයි කරන්නට ඕනෑ. මේ ණය චක්‍රයෙන් එළියට එන්න නම් අපි විපක්ෂයේ ඉන්න මහින්ද රාජපක්ෂ මැතිතුමාට බැන්නාය කියා වැඩක් නැහැ; අපි අපේ රටේ නිෂ්පාදනයයි වැඩි කරන්නට ඕනෑ. නිෂ්පාදනය වැඩි කරන්නට අද වෙනකොට අපේ රටේ හැම කෙනෙකුටම මේ අය වැය තුළින් සම්පූර්ණ සහාය ලබා දී තිබෙනවා. ඒ ගැන කථා කරනවා නම්, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය හැටියට මගේ අමාත්‍යාංශයට විශාල වගකීමක් අද රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා භාර දී තිබෙනවා.

අපේ රටේ සමෘද්ධිලාභීන් ලක්ෂ 14ක් ඉන්නවා. මට මතකයි, මා තරුණයෙක් හැටියට ඉන්නකොටයි එදා ප්‍රේමදාස ජනාධිපතිතුමා ජනසවිය පටන් ගත්තේ. එතුමා මැතිවරණ පොරොන්දුවක් හැටියට කිව්වේ, "මම රුපියල් 2,000ක් දෙනවා. අවුරුදු දෙකක් ඇතුළත මම ඔය උදවිය සවිබල ගන්වනවා "කියලායි. නමුත් එතුමාට ඒක කරන්නට බැරි වුණා. එතුමා අපි වාගේ තරුණයන්ට කථා කර කිව්වා, "මට උදවු කරන්න. ආණ්ඩුවෙන් දෙන්න ආණ්ඩුවට මෙච්චර සල්ලි නැහැ" කියා. එහෙමයි එදා ඇඟලුම් කර්මාන්ත දෙසීයේ ව්‍යාපෘතිය පටන් ගත්තේ. මේ ආකාරයට අවුරුදු දෙකක් තුළ එතුමා ආර්ථිකය සවිබල ගැන්වුවත්, අද වෙනකොට සමෘද්ධිලාභීන් ලක්ෂ 14ක් ඉන්නවා. සියයට 83ක් ජනතාව අවුරුදු 15ක් තිස්සේ සමෘද්ධිය ලබා ගන්නවා. පසුගිය රජය ඔවුන්ව සවිබල ගැන්වීමට අපොහොසත් වී ති+බෙනවා. එතකොට මට තිබෙන ලොකුම වගකීම තමයි, මේ ලක්ෂ 14ට අමතරව තව ලක්ෂ අටහමාරක් සමෘද්ධි පොරොත්තු ලැයිස්තුවේ ඉන්න එක. අද ලක්ෂ හයකට සමෘද්ධි සහනාධාරය ලබා දීමට මුදල් වෙන් කර තිබෙනවා. මට මේ අමාත්‍යාංශය භාර දුන්නු ගමන් මේ අටලක්ෂ පනස්දහසට අදියර තුනකින් අනිවාර්යෙන්යෙන්ම 2019 අවුරුද්දේ සමෘද්ධි සහනාධාරය ලබා දෙනවා කියා මම පොරොන්දු වුණා. අද මම ඒ සඳහා සැලසුමක් සකස් කර තිබෙනවා. ඒ, අපනයන ගම්මාන 5,000ක් අපේ රට පුරා ඇති කිරීමට. විරුද්ධ පක්ෂයේ සිටින ඔබතුමන්ලා සියලුදෙනාගෙන් මම ඉල්ලීමක් කරනවා, මේක දේශපාලන ව්‍යාපෘතියක් කියලා හිතන්න එපා කියලා. මෙය රටේ අනාගතය වෙනුවෙන් අපි ඇති කරන ව්‍යාපෘතියක්. අපි ව්‍යාපෘතිය තුළින් බලාපොරොත්තු වෙන්නේ මේ හැම කෙනෙක්ම සවිබල ගන්වන්නයි. අවුරුදු තුනක් ඇතුළත ක්‍රියාත්මක වෙන ආකාරයට දැන් අපේ අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති 50,000ක් සැලසුම් කරලා තිබෙනවා. අඩුම වශයෙන් මේ අවුරුද්දේ ව්‍යාපෘති 20,000ක් ක්‍රියාත්මක කිරීමට මා බලාපොරොත්තු වෙනවා. අපට මේ සඳහා විශාල මුදලක් අවශ්‍ය කරනවා. සමෘද්ධිලාභීන්ට දෙන තුට්ටු දෙකෙන් මේක කරන්න පුළුවන්කමක් නැහැ. ඒ වෙනුවෙන් දැනට සාමෘද්ධි ගිණුම්වල ඉතිරි කරලා තිබෙන මුදල්වලින් අප්‍රේල් මාසය වෙනකොට රුපියල් 15,000ක් ලබා දෙනවා; දෙසැම්බර් මාසය වෙනකොට තව 15,000ක් ලබා දෙනවා. ඒ සඳහා රුපියල් බිලියන 60ක් ලබා දෙන්න අපි තීරණය කරලා තිබෙනවා. ඒ අනුව අපනයන ගම්මාන ව්‍යාපෘතියට මේ හැම කෙනෙකුගේම දායකත්වය ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව අපි අපේ රටේ ආදායම වැඩි කරනවා. අපේ රටේ ආදායම වැඩි කරන්න නම්, අපි ඉස්සෙල්ලාම අපේ රටේ නිෂ්පාදනය වැඩි කරන්නට ඕනෑ.

කුළුබඩු අංශය ගත්තොත්, ඉස්සර මේ රටට මිනිසුන්, සංචාරකයින්, වෙළඳුන් වැඩියෙන්ම ආවේ කුළුබඩු මිලදී ගන්නයි. නමුත් බ්‍රිතාන්‍යයන් අපේ රටට ආවාට පසුව මේ රටේ තේ වවන්න පටන් ගත්තා. තේවලට හොඳ ආදායමක් ලැබෙනකොට කොළඹ කුරුඳුවත්තේ තිබුණු කුරුඳු ගස් එකින් එක ගැලවිලා, ඒ ඉඩම් නාගරික වුණා විතරක් නොවෙයි, හැම පැත්තකම තිබුණු කුරුඳුගස් ගැලවලා තේ වවන්නට පටන් ගත්තා. 2022, 2023 වෙනකොට අපේ කුළුබඩු ආදායම තේවලින් ලැබෙන ආදායමට වඩා වැඩි කිරීමට මම බලාපොරොත්තු වෙනවා. අපේ කුළුබඩුවලට තිබුණු තැන නැවත ලබා ගැනීමට, කුළුබඩු තේවලට වඩා උසස් තැනකට පත් කිරීමට මම අනිවාර්යෙන්ම කටයුතු කරනවා. අපි මේ වන විට කුළුබඩුවල අගයදාමය වැඩි කිරීමට විශ්වවිද්‍යාල පහක් එක්ක වැඩසටහනක් ආරම්භ කර තිබෙනවා. අවුරුදු තුනක් විශාල පැවිල්ලකට මුහුණ දෙන්න වුණත්, අපේ කෘෂිකර්මය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණත් කුළුබඩු පැත්තෙන් අපට ලැබෙන ආදායම වැඩි කර ගැනීමට අපට හැකි වී තිබෙන බව මට සතුටින් කියන්න පුළුවන්. අපට එක දිගට සියයට 39ක වර්ධනයක් ඇති කර ගැනීමට හැකි වී තිබෙනවා.

ගම්මිරිස් ගැන බැලුවොත්, ගම්මිරිස්වලින් සියයට 60ක් අපි නිකම් ගෝනි කරලා ඉන්දියාවට යවනවා. අපේ කුරුඳුවලින් සියයට 52ක් මෙක්සිකෝවට යනවා. ඒ හැම එකකම අගයදාමය වැඩි කරලා අපි විදේශ රටවලට යවන්නට ඕනෑ. එතකොට තමයි අපේ රටේ අගය වැඩි වෙන්නේ.

අපි ඒ වෙනුවෙන් ලෝක බැංකු ව්‍යාපෘතියක් හරහා රුපියල් ලක්ෂ 10 සිට ලක්ෂ 1,500ක් දක්වා සහන ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මේ තුළ අපි අපේ කර්මාන්තකරුවන්ට විශාල වශයෙන් උදව් කරනවා. අපේ කුරුඳු යුරෝපයට යවන්න අපට පුළුවන්කමක් නැහැ. මොකද, ඒ standard එක අපට නැහැ. මේ කර්මාන්තශාලා ඒ standard එකට ගෙන ඒමට, ඒ කර්මාන්තශාලා තුළ අවශ්‍ය ප්‍රමිතිය ඇති කිරීමට මෙම ව්‍යාපෘතිය තුළින් මම අද ඒ කර්මාන්තකරුවන්ට උදවු කරගෙන යනවා. 2019 අවුරුද්ද අවසන් වීමට පෙර මෙවැනි ව්‍යාපෘති 2,000ක් ආරම්භ කිරීමට අපි සැලසුම් කරලා තිබෙනවා.

මෙවර අය වැයෙන් ආබාධිත පුද්ගලයින් 72,000කට ලබා දුන් රුපියල් 3,000 දීමනාව රුපියල් 5,000 දක්වා වැඩි කර තිබෙනවා. එතකොට ආබාධිත ජනතාව 72,000කට මේ දීමනාව ලබා දෙන්න පුළුවන්. පවුලක කවුරු හරි ආබාධිත පුද්ගලයෙක් ඉන්නවා නම්, එම තැනැත්තා රැක බලා ගැනීමට කවුරු හෝ කෙනෙක් වෙන් වෙන්න ඕනෑ. එතකොට ඒ වෙන් වෙන පුද්ගලයාට රැකියාවක් කරන්න පුළුවන්කමක් නැහැ. එතකොට ඒ පවුලේ ආදායම සම්පූර්ණයෙන්ම අඩු වෙනවා. ඒ කට්ටිය බලා ගන්නා රජයක් හැටියට අපි වගකීමකින් වැඩ කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් ගරු මංගල සමරවීර ඇමතිතුමා වෙන් කරලා තිබෙන මුදල ගැන මගේ ගෞරවනීය ස්තුතිය විශේෂයෙන්ම එතුමාට මම මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම, නිදන්ගත වකුගඩු රෝගීන් සඳහා රුපියල් 5,000ක මාසික දීමනාවක් මේ වන විටත් ලබා දෙනවා. තවත් රෝගීන් 5000ක් සඳහා එම මුදල ලබාදීම සඳහා මෙම අය වැයෙන් තවත් රුපියල් මිලියන 1,840ක් වෙන් කරලා තිබෙනවා. විශේෂ හැකියාවන් සහිත පුද්ගලයන්ට දැනට ගෙවන රුපියල් 3,000 දීමනාව රුපියල් 5,000 දක්වා වැඩි කරලා තිබෙනවා. මේ වෙනුවෙන් රුපියල් මිලියන 4,320ක් අපි මෙම අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කයේ වැසිකිළි නැති පවුල් 12,800ක් ඉන්නවා. මොනරාගල දිස්ත්‍රික්කයේ වැසිකිළි නැති පවුල් 25,000ක් ඉන්නවා. මංගල සමරවීර ඇමතිතුමාගේ කථාවේදී එතුමා කිව්වා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැසිකිළි නැති උදවිය ලක්ෂයක් ඉන්නවා කියලා. අපේ විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මැතිතුමා කිව්වා, "නැහැ, පවුල් 15,000යි ඉන්නේ." කියලා. ඒක ඇත්ත. පවුල් 15,000ක් ඉන්නකොට, ඒ පවුල්වල ඉන්න කට්ටියගේ ගණනින් වැඩි කළාම අනිවාර්යයෙන්ම ලක්ෂයකට කිට්ටු වෙන්න

[ගරු දයා ගමගේ මහතා]

ඉන්නවා. එතුමා ඒක පිළිගත්තා. අපට කනගාටු, එතුමාව මන්ත්‍රීවරයෙක් කරන්න ඡන්දය දීපු ඡන්දදායකයන්ට, එතුමාව ඇමතිවරයෙක් කරන්න ඡන්දය දීපු ඡන්ද දායකයන්ට, එතුමා අගමැති කරන්න ඡන්දය දීපු ඡන්දදායකයන්ට, ඊට පස්සේ එතුමා ජනාධිපති කරන්න උදව් කරපු හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඡන්ද දායකයන්ට වැසිකිළියක් හදලා දෙන්න එතුමාට බැරි වුණු එක ගැනයි. ඒ වුණාට, එතුමා ක්‍රිකට් නොගහන ක්‍රීඩා පිටි හැදුවා; සම්මන්ත්‍රණ පවත්වන්නේ නැති සම්මන්ත්‍රණ ශාලා හැදුවා; ගුවන් යානා එන්නේ නැති ගුවන් තොටුපොළවල් හැදුවා. හම්බන්තොට ජාත්‍යන්තර වරායක් හැදුවා. ඒකට නැව් 57යි ඇවිල්ලා තිබුණේ.

තමන්ගේ ගෙදර වැසිකිළියක් නැත්නම්, ඒ ගෙදර කාන්තාව ඒ කටයුත්ත කරන්න කැළයට යන්න ඕනෑ. ඒ කියන්නේ, ඒ ශාරීරික අවශ්‍යතාව තද කරගෙන කළුවර වැටෙනකම් ඉන්න ඕනෑ, ගෙදර වැසිකිළියක් නැති නිසා කැළයට යන්න. ඒ නිසා ඒ කාන්තාවට ඒ කටයුත්ත කරන්න වෙන්නේ රාත්‍රී කාලයට විතරයි. මෙන්න මේ තත්ත්වය ගැන පොඩ්ඩක්වත් කල්පනා කරන්නේ නැතිව, මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා අරලියගහ මන්දිරයේ වැසිකිළි වායු සමීකරණය කරලා තිබුණා. ඒ වාගේම, එතුමාගේ දරුවෝ බලු කූඩුවලටත් air conditioners සවි කරලා තිබුණා. මේවා ගැන බලද්දී අර අහිංසක ජනතාවට වැසිකිළි හදලා නොදුන්නු එක ගැන අපි කනගාටු වෙනවා. මේ අය වැයෙන් මංගල සමරවීර ඇමතිතුමා රුපියල් ලක්ෂ 40,000ක් වෙන් කරලා තිබෙනවා, වැසිකිළි නැති උදවියට වැසිකිළි හදන්න.

පසුගිය දවස්වල නවත්වපු "ගම්පෙරළිය" වැඩසටහන අපි නැවත පටන් අරගත්තා. ඒ වෙනුවෙන් මේ අය වැය හරහා රුපියල් මිලියන 48,000ක් වෙන් කරලා තිබෙනවා. පන්සල් හා අනෙකුත් ආගමික ස්ථාන මේ හැම එකක්ම දියුණු කරන්න රුපියල් ලක්ෂ 10ක් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වාගේම, තරුණ යුවලකට ගෙයක් හදා ගන්න විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ඔක්කොම කාරණාවලට වඩා මම දකින දෙයක් තිබෙනවා. ඒ තමයි, අපේ රටේ ගොවිපොළවල්වල හදන එළවලු සහ පලතුරු ගොවිපොළේ සිට කුස්සියට ඇවිත් අපි කන තැන දක්වා එනකොට සියයට 40ක් සම්පූර්ණයෙන්ම විනාශ වෙන එක. ඒකට හේතුව තමයි අපට නියම ගබඩාකරණයක් නැතිකම. ඒ නිසා අද මේ ගබඩාකරණයට වුවමනා කරන ශීතාගාර හදන වැඩ පිළිවෙළට අවශ්‍ය මුදල් මේ අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම රබර් ආශ්‍රිත කර්මාන්ත, පොල් හා මැටි කර්මාන්ත, මේ හැම එකකටම මුදල් වෙන් කරලා තිබෙනවා. දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් දෙන්නත් අපි වැඩසටහනක් හදලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට අමතරව අද අපේ රටේ ජනගහනයේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඇත්තටම ඉදිරියේදී අපේ රටට දරුවෝ වැඩි වැඩියෙන් අවශ්‍ය කරලා තිබෙනවා. අද පවුලේ දෙදෙනාම රැකියාවට යන්න ඕනෑ. වෙනදා වාගේ නොවෙයි. කාන්තාවට රැකියාව කරන ගමන් දරුවෝ හදන එක ලොකුම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා පෞද්ගලික අංශයේ මව්වරුන්ටත් මාස තුනක අතිරේක ප්‍රසූත නිවාඩුවක් ලබා දීලා, ඔවුන්ව දිරි ගන්වන්න වෙනම වැඩසටහනක් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

හෙරොයින් ආදී මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ට වීරවිල සහ අඹේපුස්සේ නව පුනරුත්ථාපන මධ්‍යස්ථාන දෙකක් අපි හදාගෙන යනවා. ඒ වාගේම සේවකයන් 250කට වැඩි ආයතනවල ළමා සුරැකුම් මධ්‍යස්ථාන හදන්න අපි කටයුතු කරනවා. කාන්තාවක් වැඩට එනවා නම්, තමන්ගේ දරුවා තබන්න ඔවුන්ට තැනක් නැහැ. ඒ නිසා පෞද්ගලික අංශයේ ඒ ආයතනවලට දිවා සුරැකුම් මධ්‍යස්ථාන හදන්න අපි උදව් කරනවා.

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ නිවාස ගම්මාන ඇති කරන්න තව රුපියල් මිලියන 24,000ක් වෙන් කරලා තිබෙනවා. මේ අවස්ථාවේ විශේෂයෙන් කියන්න ඕනෑ, සජිත් ප්‍රේමදාස ඇමතිතුමා විශාල වැඩ කොටසක් කරගෙන යනවා කියන එක. එතුමා බලාපොරොත්තු වෙනවා, අම්පාරේ විතරක් ගෙවල් විශාල ප්‍රමාණයක් හදන්න. අම්පාර දිස්ත්‍රික්කයට විතරක් ගෙවල් 65,000ක් අවශ්‍ය කරලා තිබෙනවා. ඒ ගෙවල් 65,000න් ගෙවල් 30,000ක් විතර අපට අලුතෙන් අවශ්‍ය කරලා තිබෙනවා. ඒ ගෙවල් 30,000න් ගෙවල් 15,000ක් විතර අපේ කාලයේ හදලා ඉවර කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වෙනුවෙන් කඩිනම් වැඩ පිළිවෙළක් එතුමා සකස් කරගෙන, ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ නිසා එතුමාට මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේදී විශේෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම එතුමා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ ශක්තිමත් කරන්න මුදල් අමාත්‍යාංශයෙන් මිලියන 24,000ක් වෙන් කිරීම ගැන මංගල සමරවීර ඇමතිතුමාට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරන්නට ඕනෑ.

මේ අය වැයෙන් අපි මුදල් වෙන් කරලා තිබෙන දේවල් නිසා විරුද්ධ පක්ෂයේ ඉන්න උදවියට දැන් පොඩ්ඩක් උණ ගැනිලායි ඉන්නේ. මොකද ඒ උදවිය දන්නවා, අනිවාර්යයෙන්ම මේවා ක්‍රියාත්මක වෙන කොට ඒ අයට ආපසු කවදාවත් ආණ්ඩු පක්ෂයට නම් එන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැයි කියලා. රටේ ජනතාව දැන ගන්න ඕනෑ, අපි කරන වැඩ කරන්නේ ඡන්දයක් බලාගෙන නොවෙයි කියලා. එදා ඡන්දය තියන්නේ, ගංවතුරට පස්සේයි. ඡන්දය තිබ්බේ කඩින් කඩ. බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇවිල්ලා රුපියල් 10,000 ගණනේ දුන්නා. 2012 පළාත් පාලන ඡන්දයේදී ඇට පැකට් එකක් දෙන්න රුපියල් මිලියන 525ක් වෙන් කරලා තිබුණා. ඊට පස්සේ හොයලා බලන කොට රුපියල් මිලියන 525ක් දීලා තිබුණේ නැහැ. රුපියල් මිලියන 125ක් තමයි සම්පූර්ණයෙන්ම දීලා තිබුණේ. ඉතුරු සල්ලිවලට මොනවාද වුණේ කියන එක දෙයියෝ තමයි දන්නේ. ඒ ඇට පැකට් අරගෙන නගරයේ ඉන්න කට්ටියත් ඇට ටික හිටෙව්වා. අන්තිමට වතුර බිල වැඩි වුණා. එළවලු කඩෙන් ගත්තා නම් ඊට වඩා ලාභයි. මෙන්න මේ වාගේ මෝඩ විදියට ආර්ථිකය දියුණු කරන්න හදපු ඒ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. හොඳ සැලසුමක් ඇතුව ගොවීන් ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් තමයි අපි හැම තිස්සේම කරන්න බලාපොරොත්තු වෙන්නේ.

මේ අවස්ථාවේ මට අදහස් ප්‍රකාශ කරන්නට කාලය ලබා දීම ගැන මගේ ගෞරවනීය ස්තුතිය ප්‍රකාශ කරමින්, මංගල සමරවීර ඇමතිතුමාගේ අය වැය අපේ හැම ඇමතිවරයෙකුටම ඉතාමත්ම ඉක්මනින් ක්‍රියාත්මක කරන්න ශක්තිය, ධෛර්ය, වාසනාව ලැබේවා!යි කියලා ප්‍රාර්ථනා කරනවා. විරුද්ධ පක්ෂයේ ඉඳගෙන අපට විරුද්ධව කෑ ගහන ඔබතුමන්ලාට මම කියනවා, අපේ අපනයන ගම්මාන 5,000 වැඩ පිළිවෙළට ඔබතුමන්ලාත් එකතු වෙලා දායකත්වයක් ලබා දෙන්න කියලා. එහෙම නැතුව බොරුවට කෑ ගැහුවාට වැඩක් නැහැ. අපේ රටේ නිෂ්පාදනය වැඩි කරලා, ආදායම වැඩි කරන්නට ඕනෑ; අපනයන ආදායම වැඩි කරන්නට ඕනෑ. අපි පොරොන්දු වුණා, අනිවාර්යයෙන්ම වසර පහක් ඇතුළත අපනයන ආදායම දෙගුණයක් කරනවා කියලා. අපට අනිවාර්යයෙන්ම වසර පහක් ඇතුළත අපනයන ආදායම දෙගුණයක් කරන්න පුළුවන්. අපි ආණ්ඩුව භාර ගන්න කොට අපනයන ආදායම තිබුණේ, ඩොලර් මිලියන 11,300යි. අපි

ඉලක්ක කළේ මේ අවුරුද්ද වන කොට අපනයන ආදායම ඩොලර් මිලියන 17,000ක් කරන්නයි. අපි දැන් එතැනටම කිට්ටු කරලා තිබෙනවා. ඩොලර් මිලියන 17,000කට කිට්ටු කරලා අපට අපනයන කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒක නිසා අනිවාර්යයෙන්ම 2020 අවුරුද්ද වෙන කොට අපි බලාපොරොත්තු වුණු අපනයන ආදායම ඩොලර් මිලියන 23,000ක් කරන්නට අපට හොඳටම හැකියාව තිබෙනවා. අපි ඒක කරනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ නැති කරපු අපනයන ආදායම -අපේ ආර්ථිකයෙන් සියයට 38ක් තිබුණු එක සියයට 12කට බස්සපු එක- දැන් වෙන කොට අපට පුළුවන් වෙලා තිබෙනවා සියයට 18ක මට්ටමකට ගෙනෙන්න. අපි ඉදිරියේදී අනිවාර්යයෙන්ම සියයට 50ක් දක්වා අපනයන ආදායම වැඩි කරනවා කියලා ප්‍රකාශ කරමින් මම නවතිනවා. සියලු දෙනාටම සම්මා සම්බුද්ධ සරණ ප්‍රාර්ථනා කරනවා.

[පූ.භා.11.18]

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවස්ථාව ලබාදුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. මුලින්ම සුරාබදු ගැන වචන කිහිපයක් කියලා ඊට පස්සේ මම නිෂ්පාදනය ගැන කියන්න කැමැතියි. මංගල සමරවීර මගේ මිත්‍රයා ප්‍රකාශ කළා, -මුදල් රාජ්‍ය ඇමතිතුමාත් මේ සභාවේ ඉන්නවා- ගල් අරක්කු මිල වැඩි කරන්නේ නැහැයි කියලා. ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමනි, හැබැයි ඊයේ ගල් අරක්කු මිල රුපියල් 70කින් වැඩි වුණා. මා මේ ගැන මුදල් ඇමතිතුමාට දෝෂාරෝපණය කරන්නේ නැහැ. මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් මේකට වග කියන්න ඕනෑ කියලායි මා කියන්නේ. මොකද, අපි දේශීය වශයෙන් ගල් අරක්කුවලට බදු අය කළේ නැතිවුණාට, එතනෝල්වල බද්ද රුපියල් 800 සිට රුපියල් 1,000 දක්වා වැඩි කළා. ඒ නිසා ඊයේ ගල් අරක්කු මිල රුපියල් 70කින් ඉහළ ගිය බවත්, ඒ නිසා මංගල සමරවීර ඇමතිතුමාගේ ප්‍රකාශය සම්පූර්ණයෙන් වැරදි බවත් මා මුලින්ම ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකාවේ මත් ද්‍රව්‍ය අළෙවි කරන බලපත්‍ර 3,000ක් විතර තිබෙනවා. මෙයින් 1,200ක් බාර් ලයිසන්. මේ ලයිසන් 1,200න් 400ක් ව්‍යාපාරිකයන් තුන්දෙනෙක් සල්ලි දීලා අරගෙන තිබෙනවා. එයින් ප්‍රධාන එක් කෙනෙක් තමයි ඇලෝසියස්. ඔවුන් තමයි "Mendis Special" නිපදවන්නේ. මේ බාර් 400හි විකුණන අරක්කුවලින් සියයට 80ක් සඳහා බදු ගෙවන්නේ නැහැ. මා පැහැදිලිව කියන්න කැමැතියි, මේ බාර් 400 සුරාබදු ආදායමට රුපියල් බිලියන 50කට වඩා අලාභ කරනවාය කියලා.

දෙවන කාරණාව තමයි, සිගරට්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් තැනින් තැන පිට රට සිගරට් අත්අඩංගුවට ගන්නවා. හැබැයි ඕනෑම කඩයක පිට රට සිගරට් තිබෙනවා. මේ හොර සිගරට් නවත්වන්න පුළුවන් නම් තවත් රුපියල් බිලියන 20ක අමතර ආදායමක් ගන්න පුළුවන්. පසුගිය දවස්වල උතුරේදී එතනෝල් ලීටර් 10,000ක් අත්අඩංගුවට ගත්තා. හැබැයි, උතුරේ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයා ඒවා අත්අඩංගුවට ගත් STF එකට බල කළා, ඒවා නිදහස් කරන්නය කියලා. ඒ අය ඒවා නිදහස් කළේ නැහැ. ඔවුන් ඒවා උතුර II -Northern Province II- සුරාබදු කොමසාරිස්වරයාට භාර දුන්නා. නමුත් ඒවා උසාවියට ඉදිරිපත් වුණේ කසිප්පු හැටියට. මා කියන්න කැමැතියි, ඒ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා.

පසුගිය දවස්වල හොර එතනෝල් බැරල් 35ක් අහුවුණා පිළියන්දලින්. ඒවා උසාවියට ඉදිරිපත් වුණේ කසිප්පු හැටියට. අද හොරට ගෙනෙන එතනෝල් බෙදා හරින ප්‍රධාන නිලධාරින් ඉන්නේ මංගල සමරවීර ඇමතිතුමාගේ වටේ කියලා තමයි කියන්නේ. සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා මුදල් අමාත්‍යාංශයේ නිකම් තියාගෙන ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔහුගේ කාලයේ සුරාබදු ආදායම රුපියල් බිලියන 123යි. ඔහු ඉවත් කළාට පස්සේ අවුරුද්දේ සුරාබදු ආදායම රුපියල් බිලියන 104යි. සුරාබදු කොමසාරිස් මුදල් අමාත්‍යාංශයේ තියාගෙන ඉන්නේ ආණ්ඩුවේම පිරිසකට හිතුමතයේ හොරෙන් එතනෝල් ගෙනෙන්නයි. මේ තුළින් එය හොඳට පෙනෙනවා. ඔහු සිටි කාලයේ සුරාබදු ආදායම රුපියල් බිලියන 123යි. දැන් සුරාබදු ආදායම රුපියල් බිලියන 104යි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෘෂි කර්මාන්තය ගැන අපේ දයා ගමගේ ඇමතිතුමාත් කිව්වා. කෘෂි කර්මාන්තය පිළිබඳව ප්‍රධාන වශයෙන් කරුණු කීපයක් කියන්න මා කැමැතියි. මොනවාද මේ අය වැයේ කෘෂි කර්මාන්තය ගැන කියලා තිබෙන්නේ? කෘෂි කර්මය නවීකරණය කරනවා, කුකුළු පාලනයට ණය දෙනවා, රබර් නැවත වගා කිරීමට ආධාර දෙනවා, පොල් කර්මාන්තයේ නිෂ්පාදනවලින් නව නිපැයුම් කරන්න උදවු කරනවා, කුරුඳුවල තත්ත්ව පාලනය කරනවා යනාදී වශයෙන් මේ අය වැයේ තිබෙනවා. අපේ දයා ගමගේ ඇමතිතුමාත් කිව්වා, ප්‍රධාන කෘෂි කාර්මික භෝගය වී කියලා. ලංකාවේ හෙක්ටයාර් ලක්ෂ 10ක් කුඹුරු තිබෙනවා. වී ගොවීන්ට තිබෙන ප්‍රශ්න මොනවාද? සමහර ප්‍රදේශවලට වතුර නැහැ, සමහර අයට කලට වෙලාවට පොහොර ටික ගන්න නැහැ. ඒ සියල්ලටම වඩා දැන් මේ අවුරුද්දේ අතිරික්ත වී නිෂ්පාදනයක් තිබෙනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? රජය රුපියල් 53ට මිලදී ගත් වී රුපියල් 43ට අඩු කළා. රජය රුපියල් 50ට මිල දී ගත් වී රුපියල් 40ට අඩු කළා. අද ගොවීන්ට වී ටික විකුණන්න වෙලා තිබෙන්නේ, රුපියල් 27ට, රුපියල් 28ට, රුපියල් 30ටයි. ඇත්තටම අද රුපියල් 28ට, 29ට, 30ට වී විකුණලා ගොවියාට ගොඩ එන්න බැහැ.

අද මේ අය වැයේ වී ගොවිතැන වෙනුවෙන් කිසිම යෝජනාවක් නැහැයි කියන කාරණය මම කියන්න කැමැතියි.

නමුත්, ඇමතිතුමා කිව්වා අපනයන වැඩි කරනවා කියලා. ඔබතුමා දන්නවාද, අද ඉඩම්වලින් විශාල වශයෙන් රබර් ඉවත් කරන බව? මොකද, රබර් විකුණා ගන්න බැහැ. රබර් පිටරටින් ගෙනෙනවා. ඒක තමයි ප්‍රධාන ප්‍රශ්නය. මේ රටේ තිබෙන කර්මාන්තශාලා සියල්ලටම රබර් පිටරටින් ගේනවා.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
අනේ! මට පොඩි වෙලාවයි තිබෙන්නේ. [බාධා කිරීමක්] නැහැ, නැහැ, එපා. මට වෙලාව නැහැ.

අද වතුවල රබර් සම්පූර්ණයෙන්ම ගලව ගලවා, ගලව ගලවා වෙන වෙන දේවල් හදනවා.

අදත් ලෝක වෙළෙඳ පොළේ කුරුඳුවලින් සියයට 90කට වැඩි -සියයට 92ක් විතර- ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නේ ලංකාව. අපේ කුරුඳු එක්ක තරග කරන්නට ඉන්දියාවේ සහ චීනයේ කැෂියා වාගේ දේවල් තිබෙනවා. නමුත්, ඒවාට අපේ කුරුඳුවලට කිට්ටු වෙන්නවත් බැහැ. නමුත්, අපි කුරුඳු වගාව නඟා සිටුවීමට මොනවාද කරලා තිබෙන්නේ? මේ අය වැයෙන්

[ගරු එස්.බී. දිසානායක මහතා]

මොනවාද කරලා තිබෙන්නේ? මොකක්වත්ම කරලා නැහැ. දැන් මිනිස්සු කුරුඳු වගාව අත හැරලාම දානවා. ඒකට බලපාන ප්‍රධානම දේ තමයි, අද කුරුඳු ගොවියාගේ මුළු ආදායමෙන් හරියටම සියයට 50ක් කුරුඳු තලන්නට දෙන්න වෙන එක. ඉතින්, මේ සඳහා පොඩි මැෂින් එකක් හදන එකයි කරන්න තිබෙන්නේ. මේ සඳහා පොඩි මැෂින් එකක් හදන්න උදවු කරන එකයි කරන්න තිබෙන්නේ. ඒ අනුව, මේ අය වැයෙන් කුරුඳු වගාව වෙනුවෙනුත් කිසිම දෙයක් කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කුකුළු පාලනයට ණය දෙනවා කියලා කියනවා. ඒ ගැන කියන්නට කලින් මම පොල් ගැන කථා කරන්නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ රටේ හෙක්ටෙයාර් ලක්ෂ 3ක් පොල් වගා කරලා තිබෙනවා. පොල් නිෂ්පාදනය අඩු වෙන්න බලපාන පළමුවෙනි දේ තමයි, ආණ්ඩුව විසින් පොල් වතු ශුද්ධ කර කර, ශුද්ධ කර කර වෙන වෙන දේවලට ලබා දීම. පළමුවෙනි දේ ඒක. ඒ වාගේම, අලුතින් පොල් වගා කිරීම සඳහා මේ අය වැය ලේඛනයේත් කිසිම සැලැස්මක් නැහැ. ඒ අතර තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මොකක්ද? පොල් එලදාවෙන් සියයට 40ක් රිළවුන්, වඳුරන් සහ දඬුලේනුන් විනාශ කරනවා. මේ රටේ පොල් නිෂ්පාදනය දියුණු කරන්න ඕනෑ නම් ගමට පැනලා ඉන්න මේ රිළවුන්, වඳුරන් සහ දඬුලේනුන් විනාශ කරන්න වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. මේක පොඩි වැඩක්. මේ ප්‍රශ්නය ගැන මම පසුගිය ආණ්ඩුවේ ඉන්න විටත් කිව්වා. මේක මම හැම වෙලේම කියන දෙයක්. මේ රටේ පොල් නිෂ්පාදනය වැඩි කරන්න බැහැ. සියයට 40ක් එලදාව රිළවුන්, වඳුරන් සහ දඬුලේනුන් ගෙඩි පැහෙන්න ඉස්සෙල්ලාම කඩලා බිමට දානවා. ඉතින් කොහොමද පොල් නිෂ්පාදනය වැඩි කරන්නේ? ගම් වැදිලා ඉන්න මේ සතුන් ටික විනාශ කරන එක පොඩි දෙයක් නොවෙයි. නමුත් ඒක ලෝකයේ කරන දෙයක්. ඒ අනුව, පොල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කිසිම දෙයක් මේ අය වැය ලේඛනයෙන් යෝජනා කරලා නැහැයි කියන එක මම කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මම සත්ව පාලනය ගැන කියන්නම්. අපේ රටේ එළදෙනුන්, ලක්ෂ 11ක් පමණ ඉන්නවා. එක එළදෙනෙකුගේ සාමාන්‍ය දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 2යි. මේ ප්‍රමාණය වැඩි කිරීම පිළිබඳ කිසිම යෝජනාවක් මේ අය වැයේ නැහැ. අපේ රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට 60ක්, 62ක්, 63ක් පමණ අදටත් කිරි පිටි ලෙස පිට රටින් ගෙනෙනවා. අද ප්‍රධාන සත්ව පාලන ව්‍යාපාරය වන කිරි හරක් ඇති කිරීමේ ව්‍යාපාරය නැංවීම සඳහා මේ අය වැයෙන් කිසිම යෝජනාවක් ගෙනැල්ලා නැහැ.

අපේ රටේ ගොවියෝ ඉන්නවා 2,140,000ක්. මේ මිනිසුන්ගෙන් වැඩි දෙනෙක් දුප්පත් අය. මේ අයට තමුන්ගේ කුඹුරට, හේනට, පුංචි ගොවිතැනට අමතරව එළදෙනෙකු ඇති කරන එක ඉතාම හොඳ දෙයක්. අද කිරි ගව පාලනය පාඩුයි. ඒකට බලපාන එක හේතුවක් තමයි, කිරි ගන්නේ නැති වුණාම ඒ ගවයන් මස් පිණිස විකුණන්න තිබෙන බාධාව. ඒ විධියට මේ ව්‍යාපාරය දියුණු කරන්න බැහැ. කිරි ගව පාලනය අඩු වීමට බලපාන දෙවෙනි කාරණය තමයි, කිරි මිල ප්‍රමාණවත් නොවීම. ඒ සඳහා බලපාන තුන්වෙනි කාරණය තමයි, ගවයන්ගේ ආහාර ඉතා ගණන් වීම.

මේ රටේ කිරි නිෂ්පාදනය ඉහළට ගෙනෙන්න ඕනෑ නම්, මේ සත්ව ආහාර ලාභයට දෙන ක්‍රමයක් රජය හදන්න ඕනෑ. ඒ වාගේම, කිරි පිටිවලට තව බද්දක් ගහලා ඒ වාසිය කිරි නිෂ්පාදකයාට දීලා, කිරි මිලදී ගන්නා මිල තව ටිකක් ඉහළට ගෙනෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, මේ ආණ්ඩුව කිරි නිෂ්පාදනය පැත්තෙන් -කිරි හරක් කර්මාන්තය පැත්තෙන්- අය වැයෙන් කිසිම යෝජනාවක් කරලා නැහැ. අනෙක් පැත්තෙන් එළුවන් ඇති කිරීම ඉතාම ලාභදායී ව්‍යාපාරයක්. එම ව්‍යාපාරය බෞද්ධ ජනතාවට කරන්න අමාරු නම්, කරදරයක් නැතුව අනෙකුත් ආගම්වල අයට එළුවන් හදන්න ඉඩ කඩ දෙන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයන්න ඕනෑ. අපේ රටේ එළුවෝ ලක්ෂ 9ක් පමණ ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද එළු මස් කිලෝ එකක් රුපියල් 1,500ක්, 1,600ක් විතර වෙනවා. ඉතාම ලාභදායී ව්‍යාපාරයක්. ඒ සඳහා කැමැති ගොවීන්ට තමන්ගේ ගොවිතැනට අමතරව එළුවෙක් දෙන්නෙක්; එළුවන් හතර පස්දෙනෙකුගෙන් යුත් පුංචි එළු පට්ටියක් පවත්වාගෙන ගොස් මාසයකට දෙකකට සැරයක් එළුවෙක් විකුණාගන්න පුළුවන් නම් ඔහුගේ ආර්ථිකය උඩට ගෙනෙන්න, දුගී භාවයෙන් මිදෙන්න එය ප්‍රධාන මාර්ගයක් වෙනවා. හැබැයි, එළුවන් ව්‍යාපාරය ගැන කිසිදු යෝජනාවක් මේ අය වැයේ සඳහන් වෙලා නැහැ. ඒ වාගේම, අපේ රටේ මී ගවයන් ඉන්නේ ලක්ෂ 3යි. අපේ රටේ මුදවපු මී කිරි විදේශිකයන් අතරත් ඉතාම ජනප්‍රිය ආහාරයක්. ඒවා විදේශ රටවලට පවා යවන්න පුළුවන්. මී ගව කර්මාන්තය කියන්නේ ඉතාම ඉහළට ගෙන යන්න පුළුවන් කර්මාන්තයක්. හැබැයි, මී ගව කර්මාන්තය ගැන මේ අය වැයෙන් වචනයක්වත් කථා කරලා නැහැ. දයා ගමගේ මැතිතුමා මොන තරම් කිව්වත්, එතුමා ඇමතිවරයා වශයෙන් සිටිනකොට තමයි අපේ ගම්මිරිස් වගාව නැත්තටම නැති වුණේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මටත් ගම්මිරිස් තිබෙනවා. ගරු සුමේධා ජී. ජයසේන මැතිනියටත් ගම්මිරිස් තිබෙනවා. අපි කවදාවත් ගම්මිරිස් කිලෝ එකක් රුපියල් 1,000ට අඩුවෙන් වික්කේ නැහැ. ගම්මිරිස් මිල රුපියල් 300ට වැටුණා. දැන් යාන්තම් නැවත රුපියල් 500ට විතර ඇවිල්ලා තිබෙනවා. මොකද, වියට්නාමයෙන් ගම්මිරිස් ගෙනැල්ලා නැවේ දී ශ්‍රී ලංකා ගම්මිරිස් කරනවා. ඇත්තටම අපි ගම්මිරිස් වගාවෙන් සල්ලි උපයා ගත් මිනිස්සු. සුමේධා මැතිනියත් එහෙමයි. ගම්මිරිස් වගාවෙන් සල්ලි උපයා ගත් අය. ගම්මිරිස් වගාව අද අපට එපා වෙලා තිබෙනවා, විකුණා ගන්න බැහැ. එම නිසා ගම්මිරිස් වගාව සහ එහි මිල කඩා වැටීම පිළිබඳව මේ රජය සම්පූර්ණයෙන්ම වග කියන්න ඕනෑ. ගම්මිරිස් මිල වැට්ටුවේ කවුද කියන කාරණය පිළිබඳව නොයෙකුත් කථා වෙළෙඳ පොළ තුළ තිබෙනවා.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, what is your point of Order?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ. ඔබතුමා වාඩි වෙන්න. හොරාට ඉස්සෙල්ලා කෙසෙල් කැන පැන්නා. වෙච්ච දේ ඒකයි.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
මෙතුමා සඳහන් කළ කාරණය සම්බන්ධයෙන් මට උත්තරයක් දෙන්න ඕනෑ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය ඇත්ත. මිල අඩු වුණා.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඒකට ඔබතුමා වග කියන්න ඕනෑ.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ඒ සඳහා මට වග කියන්න බැහැ. ලෝක වෙළෙඳ පොළේ මිල අඩු වීම ගැන මට වග කියන්න බැහැ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ලෝක වෙළෙඳ පොළේ ගම්මිරිස් මිල අඩු වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ ගම්මිරිස්වල මිල වියට්නාම් ගම්මිරිස් තැනට වැටුණා. ලෝක වෙළෙඳ පොළේ මිල අඩු වුණේ නැහැ.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, what is your point of Order?

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඇමතිවරයෙක් හැටියට කැබිනට් මණ්ඩලයේ ඉන්න කොට මම මේ පිළිබඳව කැබිනට් මණ්ඩලයේ සියලු දෙනාවම දැනුවත් කළා. එම නිසා ඔබතුමා මට විරුද්ධව ඇඟිල්ල දිගු කරන්න එපා. ඇත්තටම ඔබතුමා දන්නවා,-

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඔබතුමාට තමයි මේ පිළිබඳව ඇඟිල්ල දිගු කළේ. පිට රටට යන ප්‍රමාණය වැඩි කරනවා කියලා මෙතුමා සිහින මවනවා. මිනිස්සු අද ගම්මිරිස් වගාව අත හැරලා තිබෙන්නේ. මිනිස්සු අද කුරුඳු වගාව අත හැරලා තිබෙන්නේ. ඒ, මෙතුමන්ලාට පින් සිද්ධ වෙන්න. අද මේ රටේ මිනිස්සු වෙන වෙන දේවල් වගා කරන්න සියලුම රබර් ගලවනවා. ඒ වාගේම මේ රටේ වී ගොවිතැන සම්බන්ධයෙන් තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි ඇමතිතුමනි, වීවලට මිලක් නැතිකම. ඔබතුමන්ලා ඒ ප්‍රශ්නය විසඳලා නැහැ. රබර් විකුණා ගන්න බැහැ. රිළව්, වඳුරෝ, දඬු ලේනෝ පොල් එළදාව විනාශ කරනවා. ඒවාට උත්තරයක් නැහැ. මම ඔබතුමන්ලාටයි මේ කියන්නේ. ඒ වාගේම තමයි කිරි හරක් පාලනය, මී ගව පාලනය, එළුවන් පාලනය, ඒ කිසි දෙයක් ගැන මේ අය වැයේ වචනයක්වත් සඳහන් වෙලා නැහැ.

වෙනත් විධියකට කිව්වොත්, අපේ රටේ සිටින ගොවීන් 2,140,000ක් වෙනුවෙන් කිසිම යෝජනාවක් මේ අය වැය ලේඛනයේ නැහැයි කියමින් මගේ කථාව අවසන් කරනවා.

[පූ.භා.11.33]

**ගරු පලනි දිගම්බරම් මහතා (කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பழனி திகம்பரம் - மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சர்)
(The Hon. PalanyThigambaram - Minister of Hill Country New Villages, Infrastructure and Community Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යහ පාලන ආණ්ඩුව ඇති වෙලා අවුරුදු හතරයි. පසුගිය අවුරුදු තුනේදීම යහ පාලන ආණ්ඩුවේ අය වැය තමයි ඉදිරිපත් කළේ. අපි මේ අවුරුද්දේ තමයි එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව විධියට අය වැයක් ඉදිරිපත් කළේ. මේ අය වැය ජනතාව ඉලක්ක කර ගෙන ඉදිරිපත් කරපු අය වැයක්. නමුත්, සමහර කට්ටිය මේ අය වැය ගැන මොනවාද කියන්නේ?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Hesha Withanage to the Chair?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I propose that the Hon. Hesha Withanage do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. HESHA WITHANAGE *took the Chair.*

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகம்பரம்)
(The Hon. PalanyThigambaram)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මංගල සමරවීර ඇමතිතුමාගේ අය වැය ඇත්තටම විශාල සංවර්ධනයක් කරන්න රට වෙනුවෙන් හදපු අය වැයක්. විපක්ෂයේ කට්ටිය ඕනෑම වෙලාවක ආණ්ඩුවෙන් ඉදිරිපත් කරන අය වැය ගැන හොඳ කියන්නේ නැහැ නේ. විවේචනය කිරීම තමයි ඔවුන් කරන්නේ. නමුත්, මේ අය වැය ගැන ජනතාව දන්නවා.

ඊයේ - පෙරේදා නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ සභාවේ කථා කරද්දී ඇහුවා, මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා උතුරේ ගෙවල් හැදුවාද, වතුකරයේ ගෙවල් හැදුවාද කියලා. මම මේ වෙලාවේ එතුමාට උත්තර දෙන්න ඕනෑ. උතුරේ ගෙවල් හැදුවාද කියලා මම දන්නේ නැහැ. වතුකරයේ නම් ගෙවල් විශාල ප්‍රමාණයක් හදලා තිබෙනවා. වතුකරයට එතුමා ආවා නම්, එතුමාට ඒවා පෙන්වන්න මට පුළුවන්. වතුකරයේ ගෙවල් ටික හැදුවේ මේ ආණ්ඩුව බව ඉතිහාසය දිහා බලන කොට පෙනෙනවා. මේ

[ගරු පලනි දිගම්බරම් මහතා]

ආණ්ඩුව පත්වුණාට පස්සේ එහි ජනතාවට ඉඩම් අයිතිය ලබා දුන්නා, ඒ වාගේම ගෙවල් ටික හදා දුන්නා කියන එක මට සතුටින් කියන්න පුළුවන්, ප්‍රාදේශීය සභා වැඩි කර ගත්තා, වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිහිටෙව්වා. ඒ වාගේ සංවර්ධන වැඩ කටයුතු රාශියක් කරලා තිබෙනවා.

අපට ප්‍රශ්න තිබෙනවා. වතු කම්කරුවන්ගේ වැටුප් ප්‍රශ්නය තිබෙනවා. මේ අය වැයේ දී මංගල ඇමතිතුමා කියපු කථාව ගැන සමහර අය වැරදි අදහසක් දෙනවා. වතුකරයේ ජනතාව ගැන දන්නේ නැති අය වතුකරයේ ජනතාවගේ පඩි ගැන කථා කරනවා. ඒ විධියට කථා කරන අයට මම කියන්න කැමැතියි, අපි කියපු රුපියල් 50ක දෛනික දීමනාව හෙට - අනිද්දා වන විට වතු කම්කරුවන්ට අනිවාර්යයෙන්ම ලබා දෙන බව. ඒ නිසා ඒ ගැන කවුරුවත් කලබල වෙන්න දෙයක් නැහැ.

இம்முறை வரவுசெலவுத்திட்டத்தில் முன்வைக்கப்பட்டுள்ள பல யோசனைகள் சாதாரண மக்களைச் சென்றடையக்கூடியதாக உள்ளது. குறிப்பாக, மலையக மக்கள் மத்தியில் பாரிய எதிர்பார்ப்புக்களை உருவாக்கியுள்ளது. கம்பெறலியத் திட்டத்திற்கு 48,000 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. இதற்கு, இந்த அரசாங்கத்தின் பங்காளி என்ற அடிப்படையில் நன்றி தெரிவிக்கின்றேன். நுவரெலியா மஸ்கெலிய தேர்தல் தொகுதியில் கம்பெறலியத் திட்டத்தினை முன்னெடுப்பதற்கு 30 கோடி ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இந்தத் தேர்தல் தொகுதியானது வலப்பனை, கொத்மலை போன்ற தொகுதிகளைவிட அதிக மக்கள் தொகையினைக் கொண்ட தொகுதியாகும். அதனால், நுவரெலியா மஸ்கெலிய தொகுதிக்கு ஒதுக்கப்பட்ட நிதியை அதிகரித்துத்தருமாறு இந்த சபையில் கோரிக்கை முன்வைக்கின்றேன். கிராமப்புறப் பாடசாலை மாணவர்களுக்கு இலவச பால் கோப்பை வழங்குவதற்கான யோசனை முன்வைக்கப்பட்டுள்ளது. இது மிகவும் சிறந்ததொரு திட்டமாகும். பெருந்தோட்டப் பகுதியிலுள்ள மாணவர்கள் மத்தியில் மந்தபோசணை நிலை அதிகரித்துக் காணப்படுகின்றது. அதற்குக் காரணம் சத்துணவுக் குறைபாடாகும். அதனை நிவர்த்திசெய்யும் வகையில், முன்வைக்கப்பட்டுள்ள இந்த இலவச பால் வழங்குந்திட்டம் பெருந்தோட்ட மாணவர்களுக்குப் பெரும் நன்மை பயக்கும் என்பதில் சந்தேகமில்லை. நாடு முழுவதும் 260,000 மக்களுக்கு மலசலகூட வசதிகள் இல்லை. அத்தகைய வீடுகள் மற்றும் பொது இடங்களுக்கு மலசலகூடம் அமைப்பதற்கு 40 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டுள்ளது. பெருந்தோட்டப் பகுதிகளில் 40,000 குடும்பங்கள் மலசலகூட வசதியின்றி உள்ளன. அந்த மக்களுக்கான மலசலகூட வசதிகளை வழங்குவதற்கு எனது அமைச்சின்மூலமாகவும் உலக வங்கியின் நிதியினூடாகவும் நாங்கள் நடவடிக்கைகளை முன்னெடுத்து வருகின்றோம். அதற்கு மேலதிகமாகத் தொழிலாளர்களுக்குத் தோட்டங்களில் ஓய்வறைகளை அமைத்து அங்கும் மலசலகூட வசதிகளை அமைக்கும் திட்டங்கள் இம்முறை முன்னெடுக்கப்பட்டுள்ளன.

வலதுகுறைந்தவர்களுக்கான கொடுப்பனவு 3,000 ரூபாவில் இருந்து 5,000 ரூபாவாக அதிகரிக்கப்பட்டுள்ளமை வரவேற்கத்தக்கதொரு விடயமாகும். இந்தத் திட்டம் சனத்தொகை அடிப்படையில், அந்தந்தக் கிராமசேவகர் பிரிவுக்குப் பங்கிட்டு வழங்கப்பட வேண்டும். புதிதாகத் திருமணம் முடிக்கும் புதுமணத் தம்பதிக்குப் புதிய வீட்டை அமைத்துக்கொள்வதற்கான 6 சதவீத சலுகை வட்டியுடனான 25 வருடங்களுக்கான கடன் திட்டம் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புகளுக்குச் செல்லும் நபர்களுக்கு வீடு கட்டிச்கொள்வதற்கான கடன் திட்டம் போன்றன இளைஞர், யுவதிகள் மத்தியில் பெரும் எதிர்பார்ப்பை ஏற்படுத்தியுள்ளன. ஏனெனில், வெளிநாடுகளில் அதிகளவான மலையக இளைஞர் யுவதிகள் வேலை செய்கின்றனர். வீட்டுக்கடன் திட்டம் அவர்களின் வீடில்லாப் பிரச்சினைக்குத் தீர்வு வழங்கும் என நாம் நம்பலாம்.

அதிக புள்ளிகளைப் பெற்று சித்திபெறும் மாணவர்களுக்கு உலகின் சிறந்த பல்கலைக்கழகங்களில் கல்விவாய்ப்புப் பெறப் புலமைப்பரிசில் வழங்கும் திட்டம் கொண்டுவரப்பட்டுள்ளது. இத்திட்டம் சிறந்ததென்பதுடன், அவ்வாறு வெளிநாடு செல்லும் மாணவர்கள் பின்னர் இலங்கையில் குறைந்தது 15 வருடங்கள் சேவை புரிய வேண்டுமென்ற நிபந்தனையும் மகிழ்ச்சியளிக்கின்றது. வட்டியற்ற கடன்வசதி என்ற அறிவிப்பின் பலனாக குடும்பக் கஷ்டம் காரணமாக கல்வியை இடைநடுவில் கைவிடும் மாணவர்களின் தொகையைக் குறைக்க முடியும். இந்தத் திட்டமானது பெருந்தோட்டப் பகுதி மாணவர்களுக்குப் பெரிதும் நன்மை பயக்கும் என்பதால் நிதி அமைச்சர் மங்கள சமரவீர அவர்களுக்கு எனது விசேட நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்தில் 6,000 கோடி நிதியொதுக்கீட்டில் 'என்டபிறைஸ் ஸ்ரீ லங்கா' திட்டம் சிறுதொழில்முயற்சியாளர்களுக்கு அறிமுகம் செய்யப் பட்டுள்ளது. இத்திட்டத்தின்மூலம் அரச வேலைவாய்ப்பை எதிர்பார்க்கும் இளைஞர் யுவதிகளுக்கு சுயதொழில் வியாபாரம் ஆரம்பிக்கும் ஏற்பாடு செய்யப்பட்டுள்ளது. இது மிகவும் ஆரோக்கியமான திட்டமாகும்.

முதலிடத்திலிருந்த பெருந்தோட்டத் தொழிற்றுறை இன்று நான்காவது இடத்திற்குப் பின்தள்ளப்பட்டுள்ளது. கடந்தமுறை கூட்டு ஒப்பந்தக் காலத்தில் 160,000 ஆக இருந்த தொழிலாளர்களின் எண்ணிக்கை இந்த முறை கூட்டு ஒப்பந்த காலத்தில் 130,000 ஆகக் குறைந்துள்ளது. சிறுதோட்ட உரிமையாளர்கள், இன்று பெருந்தோட்ட தொழிலாளர் களைவிட வாழ்க்கைத் தரத்தில் உயர்ந்துள்ளனர். ஆனால், பெருந்தோட்டத் தொழிலாளர்கள் இன்னும் நாளாந்தச் சம்பளத்திற்குப் போராடிக் கொண்டிருக்கிறார்கள். எனவே, அவர்களின் தொழிற்றுறையில் மாற்றம் தேவை. கூட்டு ஒப்பந்தத்தின்மூலம் ஏமாற்றப்பட்ட தொழிலார்களுக்கு இனிமேலும் கூட்டு ஒப்பந்தத்தின்மூலம் நியாயத்தை எதிர்பார்க்க முடியாது. எனவே, தோட்டங்களைத் தொழிலாளர் குடும்பங்களுக்குப் பிரித்துக்கொடுத்து அவர்களைச் சிறுதோட்ட உரிமையாளர்களாக மாற்றுவதே அந்த மக்களுடைய பிரச்சினைக்கு ஒரே தீர்வாக அமையுமென இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இம்முறை வரவு செலவுத்திட்டத்தில் தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு குறித்து நிதி அமைச்சர் மங்கள சமரவீர அவர்கள் விடுத்துள்ள அறிவிப்பு மகிழ்ச்சியளிக்கின்றது. அந்த அறிவிப்பின் பின்னர் அமைச்சரவைப்பத்திரம் தாக்கல் செய்து தோட்டத் தொழிலாளர்களுக்கு மேலதிகமாக நாளொன்று 50 ரூபாய் வழங்க இணக்கம் காணப்பட்டுள்ளது. அது அடுத்த வரவு செலவுத்திட்டத்திலும் நீடிக்கப்பட வேண்டும். வரவு செலவுத்திட்டத்தில் இறப்பர், தென்னை போன்ற துறைகளை அபிவிருத்தி செய்ய இம்முறை அதிகளவு நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. அதன்மூலம் நுவரெலியா, பதுளை மாவட்டங்களுக்கு வெளியில் வாழும் மலையக மக்களின் பிரச்சினைகளும் தீர்க்கப்பட வேண்டும். இம்முறை சமர்ப்பிக்கப்பட்டுள்ள இந்த வரவு செலவுத்திட்டத்தில் எனது

அமைச்சிற்கான நிதி ஒதுக்கீடு அதிகரிக்கப்பட்டுள்ளதுடன் வீடமைப்பு, பாதை, குடிநீர் உள்ளிட்ட உட்கட்டமைப்பு வசதிகளுக்கும் வறுமை ஒழிப்புப் போன்றவற்றுக்கும் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. இதனையிட்டு அதிமேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களுக்கும் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் நிதி அமைச்சர் மங்கள சமரவீர அவர்களுக்கும் நன்றிகளைத் தெரிவிப்பதுடன் இதற்கு அனைத்து வகையிலும் ஒத்துழைப்பு வழங்கிய அனைவருக்கும் நன்றிகளைத் தெரிவித்து விடைபெறுகின் றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි, ගරු අමාත්‍යතුමනි.

මීළඟට, ගරු තුරෙයිරෙත්නසිංහම් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[மு.ப. 11.42]

**ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා**
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவ்வருடத்திற்கான வரவு செலவுத்திட்ட விவாதத்தின்போது உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி! கடந்த வருடம் ஒக்ரோபர் மாதம் ஏற்பட்ட நிலையற்ற அரசியல் தன்மையின் பின் இவ்வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட்டுள்ளது. கௌரவ நிதியமைச்சர் அவர்கள் இவ்வரவு செலவுத்திட்டத்துக்கு முடியுமானவரை சிந்தித்துச் செயல்வடிவம் கொடுத்திருக்கின்றார். காலத்தின் கட்டாயத் தேவை கருதி இவ்வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட்டுள்ளது. இந்த வரவு செலவுத்திட்டத்தை வெற்றிகரமாக நடைமுறைப்படுத்துவதில்தான் அதன் வெற்றியும் நாட்டினுடைய எதிர்காலமும் தங்கியுள்ளது. இந்த வரவு செலவுத்திட்டத்தை இன, மத, பிரதேச பேதமற்ற வகையில், மக்கள்மயப்படுத்தப்பட்ட வகையில் நடைமுறைப்படுத்துவது அவசியமாகும். இன்று கிராம இராச்சியங்கள் கட்டி வளர்க்கப்பட வேண்டும். இருந்தபோதிலும் கிராம மக்கள் படும் துன்ப துயரங்கள் கண்டுகொள்ளப்படுவதில்லை. ஆனால், அந்த மக்கள் பலவிதமான துன்ப துயரங்களுக்கு மத்தியிலே வாழ்கின்றார்கள். இன்று ஏறக்குறைய 60 வீதமான மக்கள் கிராமப்புறங்களிலே வாழ்கின்றார்கள். இவர்களின் வாழ்க்கையில் ஒரு பாரிய மாற்றத்தை 'கம்பெறலிய' எனப்படும் துரித கிராம அபிவிருத்தித் திட்டம் ஏற்படுத்தும் என எதிர்பார்க்கப்படுகின்றது.

இதேபோன்று இந்த வரவு செலவுத்திட்டத்தில் சிறந்த நகர உருவாக்கல் திட்டமும் கவனத்திற் கொள்ளப்பட்டுள்ளது. வாழ்வாதார வசதிகளை மேம்படுத்துதல், தனி மனித, சமூக பொருளாதார நிலையை உயர்த்துதல் என்பன கவனத்தில் எடுத்துக்கொள்ளப்பட்டிருப்பதைச் சிறந்த அம்சமாகக் கருதுகின்றேன். ஒருநாட்டின் வளர்ச்சிப் படியில் தனிமனிதனுடைய வருவாய் ஒரு சுட்டியாக இருக்கின்றது. இதை மேலும் வலுப்படுத்தப் பல முயற்சிகள் மேற்கொள்ளப்பட வேண்டுமெனக் கருதுகின்றேன். சமூகப் பாதுகாப்பு வலையமைப்பு, சமுர்த்தி வறுமை ஒழிப்புத்திட்டம், வசதியற்றவர்களை மேம்படுத்துதல் போன்ற விடயங்கள் மேலும் கவனத்தில் எடுக்கப்பட வேண்டும். ஆனால், இன்று வறுமையிலுள்ள மக்கள் தொடர்ந்தும் பாதிக்கப்பட, சமுர்த்தி ஆதாரம் பெறுவதற்குத் தகுதியில்லாத பலர் பிரதேச மட்டங்களிலே சமுர்த்தி ஆதாரத்துக்காகத் தெரிவு செய்யப்படுவதும் அவர்கள் தங்களது வாழ்க்கையை வளப்படுத்திக் கொள்வதும் எங்களுடைய நாட்டிலே ஒரு துரதிருஷ்டவசமான நிகழ்வாக இருக்கின்றது. அரசாங்கம் எதிர்காலத்தில் இந்த விடயத்தில் ஓர் இறுக்கமான நடைமுறையை ஏற்படுத்தி, உண்மையாக சமுர்த்தி பெறத் தகுதியுள்ள, வறுமைக்கோட்டின்கீழ் வாழ்கின்றவர்களை மேம்படுத்துகின்ற விதத்திலே சமுர்த்தி திட்டம் நடைமுறைப்படுத்தப்பட வேண்டியது மிகவும் முக்கியம் என நான் கருதுகின்றேன்.

தூய பசுமையான நிலைபேறான சூழல் என்ற அடிப்படையில், பல திட்டங்கள் வரவேற்கப்படுகின்றன. ஆனால், இந்தச் சுற்றாடல், சூழல் பாதுகாப்பில் இன்று ஒரு கட்டுக்கோப்பான திட்டம் எமது நாட்டிலே நடைமுறைப்படுத்தப்படவில்லை என்பதை வேதனையோடு குறிப்பிட விரும்புகின்றேன். குறிப்பாக, திருகோணமலை மாவட்டத்தில் மண் அகழ்வு, கல் உடைத்தல், காடழிப்புப் போன்ற சட்டவிரோதச் செயற்பாடுகள் அனுமதிபெற்றே நடைபெறுகின்றன. இதனால் அங்கு இயற்கைச் சூழல் பாதிக்கப்படுகின்றது. இவற்றைத் தடுத்து நிறுத்தவேண்டியது அரசாங்கத்தினுடைய முக்கிய பொறுப்பும் கடமையும் என நான் இந்த இடத்தில் வலியுறுத்திக்கூற விரும்புகின்றேன்.

அறிவினால் வழிநடத்தப்படும் திறன்வாய்ந்த சமூகத்தை உருவாக்குதல் ஒரு தொடர்ச்சியான முயற்சி. இன்று கல்வியில் பாரிய மாற்றம் ஏற்படுத்தப்படுமென எதிர்பார்க்கப்படுகின்றது. மாறிவரும் உலகப் போக்கிற்கு அமைய தொழிற்றுறைப் பயிற்சியளித்தல், தொழில்வாய்ப்புக்களை ஏற்படுத்தல் என்பன மிக முக்கியமானதென நான் கருதுகின்றேன். இன்று படித்துவிட்டு வேலையற்றிருக்கும் இளைஞர், யுவதிகளைத் தமக்கும் சமூகத்திற்கும் பயனுடையவர்களாக மாற்றியமைக்க வேண்டியது மிக முக்கிய பொறுப்பு என்று இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன். கல்வி, உயர் கல்வி ஆகியவற்றிக்கு ஒதுக்கப்படுகின்ற பணம் மிகவும் பயன்பாடுடையதாகக் கருதப்படுகின்றது.

அரச ஊழியர்களின் சம்பளம், ஓய்வூதியக்காரர்களின் ஓய்வூதியக் கொடுப்பனவு என்பவற்றில் மாற்றம் ஏற்படுத்தப்படுவது வரவேற்கக்கூடியது. புனர்வாழ்வு பற்றியும் மற்றும் பெண்கள் தலைமைதாங்கும் குடும்பங்களின் வாழ்வாதரம் பற்றியும் மேலும் கவனம் செலுத்தப்பட வேண்டும். புனர்வாழ்வு அளிக்கப்படுகின்ற ஒரு திட்டம் இருந்தாலும், இன்று உண்மையிலே புனர்வாழ்வு பெறத் தகுதியுடையவர்கள் புறக்கணிக்கப்பட்டு வருவது வேதனையைத் தருகின்றது. எனவே, அந்தத் திட்டத்தை மேலும் வலுப்படுத்த வேண்டும். யுத்தத்தினாலே பாதிக்கப்பட்ட மக்களுக்கும் புனர்வாழ்வு பெற்றிருக்கின்ற இளைஞர், யுவதிகளுக்கும் பெண்கள் தலைமைதாங்குகின்ற குடும்பங்களுக்கும் மேலதிகமாகச் சில கொடுப்பனவுகளைக் கொடுத்து, அவர்களுடைய வாழ்வாதாரத்தை உயர்த்தவேண்டியது ஒரு பாரிய பொறுப்பாக இருக்கின்றது.

திருகோணமலை மாவட்டத்தில் திருத்தியமைக்கப்பட வேண்டிய பல வீதிகள் பற்றிய விபரங்கள் அரசாங்கத்தினாலே கோரப்பட்டு, அவை தொடர்பான விபரங்கள் எங்களினாலே வழங்கப்பட்டு, அது தொடர்பான ஆரம்ப வேலைகள் ஆரம்பிக்கப்பட்டும், கடந்த 3 - 4 வருடங்களாக அவ்வேலைகள் நடைமுறைப்படுத்தப்படாமல் இருப்பது வேதனையளிக் கின்றது. எனவே, எதிர்காலத்தில் அந்த வீதிகளை குறிப்பாக, கிராம விதிகளைத் திருத்தியமைத்து, கிராமப்புற மக்களுக்குப்

[ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා]

போக்குவரத்து வசதிகளையும் ஏனைய வசதிகளையும் ஏற்படுத்திக் கொடுக்கவேண்டிய கட்டாயப் பொறுப்பும் அரசாங்கத்துக்கு இருக்கின்றது என்பதையும் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

கால்நடைகளின் அபிவிருத்தியிலே கூடிய கவனம் எடுக்கவேண்டும். இலங்கையினுடைய பொருளாதார வளர்ச்சியிலே கால்நடைகளும் முக்கிய பங்கை வகிக்கின்றன. ஆனால், இன்று கால்நடை வளர்ப்பாளர்கள் பல கஷ்டங்களை எதிர்நோக்குகின்றார்கள். கால்நடைகளுக்குப் போதுமான மேய்ச்சல் நிலம் இல்லை; நீர் வசதிகள் இல்லை; மேய்ச்சல் நிலங்களில் பாதுகாப்பு இல்லை. இந்த வகையில் கால்நடை வளர்ப்பாளர்கள் பல பிரச்சினைகளுக்கு முகங்கொடுக் கிறார்கள். எனவே, கால்நடை வளர்ப்பாளர்களுக்கு உரிய வசதி வாய்ப்புகளை ஏற்படுத்திக்கொடுப்பது தொடர்பில் கவனம் எடுக்கவேண்டி இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

**ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා**
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
இந்த வரவு செலவுத்திட்டத்தின் வெற்றி, தோல்வி அதனைச் சிறப்பாக நடைமுறைப்படுத்துவதில்தான் தங்கியிருக்கின்றது என்பதைக் குறிப்பிட்டு, எனது உரையை முடிக்கின்றேன். நன்றி. வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මැතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා.11.51]

**ගරු ජේ.සී. අලවතුවල මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்ளக, உள்நாட்ட லுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - State Minister of Internal and Home Affairs, Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මංගල සමරවීර අමාත්‍යතුමා ඉතාම අමාරු අවස්ථාවක මේ රටේ සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ජනතාවට ඉතාම වැදගත්, සමබර අය වැයක් මෙවර ඉදිරිපත් කළා. විශේෂයෙන්ම අපේ අය වැයේ පරමාර්ථය පිළිබඳව මම මතක් කරන්න ඕනෑ. "ජනතාවට ශක්තිය - දුප්පතුන්ට රැකවරණය" යන තේමාව යටතේ, ඒ තේමාවට නිවැරදි අර්ථයක් දක්වමින් එතුමා මෙවර අය වැය ඉදිරිපත් කර තිබෙනවා. විපක්ෂයේ හුඟක් දෙනා කථා කරනකොට හුවා දක්වන්න උත්සාහ කළා, "මේ අය වැය සිහින අය වැයක්. මංගල ඇමතිතුමාගේ සිහිනයක්." කියා. මෙවර අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙන ගොඩක් සිහින සැබෑ වන -යථාර්ථයක් වන- සිහින බව අපි විශේෂයෙන්ම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මතක් කරන්න ඕනෑ. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට ඒ සිහින දැක දැක සතුටු වෙන්න පුළුවන්, ඒ ආකාරයෙන් ප්‍රකාශ කර කර ඉන්න පුළුවන්. නමුත් අද රටේ ජනතාව මෙවර අය වැය සම්බන්ධයෙන් ප්‍රීතියට පත්වෙලා සිටිනවා. මෙවර අය වැය තුළ තිබෙන යථාර්ථය ඔවුන් අවබෝධ කරගෙන කටයුතු කරන ආකාරයක් අපට පෙනෙනවා.

සාමාන්‍යයෙන් අය වැයක් ඉදිරිපත් කරන්නේ වසරක අවසානයේදීයි. නමුත් අපිට මාර්තු මාසයේ අය වැය ඉදිරිපත් කරන්න සිදු වුණේ මොන හේතුව නිසාද කියන කාරණය පිළිබඳව සඳහන් කරන්න ඕනෑ. නොවැම්බර් මාසයේ 05 වැනිදා ඉදිරිපත් කරන්න තිබුණු අය වැය තමයි, මාර්තු මාසයේ 05 වැනිදා අපිට ඉදිරිපත් කරන්න සිදු වුණේ. ඒකට හේතුව මෙයයි. ඔක්තෝබර් මාසයේ 26 වැනිදා නීති විරෝධී, ව්‍යවස්ථා විරෝධී, කුමන්ත්‍රණකාරී ආණ්ඩු පෙරළියක් තුළින් අපේ රට දින 52ක් අරාජික තත්ත්වයට පත් කළා. ඒ අරාජික තත්ත්වය තුළ අපේ රට ඉතාම භයානක ආර්ථික කඩා වැටීමකට ලක් වුණා වාගේම අපේ රටේ කීර්ති නාමයට ඒ තුළින් විශාල හානියක් සිදු වුණා. නමුත් අපේ පාර්ලිමේන්තුව තුළ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා බහුතරයක් වාගේම ගරු කථානායකතුමා ඒ අවස්ථාවේදී අපට සහයෝගය ලබා දුන්නා. අධිකරණය, ව්‍යවස්ථාදායකය ගත්ත ඒ නිවැරදි ක්‍රියාමාර්ග නිසා අපට නැවත වතාවක් නීත්‍යානුකූලව, ව්‍යවස්ථානුකූලව, ප්‍රජාතන්ත්‍රවාදීව ලෝකය පිළිගත්, රටේ ජනතාව පිළිගත් ආණ්ඩුවක් දෙසැම්බර් මාසයේ 17 වැනිදා වනකොට සකස් කරන්න පුළුවන් වුණා. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා දෙසැම්බර් මාසයේ 17 වැනිදා නැවත අග්‍රාමාත්‍යවරයා හැටියට දිවුරුම් දුන්නා.

"ගම්පෙරළිය" වැඩසටහනට අපි මේ වර්ෂයේ රුපියල් මිලියන 48,000ක් වෙන් කර තිබෙනවා. පැවැති දින 52 තුළ මෙතුමන්ලා කරපු ලොකුම කාර්යය තමයි ඒ ව්‍යාපෘතිය නවත්වන්න කියා දිස්ත්‍රික් ලේකම්තුමන්ලාට, ප්‍රාදේශීය ලේකම්තුමන්ලාට චක්‍රලේඛයක් නිකුත් කළා. ඒ නිසා අපේ රටේ ජනතාවගේ යෝජනා ගණනාවක් අපට පසුගිය වසරේදී අත්හිටුවන්න සිදු වුණා. නමුත් දෙසැම්බර් මාසයේ 17 වැනිදා අපි ආරම්භ කරපු නව රජයේ පළමුවැනි කැබිනට් රැස්වීමේදීම "ගම්පෙරළිය" වැඩසටහන නැවත ක්‍රියාත්මක කරන්න යෝජනා කළා. ඒ පිළිබඳව අපි ඉතාම සතුටු වනවා. ඒ කටයුතු කිරීම සම්බන්ධයෙන් අපි අග්‍රාමාත්‍යතුමාටත්, මුදල් අමාත්‍යතුමාටත් ස්තුතිවන්ත වනවා. ලංකාව පුරාම තිබෙන සෑම කොට්ඨාසයකටම රුපියල් ලක්ෂ තුන්දාහක මුදලක් ජනතාවගේ අවශ්‍යතාව වෙනුවෙන් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම මාර්ග, විහාරස්ථාන, දේවස්ථාන වැනි ආගමික ස්ථාන, පාසල්, වැව් අමුණු ආදී මේ රටේ ජනතාවගේ ගම් මට්ටමේ, බිම් මට්ටමේ අවශ්‍යතාවලට මෙවර අය වැයෙන් යෝජනා ගණනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ වනකොට "ගම්පෙරළිය" ව්‍යාපෘතියට යෝජනා ගණනාවක් ලැබිලා තිබෙනවා. ඒ යෝජනා මේ වනකොට දිස්ත්‍රික් ලේකම්තුමන්ලාගේ මාර්ගයෙන් ප්‍රාදේශීය ලේකම්තුමන්ලාට ගිහිල්ලා, අද ඒ සැලැසුම් සකස් කරමින් තිබෙනවා. අපි මාර්තු මාසයේ අය වැය ඉදිරිපත් කරන වේලාව වනකොටත් ඔවුන් මෙවාට අවශ්‍ය ඇස්තමේන්තු සකස් කරනවා. ඒ යෝජනා සඳහා තමයි රුපියල් මිලියන 48,000ක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙන්නේ. විපක්ෂය කියනවා, "සිහින අය වැයක්" කියා.

සිහින නොවෙයි, මෙය මහ පොළොවේ ක්‍රියාත්මක වන අය වැයක්. මේ ඇස්තමේන්තුව සකස් කළාට පසුව අපි හැම කෙනාම බලාපොරොත්තු වෙනවා, 'ගම්පෙරළිය' වැඩසටහනට අදාළ වැඩ කටයුතු අප්‍රේල් මාසය වන කොට ආරම්භ කරලා මැයි, ජූනි, ජූලි මාස වන විට ඒ සියලු වැඩ කටයුතු -ඒ රුපියල් මිලියන 48,000ට ම අදාළ වැඩ කටයුතු- අවසන් කරලා එම වැඩසටහන ජනතාවට ප්‍රයෝජනයට ගත හැකිවන තත්ත්වයට පත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි යථාර්ථවාදී අය වැයක් තමයි අප ඉදිරිපත් කර තිබෙන්නේ. 'ගම්පෙරළිය' විතරක් නොවෙයි, 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' වැඩසටහන යටතේ අපේ රටේ ව්‍යවසායකයන්ට අවස්ථාව දෙන්න, අත හිත දෙන්න කටයුතු කරනවා. දැනට ක්‍රියාත්මක තත්ත්වයේ සිටින ව්‍යවසායකයන්ට සහ අලුතින් මෙයට ඇතුළු වන ව්‍යවසායකයන්ට අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' ණය යෝජනා ක්‍රමය තවදුරටත් ඉස්සරහට ගෙන යනවා. ඒ යෝජනා ක්‍රමයේ තිබූ වැඩසටහන් 12ට අමතරව වැඩසටහන් 16ක් වන කල් තවත් වැඩසටහන් එකතු කරලා අපේ රටේ අලුත් ව්‍යවසායකයන් ඇති කරන්න තරුණ තරුණියන් බොහෝ දෙනකුට අවස්ථාව ලබා දෙන්න අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ උපාධිධාරින්ට ව්‍යවසායකයන් හැටියට ඉස්සරහට එන්න අවස්ථාව ලබා දීම සඳහා අපි රුපියල් ලක්ෂ 15ක ණය ක්‍රමයක් යෝජනා කර තිබෙනවා. ණය මුදලේ ආරක්ෂාව සඳහා කිසිම දෙයක් ඉල්ලන්නේ නැතිව උපාධිධාරියාගේ ව්‍යාපෘති වාර්තාව විතරක් ඉල්ලා තමයි ඒ ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දෙන්නේ. එහිදී සියයට 100ක්ම පොලිය ගෙවන්නේ භාණ්ඩාගාරයයි. 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ ඇති බොහෝ ණය යෝජනා ක්‍රමවල අය කරන්නේ සියයට 6ක් වාගේ ඉතාම අඩු පොලියක්. ඒ ඉතිරි පොලී ප්‍රමාණයේ වගකීම භාණ්ඩාගාරය -රජය- බාර ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන්ම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මෙම අලුත් අය වැය තුළින් අපට අවස්ථා ගණනාවක් ලබා දී තිබෙනවා. විශේෂයෙන්ම විදේශගත උදවියට ලොකු සිහිනයක් තිබෙනවා, නිවසක් හදා ගැනීමේ. ඒ සිහිනය සැබෑ කර ගන්න රුපියල් මිලියන 10ක් දක්වා වන මුදලක් විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට ලබා දෙන්න යෝජනා කර තිබෙනවා. කාන්තාවන් ලක්ෂ ගණනක් විදේශගත වෙලා ඉන්නවා. ඒ අයට තිබෙන ලොකුම බලාපොරොත්තුවක් තමයි නිවසක් සාදා ගැනීම. ඒ නිසා රුපියල් මිලියන 10ක උපරිමයක් දක්වා යන්න පුළුවන් ණය යෝජනා ක්‍රමයක් අද ඒ අය වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ ණය අවුරුදු 15ක් දක්වා වන කාල සීමාවක් තුළ ගෙවන්න අවස්ථාව ලබා දී තිබෙනවා. ඒ වාගේම grace period එකක් හැටියට ඒ අයට අවුරුදු 2ක කාල සීමාවක් ලබා දී තිබෙනවා. මෙවැනි ඉතාම වැදගත් යෝජනා මේ අය වැය මඟින් ඉදිරිපත් කර තිබීම ගැන අපි බෙහෙවින් සතුටට පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කිරීමේදී අපේ රජය මුල ඉඳලාම විශේෂ සහයෝගයක් ලබා දී තිබෙනවා. අපි මතක් කරන්න ඕනෑ අපේ රජය පත් වූ අවස්ථාවේ -2015 වර්ෂයේ- කරපු වැටුප් වැඩි කිරීම ගැන. අපි උදාහරණයක් ලෙස ගනිමු කාර්යාල කාර්ය සහායකයකුගේ වැටුප. 2015 වර්ෂයේදී ඔහුට මූලික වැටුප ලෙස රුපියල් 11,730ක් ලැබුණා නම් අප එය අවුරුද්දෙන් අවුරුද්ද ඉස්සරහට ගෙනැල්ලා 2019 වන කොට රුපියල් 21,746ක් දක්වා වැඩි කර තිබෙනවා. 2020 වන කොට එය රුපියල් 24,250 දක්වා වැඩි වෙනවා. ඒ විතරක් නොවෙයි. ගුරු, හෙද වාගේ සේවාවන් ගත්තොත්, මූලික වැටුප රුපියල් 15,620 ඉඳලා රුපියල් 32,525 දක්වා වැඩි වෙනවා. ලේකම්වරයකුගේ, ඉහළ ශ්‍රේණියේ නිලධාරියකුගේ, විශේෂඥ වෛද්‍යවරයකුගේ මූලික වැටුප, 2015 වර්ෂයේදී අප ආණ්ඩුව බාර ගන්න කොට රුපියල් 47,515කින් ආරම්භ කළේ. ඔහු රුපියල් 88,423ක් ලබනවා, 2019දී. මෙය රුපියල් 98,650ක් වෙනවා, 2020දී. අපේ රජයේ කාල සීමාව වන අවුරුදු 5 තුළ අපේ සෑම රාජ්‍ය සේවකයකුගේම වැටුප අපි සියයට 107කින් වැඩි කර තිබෙනවා. ඉතිහාසයේ මෙහෙම පඩි වැඩි කරපු රජයක් තිබෙනවාද? සියයට 107කින් පඩි වැඩි කළා කියන්නේ, අවුරුදු 5 තුළ දෙගුණයකටත් වඩා එහාට ගිහිල්ලා කියන එකයි. මෙවන් අවස්ථාවක් තමයි අප රජයේ සේවකයන්ට ලබා දී තිබෙන්නේ. ඊට අමතරව, මෙවර අය වැයෙන් අපේ මුදල් ඇමතිතුමා රජයේ සේවකයන්ගේ වැටුපට තවත් රුපියල් 2,500ක් එකතු කර තිබෙනවා. ජූලි මාසයේ පළමුවන දා ඉඳලා එයත් වැටුපට එකතු වෙනවා. එය ඊළඟ අවුරුද්දේ මූලික වැටුපට එකතු කරන්න බලාපොරොත්තු වෙනවා කියා එතුමා ප්‍රකාශ කළා. මෙවැනි තත්ත්වයක් රාජ්‍ය සේවකයාට ලබා දී තිබෙන්නේ කවුද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, අපි විශ්වාස කරනවා, පෞද්ගලික අංශයේ සේවකයන්ටත් ඉදිරි කාලයේදී වැටුප් වැඩි කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මුදල් අමාත්‍යාංශයෙන් අදාළ ආයතනවලට ලබා දේවි කියා.

මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, රටේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න මේ අය වැයේ ඉතා වැදගත් යෝජනා ගණනාවක් තිබෙන බව. 2015 දී තිබුණු තත්ත්වයට වඩා තුන් ගුණයකින් අද අපි සමෘද්ධි සහනාධාරය වැඩි කරලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත් රුපියල් 1,000ක් ගත් සමෘද්ධිලාභියාට අපි දැන් රුපියල් 3,000ක් දක්වා ලබා දෙනවා. ඒ වාගේම සමෘද්ධි සහනාධාරය නොලබා ඉන්න ලක්ෂ හයක සංඛ්‍යා ලේඛන අපට ලැබී තිබෙනවා. ඒ අනුව මේ අය වැයෙන් මුදල් අමාත්‍යතුමා යෝජනා කර තිබෙනවා, සමෘද්ධි සහනාධාරය නොලැබී සිටින තවත් ලක්ෂ හයකට එය ලබා දෙන්න. මේක ඉතාමත් වැදගත් යෝජනාවක්. දීර්ඝ කාලයක් තිස්සේ සමාජ අසාධාරණයට ලක් වෙලා, එහෙම නැත්නම් දේශපාලන හේතු මත සමෘද්ධිය නොලැබී සිටි ලක්ෂ හයකටත් සිංහල අලුත් අවුරුද්දට පෙර මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වනවා. සමෘද්ධිය භාර ඇමතිතුමාත් එය ප්‍රකාශ කළා. විපක්ෂය බොහෝ වෙලාවට මේවා දකින්නේ හීන හැටියටයි. ඔබතුමන්ලාට ඒ හීනය දැක දැක ඉන්න පුළුවන්. නමුත්, රජයක් හැටියට අපි මේ යෝජනාව ක්‍රියාත්මක කර, ජනතාවට ලබා දෙන සහනයක් හැටියට සමෘද්ධි වැඩසටහන ගන්න පුළුවන්.

ආබාධිත පුද්ගලයන්ට මේ වනකොට ගෙවන්නේ රුපියල් 3,000යි. මේ මුදල රුපියල් 5,000 දක්වා වැඩි කර තිබෙනවා. මේක ඉතාමත් වැදගත් යෝජනාවක්. මේ වනකොට ආබාධිත පුද්ගලයන් 21,000කට එම මුදල ගෙවනවා. ඒ වාගේම මෙම දීමනාව ඉල්ලා තිබෙන ප්‍රමාණය අනුව පුද්ගලයන් වශයෙන් ඒක වැඩි කිරීමටත් අපි කටයුතු කර තිබෙනවා.

අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තාම අපේ රජය පසුගිය කාල සීමාව තුළ ඒ සඳහා විශාල මුදලක් වෙන්කර දිගටම ඒ කටයුතු කර ගෙන ආවා. "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ සෑම කොට්ඨාසයකම අලුතෙන් පාසල් හදන්නත්, තිබෙන පාසල්වලට අලුත් ගොඩනැගිලි හදන්නත්, ඒ වාගේම විද්‍යාගාර සහ පුස්තකාල පහසුකම් ලබා දෙන්නත් අපි කටයුතු කර තිබෙනවා. ඒ අනුව අද අපි ඒ භෞතික සම්පත් පාසල්වලට ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම "සුරක්ෂා" රක්ෂණ ක්‍රමය තුළ අද පාසල් දරුවන් ලක්ෂ 45ක් පමණ රක්ෂණය කරලා අපි ඒ ආරක්ෂාව දරුවන්ට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම වසර 13ක් පාසල් අධ්‍යාපනය ලබන වැඩ පිළිවෙළ තුළ දරුවන් සාමාන්‍ය පෙළ විභාගය නිසි ලෙස සමත් නොවුණා කියලා අපි ඔවුන්ට ගෙදර යන්න දෙන්නේ නැහැ. එම දරුවන්ට අද වෙනත් විෂය ධාරා -තාක්ෂණ විෂය ධාරා-හරහා අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාව ඇති කරලා තිබෙනවා. එවැනි කටයුතු ගණනාවක් ක්‍රියාත්මක කරන ගමන්ම, මෙවරත් තවත් මිලියන 35,000 අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙම අවශ්‍යතා සඳහා විශේෂයෙන් Smart Classroom, පුස්තකාල පහසුකම්, විද්‍යාගාර

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

පහසුකම් ඇති කිරීම සඳහා මේ අය වැයෙන් වෙන් කරලා, එම වැඩ කටයුතු තව-තවත් ඉස්සරහට අරගෙන යන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා.

ඊට අමතරව ගරු මුදල් අමාත්‍යතුමා මෙම අය වැයෙන් ඉදිරිපත් කර තිබෙන ඉතාම වැදගත් යෝජනාවක් තමයි අපේ ගම්වල ජීවත් වන දරුවන්ට තමන්ගේ දක්ෂතාව අනුව ලෝකයේ තිබෙන හොඳම විශ්වවිද්‍යාලවලට යෑමට අවස්ථාව සලසා තිබීම. ඒ කියන්නේ අපේ රට තුළ එක් එක් මාධ්‍ය තුළින් ප්‍රථම ස්ථානය ලබන දරුවන්ට ලෝකයේ තිබෙන ඉහළම විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. එහි පළමුවන වටය හැටියට දරුවන් 14 දෙනෙකුට අවස්ථාව ලබා දී තිබෙනවා. උදාහරණයක් හැටියට ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් වැනි විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලැබීමට අපේ දරුවන්ට දක්ෂතාව අනුව යෑමේ හැකියාව පළමුවැනි වතාවට අද ලබා දීලා තිබෙනවා. එතුමා ප්‍රකාශ කළා වාගේම ඉදිරියේදී දිස්ත්‍රික් මට්ටමින් වැඩි ලකුණු ගන්නා දරුවන්ට එම අවස්ථාව ලබා දීමටත්, එම කාර්යය තවත් වැඩිදියුණු කරලා ඉදිරියේදී එසේ ලබා දෙන අවස්ථා ගණන වැඩි කරන්නත් කටයුතු කරනවා. ඒක ඉතාම වැදගත් කාරණයක්.

ඊළඟට, සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම, පසුගිය කාල සීමාව තුළ රෝහල්වල තිබුණු අඩුපාඩුකම් ගණනාවකට අපි අවශ්‍ය පහසුකම් ලබා දී තිබෙන බව සඳහන් කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපි මහ රෝහල්, දිසා රෝහල්, පළාත්බද රෝහල් ගණනාවක අඩුපාඩු සකස් කරලා, ඒවාට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් විශාල ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා වාගේම, එම කටයුතු තවත් ඉදිරියට ගෙන යෑම සඳහා මේ අය වැයෙන් පවා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට අපි බෙහෙත්වල මිල සියයට 70කින් අඩු කළා. ඒ වාගේම නොයෙක් සැත්කම් සඳහා අවශ්‍ය විශේෂයෙන්ම හෘද සැත්කම් සඳහා අවශ්‍ය ස්ටෙන්ට් ආදියෙහි මිල සියයට 50කින් අඩු කරලා තිබෙනවා. ඒ වාගේම රජයේ රෝහල්වලින් ඒවා නොමිලේ ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මකවීමත්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ලබා තිබෙන ජයග්‍රහණ හැටියට අපට කථා කරන්න පුළුවන්.

පිළිකා රෝගය කියන්නේ ඉතාම අමාරු රෝගයක්. එක් පිළිකා රෝගියෙකුට රජයෙන් වියදම් කරන්නේ ලක්ෂ 15 දක්වා වූ මුදල් ප්‍රමාණයක් කියලා ඒ කාලයේ සීමාවක් තිබුණා. ඇත්තටම එම සීමාව -දරුවෙක් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් තරුණයෙක් වෙන්න පුළුවන්- ඕනෑම කෙනෙකුට තිබුණු සීමාවක්. අද වනවිට එම සීමාව අයින් කරලා එම රෝගියා ජීවත් වෙනකම්, සුව වෙනකම් එකී රෝගය සඳහා ප්‍රතිකාර කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමටත් සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කරනවා. ඒවා ඉතාම වැදගත් කාරණා හැටියටත්, මානුෂික පැත්තෙන් බලා ක්‍රියාත්මක කරන කාරණා හැටියටත් අපි සඳහන් කරන්න ඕනෑ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මෙවැනි කාරණා ගණනාවක් ක්‍රියාත්මක කරන ගමන්, විශේෂයෙන්ම ඉන්දියානු රජයේ ආධාර මත, ඉන්දියානු අග්‍රාමාත්‍යතුමා අපේ අග්‍රාමාත්‍යතුමාට ලබා දුන් යෝජනාවක් හැටියට අද රට පුරාම ඇම්බියුලන්ස් සේවාවක් ක්‍රියාත්මක කරනවා. ඒ නිසා දැනුම් දීමකින් පසුව විනාඩි දහතුනක් තරම් කෙටි කාලයක් තුළ රෝගියාගේ ගෙදරට හෝ රෝගියා ඉන්නා ස්ථානයට ඇවිල්ලා එම රෝගියා රෝහලට අරගෙන යන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. මම හිතන විධියට ඒක අද පළාත් ගණනාවක ක්‍රියාත්මක වෙනවා. ඉදිරි කාලයේ මුළු රට පුරාම එම වැඩසටහන ක්‍රියාත්මක වෙයි. ඒවා රටේ ජනතාවට ඉතාම අවශ්‍ය සේවා විධියට අපි සඳහන් කරනවා. ඒ තුළින් රෝගීන්ගේ ජීවිත ආරක්ෂා කරගන්නත් පුළුවන්කම ලැබෙනවා. මෙවැනි සේවාවක් නොතිබුණා නම්, මේ වෙනකොට ජීවිත කීයක් අපට අහිමි වෙනවාද? මේවාට ගොඩාක් දෙනෙක් විරුද්ධ වුණා. විශේෂයෙන්ම විපක්ෂයේ උදවිය වාගේම වෛද්‍ය ක්ෂේත්‍රයේ උදවියත් මේවාට විරුද්ධ වුණා. නමුත් අද රටේ ජනතාවට අවශ්‍ය ඉතාම වැදගත් සේවාවක් හැටියට මෙම ඇම්බියුලන්ස් සේවාව ක්‍රියාත්මක වෙනවා.

මේ අය වැය යෝජනාවලින් රණ විරුවන්ටත් සහන ලබා දී තිබෙනවා. අද රණ විරුවන් වෙනුවෙන් කෑ ගහපු උදවිය පසුගිය කාල සීමාව තුළ රණ විරුවන් වෙනුවෙන් මොනවාද, ක්‍රියාත්මක කළේ? අපි පැහැදිලිව කියන්න ඕනෑ, රණ විරුවන්ට ලබා දෙන ගෙවල් කුලී දීමනාව අපි මෙවර අය වැයෙන් සියයට 100කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම කොමාන්ඩෝ දීමනාව රුපියල් 1,000 ඉඳලා 5,000 දක්වා වැඩි කරලා තිබෙනවා.

රණ විරුවන් වෙනුවෙන් එවැනි යෝජනා ගණනාවක් මෙවර අය වැයට ඇතුළත් කරලා, රණ විරුවන්ට අවශ්‍ය ශක්තිය ලබා දෙන්න අපේ රජය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා. පසුගිය කාලයේ ගොඩක් දෙනෙක් කථා කළා, විදුලි පුටුව ගැන; ඒ වාගේම රණ විරු දඩයම ගැන. හැබැයි, ඔබතුමන්ලා තමයි අපේ ප්‍රධානම රණ විරුවා වන සරත් ෆොන්සේකා මැතිතුමාව කුදලාගෙන ගිහින් එතුමාට හිරිහැර කළේ. විශේෂයෙන්ම අපේ මේජර් ජනරාල්වරු, බ්‍රිගේඩියර්වරු, කර්නල්වරු ගණනාවකට පසුගිය කාල සීමාව තුළ රට හැර යන්න සිද්ධ වුණේ, ඔබතුමන්ලා කරපු හිරිහැර හා කරදර නිසායි. අපි රණ විරුවන්ට සලකන්නේ ඒ ආකාරයෙන් නොවන බව මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. රණ විරුවන්ට දිය යුතු සියලු සහන අපි ලබා දෙනවා. මෙතුමන්ලා කියපු විදුලි පුටුව යනාදී කාරණා සම්බන්ධයෙනුත් අපේ විදේශ ප්‍රතිපත්තිය තුළ අපට පුළුවන් වෙලා තිබෙනවා ජයග්‍රහණ ගණනාවක් ලබා ගන්න.

2015දී අපි මේ ආණ්ඩුව භාර ගන්නකොට GSP Plus සහනය ඇතුළු සහන ගණනාවක් අපට අහිමි වෙලා තිබුණා. අපට පුළුවන් වුණා එම සහනය පවා නැවත ලබාගෙන ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා සුරක්ෂිත කරනවා වාගේම, විශේෂයෙන්ම රටට අලුත් ආදායම් මාර්ග ඇති කර ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළට ගැනීම සඳහා මේ අය වැයෙන් අපි යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට අවශ්‍ය අවශ්‍ය මූලික පහසුකම් ලබාදෙන වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන්නත් බලාපොරොත්තු වනවා. අද අපේ රටේ දෙලක්ෂයකට වැඩි පිරිසක් මූලික සනීපාරක්ෂක පහසුකම පවා නැතිව ඉන්නවා. කිසිම භේදයක් බලන්නේ නැතිව ඒ අයට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් -වැසිකිළි පහසුකම්- ලබා ගැනීම සඳහා අවශ්‍ය සහනාධාර ලබා දීම මේ අය වැයේ තිබෙන ඉතාමත් වැදගත් යෝජනාවක් බව අපි මතක් කරන්න ඕනෑ. මූලික සනීපාරක්ෂක පහසුකම් නැතිව අපේ රටේ මේ තරම් ප්‍රමාණයක් ජීවත් වනවා කියන්නේ, ලොකු සමාජ අසාධාරණයක්. මා විශේෂයෙන්ම ඒ යෝජනාව ඉතාමත් අගය කරනවා.

මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා, අපේ රජය මෙම අය වැය යෝජනා සකස් කිරීමේදී අරමුණු කරගත් පරමාර්ථ ගැන කිව්වා. "ජනතාවට ශක්තිය සහ දුප්පතුන්ට රැකවරණය" ලබා දීම කියන තේමාවට ගැළපෙන විධියට මේ අය වැය යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම යෝජනා අප්‍රේල් මාසයේ ඉඳලා අපි ඉතාමත් සාර්ථකව ක්‍රියාත්මක කරන බව මතක් කරමින්, මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක් තිබෙනවා.

[අ.භා. 12.11]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර 71ක් රට පාලනය කළ, දැනටත් පාලනය කරන සහ තවදුරටත් ඉදිරියටත් රට පාලනය කරන්න සිහින දකින මේ මහත්වරු දෙපිරිසම ඉදිරිපත් කරලා තිබෙන අය වැය කථා සහ යෝජනා ඵලදායක නම්, ප්‍රශස්ත ලෙස භාවිතයට නැඟුණා නම්, මේ වනකොට මේ රටේ ආර්ථික, සාමාජික, සංස්කෘතික සහ දේශපාලන ක්‍රියාවලිය තිබෙන්න ඕනෑ ඉතාමත්ම ප්‍රශස්ත මට්ටමක නේද කියා මම ප්‍රශ්න කරනවා. නමුත් අද අපට පෙනෙනවා, මේ සියලු පදනම් කුණු වෙලා ඕජස් ගලන තුවාලයක් බවට පත් වෙලා තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ වැඩ කරන බහුතරයක් ජනතාව හා ඒ අයගේ දූ දරුවන්ගේ අතීතය, වර්තමානය හා අනාගතය දිහා බැලුවායින් පස්සේ ඒ අයගේ ජීවිත තෘප්තිමත්ද, සුබනම්‍යද කියලා බලන්න. එහෙම නැත්නම්, රටේ ආර්ථිකයේ පිම්ගහන වර්ධනයක් සිද්ධවෙලා තිබෙනවාද? ඒ සම්බන්ධව අපට ගැටලුවක් තිබෙනවා. රටේ සමාජ ජීවිතය යහපත්ද සංස්කෘතික හර පද්ධතීන් සුබනම්‍යද කියන එක, දේශපාලන සංස්කෘතිය සාමකාමී සහජීවනය පදනම් කරගෙන පවතිනවාද කියන එකත් ගැටලුවක්. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ, ඒ තත්ත්වයන් කිසිසේත්ම ඵලදායක ආකාරයෙන් ක්‍රියාත්මක නොවන බවයි.

මගේ පාර්ලිමේන්තු ජීවිතයේ අවුරුදු 21ක කාලය තුළත්, පාර්ලිමේන්තුවෙන් පිටත ජීවත් වූ කාලයේත් අත් දැකීම් අනුව මට දැනෙනවා, මේ ආණ්ඩු දෙකෙන්ම මෙතෙක් කල් ඉදිරිපත් කරපු හැම අය වැයක්ම භාවිතය ඉතාමත්ම අවම වෙච්ච අය වැය කථා සහ ක්‍රියාවලියක් බව.

මේ දෙපිරිසම අතීතය, වර්තමානය හා අනාගතය යන තුන් කාලයේදීම කළේත්, කරන්නේත්, කිරීමට අපේක්ෂා කරන්නේත් රටේ බහුතරයක් ජනතාව රැවටීම පමණයි, සිය රට වෙනුවෙන් දුක් ගැහැට විඳපු ජනතාවක් ලෝකයේ කිසිම රටක නැහැ කියලා මා විශ්වාස කරනවා. මොකද හේතුව, අද මේ රටේ ජනතාව මුහුණ දීලා තිබෙන ප්‍රධාන ගැටලු දෙකෙන් එකක් තමයි තමන්ගේ න්‍යෂ්ටික පවුල සහ විස්තාරික පවුල ජීවත් කරවීම. නමුත්, ඊටත් වඩා බරපතළ ප්‍රශ්නයකට ඒ ගොල්ලන් මුහුණපාලා තිබෙනවා. ඒ තමයි සියල්ල සපිරි සියල්ලෙන්ම ආඪ්‍ය වෙච්ච මේ රටේ පාලක පැළැන්තිය ජීවත් කරවන්නත්, ඒ පාලක පැළැන්තියේ දූ දරුවන්, ඔවුන්ගේ ඥාතීන් ජීවත් කරවන්නත් අද මේ ජනතාවට සිද්ධ වෙලා තිබීම. මම තමුන්නාන්සේලාගෙන් අහනවා, මේ දෙවැනි කාරණයෙන් ඔවුන්ට ලැබෙන ප්‍රතිඵලය මොකක්ද කියලා. ඒකෙන් සිද්ධ වෙලා තිබෙන්නේ වෙනත් මොකුත් නොවෙයි, මේ කැපකිරීම නිසා තමන්ගේ දූ දරුවන් සහ දෙමව්පියන් යනාදී සියලුම දෙනා මහ පාරට වැටිලා සිහමනට පත්වීම පමණයි. මුදල් ඇමතිතුමා පසුගිය සතිය තුළ ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වමින් කිව්වා, "මේ රටේ මිනිස්සු තොටිල්ලේ සිට මරණය දක්වා හැම දෙයක්ම නොමිලේ ලබා ගන්න බලාපොරොත්තු වෙනවා" කියලා. මේ වාගේ දැවැන්ත කැප කිරීමක් කරපු මේ රටේ බහුතරයක් ජනතාව වෙනුවෙන් තමයි අද මුදල් ඇමතිතුමා මේ වාගේ ඉතාමත්ම අමනෝඥ ප්‍රකාශයක් කරන්නේ. මම එය හෙළා දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019 වර්ෂය වන විට -මේ වන විට- අපේ රටේ තත්ත්වය කුමක්ද කියන එක පිළිබඳව ඔබතුමාගේ අවධානයට යොමු කරවන්න මා කැමතියි. 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා දළ වශයෙන් බැලුවොත් ප්‍රධානම නිෂ්පාදන ක්ෂේත්‍රයක් හැටියට කෘෂිකර්මාන්තයේ ආංශික දායකත්වය, එහි නිෂ්පාදනය බරපතළ ලෙස කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. 2017 වර්ෂයේ කෘෂිකර්මාන්තයෙන් රුපියල් බිලියන 1,022ක්, කාර්මික නිෂ්පාදනයෙන් රුපියල් බිලියන 3,641ක්, සේවාවලින් රුපියල් බිලියන 7,411ක් එකතුව රුපියල් බිලියන 12,074ක් මේ ක්ෂේත්‍රයෙන් ආර්ථිකයට දායක වෙලා තිබෙනවා.

2018 වර්ෂයේ අපි බැලුවොත්, කෘෂිකර්මාන්තයෙන් රුපියල් බිලියන 533යි; කාර්මික නිෂ්පාදනයෙන් රුපියල් බිලියන 1,942යි; සේවාවලින් රුපියල් බිලියන 3,837යි. එකතුව රුපියල් බිලියන 6,312යි. තමුන්නාන්සේලා කල්පනා කරලා බලන්න, කෘෂිකර්මාන්තය, කාර්මික ක්ෂේත්‍රය සහ සේවා ක්ෂේත්‍රය තුළින් දළ දේශීය නිෂ්පාදනයට දායක වීම සියයට 50කට වැඩිය කඩා ගෙන වැටිලා තිබෙනවා. 1977 වසරේදී කෘෂිකර්මාන්තයෙන් පමණක් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 30.7ක් ආර්ථිකයට දායක වෙලා තිබෙනවා. 2017 වසරේදී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 8.5 දක්වා අඩු වෙලා තිබෙනවා. තේ, රබර්,පොල්, වී යනාදිය සියයට 22.2කින් කඩා ගෙන වැටිලා තිබෙනවා. කිලෝග්‍රෑම්වලින්, මිලියනවලින්, මෙට්‍රික් ටොන් දහස් ගණන්වලින් අද මේ ක්ෂේත්‍රයේ නිෂ්පාදන බරපතළ විධියට කඩා ගෙන වැටිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ වෙළෙඳාම සම්බන්ධයෙනුත් මා ඔබතුමාගේ අවධානයට යොමු කරවන්න ඕනෑ. එක්සත් ජනපද ඩොලර් මිලියනවලින් ආනයන, අපනයන තත්ත්වය දක්වා තිබෙන්නේ මේ විධියටයි. 2015 වර්ෂයේ ආනයන වියදම ඩොලර් මිලියන 18,935යි. 2015 අපනයන ආදායම ඩොලර් මිලියන 10,547යි. වෙනස ඩොලර් මිලියන 8,308යි. සියයට 180කින් එහි වෙනස දක්වන්න පුළුවන්. ඒ වාගේම 2016 ආනයන වියදම ඩොලර් මිලියන 19,183යි. අපනයන ආදායම 10,310යි. වෙනස ඩොලර් මිලියන 8,873යි. වෙළෙඳ අනුපාතයේ සියයට 190ක වෙනසක් තිබෙනවා. 2017 වර්ෂයේ ආනයන වියදම ඩොලර් 20,980යි. අපනයන ආදායම ඩොලර් මිලියන 11,360යි. වෙනස ඩොලර් මිලියන 9,620යි. සියයට 195ක වෙළෙඳ පරතරයක් තිබෙනවා.

ඒ වාගේම 2018 වර්ෂයේ ආනයන වියදම ඩොලර් මිලියන 14,837යි. අපනයන ආදායම ඩොලර් මිලියන 7,839යි. වෙනස ඩොලර් මිලියන 6,998යි. සියයට දෙසියයක වෙනසක්. කල්පනා කර බලන්න. අපේ ආනයන එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා. පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ආයෝජන භාණ්ඩ, තෙල්, ඛනිජ ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන, රසායනික ද්‍රව්‍ය, ආහාර සහ පාන වර්ග, වාහන, වෛද්‍ය උපකරණ, බෙහෙත්, කිරිඟු පිටි ආනයනය වැඩි වෙලා තිබෙනවා. අපේ අපනයන ක්ෂේත්‍රයේ බරපතළ විධියේ කඩා වැටීමක් ඇති වෙලා තිබෙනවා. තේ, රෙදිපිළි සහ ඇඟලුම් අපනයනය බරපතළ ලෙස අඩු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා හඳුන්වා දෙන්න උත්සාහ කළේ මොකක්ද? ආනයන ආදේශ සහ අපනයන වර්ධනයක්. නමුත්, ආනයන වර්ධනයක් සහ අපනයන කඩා වැටීමක් තමයි මේ වසර ගණනාව තුළ අපේ ආර්ථිකයේ දකින්න තිබෙන්නේ.

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

ඒ වාගේම, රාජ්‍ය ණය අරගෙන බැලුවොත්, 2014 වර්ෂයේ රුපියල් බිලියන 7,390යි. 2015 වසරේ රුපියල් බිලියන 8,503යි. 2016 වසරේ රුපියල් බිලියන 9,387යි. 2017 වසරේ රුපියල් බිලියන 10,313යි. 2018 වසරේ රුපියල් බිලියන 11,052යි. 2015 වසරට සාපේක්ෂව 2016 වසර තුළ ණය ගැනීම් සියයට 10.3කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා.

ඒ වාගේම, ණය වාරික සහ පොලිය ගෙවීමට ලක් වෙලා තිබෙන්නේ මෙන්න මේ විධියට. 2014 වසරේ ණය වාරික පොලී ගෙවීමට රුපියල් බිලියන 1,076ක් වැය වෙලා තිබෙනවා. 2015 වසරේ රුපියල් බිලියන 1,317ක් වැය වෙලා තිබෙනවා. 2016 වසරේ රුපියල් බිලියන 1,352ක් වැය වෙලා තිබෙනවා. මෙන්න මේ විධියට බරපතළ ලෙස රාජ්‍ය ණය පොලී ගෙවීමට මුදල් වැය කර තිබෙනවා. ඒක බරපතළ ගැටලුවක්.

ඒ වාගේම, අපි කිව යුතුයි, රාජ්‍ය බදු ආදායම වෙනස් වෙලා තිබෙන්නේ කොහොමද කියලා. 2014 වසරේ රාජ්‍ය බදු ආදායම රුපියල් බිලියන 1,050යි. 2015 වසරේ රුපියල් බිලියන 1,355යි. 2016 වසරේ රුපියල් බිලියන 1,463යි. බදු ආදායමින් ණය වාරිකවල පොලිය ගෙවා තිබෙන්නේ මේ ආකාරයට. 2014 වසරේ සියයට 102.4යි. කල්පනා කර බලන්න. ජනතාවගේ ලේ, කඳුළු, දහඩිය උරා බොන මේ පාලකයන් ජනතාව නැති වෙන්නම බදු ගහලා ඒ මුදලින් ගත්ත ණය වාරිකවල පොලී ගෙවනවා, සංවර්ධනයට, ජනතාවගේ සුබසිද්ධියට ඵලදායක විධියට ශත පහක්වත් වෙන් කරන්නේ නැහැ.

බදු ආදායමින් ණය වාරික පොලිය ගෙවීම මෙන්න මේ ආකාරයට කර තිබෙනවා. 2014 වසරේ සියයට 102.4යි. 2015 වසරේ සියයට 97.19යි. 2016 වසරේ සියයට 92.41යි. 2017 වසරේ සියයට 90යි. 2018 වසරේ සියයට 91යි. මහජනතාව තළා පෙළා මේ ලබා ගන්නා බදුවලින් ණය ගෙවීම සහ ණය වාරික පොලී ගෙවීමයි සිද්ධ කරන්නේ. ජනතාවට, රටට යහපතක් කිරීමට මේ පාලකයන් කවදාවත් කල්පනා කර නැහැ කියන එකයි මගේ විශ්වාසය.

ඊළඟට, බදු ප්‍රතිපත්තිය ගත්තොත් එක්සත් ජනපදයේ සෘජු බදු අය කරන්නේ සියයට 92යි, වක්‍ර බදු සියයට 8යි. කැනඩාවේ සෘජු බදු සියයට 77යි, වක්‍ර බදු සියයට 23යි. මැලේසියාවේ සෘජු බදු සියයට 70යි, වක්‍ර බදු සියයට 30යි. ඉන්දියාවේ සෘජු බදු සියයට 52යි, වක්‍ර බදු සියයට 48යි. පාකිස්තානයේ සෘජු බදු සියයට 39යි, වක්‍ර බදු සියයට 61යි. ශ්‍රී ලංකාවේ සෘජු බදු සියයට 10යි, වක්‍ර බදු සියයට 90යි! කල්පනා කර බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආසියාකරයේ ඉන්දියාවට, පාකිස්තානයට, මැලේසියාවට වඩා අපි ඉතා ඉදිරියෙන් ඉන්නවා වක්‍ර බදු අය කිරීම අතින්. ජනතාව තලා පෙළා, සූරා කාලා සියයට 10ක් වූ ධනපති පන්තිය ආරක්ෂා කරන්න මේ ආණ්ඩු දෙකම දිගින් දිගටම කටයුතු කර තිබෙනවා කියන එකයි මගේ විශ්වාසය.

2018දී රුපියල් කෝටි 171,200 වූ බදු ප්‍රමාණය, 2019දී රුපියල් කෝටි 207,700 දක්වා වැඩි කරලා රුපියල් කෝටි 36,500ක අමතර බද්දක් මේ ආණ්ඩුව විසින් 2019 ඉදිරි කාලවකවානුව සඳහා ජනතාව මත පටවා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලාගේ අවධානයට මම යොමු කරනවා, මේ ආණ්ඩුව අය වැය හිඟය පියවා ගන්න අලුතින් රුපියල් කෝටි 208,000ක් ණය ගන්න බලාපොරොත්තු වෙනවාය කියන කාරණය. අනිවාර්යයෙන්ම ඒ ණය ගන්න සිද්ධ වෙනවා. ඒ ණය ගත්තාට පස්සේ 2019 වසරේ සමස්ත වියදම වන රුපියල් බිලියන 4,500න් සියයට 50ක්ම වෙන් කරලා තිබෙන්නේ ආණ්ඩුව ලබා ගත් ණය සහ පොලී වාරික ගෙවීමට පමණමයි. ඉතිරි රුපියල් බිලියන 2,250 තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි අනෙක් සියලු වැඩ කටයුතුවලට එනම් ආර්ථික, සාමාජික, සංස්කෘතික සඳහාම වෙන් කර තිබෙන්නේ. ප්‍රාග්ධන වියදම්, පුනරාවර්තන වියදම් යන මේ සියල්ලටම වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 2,250යි. අපි අහනවා, මේ දැවැන්ත ණය කන්දරාවට අපේ රට යට කරලා, ජනතාවගේ සුබසිද්ධියට කටයුතු නොකර මේ විධියට ණය ගෙව ගෙවා ඉන්න මේ ආණ්ඩුවට පුළුවන්ද කියලා. ඒ නිසා තමයි අපි කියන්නේ මේ අය වැය තනිකරම සිහින සාප්පු සංකීර්ණ, එහෙම නැත්නම් සිහින විමාන අය වැයක් කියලා. මොනතරම් කෙස් පැළෙන තර්ක ඉදිරිපත් කළත් අපි තමුන්නාන්සේලාට කියනවා, මේ අය වැයේ ඇත්ත හරය, මෙහි පදනම ණය මතම හිරවූ, ණය මතම පදනම් වූ අය වැයක් කියන එක. මේ අය වැය සියල්ල පෞද්ගලීකරණයට සහ විකිණීමට ලක් කරපු අය වැයක් මිස වෙන එකක් නොවෙයි. වරාය, ගුවන්තොටුපොළ, ඛනිජ නිධි විතරක් නොවෙයි, ජනතාවගේ පොදු වැසිකිළියත් පෞද්ගලික අංශයට විකිණීමට තමයි මුදල් ඇමතිතුමා මේ අය වැයෙන් යෝජනා කරන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ හැර වෙන මොන ආකාරයකවත් ප්‍රශස්ත යෝජනා මේ අය වැයේ නැහැ කියන එකයි අපි විශ්වාස කරන්නේ. අද මේ නිසා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පූර්ණ බිඳ වැටී තිබෙනවා.

පසුගිය වසරවල දත්ත ගත්තොත්, 2014දී අපේ ආදායම රුපියල් බිලියන 1,264යි, වියදම රුපියල් බිලියන 1,855 යි, අය වැය පරතරය රුපියල් බිලියන 591යි. 2015දී ආදායම රුපියල් බිලියන 1,515 යි, වියදම රුපියල් බිලියන 2,345යි, අය වැය පරතරය බිලියන 830යි. 2016දී ආදායම රුපියල් බිලියන 1,658යි, වියදම රුපියල් බිලියන 2,328යි, අය වැය හිඟය රුපියල් බිලියන 670යි. 2017දී ආදායම රුපියල් බිලියන 2,098යි, වියදම රුපියල් බිලියන 2,723යි, අය වැය හිඟය රුපියල් බිලියන 625යි. 2018දී ආදායම රුපියල් බිලියන 2,175යි, වියදම රුපියල් බිලියන 3,982යි, අය වැය හිඟය රුපියල් බිලියන 1,807යි. 2019දී ආදායම රුපියල් බිලියන 2,500යි, වියදම රුපියල් බිලියන 4,500යි, අය වැය හිඟය රුපියල් බිලියන 2,000යි. අපි අහනවා, මේ දැවැන්ත අය වැය පරතරය නිසා සෑම ක්ෂේත්‍රයකම ඇතිවන කඩා වැටීම නතර කරන්න පුළුවන්කමක් තිබෙනවාද කියලා. තමුන්නාන්සේලා මේ අය වැයෙන් නිෂ්පාදන ක්ෂේත්‍රය වැඩි දියුණු කරන්න, සේවා ක්ෂේත්‍රය වැඩි දියුණු කරන්න, කර්මාන්ත හා කෘෂිකර්මාන්තයේ තත්ත්වය වැඩි දියුණු කරන්න යෝජනා කරලා තිබෙන්නේ මොනවාද? ආදායම් උත්පාදනය කරන මාර්ග තුළින්, ඵලදායී ආයෝජන තුළින් ආදායම හොයාගෙන මේ අය වැය හිඟය පියවා ගන්න කිසිදු ආකාරයක යෝජනාවක් තමුන්නාන්සේලා ඉදිරිපත් කරලා නැහැ. අපි දළ වශයෙන් අය වැය පරතරය බැලුවොත් එය 2017දී සියයට 5.3ක් බවට පත් වෙලා තිබෙනවා. 2018දී එය සියයට 5ක් බවට පත් වෙලා තිබෙනවා.

2019 වසරේ මේ වියදම සියයට පහකට වඩා වැඩියි කියලා අපි විශ්වාස කරනවා. මොන තර්ක දැම්මත්, මොන කථා කළත් ඇත්ත ඒකයි. ඒ නිසා රටේ පාලකයෝ සිහින මවනවා; සිහින දකිනවා පමණයි. අය වැය පරතරය අඩු කරනවා කියලා ප්‍රකාශ කළත් යථාර්ථය නම් ඒක නොවෙයි. ඒ නිසා මේ මහා දැවැන්ත අය වැය පරතරය මේ විධියට තියෙද්දී, රටේ රාජ්‍ය නායකයන්ගේ පිළිවෙත කොහොමද කියලා අපි කල්පනා කර බලමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 වර්ෂයේ ජනාධිපතිතුමාගේ පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 1,951යි. ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 4,501යි. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් රුපියල් බිලියන 6,452ක් ජනාධිපතිවරයාගේ සුබ විහරණයට වෙන් කර තිබෙනවා.

කථාවට නම් කිව්වේ කොහොමද? කථාවට කිව්වේ, "මම ඉතාමත්ම සරල ජීවිතයක් ගත කරමින්, ආදර්ශයක් දෙමින් තමයි මේ රට වැටිලා තිබෙන අගාධයෙන් ගොඩ ගන්නේ" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 වර්ෂය දිහා බැලුවොත්, ජනාධිපතිතුමාගේ පුනරාවර්තන වියදම රුපියල් බිලියන 2,708යි. ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 7,275යි. සමස්ත වියදම රුපියල් බිලියන 9,983යි. තමුන්නාන්සේ මේ ගැන කල්පනා කර බලන්න.

ඒ වාගේම, අගමැතිවරයා ගැනත් කියන්න ඕනෑ. 2017 වසරේ අගමැතිවරයාගේ පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 770යි. ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 488යි. සමස්ත වියදම රුපියල් බිලියන 1,258යි. 2018 පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 951යි. ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 821. සමස්ත වියදම රුපියල් බිලියන 1,772ක්.

රටේ සිටින ඉහළම පුරවැසියාගේ සහ දෙවැනි පුරවැසියාගේ පැවැත්ම, ක්‍රියාකාරිත්වය, සුඛ විහරණය මෙහෙම වුණාට පසුව මැති ඇමැතිවරු ගැන කුමන කථාද? වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසම් ඒ අමාරුව!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු මන්ත්‍රීතුමනි, දිවා ආහාරය සඳහා සභාවේ කටයුතු නතර කිරීමට සිදු වනවා. දිවා ආහාර විවේකයෙන් පසුව ඔබතුමාට කථා කිරීමට විනාඩි 06ක කාලයක් ලැබෙනවා.

මේ අවස්ථාවේ සභාවේ කටයුතු පස්වරු 1.30 දක්වා අත්හිටුවනු ලබනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කථානායකතුමා (ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා) ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අත් හිටුවන විට මම කථා කරමින් සිටියේ, 2019 වසර තුළ අපි රුපියල් බිලියන 2,000ක දැවැන්ත අය වැය හිඟයකට මුහුණ දීලා තියෙද්දී, රටේ ඉහළ පුරවැසියා, දෙවැනි පුරවැසියා සහ වගකිව යුතු අනිකුත් අය ඒ වෙනුවෙන් මේ රටට මොන වාගේ පරිත්‍යාගයක් කරනවාද කියන කාරණය ගැනයි. ඒක එතුමන්ලාගේ භාවිතාව තුළ ඔබතුමාට වැටහෙයි කියා මම විශ්වාස කරනවා. පාලකයන් මුලින් ආදර්ශයක් දෙන්නේ නැත්නම්, කවදාවත් රටක් හදන්න බැහැ. එතකොට සිද්ධ වෙන්නේ කකුළුවාගේ න්‍යාය වාගේ දෙයක්. කකුළුවා ඇදේට යමින්, "මගේ පස්සෙන් කෙළින් වරෙන් පුතේ" කියා පැටියාට කියනවා. මෙතෙක් කල් අපේ රටේ පාලකයන් කළේත්, ඉදිරියට කරගෙන යන්න බලාපොරොත්තු වන්නේත් ඒ දෙයම තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය කෙරෙහි ඊළඟට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේ ආර්ථික අර්බුදය තුළ මේ වන විට මුදලේ අගය බරපතළ විධියට අඩු වෙලා තිබෙනවා. 2014දී ඩොලර් එකක් රුපියල් 131යි; 2015දී රුපියල් 143යි; 2016දී රුපියල් 148යි; 2017දී රුපියල් 153යි. 2018දී ඩොලර් එකක් රුපියල් 182 දක්වා ඉහළ නැඟ තිබෙනවා. මේ නිසා රටේ මූල්‍ය අර්බුදයක් නිර්මාණය වෙනවා. රටක මුදලේ අගය අවප්‍රමාණය වීම ආර්ථික, සාමාජයීය සංස්කෘතික, දේශපාලන කියන සෑම ක්ෂේත්‍රයකටම බලපානවා.

මේ වන විට පවුමේ අගයත් ඩොලරයට සාපේක්ෂව වැඩි වෙලා තිබෙනවා. 2017 වර්ෂයේදී එය රුපියල් 209යි; 2018දී රුපියල් 231යි. එම නිසා අපි ආනයනය කරන භාණ්ඩවල මිල බරපතළ ලෙස වැඩි වෙනවා. එය රටේ ආර්ථික ක්‍රියාවලියට වාගේම ජන ජීවිතයේ අයහපත් පැවැත්මටත් බලපානවා. මේ තුළින් විනිමය අර්බුදය බරපතළ විධියට උග්‍ර වෙලා තිබෙනවා. වෙළෙඳ ශේෂයේ පරතරයත් ඉතාම දැවැන්ත එකක්; අපට ළඟා කර ගන්න නොහැකි එකක්. ඒ වාගේම ගෙවුම් ශේෂය මත ඇති කරන පීඩනය තවදුරටත් එන්න එන්නම ඉහළ යනවා. ඒ වාගේම අනෙකුත් විනිමය ආදායම් ප්‍රමාණවත් නොවීම නිසා -විදේශ ශ්‍රමික ප්‍රේෂණය අඩු වීම නිසා- අපේ ආර්ථික අර්බුදය ඉදිරියට වර්ධනය වෙනවා මිස, අපට එයින් ගොඩ එන්න පුළුවන්කමක් නැති වෙනවාය කියන එක පාලකයන් තේරුම් ගත යුතුයි.

ඊළඟට අපි කොටස් වෙළෙඳපොළේ පිරිවැටුම අරගෙන බලමු. 2015 වර්ෂයේදී එය රුපියල් මිලියන 253,251යි; 2016දී රුපියල් මිලියන 176,935යි; 2017දී රුපියල් මිලියන 220,591යි; 2018දී රුපියල් මිලියන 130,070යි. මේ අනුව බැලුවාම, කොටස් වෙළෙඳපොළේ මිල කොයිතරම් අඩු වී තිබෙනවාද කියා අපට පෙනෙනවා. කොටස් වෙළෙඳපොලේ මිල අඩු වීමෙන් එය කොයි තරම් දුරට ආර්ථිකයට බලපානවාද යන්න අවබෝධ කර ගත යුතුමයි. එය බරපතළ විධියේ ආර්ථික අර්බුදයක් මතු කරනවා. කොටස් වෙළෙඳ කඩා වැටීම කියන්නේ ආර්ථිකයේ කඩා වැටීම බව තේරුම් ගත යුතුයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තමයි තිබෙන්නේ.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩි දෙක තුනක් දෙන්න.

2013දී උද්ධමන වේගය සියයට 7යි; 2016දී එය සියයට 4යි; 2017දී සියයට 6.6යි. 2018දී සියයට 4.4 යි. මේක බොරුවක්. ඇත්ත උද්ධමන වේගය මෙය නොවෙයි. එම නිසා මේ උද්ධමන වේගය අඩු වෙන්න, තිබෙන සංවර්ධනය මොකක්ද කියන එක ගැටලුවක් වෙනවා.

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

"ගම්පෙරළිය" වැඩසටහනට රුපියල් මිලියන 48,000ක් වෙන් කර තිබෙනවා. එම වැඩසටහනේ ප්‍රගතිය මොකක්ද කියා මම ආණ්ඩුවෙන් අහනවා. ඒ වගේම ග්‍රාමීය පාසල්වල දරුවන්ගේ පෝෂණය සඳහා කිරි වීදුරුවක් ලබා දීමට ලොකු මුදලක් වෙන් කර තිබෙනවා. කිරිවලට වඩා සහල් කැඳවල පෝෂණ ගුණයක් තිබෙනවාය කියා වෛද්‍යවරුන්ගේ සංගමය කිව්වා. සහල් කැඳ දරුවන්ට දීම වඩා ඵලදායකයි කියායි ඔවුන් පැහැදිලි කරන්නේ. ඊළඟට, ලක්ෂ 10කට වැසිකිළි පහසුකම් නැහැය කියා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට රුපියල් බිලියන 4ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ලක්ෂ 6කට අලුතෙන් සමෘද්ධි සහනාධාර ලබා දීමට මෙවර අය වැයෙන් යෝජනා කර තිබෙනවා. දැන් හරි ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තටම අලුතින් ලක්ෂ 6ක පිරිසකට සමෘද්ධිය දෙන්න ඕනෑ නම්, එතැන ලොකු ගැටලුවක් නේ තිබෙන්නේ. අපේ ආර්ථිකයේ විශාල කඩා වැටීමක් තිබෙනවාය කියන එකයි ඒකෙන් පෙනෙන්නේ. ඒ කියන්නේ, මිනිස්සු හිඟන්නෝ බවට පත් වෙන එක, අඩු ආදායම්ලාභීන් බවට පත් වෙන එක ආර්ථිකයේ දියුණුවක් නොවෙයි නේ. ආර්ථිකය බිඳ වැටිලා තිබෙනවා. එම නිසා ආර්ථිකය සම්බන්ධයෙන් ලොකු ගැටලුවක් තිබෙනවා. ඊළඟට බල්ලන් වන්ධ්‍යාකරණය සඳහා රුපියල් මිලියන 100ක වෙන් කර තිබෙනවා.

මේ ඔක්කොටම වඩා, අද රැකියා නැති උපාධිධාරීන් 57,000ක් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ පිරිසෙන් 1,000ක් පුහුණු කිරීමට වෙන්කර තිබෙන්නේ රුපියල් මිලියන 300ක් විතරයි. අද උපාධිධාරීන් බල්ලෝ බළල්ලු ගණනටත් වඩා, වැසිකිළිවල ගණනටත් වඩා පහතට දමා තිබෙනවා. මේ වාගේ අපරාධ කරන්න එපාය කියා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන්, මෙන්න මේ කාරණය මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ මහා ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න තමුන්නාන්සේලා කිසිදු ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කර නැහැ. ඒ වෙනුවෙන් අතීත ක්‍රියාමාර්ග අනුමනය කරමින්, අර්බුදය විසඳීමට ජනතාවටම වගකීම පවරා දෑත් බැඳගෙන ඉඳීමක් තමයි අපට දකින්න ලැබෙන්නේ. අද සියල්ල විකිණීම, බදු, දඩ, ණය කියන දේවල් ආදායම් මාර්ග බවට පත් කර ගෙන කටයුතු කිරීමයි දකින්න ලැබෙන්නේ. අතීත ක්‍රියාමාර්ග අනුගමනය කරමින්, මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්නට උත්සාහ කරනවා. ඒක, "ගහට ඉණි කැපීම සමානයි" කියලා තමයි අපට කියන්න වන්නේ. තමුන්නාන්සේලා දෙපිරිසම වැඩ ආරම්භ කළේ, " සිරිලක දේ සිරි සැප දේ" කියන තේමා පාඨය යටතේයි. දැන් භාවිතය සිරිලක දෙය නොවෙයි. එය දැන් "පිටරට දේ සිරි සැප දේ කියන" තේමා පාඨයට මාරු වෙලා තිබෙනවා.

මෙන්න මේ අමනෝඥ ප්‍රතිපත්තිය නිසා බුදියන පැදුර විතරක් නොවෙයි, බිමට එළාගන්නා රෙදි කෑල්ලත් ගේන්න වෙන්නේ පිට රටින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මෙම අය වැය, තනිකරම බහුතරයක් ජනතාව මුළා කරන, පොරොන්දු සියල්ල කඩ කරන ''වත්ත බද්දට දීලා ඇස්සට දත නියවන'' වාගේම, ''ගඟෙන් වතුර බීලා මුහුදට ආවඩන'' නරුම එකක් බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.38]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - State Minister of Mahaweli Development and Environment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019 වර්ෂයේ අය වැය ගැන කථා කරන මේ විවාදයට එක්වෙලා, අදහස් ප්‍රකාශ කිරීමට මට අවස්ථාව ලබාදීම ගැන මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

වැටී තිබුණු මේ රට ගොඩ නැඟීමට, බොහොම පරිස්සමෙන්, ක්‍රමානුකූලව, පියවරෙන් පියවර ඉදිරියට යන සැලැස්මක් ඉදිරිපත් කිරීම ගැන අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාටත් අප ස්තුතිවන්ත වෙනවා. මොකද, අපි මේ ආණ්ඩුව භාර ගන්නකොට කොහොම ආණ්ඩුවක්ද, කොහොම රටක්ද තිබුණේ කියා අපි දන්නවා. ජනතාව අවුරුදු 12කට බලය දුන් රජ්ජුරුවෝ රටේ ණය ගෙවාගන්න බැරිව රට දමලා පැනලා දිව්වා. ගෘහ මූලිකයා ණය වෙලා, ණය වෙලා, ඒ ණය ගෙවා ගන්න බැරි වෙලා, ආදායම් මාර්ග නැති වෙලා කර ගන්න දෙයක් නැති වුණාම සිය දිවි නසා ගත් සිද්ධීන් අපි ඕනෑ තරම් අසා තිබෙනවා. අන්න ඒ වාගේ දෙයක් තමයි මේ රටට වෙලා තිබුණේ. පාලකයා රටේ මිනිසුන් උකසට තියලා ණය වෙලා ඉන්නවා. නමුත් තමන්ගේ නෑදෑයෝ ටික හොඳට ඉන්නවා; ඒ අය කෝටිපතියෝ වෙලා ඉන්නවා. රටේ ජනතාව උකසට තියලා, ණය වෙලා, ඒ ණය ගෙවා ගන්න බැරි වුණාම මේ අය මොකක්ද කළේ? අර සාමාන්‍ය මිනිසුන් තමන්ගේ පෞද්ගලික ණය ගෙවා ගන්න බැරි වුණාම සිය දිවි නසා ගන්නවා වාගේ, මේ අය ඡන්දය දුන් ජනතාවයි, බලාපොරොත්තු දුන් ජනතාවයි, "තව අවුරුදු 12ක් රට කරපන්" කියලා කියද්දී, අවුරුදු දහයෙන් රට දමලා පැනලා ගියා.

එහෙම ආණ්ඩුවක්, රටක් භාරගෙන ක්‍රමානුකූලව අය වැය ඉදිරිපත් කරමින්, විවිධ ක්‍රමවේද හදාගෙන, වෙනස්කම් කරගෙන, විවිධ බාධකවලට, විවේචනවලට, අපවාදවලට ලක් වෙමින් අද මෙවන් ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීම ගැන, පරිස්සමෙන් කටයුතු කිරීම ගැන -විශේෂයෙන් ඉවසීමෙන් කටයුතු කිරීම ගැන- අපි රජයට ස්තුතිවන්ත වෙනවා.

මෙතුමන්ලා පසුගිය කාලයේ මොනවාද කළේ? එතුමන්ලාගේ සැලසුම් තිබුණේ මොනවාටද? එක්කෝ වරාය හැදුවාය කියලා කියාවි. ඒක මේ වෙලාවේ අපට වැඩක් තියෙන දෙයක්ද? අන්තිමට අපට ඒක ගොඩ නඟාගන්න සිද්ධ වුණා. ඒ කාලයේ රුපියලකවත් ආයෝජන මේ රටට ආවාද? නැහැ. කෝටි ගණන්වලින් ණය ගත්තා. වරාය හැදුවා. ඒක රටට අත්‍යවශ්‍ය දෙයක් නොවෙයි. විදුලි බලාගාර හැදුවා. නමුත් ඒවා හැම දාම කැඩිලා. ඒවා රටට බරක් වුණා. වර්තමානය වන විට ඒවා යන්තම් ඒ වැඩකටයුතු ටික විතරක් කරගෙන යන්න පුළුවන් ආකාරයට හදා තිබෙනවා. ගුවන් තොටුපළවල් හැදුවා. හැබැයි, ගොවියාගේ වී ටික ගබඩා කර ගන්න තැනක් නැහැ. අන්තිමට අපිට ආණ්ඩුව භාරගෙන ගොවියාගේ වී ටික ගුවන් තොටුපළවල වවුලන් ලගින ගබඩාවලට දමන්න සිදු වුණා. එහෙම ආර්ථිකයක් තිබුණු රටක් මෙක. අද අපි විනිවිදභාවයකින් යුතුව කටයුතු කරලා මේ හැම දෙයක්ම යම් මට්ටමකට අරගෙන ඇවිත් තිබෙනවා.

අපි රජය කරනකොට, ඒ අඩු පාඩු ඕනෑ තරම් විවේචනය කරන්න අද අපි ඉඩ දීලා තිබෙනවා. එදා ඒ අඩු පාඩු විවේචනය කරන්න පුළුවන්කම තිබුණාද? රට කරවන ආකාරය ගැන කථා

කරන්න කාටවත් පුළුවන්කම තිබුණාද? එදා මේ රටේ සුදු වෑන් සංස්කෘතියක් බිහිවෙලා තිබුණා. උදේට දකින මිනිහා රෑ වෙනකොට නැහැ. රටේ වංචාවක් ගැන, දූෂණයක් ගැන මාධ්‍යයක පළ වුණා නම්, එළි වෙනකොට ඒ පත්තර වාර්තාකාරයා නැහැ; පත්‍ර කර්තෘවරයා නැහැ. ඔහු මහදී මරා දමලා. "නාඳුනන තුවක්කුකරු විසින් මරා දමන ලදී" කියලා තමයි කියන්නේ. එහෙම නැත්නම් ප්‍රසිද්ධියේ ගිහින් ඒ මාධ්‍ය ආයතනයට ගිනි තැබුවා. එහෙම බලහත්කාරයෙන්, පීඩනයක් තුළින් රට පාලනය කළ කාලයක් තිබුණා. මේ රටේ ජනතාවට ඒ කාලය මතක ඇතැයි කියා අපි හිතනවා. එහෙම කටයුතු කළ පාලකයන් අද පන්සල් ගණනේ ගිහින් විවිධ කථා කියමින්, පුරසාරම් දොඩවනවා; තමන් ඒ කාලයේ පාලනය කළේ කොහොමද කියා මතක නැහැ වාගේ කථා කරනවා.

එදා පොඩි දරුවා වඩාගෙන සුරතල් කරනවා. එතකොට ඒ දෙමව්පියෝ හිතනවා, "අනේ මේ අප්පච්චි දරුවන්ට හරි ආදරෙයි නේ" කියලා. අනේ! දරුවා බිමින් තියන්න ඉස්සෙල්ලා කිරි පිටි මිල වැඩි වෙලා. නමුත් අපේ ආණ්ඩුවට පුළුවන්කම ලැබුණා, මෙවර අය වැයෙනුත් කිරි පිටි මිල එදා තිබ්බාට වඩා අඩුවෙන් පවත්වාගෙන යන්න. දරුවෝ වඩා ගත්තේ නැති වුණාට, දරුවන් බොන කිරි පිටි මිල අඩු කර පවත්වාගෙන යෑමේ හැකියාව අපට තිබුණා. මම කිව්වේ ඒකයි. ෂෝ එකක් නැති පාලනයක් වුණාට ෂෝ එකක් නැතිකම ආණ්ඩුවක් වශයෙන් අපට පාඩුයි. අපි ආණ්ඩුවක් විධියට කරන වැඩ පෙන්වන්නේ නැහැ. කරන වැඩ කියමින් කෑ ගහන්නේ නැහැ. කරන වැඩ ප්‍රචාරය කරන්න සල්ලි වියදම් කරන්නේ නැහැ. නමුත්, අපි අවශ්‍ය වැඩ කරගෙන ඇවිල්ලා ඒ දරුවන්ව ආරක්ෂා කර තිබෙනවා. දැන් මෙතුමන්ලා බදු ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාටත් මතක ඇති එදා දෙදෙනෙක් කසාද බඳින්න ඕනෑ නම්, රුපියල් 5,000ක ගාස්තුවක් ගෙවන්න ඕනෑ කාලයක් තිබුණු බව. මේ අයට අද ඒවා අමතකයි. ජෝඩුවකට කසාද බඳින්න රුපියල් 5,000ක ගාස්තුවක් ගෙවන්න ඕනෑ. එවැනි රටක් එදා තිබුණේ. අද අපි ඒවා නැති කර දමා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ජෝඩුවක් කසාද බැන්දාට පස්සේ අවුරුදු 25කින් අඩු පොලියට ගෙවන්න පුළුවන් විධියට ගෙයක් හදාගන්න ණය දෙන වැඩසටහනක් නිර්මාණය කර තිබෙනවා.

අලුතින් යුවලක් කසාද බැන්දාට පස්සේ ඒ කසාද සහතිකය ඉදිරිපත් කර තමුන්ගේ ගේ නිර්මාණය කරගන්න, තමුන්ගේම කියා ගෙයක් හදා ගැනීමට අවශ්‍ය ණයක් ගන්න පුළුවන් වාතාවරණය අපි මෙවර අය වැය තුළින් නිර්මාණය කර දීලා තිබෙනවා. ඒකයි මම කිව්වේ, "මෙවර අය වැය පාරවල් හදන එකක් නොවෙයි." කියා. පාරවල් හදන ඒවාත් තිබෙනවා. මෙවර අය වැය රටට අත්‍යවශ්‍ය දේවල් පැත්තකට දමා, විදුලි බලාගාර හදන, ගුවන් තොටුපොළවල් හදන සංවර්ධන අය වැයක් නොවෙයි. මේ අය වැය රටේ ජනතාව ගැන දැඩි විශ්වාසයක් තියලා, රටේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්නේ කොහොමද කියා හිතලා ඉදිරිපත් කරපු අය වැයක් බව මම සතුටින් කියනවා. අන්න ඒ විධියේ අනාගත දැක්මක් තුළ, අනාගත ගමන් මාර්ගයක් තුළ අපි වැඩ කරගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මෙතුමන්ලා අපට කියනවා, "මහ බැංකුව කැඩුවා." කියා. අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තා අනුව 2008 ඉඳලා මහ බැංකුවේ හොරකම් කරගෙන ආවා කියා. අපට චෝදනා කරන්න පුළුවන් වෙන්නේ කොහොමද? මහ බැංකුවේ හොරකම අපි 2015 නැවැත්තුවා කියායි. 2008 ඉඳලා කරගෙන ආපු මහ බැංකු හොරකම 2015දී අපි නැවැත්තුවා. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව අනුව 2015දී බිලියන 11ක වංචාවක් සිද්ධ වුණා කියා සඳහන්ව තිබෙනවා. නමුත්, 2008 අවුරුද්දේ ඉඳලා කරපු වංචාවල ප්‍රමාණය බිලියන 290 පැනලා. ඒ ගැන කථා කරන්නේ නැහැ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට point එකක් නැහැ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Point එකක් නැති වෙන්න මම කරුණු පැහැදිලි කරන්න එපෑ යි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විමසීමක් කරනවා. මෙතුමා කිව්වා, "2008 ඉඳලා මහ බැංකුව කැඩුවා." කියා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
එහෙම නම්, 2008 ඉඳලා හොරු අල්ලන්න එපෑ යි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් මාන්නප්පෙරුම රාජ්‍ය ඇමතිතුමා කතා කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මම ඒකට උත්තර දෙන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒකට උත්තරය දෙන්නම්. ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉඳගන්න. -[බාධා කිරීමක්]- නැහැ, උත්තර දෙනවා. හොරු අල්ලන එක දිහා බැලුවොත්, මේ රටේ අධිකරණය,-[බාධා කිරීමක්]-

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඔය කෑ ගහන්නේ ඇලෝසියස්ගේ සල්ලි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඇලෝසියස්ගේ සල්ලි තමයි ඔබතුමන්ලා මෙපමණ කල් අරගෙන හිටියේ. ඔබතුමන්ලා මෙපමණ කල් ඇලෝසියස්ගේ සල්ලිවලින් තමයි දිව්වේ. 2015දී මහ බැංකු හොරකම නැවැත්තුවේ අපියි. 2015න් පස්සේ මහ බැංකුවේ හොරකම් වුණා ද? ඔබතුමන්ලා ඇලෝසියස් සමඟ දීග කාලා, 2008 ඉඳලා හොරකම් කළා. ඔය වාගේ හොරකම් කරගෙන ආපු එක තමයි 2015දී අපි නැවැත්තුවේ. 2015දී මහ බැංකුවේ සිද්ධ වුණු හොරකම බිලියන 11යි. ඔබතුමන්ලාගේ කාලයේ බිලියන 295යි. 2016දී මහ බැංකුවේ හොරකම් වුණා ද? 2017 හොරකම් වුණා ද? නැහැ නේ. හොරකම නැවැත්තුවේ අපියි. නමුත්, අවලාද, අපවාද අපි විඳිනවා. හොරකම නැවැත්තුවාම ඔය වාගේ හොරුන්ගේ සල්ලිවලින් ඔබතුමන්ලා කෑ ගහනවා. මාධ්‍ය අරගෙන අපට මඩ ගහන්නේ ඔය සල්ලිවලින්. ඒ විධියට බැලුවාම අපට මාධ්‍ය නැහැ, අපි දුප්පත්. ඔයගොල්ලන්ට කළු සල්ලි තිබෙනවා. ඒ නිසා තමයි සල්ලි කොහෙන්ද කියා ඇහුවාම, ඩේසි ආච්චි මැණික් මල්ලක් දුන්නයි කියා කිව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගොල්ලන්ගේ ගෙවල්වලට හොරු එනකොට ඒ හොරා මැණික් මල්ලකුත් අරගෙනයි එන්නේ. ඒ මැණික් මල්ල මේ අයගේ ගෙදර දමා යනවා. හොරා මැණික් මල්ලක් අරගෙන ඇවිල්ලා මේ ගොල්ලන්ගේ ගෙදර දමා ගිහිල්ලා. අනේ! කොහොමද සල්ලි හම්බ වුණේ? මම ඔබතුමාට කියන්නම්, හොරු බේරෙන්නේ කොහොමද කියා. ඒ පිළිබඳව හොඳ ඉතිහාස කථාවක් තිබෙනවා. එදා මිනීමරලා, "ගොයම් කොළයට මුවා වෙලා ඉඳලා වෙඩි තැබුවා." කිව්වාම, ගොයම් කොළයට මුවා වෙලා කොහොමද මිනී මරන්නේ කියා එදා කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා ගොයම් කොළයක් පෙන්නලා ඇහුවා. එතුමා ඇහුවා, ගොයම් කොළයකට මුවා වෙලා කොහොමද වෙඩි තියන්නේ කියා. එතැනින් නඩුව කඩලා ගියා. ඒ වාගේ තමයි මේ හොරු. ඩේසි ආච්චිගේ මැණික් මල්ල පෙන්වලා හොරකමින් බේරෙනවා. නීතියේ තිබෙන දුර්වල තැන්වලින් රිංගනවා. අයිතිකාරයෝ නැති ඉඩම් තිබෙනවා. අපේ පැත්තේ මිලියන 22ක් වටිනා අයිතිකාරයෙක් නැති ඉඩමක් තිබෙනවා. ඔන්න, නඩුවලින් රිංගන හැටි. රිංගන්න පුළුවන් හිල් බලලා නඩුවේදී ඒවායින් රිංගනවා. අපි ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක්. මිනීමරුවා කියා දැන දැනත් කොල්වින් ආර්. ද සිල්වා මහත්මයා ඒ නඩුව පැරැද්දුවා.

විනිශ්චයකාරතුමාත් දන්නවා, මිනීමරුවා කියා. නමුත් ගොයම් කොළය පෙන්වලා මේකට මුවා වෙලා කොහොමද වෙඩි තියන්නේ කියා ඇහුවාම නඩුව පැරදුණා. අන්න ඒ වාගේ තමයි ඔබතුමන්ලාත්, ඒ නඩුවේ තිබෙන හිල් හොඳට බලලා රිංගනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගෙවල්වලට හොරෙක් ආවොත් තිබෙන දේත් උස්සගෙන යනවා. විපක්ෂයේ සිටින උදවියගේ ගෙවල්වලට හොරු ආවාම මැණික් මල්ලක් දමා යනවා. සල්ලි හම්බ වුණේ කොහොමද කියා ඇහුවාම හොරෙක් ඇවිල්ලා මැණික් මල්ලක් දමා ගියා ලු. අපේ ගෙදරට හොරෙක් ආවාම, මැණික් ටික අරගෙන යනවා. ඉඩම් අයිතිකාරයන් නැහැ, නම් නැහැ. අන්න, බියගම මාලිගයක් ගහලා තිබෙනවා. ඒකට අයිතිකාරයෙක් නැහැ. අයිතිකාරයෙක් සිටිනවා කියා ඔක්කෝම දන්නවා. නඩුකාරයත් දන්නවා. නමුත් නීතියේ තිබෙන දුර්වලතා අනුව අපට දඬුවම් දී ගන්න බැරි වෙලා තිබෙනවා. අපේ රටේ නීතිය දුර්වල වෙලා තිබෙනවා.

නීතිය මකුළු දැලක්. ශක්තිමත් දැලක් නොවෙයි. දූෂණ විරෝධී කමිටුවේ සභාපතිවරයා වශයෙන් මම වග කීමෙන් කියනවා, අපි ඒ නීතිය ශක්තිමත් කළා; ඉදිරියටත් තවත් ශක්තිමත් කිරීම සඳහා සියලු යෝජනා ඉදිරිපත් කර තිබෙනවා කියා. ඒවා ක්‍රියාත්මක කර තිබෙනවා. ඉස්සරහට ඔය සෙල්ලම් කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. මෙතුමන්ලා එදා මොනවාද කිව්වේ? කොහොමද ඔය නඩුවලින් බේරෙන්නේ? යාළුවෙක් තෑග්ගට දුන්නා ලු, කෝටි ගණනක දේපළක්. යාළුවා තෑග්ගට දීලා ගියා. බැලුවාම ඒ යාළුවා මැරිලා. කාගෙන්ද අහන්නේ? ඔන්න ඔය වාගේ නීතියේ තිබෙන අඩු පාඩුවලින්, හිල්වලින් රිංගන්න ඒ ගොල්ලන් දන්නවා. ඒ හිල්වලින් රිංගන ගමන් අපෙන් අහනවා, "හොරු ඇල්ලුව දෙ" කියා. ගොයම් කොළයට මුවා වෙලා වෙඩි තියපු මිනීමරුවා අර නෑදෑයන්ගෙන් අහනවා, "ඇල්ලුවාද මාව." කියා. "ගොයම් කොළයට මුවා වෙලා කොහොමද වෙඩි තියන්නේ." කියා උසාවියේදී අහනවා. එළියට ඇවිල්ලා අහනවා, "ඇල්ලුවාද මාව." කියා.

අන්න ඒ වාගේ කථාවක් තමයි අපේ ගරු සොයිසා මන්ත්‍රීතුමා කියන්නේ. ඔබතුමා හොරෙක් නොවෙයි. ඔබතුමා බොහොම වටිනා මන්ත්‍රීවරයෙක්; අවංකයි. නමුත් ඔබතුමාගේ විපක්ෂයේ සිටින නායකයෝ ලෝක හොරු. ඒ හොරුන්ව ආරක්ෂා කරන්න කටයුතු කරන්න එපා කියා මම කියනවා. අපි එකතු වෙමු. ඔබතුමාත් හොඳ මන්ත්‍රීවරයෙක්. හොඳ මිනිස්සු එකතු වෙමු. හොරුන්ව පරාජය කරමු. හොරුන්ව පන්නමු. ඔබතුමා එන්න අපිත් සමඟ වැඩ කරන්න. හොඳ මිනිස්සු එකතු වෙලා ඒකාබද්ධ ආණ්ඩුවක් හදා ගනිමු. අපි ඔවුන්ට ආරාධනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැය ගැන අපේ ගලප්පත්ති මන්ත්‍රීතුමා කිව්වා, මේකේ ආදායම් උපයන විධි නැහැ කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ වර්තමාන අර්බුදය ඉස්සරහ ඩොලර් තමයි අපට හොයන්න වෙන්නේ. විදේශ සල්ලි හොයන්න වෙන්නේ. අපි විදේශ සල්ලි හොයන්න නම් අපට ආයෝජන අවශ්‍යයි. ආයෝජන හදන්න සිංගප්පූරු ගිවිසුම ගැහුවාම මේ සහෝදරයෝ උද්ඝෝෂණය කරනවා, "සිංගප්පූරු ගිවිසුම අපට එපා." කියා. හේතුව මොකක්ද කියා ඇහුවාම කියන්න හේතු නැහැ. හැබැයි, "විදේශ ව්‍යාපාර මෙහාට ගෙනෙන්න එපා. අපේ රටේ ඉඩම් බදු දෙන්න එපා." කියා අපට කෑ ගහනවා. එහෙම කරන්නේ නැතුව විදේශ ආයෝජන ලංකාවට ගෙනෙන්නේ කොහොමද? ඇයි ඒවා හිතන්න බැරි? රටේ තිබෙන අභියෝගවලට මුහුණ දෙන්න අපි කටයුතු කරද්දී ඇයි ඒවාත් සමඟ එකතු වෙන්න බැරි? ඒකේ අඩු පාඩුවක් තිබෙනවා නම් ඒවා හදාගෙන වැඩ කරනවා මිසක් ඒකට විරුද්ධව වැඩ කරන්නේ කොහොමද?

හම්බන්තොට වරාය ආශ්‍රිත කර්මාන්තශාලා හදන්න පැවැත්වූ උත්සවය වෙලාවේදී හිටපු ජනාධිපතිතුමා මොකක්ද කළේ? පන්සල්වලට ගිහිල්ලා කිව්වා, "ස්වාමීන් වහන්ස, පන්සල ඩෝසර් කරන්නයි යන්නේ. චීන ජාතිකයන්ට ඉඩම් දෙන්න යන්නේ." කියා. ගෙවල්වල මිනිසුන්ට ගිහින් කිව්වා, "දැන් මේ ගෙවල් ඉවරයි. අක්කර 20,000ක් දෙන්න යන්නේ." කියා. බලපුවාම එක පන්සලක්වත් කැඩෙන්නේ නැහැ. රජයේ ඉඩම් කර්මාන්තශාලා බවට පරිවර්තනය කරන්නේ. මෙහෙම වැඩ කරද්දී කොහොමද රටක් දියුණු කරන්නේ? හැබැයි, ඒ අභියෝගවලට මුහුණ දෙන්න අපට ශක්තිමත් හයියක් තිබෙනවා. අපි ඒවාට මුහුණ දීලා වැඩ කටයුතු කරගෙන යනවා. අද වෙනකොට ක්‍රමක්‍රමයෙන්, ක්‍රමක්‍රමයෙන් අපි ඒ අභියෝග ජය ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ රට යම් තැනකට ගෙනාවා. අවුරුදු 12ක් ජනතා වරම ලැබූ නායකයා, පාලකයා එදා ආණ්ඩුව කරන්න බැහැ කියා ආණ්ඩුව දමා ගෙදර ගියා. ඒ ගෙදර ගියේ බැරි නිසායි. අපි ඒක කරගෙන ඇවිල්ලා යම් තැනකට ගෙනෙනකොට මොකක්ද කළේ?

එදා, "බැහැ." කියා ගිය මිනිහා 2018 අගවනකොට පිටිපස්ස දොරෙන් ඇවිල්ලා බලය ගත්තා. එදා ආණ්ඩුව කරගන්න බැහැ. ණය ගෙවා ගන්න විධියක් නැතුව පැනලා ගිය මනුස්සයා හොර පාරෙන් ඇවිල්ලා බලය ගත්තා. ඒකයි අපට මේ මාර්තු මාසයේ අය වැය ඉදිරිපත් කරන්න සිදු වුණේ. මේක තමයි රට කරවන ලියවිල්ල. රට කරවන, රටට මුදල් වියදම් කරන, රටේ යන ගමන් මාර්ගය පැහැදිලි කරන ලියවිල්ල තමයි අය වැය. ඒක ඉදිරිපත් කරන්න ඕනෑ පසු ගිය අවුරුද්දේ අග, දෙසැම්බර් මාසයේ. නමුත් අපට ඒක කර ගන්න බැරුව ගියා.

මාර්තු වන තෙක් අපට මේක ඇදගෙන යන්න සිද්ධ වුණේ ඇයි? ව්‍යවස්ථා විරෝධී විධියට, ප්‍රජාතන්ත්‍ර විරෝධී විධියට හොර පාරෙන් බලය ගන්න ගිය නිසායි, මේ රට යම් දුරක් පස්සට ගියේ, මේ අය වැය පස්සට ගියේ කියන එක මා විශේෂයෙන් කියනවා. ඒකයි මා කිව්වේ, රට හදන්න අපි සියල්ලන්ම එකතුවෙලා වැඩ කරන්න ඕනෑය කියලා. දේශපාලනය කරන වෙලාවට අපි දේශපාලනය කරමු. නමුත් රට හදන්න අපි එකතු වෙන්න ඕනෑ.

මේ අය වැය දිහා බැලුවාම, අපි දැක්කා, මේ අය වැය තුළින් දරුවන්ට කොපමණ උදවු කර තිබෙනවාද කියලා. රටේ අපනයනය වැඩි කිරීම මඟින් රටට විදේශ ආදායම ගෙනෙන්න මේ අය වැය තුළින් කොපමණ පියවර ගෙන තිබෙනවාද? රට රැකියා ඇති කරන්න, උගත් අය හදන්න කොපමණ මහන්සිවෙලා තිබෙනවාද කියන එක මේ අය වැයේ අධ්‍යාපනය වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනා දිහා බැලුවාම පෙනෙනවා. ගෘහ සේවිකාවන් රට යවා ආදායමක් ලබා ගන්නවා. එදා මේ රට රැකියාවලට දොර විවෘත කළේ කවුද? අපේ ආණ්ඩුවේ ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා තමයි, රට රැකියාවට ගිහින් ඩොලර් සොයාගෙන එන්න දොර විවෘත කළේ. එතකොට අපට හිනා වුණා. නමුත් අද විදේශ රැකියා කරන අය -ගෘහ සේවිකාවන් වෙන්න පුළුවන්,- තමයි අපේ රටට විශාල ආදායමක් ගෙනෙන්නේ. නමුත් අද අපි උගතුන් නිර්මාණය කරන්න මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා. මොන්ටිසෝරි දරුවාගේ සිට විශ්වවිද්‍යාලයට යන දරුවා දක්වා ශක්තිමත් කරලා, ඒ අය ලෝකයට ගැළපෙන උගතුන් කරලා, රටේ තිබෙන දැවෙන ප්‍රශ්නය වන විදේශ විනිමය අවශ්‍යතාව සපුරා ගන්න පුළුවන් විධියට උගතුන් නිර්මාණය කරන අය වැයක් විධියට මේ අය වැය අපි දකිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි. විවාහ වනකොට රුපියල් 5,000ක ගාස්තුවක් අය කළ යුගය අපි නැති කළා. ඒ කාලය අවසන් වුණා. අද විවාහ වනකොට ගෙයක් හදාගන්න සල්ලි දෙනවා. රුපියල් ලක්ෂ 10ක් දෙනවා, ගෙයක් හදාගන්න. එදා කිරි පිටි මිල වැඩි කළාම දරුවන්ට කන්න බොන්න දෙන්න බැරි වුණා. දරුවන් වඩාගන්නවා. ගෙදර ගිහින් බැලුවාම කිරි පිටි මිල වැඩියි. දරුවාට කිරි පිටි ටික ගන්න වත්කමක් නැතිකමට දරුවාත් එක්ක ගඟට පැනපු අම්මලා හිටියා. එදා තිබුණු කිරි පිටි මිලට වඩා අද කිරි පිටි මිල අඩුවෙලා තිබෙන එක ගැන අපි සතුටු වෙනවා.

ඒ චූටි දරුවා ගැන හිතුවා විතරක් නොවෙයි; ඒ දරුවා සමාජයේ වැඩිහිටියකු දක්වා යන ගමන් මාර්ගය මේ අය වැය තුළ තිබෙනවා. මොන්ටිසෝරි අධ්‍යාපනය ශක්තිමත් කරන විධිය මේ අය වැය තුළ තිබෙනවා. දරුවා පාසලේ 13වන ශ්‍රේණිය දක්වා අනිවාර්යයෙන් ඉගෙන ගන්න ඕනෑ. ඒ සඳහා පහසුකම් දෙන විධිය, වියදම් කරන විධිය මේ අය වැය තුළ තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් පෙළ විභාගයට පෙනී සිටින ශිෂ්‍යයන් ලක්ෂ තුනෙන්, ශිෂ්‍යයන් 30,000කටයි විශ්වවිද්‍යාලයට යන්න පුළුවන්කම තිබෙන්නේ. අනික් දරුවන්ට ඉගෙන ගන්න, උපාධියක් ගන්න රුපියල් ලක්ෂ 11ක පොලී රහිත ණයක් දෙනවා. පොලියක් ඕනෑ නැහැ. රජය පොලිය ගෙවනවා. හැබැයි ණය ගෙවන්න වෙන්නේත් උපාධිය ලබාගෙන අවුරුදු දෙකකට පසුවයි. හැම දරුවකුම උගතකු කරන්න පුළුවන් මූලා ක්‍රමවේදයක් මේ අය වැය තුළින් යෝජනා කර තිබෙනවා. මේ අය වැය තුළින් මිනිසුන් ගැන හිතලා තිබෙනවා; රටේ ජනතාවගේ බුද්ධිය ගැන හිතලා තිබෙනවා; රටේ ජනතාවගේ බුද්ධියෙන් රට කරවන්න අවශ්‍ය පසුබිම නිර්මාණය කර තිබෙනවා.

මේ අය වැය ඉලක්ක -target- කර තිබෙන්නේ තවත් ගුවන් තොටුපොළක් හදන්න නොවෙයි, එහෙම නැත්නම් තවත් වරායක් හදන්න නොවෙයි, එහෙම නැත්නම් තවත් පාරවල් කාපට් කරන්න නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කොමිස් ගන්න ව්‍යාපෘති මේ අය වැය තුළ නැහැ. "මේ මේ ව්‍යාපෘතිවලට නායකයා කොමිස් ගත්තා"යි කියලා ඇමෙරිකාවේ නිව්යෝර්ක් ටයිම්ස් සඟරාවේ පළවුණා. එවැනි ව්‍යාපෘති කරන අය වැයක් නොවෙයි, මේ අය වැය. මේ අය වැය ගමේ දුප්පත් මිනිහා කෝටිපතියකු විධියට ශක්තිමත් කරන අය වැයක්; මොන්ටිසෝරි දරුවා උගතකු විධියට විශ්වවිද්‍යාලයෙන් එළියට එන පරිදි රටේ නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරන අය වැයක්.

මේ අය වැය තුළින් නිදහස් සෞඛ්‍යයට ශක්තිය දීලා තිබෙනවා; වැවිලි කර්මාන්තයට, කුරුඳු කර්මාන්තයට, පොල් කර්මාන්තයට, වී ගොවිතැනට, ජල සුරක්ෂිතතාවට තැනක් දීලා තිබෙනවා. ඒ නිසා අද විපක්ෂයට මේ අය වැයේ අඩු පාඩු කියන්න විධියක් නැහැ. බුද්ධිමත් කෙනකුට මේ අය වැයේ අඩු පාඩු කියන්න විධියක් නැහැ. රට ගෙන යන ගමන් මාර්ගය බොහොම ලස්සනට පැහැදිලිව මේ අය වැයේ සඳහන් වෙලා තිබෙනවා.

විපක්ෂයෙන් කියනවා, "මෙය සිහින අය වැයක්. මෙය කවදාවත් කරන්න බැරි අය වැයක්. මෙය හොඳ අය වැයක් තමයි. නමුත් කරන්න බැහැ"යි කියලා. මතක තබා ගන්න, අපි වගකීමෙන් කියනවා, මේ අය වැයේ යෝජනා ඉටු කරන ක්‍රියාදාමය හදන්නත් මුදල් අමාත්‍යාංශයෙන් වෙනම කමිටුවක් පත්කරලා තිබෙන බව.

අවුරුද්ද මුළුල්ලේ මේක පරීක්ෂා කරලා බලලා, මේ අය වැයේ ප්‍රගතිය කොපමණද, කොතරම් යෝජනා ක්‍රියාත්මක වෙනවාද, මොනවාද අඩු පාඩු කියලා පසු විපරම් කිරීමට පවා කමිටුවක් නිර්මාණය කිරීමට මෙයින් කටයුතු කරලා තිබෙනවා.

එදා, නිදහස ලබා ගත් දා සිට අද වනතෙක් ඇයි මේ රට සංවර්ධනය වීම මෙතරම් ප්‍රමාද වුණේ? මේ රටේ මුදල් මංකොල්ල කෑවා. දේශපාලනයේ ඉහළ තලයේ හිටපු මිනිස්සු මේ රටේ සල්ලි මංකොල්ල කෑවා. එහෙම නැත්නම් රාජ්‍ය සේවයේ ඉහළ තලයේ හිටපු මිනිස්සු මේ රටේ සල්ලි මංකොල්ල කෑවා. අපි මොන බදු ගැහුවත්, මොන ආදායම් හෙව්වත් ඒවා රටේ ජනතාවට ගියේ නැහැ. ඒ නිසා අපි දැක්කා, දූෂණයෙන් තොර රටක් හදන්නට අතිගරු ජනාධිපතිතුමා මේ වර්ෂයේ ප්‍රතිඥා දීලා තිබෙනවා. දූෂණයෙන්, වංචාවෙන් තොර රටක් නිර්මාණය කරනවා කියලා මේ 2019 වර්ෂය නම් කරලා තිබුණා. එහෙම නම් මේ හැම සතයක්ම වංචාවකින්, දූෂණයකින් තොරව ජනතාවට ප්‍රතිලාභ ලැබෙන විධියට වියදම් කරන්නට ඕනෑ. ඒ සඳහා තිබෙන යෝජනා මේ අය වැය වාර්තාව තුළ තිබෙනවා අපි දැක්කා. ඒ යෝජනා අයවැය අල්ලලා බැලුවාට පේන්නේ නැහැ.

වංචාව, දූෂණය නැති කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමක් කිරීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා පැහැදිලි කළා, මේ රටේ බදු අය කරන්නේ සල්ලි නැති මිනිසුන්ගෙන් කියලා. එතුමා

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

කිව්වා, ඍජු බද්ද සියයට 10යි කියලා. මේ රටේ ඍජු බද්ද සියයට 10ක් නොවෙයි සියයට 18ක් වෙනවා. සියයට 82ක් වක්‍ර බද්ද. ඇත්ත, අහිංසක මිනිසුන්ගෙන් තමයි බදු අය කරන්නේ. වංචා, දූෂණයෙන් තොරව ඍජු බදු එකතු කිරීම ශක්තිමත් කිරීම සඳහා වෙනම වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්නට කටයුතු කරලා තිබෙනවා. ආදායම් බදු දෙපාර්තමේන්තුව, වරාය සහ Excise Department එක වැනි ආයතනවල ව්‍යුහයට ඉලෙක්ට්‍රොනික් ක්‍රමවේද, ඩිජිටල් ක්‍රමවේද එනම් කාටවත් රිංගන්නට බැරි ක්‍රමවේද හඳුන්වා දීමට වෙනම අරමුදලක් ඇති කරලා තිබෙනවා. සමහරවිට හිනා වෙයි. නමුත්, "මේ පාරට අච්චර සල්ලි දුන්නා", "නව විදුලි බලාගාරයක් හදනවා", "නව වරායක් හදනවා", "මේ වැඩේ කරනවා" කියලා කයිවාරු ගහන අය වැයක් නොවෙයි මේක. මේ අය වැය, රටේ දූෂණයෙන්, වංචාවෙන් තොර යන්ත්‍රණයක් නිර්මාණය කරලා, "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා", "ගම්පෙරළිය" වැනි වැඩසටහන් ඉදිරිපත් කරලා, මිනිස් සම්පත ගැන, මිනිස් ශ්‍රමය ගැන, මිනිස් ශක්තිය ගැන, මිනිසාගේ ඥානය ගැන, මොළය ගැන විශ්වාස කරලා ඒ ශක්තිය පරිවර්තනය කර රටට ලබා දීම සඳහා ඉදිරිපත් කළ අය වැයක් කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි. ඔබ වහන්සේට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.00]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අය වැය සම්බන්ධයෙන් විවාදයේදී මම මගේ අදහස් මෙසේ ඉදිරිපත් කරන්නට කැමැතියි.

මෙම අය වැයෙන් පෙන්වා තිබෙන ප්‍රතිපත්ති හා දිශානතිය හඳුනා ගැනීම ඉතාමත් වැදගත් කියලා මම කල්පනා කරනවා. මේ අය වැයේ පිටු අංක 13හි මෙසේ සඳහන් කරලා තිබෙනවා:

"63. කලාපීය වටිනාකම් දාමය හා වෙළඳ ගිවිසුම් ජාලය සම්බන්ධ කිරීමේ ක්‍රමෝපායකට රජය අනුගතවී ඇත. සාර්ථකව නිම කරන ලද සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම හා එයින් ලබා ගත් අත් දැකීම් දැනට සාකච්ඡා වෙමින් පවතින ඉන්දිය, චීන හා තායිලන්ත වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් යොදා ගනු ලබනවා."

සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම පිළිබඳව කොමිෂන් දාලා තිබෙන්නේ ජනාධිපතිතුමා. මම දන්නේ නැහැ කොමිෂන් වාර්තාව කුමක්ද කියලා. ලංකාවේ ස්වදේශික, ජාතික නිෂ්පාදකයන්ගේ සංගම්, වෛද්‍ය සංගමය ඇතුළු රටේ විශාල පිරිසක් විරෝධයක් එල්ල කළ, සමාජ ජන මතයක් ගොඩ නඟපු මේ සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම වැනි තවත් වෙළෙඳ ගිවිසුම රාශියක් අත්සන් කරනවා කියලා තමයි මේ අය වැයේ ප්‍රතිපත්තිය හැටියට ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ අය වැයේ ජනාධිපතිවරණය ඉලක්ක කරගෙන පඩි වැඩි වීම් වැනි තවත් දේවල් ඉදිරිපත් කරලා තිබෙනවා. මම ඒවා ගැන කියන්න යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මම කැමැතියි, ලෝකයේ දිශානතිය පිළිබඳව යම්කිසි අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට. මේ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය හැදුවේ දෙවෙනි ලෝක යුද්ධයෙන් පසුව එක්සත් ජනපදය ප්‍රමුඛ යුරෝපීය රටවල්. නමුත්, ඒ රටවල් අද මේක සම්පූර්ණයෙන් අත හරින තත්ත්වයට ගිහින් තිබෙනවා. ඇයි, අද ලෝකය මේ ප්‍රතිපත්තිය අතහරින තත්ත්වයට ගමන් කරලා තිබෙන්නේ? ලෝකයේ ඇතිවෙලා තිබෙන නූතන සංවර්ධන මාදිලිය තුළ මනුෂ්‍ය සංහතියේ පැවැත්ම ඉදිරියට පවත්වාගෙන යන්න පුළුවන්ද කියන බරපතළ ප්‍රශ්නය අද ඇවිල්ලා තිබෙනවා. එම නිසා කාලගුණ විපර්යාස පිළිබඳ සමුළුව 2015දී පවත්වන විට කිව්වා, "මේ විධියට ගියොත් මනුෂ්‍ය සංහතියට පවතින්න බැරි වෙනවා. එම නිසා අපි වහාම තිරසර සංවර්ධනයක් කරා යනවා" කියලා.

මේ 2019 අය වැය පොතේ "තිරසර" කියලා කිසිම තේරුමක් නැතිව දාලා තිබෙනවා. නමුත්, ඒ සම්බන්ධව එකම ප්‍රතිපත්තියක්වත්, තිරසර සංවර්ධනයට අදාළ එකම ප්‍රතිපත්තියක්වත් මේ ලියවිල්ලේ සඳහන්ව නැහැ. අය වැය ඉදිරිපත් කරන ලෝකයේ සියලුම රටවල් තිරසර සංවර්ධනය පිළිබඳව විශාල වගන්ති ඉදිරිපත් කරනවා. නමුත් මේ අය වැයේ තිරසර සංවර්ධනයට අදාළව එක ප්‍රතිපත්තියක්වත් සඳහන් කරලා නැහැ. හැබැයි, "තිරසර" කියලා කිසිම තේරුමක් නැතිව ඇතුළත් කරලා තිබෙනවා, මොන තේරුමකින් ඒක ලියලාද කියලා මම දන්නේ නැහැ. කිසිසේත්ම අදාළ නැති විධියට කිහිප තැනකම ඒ වචනය පාවිච්චි කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ලෝකයේ ඇතිවෙලා තිබෙන ප්‍රවණතාව මොකක්ද? අද එක්සත් ජනපදය කියනවා, "අපි වෙළෙඳ ගිවිසුමෙන් ඉවත් වෙනවා" කියලා. කැනඩාව, මෙක්සිකෝව, එක්සත් ජනපදය අතර අවුරුදු ගණනක් තිබුණු වෙළෙඳ ගිවිසුමෙන් ඒකපාර්ශ්විකව සම්පූර්ණයෙන්ම ඉවත් වෙනවා කියලා ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා කිව්වා. වෙළෙඳ ගිවිසුමෙන් ඉවත් වෙන්නේ ඇයි? ඒ වාගේම යුරෝපා සංගමය තුළ නිදහස් වෙළෙඳාමට හා ආර්ථික පදනම් ඇති කර ගැනීම උදෙසා “BREXIT”නමින් ප්‍රතිපත්තියක් ඉදිරිපත් කර ගත්තා. මොකටද? ඒකීය වෙළෙඳ ගනු දෙනු කිරීම සඳහා. මොකක්ද වුණේ? අන්තිමට “BREXIT” කියන එක හරි ප්‍රසිද්ධයි. බ්‍රිතාන්‍ය ඒකෙන් ගැලවුණා, නැත්නම් ඉවත් වුණා. ඒ කියන්නේ, නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියෙන් ලෝකය ගැලවෙනවා කියන එක, ලෝකයට ඒවා හඳුන්වා දීපු මිනිස්සු අද ඒකෙන් ගැලවෙනවා කියන එක ඉතා පැහැදිලියි. ඇයි එහෙම වෙලා තිබෙන්නේ? ප්‍රධානම දේ තමයි, බිලියන 1.33ක් ජීවත් වන චීනයත් එක්ක බඩු හදන්න, ඔවුන්ගේ වෙළෙඳ පොළ එක්ක තරග කරන්න, ඔවුන් අත් පත් කර ගත් විද්‍යා හා තාක්ෂණික දැනුම ඒ ප්‍රමාණයෙන් අත් පත් කර ගන්න අද කිසිම රටකට බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. ඒ නිසා, අලුතින් ඇතිවෙලා තිබෙන නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියත් එක්ක යන්න බැහැයි කියන එක සම්බන්ධයෙන් අද ලෝකයේ විශාල කථිකාවතක් ඇතිවෙලා තිබෙනවා. එහි එක් කියමනක් තමයි, චීනයත් එක්ක තරග කරන්න බැහැයි කියන එක. දෙවැනි කියමන තමයි, ලෝකයේ ඇතිවෙලා තිබෙන පරිසර ගැටලුත් එක්ක අද ලෝකය දැවැන්ත හා ගැඹුරු අර්බුදයකට පාත්‍රවෙලා කියන එක. ඒ සඳහා අද ලෝකය අවධානය යොමු කරන කරුණු කිහිපයක් තිබෙනවා. ඒ තමයි, පුනර්ජනනීය බලශක්තිය කරා ගමන් කිරීම, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, සොබාදහමේ ගොවිතැන -sustainable agriculture- කරා ලෝකය මෙහෙයවීම. මේ පියවර තුන මත තමයි අද ලෝකයේ ආර්ථික ප්‍රතිපත්ති හැදෙන්නේ. ඒ අනුව ස්වදේශීය කර්මාන්ත රැක ගනිමින්, මධ්‍යම කර්මාන්ත ශක්තිමත් කරමින්, ජාතික ආර්ථිකයක් - national economy එකක් - දිශාවට යන ගමනකට තමයි අද ලෝකය ආර්ථික ප්‍රතිපත්තිය සකස් කරමින් යන්නේ. එම නිසා අද මුළු ලෝකයම තීන්දු කරලා තිබෙනවා, මේ යන ගමන යන්න බැහැ, ඒක නිසා අපි ආපස්සට

හැරෙන්න ඕනෑ, නැත්නම් අපේ දේශීය නිෂ්පාදන කඩා වැටෙනවා, ඒ වාගේම දරාගත නොහැකි ඉමකට ලෝකය ගමන් කරමින් තිබෙනවා, ඒක නිසා අපි කවුරුත් අපි අපේ කටයුතු බලාගන්න කියලා. ඒ අනුව එදා අපේ වාගේ රටවලට ලෝක බැංකුවේ, ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල තිබුණු තෙරපීම දැන් අඩුවෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ පාර අපට හදාගන්න ඉඩක් තිබියදී අපි අන්ධයෝ වාගේ, දීනයෝ විධියට කිසිම අවබෝධයක් නැතුව, කිසිම වැටහීමක් නැතුව, ලෝකයේ ප්‍රවණතා පිළිබඳව අල්ප මාත්‍ර අදහසක් නැතුව, පරණ පාරේම යමින් තමයි අද මෙවැනි අය වැයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය එංගලන්තයට හරි ආදරෙයි. එංගලන්තය හරියට වර්ණනා කරනවා. කවුරුත් දන්නවා, එංගලන්තයේ ප්‍රධාන පාලක පක්ෂය ලේබර් පක්ෂය බව. ලේබර් පක්ෂයේ ප්‍රතිපත්තිය මොකක්ද කියන එක පිළිබඳව මම මේ අවස්ථාවේ අවධානය යොමු කරවන්න කැමැතියි. මම ඒ ප්‍රතිපත්තිවලින් කිහිපයක් කියවන්න කැමැතියි. මොකද, මේක හුඟක් අවධානයට පත් වන නිසා. මේ ලියවිල්ල මොකක්ද? "Policy Framework : Transformation towards Solidarity Economy and Economic Democracy." එහි සඳහන් වෙනවා, "1. Totally reject neo-liberalism: The Left, Center-Left - parties and Nationalist-progressive political movements must consider solidarity economy as a transitional steps towards true Economic Democracy and also recognize the solidarity economy as the third economic model. It would be a response to peoples demand for an alternative people's economy with democratic governance" කියා. මෙන්න, ලෝකයේ ප්‍රධාන කම්කරු පක්ෂයේ ඒ කියන්නේ එංගලන්තයේ බලයට පත් වන පක්ෂයේ ප්‍රතිපත්තිය. ඒ වාගේම, සමුපකාර ව්‍යාපාරය බලගැන්වීම, ඒ වාගේම පෞද්ගලීකරණය වෙනුවට ජනතාව මත පදනම් වූ කර්මාන්ත ආරම්භ කිරීම වැනි දේවල් පිළිබඳව කරුණු 16ක් මෙහි සඳහන් වෙලා තිබෙනවා. හැන්සාඩ් එකේ තිබෙන කොටවත් කියවයි කියන බලාපොරොත්තුව ඇතුව ඒ කරුණු 16ම හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම පිණිස මම **සභාගත*** කරනවා.

මේ තමයි අපට උගන්වපු නියෝ ලිබරල් ප්‍රතිපත්ති හදපු මිනිස්සු, ලොකයේ ප්‍රධානම ජාතික පක්ෂ. මෙතැන වාමාංශික පක්ෂත් තිබෙනවා. මේ ලෝකය යන ප්‍රවණතාව පිළිබඳව කිසිම කෙනෙකුට කිසිම අදහසක් නැහැ. අද ධනපති හා සමාජවාදී කියා බෙදීමක් නැහැ. මේ මනුෂ්‍ය සංහතිය අද මුහුණ දෙන අර්බුදය හමුවේ අප ගත යුතු මඟ පිළිබඳව අද ලෝකයේ ප්‍රධාන ජාතික දේශපාලන පක්ෂ, ඒ වාගේම යූඑන්පී, ශ්‍රී ලංකා කියලා කිසිම බේදයක් නැතුව ප්‍රතිපත්තිවලට ඇවිල්ලා තිබෙනවා. මොකක්ද, මේ රට යන පාර?

අපි මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව විවේචනය කළා. අධිවේගී මාර්ග, වරායන්, ගුවන් තොටුපොළවල් හැදුවාට ජනතාව පාදක වූ ආර්ථික සංවර්ධනයට වැඩ පිළිවෙළක් නැහැයි කියලා අපි ඒ ආණ්ඩුව විවේචනය කළා. අපි කිව්වා, අධිවේගී මාර්ග හදනවා වෙනුවට අපි වෙනත් විකල්පයකට යමු කියලා. උදාහරණයක් විධියට ගත්තොත් කොළඹ - මහනුවර පාර lines 4ක් කළා නම්, මේ තිබෙන මාර්ග තදබදය අඩු කරන්න අපට පුළුවන් වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම අධිවේගී මාර්ගයක් මාතරට හැදූ පමණින් මාතර සිට කොළඹට යන සාමාන්‍ය ජනතාවගේ මාර්ග තදබදයේ ප්‍රශ්නය විසඳී නැහැ. ඒ කියන්නේ ජනතාවට ගමනාගමන පහසුකම් ඇති වෙලා නැහැ. එක කෝච්චියක කෝච්චි පහක සෙනඟ එනවා. ඒ මිනිසුන් ජීවිතයේ අන්තිම දුෂ්කර ක්‍රියාවක් තමයි ඒ ගත කරන්නේ. ඒක හින්දා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේදී අපි කිව්වා, කොහෙන් හරි ණය කුට්ටියක් අරගෙන පාරවල් හැදූ පළියට රටක් දියුණු වන්නේ නැහැ; මහ ජනතාවගේ සුභසාධනය ඉලක්ක කර ගත්, ජාතික සංවර්ධනයක් ඉලක්ක කර ගත් ආයෝජනයක් කරන්න ඕනෑය කියලා. මේ ආණ්ඩුව මොකක්ද කරලා තිබෙන්නේ? මේ ආණ්ඩුවත් ඒ ණය ගත් ආණ්ඩුවට මේ රට චීන කොලනියක් වෙනවා කියලා බැණ බැණම ඒ පාරේම ගිහිල්ලා අද ප්‍රමුඛතාවක් දීලා තිබෙන්නේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහායි. අපි මේ අය වැය ගත්තොත් එහි 27වන පිටුවේ යටිතල පහසුකම් ගැන සඳහන් කරලා තිබෙනවා. ඒ 27වන පිටුවේ කියලා තිබෙන්නේ මොකක්ද? අපි ගන්නා මේ ණය ප්‍රමාණයත් සම්පූර්ණයෙන්ම ඒ සඳහා යොමු කරන බව එහි සඳහන් වනවා. මේකේ ඉලක්කම් දක්වා තිබෙනවා. ඉලක්කම්වලින් ගත්තොත් විශාල මුදලක් අද මේ සඳහා වැය කර තිබෙනවා. මේකෙන් රටේ මොනවාද සංවර්ධනය වෙන්නේ? අපට මේකෙන් ඉක්මන් ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්ද? දැවෙන ප්‍රශ්නවලට උත්තර හම්බවනවාද? අද අපට ගෙවා ගන්න බැරි විධියට අය වැය පරතරය විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. අපේ රටේ මුළුමහත් ආර්ථිකයට වඩා ණයබර සියයට 87ක් තරම් විශාල ප්‍රමාණයකට ගමන් කර තිබෙනවා. අපි මේකට උත්තරයක් හොයන්නේ කොහොමද කියන එකට කිසිම උත්තරයක් මේ ආණ්ඩුවෙන් ලබා දීලා නැහැ.

මෙවර අය වැයෙන් මේ ආණ්ඩුව පාසල් දරුවන්ට පොඩි පොඩි කථා ටිකක් කියනවා. මේ අය වැයේ තිබෙන එක දෙයක් තමයි, SSC අසමත් වුණත් උසස් පෙළ දක්වා ඉගෙන ගන්න පුළුවන්ය කියන ප්‍රතිපත්තිය. අධ්‍යාපන ප්‍රතිපත්ති පැත්තෙන් ගත්තොත් අපි කාලයක් තිස්සේ කථා කරපු ප්‍රතිපත්තියක් වශයෙනුත්, මේ අය වැයේ සඳහන් වන වැදගත් ප්‍රතිපත්තියක් වශයෙනුත් මේ ප්‍රතිපත්තිය හඳුන්වන්න පුළුවන්. හැබැයි, ඒ අතරේ තව මොනවාද කියන්නේ? පාසල් දරුවන්ට කිරි පිටි දෙනවා කියනවා. බුද්ධික පතිරණ නියෝජ්‍ය ඇමතිතුමාත් කිරි පිටි ගැන කථා කළා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුත් කිරි පිටි ගැන කථා කළා. ඒ කිරි පිටි සම්බන්ධයෙන් මමත් යමක් කියන්න කැමැතියි. මේ සම්බන්ධයෙන් මගේ ළඟ තිබෙන ලියවිල්ලකුත් මම අවධානයට යොමු කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ලියවිල්ලේ කරුණු කීපයක් තිබෙනවා. ඒ කියන්නේ මේ ලියවිල්ලේ පැහැදිලි කරලා තිබෙනවා, මේ කිරි පිටිවලින් හැදෙන රෝගාබාධ පිළිබඳව. සෞඛ්‍ය අමාත්‍යාංශයයි, ජාත්‍යන්තර සංවිධානයි එකතු වෙලා තමයි මේ ලියවිල්ල හදා තිබෙන්නේ. මෙන්න, කිරි පිටිවලින් දරුවන්ට හැදෙන රෝග. ඇදුම, අසාත්මිකතාවන්, කනේ ආසාදන, අධි රුධිර පීඩනය සහ හෘදය රෝග, ශ්වසන ආසාදන, බුද්ධි මට්ටම අඩු වීම, ස්ථූලතාව, යකඩ ඌනතාව (නීරක්තිය), තොට්ලි මරණ, දියවැඩියාව, ආහාර දිරවීමේ අපහසුතා, ළමාවියේ ඇතිවන පිළිකා වර්ග, පාරිසරික අපද්‍රව්‍යයන්ට නිරාවරණය වීම -දරුණු විෂබීජ සහ හානිකර රසායන ද්‍රව්‍ය-, නින්දේදී ඇතිවන හුස්ම ගැනීමේ ආබාධ, දන්තාබාධ සහ දන්ත විකෘතිවීම් ඇතුළු බරපතළ රෝග තත්ත්ව කිරි පිටි පානයෙන් ඇතිවන බව මේ ලියවිල්ලේ සඳහන් වනවා. මේ ලියවිල්ල හැම තැනම අලවන්න කියලා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කියා තිබෙනවා. හැබැයි, මේක කොහේවත් අලවා නැහැ. හංගලා තිබෙන්නේ. අද කිරි පිටි දෙනවා වාගේ මෙන්න මේ වාගේ කථා තමයි කියලා තිබෙන්නේ.

මට මතකයි, 2005 ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේම කිව්වා, ඇන්කර්වල මිල අඩු කරනවා කියලා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයට

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

'ඇන්කර්' කියන වෙළෙඳ නාමයත් දැම්මා. අපි ඒක ඒ කාලයේ විවේචනය කළා. අද කිරි පිටි සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා. අපේ රට ගැන මොනවා කිව්වත්, ඉන්දියාවට වඩා වසර පුරා හොඳට කොළ පාට තිබෙන රටක් තමයි, අපේ රට. ඉන්දියාවේ අපේ රටේ වාගේ සදාහරිත ගතියක් අවුරුද්ද පුරාම නැහැ. පැත්තක් අධික ශීතලයි, තව පැත්තක් තදම උෂ්ණත්වයට යනවා. ඒ වාගේ වාතාවරණයක් තමයි, ඉන්දියාවේ තිබෙන්නේ. අපේ රටේ කිරි කර්මාන්තය සම්බන්ධයෙන් පසුගිය අවුරුදු 15ම අරගෙන බැලුවාට පස්සේ පෙනෙනවා, කිසිම ආණ්ඩුවක් මේ කිරි කර්මාන්තය දියුණු කරන්න කිසිම තීරණයක් අරගෙන නැති බව. ගිය ආණ්ඩුව අරගෙනත් නැහැ, මේ ආණ්ඩුවත් ඒ පිළිබඳව අන්තිම දුර්වල විධියටයි කටයුතු කරලා තිබෙන්නේ. ඒ කියන්නේ අද කිරි පිටි ගෙන්වන එක සම්පූර්ණයෙන්ම වැඩි කරලා තිබෙනවා.

අද ආහාර සහ ආහාර නිෂ්පාදනයට අවශ්‍ය ද්‍රව්‍ය ගෙන්වන්න ඩොලර් බිලියන තුනක් පමණ වියදම් කරනවා. අපේ දුප්පත් අම්මලා ඇතුළු අහිංසක මිනිසුන් පිට රට ගිහිල්ලා අපට ඩොලර් බිලියන හතක් පමණ ගෙනැල්ලා දෙනවා. ඒකෙන් ආහාර ගෙන්වන්න ඩොලර් බිලියන තුනක් වැය වනවා. ඊ ළඟට තෙල්, ගල්අඟුරු හා ගෑස් ගෙන්වන්න ඩොලර් බිලියන හතරක් වැය වනවා. නමුත්, ලෝක තෙල් මිල ඉහළ යනකොට මේ ප්‍රමාණය ඩොලර් බිලියන පහක් පමණ වනවා. ලෝක තෙල් මිල ඉහළ නොගියොත් ඔක්කෝම ඩොලර් බිලියන හතක් පමණ වැය වනවා. ලෝක තෙල් මිල ඉහළ ගියොත් ඔක්කෝම ඩොලර් බිලියන අටක් පමණ වැය වනවා. අපට මේ ඩොලර් බිලියන හත නවත්වා ගන්න ක්‍රමවේදයක් තිබෙනවාද?

ජාතික නිෂ්පාදනය වැඩි කරන්න ක්‍රමවේදයක් තිබෙනවාද? අපි මහන්සි වෙලා තේවලින් ගන්නේ, ඩොලර් බිලියන එකහමාරයි. කුරුඳුවලින් ගන්නේ ඊටත් වඩා අඩු මුදලක්. කුරුඳු ගැනත් මෙහි කියා තිබෙනවා, කුරුඳු තළන්න මිනිසුන් සූදානම් කරනවා ආදි දේවල්. ජාතික ප්‍රතිපත්තියක තිබෙන්න ඕනෑ, අපේ අමු ද්‍රව්‍ය මත අප නිෂ්පාදන කරන්නේ කොහොමද කියන එක. කුරුඳුවලින් ලෝකයේ මොන වාගේ නිෂ්පාදනද කරන්නේ? අපි කුරුඳු වැඩිපුරම පටවන්නේ මෙක්සිකෝවටයි. මෙක්සිකෝවට යැව්වාම, එහේදි තවත් විශාල කොම්පැනියක් ඒවා අත් පත් කර ගන්නවා. ඊට පස්සේ සුවඳ විලවුන් වර්ග, ඖෂධ වර්ග, වෙනත් විවිධ වූ දේවල් ඒ කුරුඳුවලින් නිෂ්පාදනය කරනවා. එහෙම නම් අප කළ යුත්තේ කුමක්ද? අපි කුරුඳුවලට ලංකාවේදී අගයක් එකතු කරන්න ඕනෑ. එහෙම කළොත්, කුරුඳු වෙළඳාමේ ලාභය හැටියට අද රුපියල් 100ක් ගන්නවා නම්, එය රුපියල් 200ක් කරන්න අපට ස්ථිරවම පුළුවන්. අද ලංකාවේ තිබෙන "ඩිල්මා" ආදි කොම්පැනි වුණත් ඉතා සුළු ප්‍රමාණයක් තමයි නිෂ්පාදනය කරන්නේ. හැබැයි එය ජාත්‍යන්තර මට්ටමේ කර්මාන්තයක් බවට පත් වෙලා තිබෙනවා.

අද වතු කම්කරුවන්ගේ තත්ත්වය ගෙන බලන්න. ඔවුන් ඉතාම දුගී මට්ටමේයි ඉන්නේ. අපට ලජ්ජා හිතෙනවා. බ්‍රිතාන්‍ය යුගයේ හැදූ පරණ ලයින් කාමරවල අන්ත දුගී දුප්පත් අහිංසක වහලුන් විධියටයි ඒ මිනිසුන් ජීවත් වන්නේ. ඒ මිනිසුන්ගේ ජීවිත නඟා සිටුවීමට අවශ්‍යයි. හැබැයි ඒකට තිබෙන විකල්පය ඡන්දය බලාගෙන කඳු වළල්ල වටේටම පර්චස් 7 බැගින් දෙන එක නොවෙයි. එයට කිසිම ප්‍රතිපත්තියක් නැහැ. අප කළ යුත්තේ ඒ ලයින් කාමර ටික තට්ටු දෙකේ නිවාස බවට පත් කරලා, මුළු මධ්‍යම කඳුකරයේම ඇති වැසි වනාන්තර දූෂණය කරන්නේ නැතිව, ඒ මිනිසුන්ගේ ආර්ථික ශක්තිය වැඩි වන පරිදි තේ කර්මාන්තයෙන් ලබා ගන්නා මුදල වැඩි කරන එකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේට තවත් විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් විනාඩි 5ක් ගන්න කිව්වා. ඒ වුණාට මා එයින් විනාඩි කීපයයි ගන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේ නිෂ්පාදනය සම්බන්ධයෙන් අප මොකක්ද කරන්න ඕනෑ? අද තේ අක්කර 80,000ක් විතර තිබෙනවා. ඒවා හෝටල්වලට දෙන්න හදනවා. ඒවා අතැනට දෙනවා; මෙතැනට දෙනවා. අවුරුදු එකසිය ගණනකට කලින් වගා කරපු තේවතු කිසිවක් වගා කළ නොහැකි, ඉතාම නිසරු, සෝදා පාළු වූ බිම් බවට පත් වෙලා තිබෙනවා. අද කිසිම ආදායමක් නැතිව මිලියන 1,000කට අධික මුදලක් දරමින් කම්කරුවන්ට වැටුප් ගෙව ගෙවා තියාගන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ඉඩම් කිසිම කොම්පැනියක් ගන්නේ නැහැ. අපි ඒ සඳහා විකල්ප යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. සමුපකාර සමිති හදලා, ඒ ඉඩම්වල බහුවිධ බෝග වගා කරලා, වන වගාවටත් ඒ ඉඩම්වලින් ටිකක් යොමු කරලා, ඒ ජනතාවටත් ආදායම ලැබෙන, වැසි වනාන්තරත් ආරක්ෂා වන ප්‍රතිපත්තියක් හදා තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳ කිසිදු සැලැස්මක්, වතුකම්කරුවන්ගේ ප්‍රශ්නය විසඳන්න කිසිදු සැලැස්මක් මේ අය වැයේ නැහැ. ඒ අය රුපියල් 1,000ක දිනක වැටුපක් ඉල්ලනවා. මෙහේ ඉන්න මැති ඇමතිවරු ඡන්ද බලාගෙන පර්චස් හත, හත හතර වටේට බෙදා ගෙන යනවා කිසිදු ඉවක් බවක් නැතිව. ඒ මිනිසුන්ට පර්චස් 7 බැගින් දෙනවා නම් ඒ අයගේ ලයින් කාමරය ඉදිරිපිටින්ම දෙන්න කියලා මම කියනවා. ලයින් කාමරය තට්ටු දෙකේ නිවසක් බවට පත් කරලා, වැසිකිළි කැසිකිළි පහසුකම් සහිතව, සනීපාරක්ෂක පහසුකම් සහිතව දියුණු කරන්න වැඩ පිළිවෙළක් හදන්න. නමුත් එවැනි කිසිම පිළිවෙළක්, ප්‍රතිපත්තියක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික නිෂ්පාදනය වැඩි කරන්න අප මොනවාද කර තිබෙන්නේ? කරවල, උම්බලකඩ, ලූනු, ලුණු, සීනි ආදි හැම දෙයක්ම පිට රටින් ගෙන්වනවා. අද අපි විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කර කිරි පිටි ගෙන්වනවා. රුපියල් බිලියන 50කට ආසන්න ප්‍රමාණයක් අප වියදම් කරනවා කිරි පිටිවලට. අපි සීනිවලටත් ඒ හා ආසන්න මුදල් ප්‍රමාණයක් වියදම් කරනවා. මොනරාගල අක්කර 50,000ක් 100,000ක් අතර වන ඉඩම් ප්‍රමාණයක් දීලා අවුරුදු 5න් සීනි ප්‍රශ්නය විසඳනවා කිව්වා. ලංකාවට අවශ්‍ය ප්‍රමාණය වාගේ දෙගුණයක් නිපදවා පිට රටටත් සීනි යවනවා කිව්වා. අවසානයේදී මොනරාගල අපේ දොඩම් වගාව නැති වෙලා ගියා. ඊට පසුව ආ ආණ්ඩුත් කිව්වේ එහෙමයි. ඔය කවුරුත් කතා කරන්නේ, කරන්න ගියේ ඒවාම තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බඩ ඉරිඟු වගාව ගෙන බලමු. සේනා දළඹුවා ආවා. විශාල ප්‍රශ්න ඇති වුණා. මේ ආණ්ඩුව යටතේම විශාල ව්‍යාපෘතියක් කළා, වස විසෙන් තොර ගොවිතැන සඳහා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ගොවිතැනින් ලබා ගන්නා ආදායම ඉතාම පැහැදිලිව දෙගුණයක් කරලා පෙන්වන්න අපට පුළුවන්. අපේ රටේ පොහොර ටික අපට නිෂ්පාදනය කරන්න පුළුවන්. 1970-1977 කාලයේ පොහොර නිෂ්පාදන ආයතන විශාල සංඛ්‍යාවක් අපට තිබුණා. එදා පිට රටවලින් පොහොර ගෙන්වන එක හුඟක් අඩුවෙනුයි කළේ. මහින්ද රාජපක්ෂ මහත්මයාත් දැන් කියනවා, "මම පොහොර

දෙනවෝ!" කියලා. මේවා, ඡන්ද ඉලක්ක කරගෙන කිසිම වගකීමක් නැතිව කරන ප්‍රකාශ. මේ ආණ්ඩුවත් කියනවා, "අපි පොහොර දෙනවා" කියලා. මොකක්ද මේ ආණ්ඩුව ගෙනා පොහොර ප්‍රතිපත්තිය? ආණ්ඩුව මුලින්ම කිව්වා, සල්ලි දෙනවා කියලා. සල්ලි දෙනවා කිව්වේ ඇයි? ඒ, මිනිසුන් පොහොර හදා ගැනීමට පෙළඹවීම සඳහායි. ඒ සඳහා ඉල්ලීම කළේ මම. ඊළඟට කිව්වා, "අපෝ, ඡන්දයත් පැරදිලා තිබෙනවා! අපි ආපහු පොහොර දෙනවා" කියලා. මම ඇහුවා, "කාබනික ගොවිතැන කරන ගොවියෝ 25,000ක් ඉන්නවා, ඔබතුමන්ලා නැවත පොහොර දුන්නාම ඒ ගොවීන්ට මොකද වෙන්නේ" කියලා. "රටේම අමු ද්‍රව්‍ය පාවිච්චි කරලා දුක් මහන්සියෙන් පොහොර විශාල ප්‍රමාණයක් හදලා තිබෙනවා. එය දියුණු කර්මාන්තයක් බවටත් වර්ධනය වෙමින් යනවා. මෙය කඩා කප්පල් කරන්නේ නැතිව, කැබිනට් පත්‍රිකාවක් පාස් කරලා ඒ මිනිසුන්ට පොහොර දෙන්න" කියලා අපි ඉල්ලා සිටියා. එතකොට මොකක්ද කිව්වේ? කැබිනට් පත්‍රිකාව පාස් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාබනික ගොවිතැන හා සම්බන්ධ කැබිනට් පත්‍රිකාව පාස් කර තිබෙනවා; වස විසෙන් තොරව ගොවිතැන් කර තිබෙනවා. කැබිනට් පත්‍රිකාවෙන් පාස් වූ සල්ලි ටිකවත් ඒ ගොවීන්ට දෙන්න මේ ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ.

මෙන්න මෙහෙම ආණ්ඩුවක් තමයි බලය ගන්න මේ දඟලන්නේ. මේ අය වැය ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් කරපු අය වැයක් කියලා ඕනෑ කෙනෙකුට පෙනෙනවා. මේ අවුරුද්දේ අග ජනාධිපතිවරණයක් එනවා. මේ අය වැයේ තිබෙන්නේ නව ලිබරල් ආර්ථිකයක්. පිටරටින් කිරි පිටි ගෙන්වන්නේ නැතිව, අපේ රටේ දේශීය කිරි ටික නිෂ්පාදනය කරන්න කිසිම ප්‍රතිපත්තියක් ආණ්ඩුවට නැහැ. අද 'ඇන්කර්' සමාගමට නඩු වැටිලා තිබෙනවා. මම 'ඇන්කර්' කොම්පැනියේ නම බය නැතිව කියනවා. ඒ වාගේම, අද කිරි පිළිබඳව වෛද්‍යවරු පැහැදිලි තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වූ සංඛ්‍යාලේඛන, දත්ත තිබෙනවා. මගේ කථාව තුළ ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාවක් නැති නිසා මම ඒ ලියවිල්ල සම්පූර්ණයෙන්ම **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. ළමයින්ට -කුඩා දරුවන්ට- කිරි පිටි දෙන්න එපා. එතකොට ඒ ළමයි හැදෙන්නේ හරක් වාගේයි. ඒ වාගේම ඒ අයට ලෙඩ රෝග බෝ වනවා. ඒක ලෝකයම පිළිගත් ප්‍රතිපත්තියක්. ඒ ප්‍රතිපත්තිය තමයි රජයේ පෝස්ටර් එකක් හැටියට මුද්‍රණය කරලා, සෑම රෝහලකම අලවන්න කිව්වේ. ඇයි ඒක හංගාගෙන ඉන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක හුළං බෝල, මැජික් අය වැයක්. ඒ නිසා නිකම් බොරු කතන්දර ඉදිරිපත් කරලා වැඩක් නැහැ. මේ රට හදන ආර්ථික වැඩ පිළිවෙළකට රටේ ප්‍රබුද්ධ ජනතාව, දේශීය කර්මාන්තකරුවන්, ව්‍යවසායකයන් අද සූදානම්වෙලා ඉන්නවා. අද මේ ආණ්ඩුවට විරුද්ධව සම්පූර්ණයෙන්ම දේශීය කර්මාන්තකරුවන් සංවිධානවෙලා ඉවරයි. ඒ වාගේම, ඒවායේ වැඩ කරන ලක්ෂ ගණනක ජනතාව, කළමනාකාරවරු මේ ආණ්ඩුවට විරුද්ධව අද පෙළ ගැහිලා අවසානයි. ඒ නිසා ඉදිරියේදී අපට ඕනෑ කරන්නේ ඒ පැත්ත වෙනුවට මේ පැත්ත මාරු කරන එක නොවෙයි. අද මේ රටට අවශ්‍ය කරන්නේ ප්‍රතිපත්තියක්. දේශීය කර්මාන්තකරුවන් හදන්නේ කොහොමද? එක්සත් ජාතික පක්ෂය කර්මාන්ත විකුණුවාය කියනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබවහන්සේට ලැබී ඇති කාලය අවසානයි. ඒ නිසා දැන් කථාව අවසන් කරනවා නම් හොඳයි.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

එක්සත් ජාතික පක්ෂය නොවෙයි, චන්ද්‍රිකාගේ කාලයේ තමයි කර්මාන්ත වැඩියෙන්ම විකුණුවේ. වතු ටික විකුණුවේත් චන්ද්‍රිකාගේ කාලයේ. හැබැයි, චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ ඒවා විකුණන කොට මොකක්ද කිව්වේ? අම්මෝ! දේශීය දැනුමත් එක්ක මේ රෙදිපිළි කර්මාන්තය දියුණු වනවාය කිව්වා. පූගොඩ කම්හල විකුණුවා. ඒ වාගේ හතර අතේ තිබුණු ඒවා විකුණුවා. නමුත් ඒ එක් කර්මාන්තයක්වත් අපට දියුණු කරන්න බැරි වුණා. අපට පරන්තන් රසායනික කම්හල නැති වුණා; කඩදාසි කම්හල නැති වුණා. අද අපේ පත්තර කඩදාසි ටික ඉන්දියාවට ගෙනිහිල්ලා, ඉන්දියාවෙන් කඩදාසියක් හදලා එනකොට අපි ඒවා මිලදී ගන්නවා. අද පත්තර කඩදාසි ටිකත් අපි පිට රටින් ගෙන්වා ගන්නවා. මේ වාගේ මිනිසුන්ට රටක් ගෙනයන්න පුළුවන්ද? හොරකම, වංචාව ගැන කථා කරනවා. හොරකම, වංචාව ලෝකයේ හැම තැනම තිබෙනවා. ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. අපේ රටේ තිබෙන ජාතික ප්‍රතිපත්තිය මොකක්ද කියන එකයි තිබෙන ප්‍රශ්නය. මේ රට හදන්න කිසිම ප්‍රතිපත්තියක් මේ අය වැය තුළ නැහැ. ලෝකයේම රටවල් අද ඉදිරිපත් කරපු තිරසාර සංවර්ධනය පිළිබඳව මෙවර අය වැයේ කිසිම උපාය මාර්ගයක් නැහැ. මේක තනිකරම සිංගප්පූරු ගිවිසුමයි, තායිලන්ත ගිවිසුම් ටිකකුයි සමග රට විකුණාගෙන කන අය වැයක්. ඒ නිසා දේශීය කර්මාන්තකරුවනි, ව්‍යාපාරිකයනි, තරුණයනි, බුද්ධිමතුනි, මේ රට හදන අනාගත වැඩ පිළිවෙළකට අපි එකතු වෙමු කියලා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

****සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*Document tabled:*

Policy Framework : Transformation towards Solidarity Economy & Economic Democracy

1. Totally reject neo-liberalism: The Left, Center-left parties and Nationalist - progressive political movements must consider solidarity economy as a transitional step towards true Economic Democracy and also recognize the solidarity economy as the third economic model. It would be a response to peoples demand for an alternative people's economy with democratic governance.

Conduct a wide range of research on solidarity economy. Generate quantitative and qualitative research data on solidarity economies locally and internationally to support the case.

2. Political economic paradigm shift: "We" instead of "I" (i.e. Cooperativism against Neoliberalism)

3. Solidarity economy must strive to assume one third (1/3) of the national economy. To begin with, state enterprises, agriculture including plantation sector

4. Contest & create required statutory provisions to facilitate the solidarity economy and economic democracy.

5. Transform the existing solidarity enterprises, cooperatives and sites, and create new entities. Revive and redirect them to respect solidarity and cooperative values and principles.

6. Facilitate and encourage co-management, employee participation and employee share and ownership in the public and private institutions.

7. Encourage local entrepreneurs and small and medium enterprises for employee participation and ESOPs to safeguard their enterprises and to stay competitive in the neo-liberal economy

8. Transform public sector research and development institutions to solidarity economy facilitating cooperatives or employee managed enterprises

9. Create a National Investment Fund, and a Capital Assets Tax to support solidarity economies, and as a means of Social Control of national development investments

10. The state banks, The Peoples Bank, Regional Development Banks and National Savings Bank must entrust the management of the National Investment Fund

11. Create a solidarity movement to facilitate and build solidarity organizations. The solidarity movement must be autonomous, free from government bureaucracy, corporate capital or political control

12. Encourage and strengthen electoral and participatory democracy observing solidarity values, principles and practices

13. The leftist political parties must assume the leadership in the Solidarity Economy Movement. A new kind of transformative activist, a solidarity economy activist must be created within their carder.

14. Promote popular education and learning about solidarity. Provide a framework for envisioning the spread and diffusion of the solidarity economy through a conscientization process

15. Solidarity and network with Local & international solidarity movement

16. Create a Ministry of Solidarity Economy in the national & provincial governments.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බුද්ධික පතිරණ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.20]

**ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න මොහොතක මේ අදහස් දැක්වීම කරන්නට ලැබීම ගැන මම ඇත්ත වශයෙන්ම සතුටු වනවා.

විශේෂයෙන්ම අය වැය පිළිබඳව කථා කරන මේ මොහොතේ, මේ අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙන විවිධ යෝජනා අතුරින් කීපයක් අරගෙන මගේ අදහස් ඉදිරිපත් කරන්න කැමතියි. වර්තමාන ආණ්ඩුව කොන්සවෙටිව්වාදය මත පදනම් වෙච්ච ආණ්ඩුවක් නොවෙයි. අපේ ආණ්ඩුව අන්ත ධනේශ්වර කොන්සවෙටිව් මතවාදයට ආසන්න, ඊට සමපාත වන ලිබරල් ප්‍රතිපත්ති මත පදනම්වෙලා ක්‍රියාත්මක වන ආණ්ඩුවකුත් නොවෙයි. කලිනුත් අපි කියපු විධියට මේ ආණ්ඩුව ක්‍රියාත්මක වෙන්නේ සමාජ වෙළෙඳ පොළ අර්ථ ක්‍රමයක් අපේ දර්ශනය විධියට යොදා ගෙනයි. මේ ස්ථානයට අපි සූත්‍රගත වෙන්නේ 2010ත්, 2015ත් අතර වකවානුවේ ඉදිරිපත් වූ ජනතා අදහස් උදහස් එක්කයි. සමාජ වෙළෙඳ පොළ අර්ථ ක්‍රමය, අපේ අනාගත ආණ්ඩුවක දිශානතිය තීරණය වන අර්ථ ක්‍රමය විධියට අපි 2013 පක්ෂ සම්මේලනයේදී තීන්දුවක් ගත්තා. ඉන් පස්සේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් එක්ක අපි ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත් ඒ මතයේ ඉඳගෙනයි අපේ ගමන යන්නේ. ඒ නිසා සමාජ වෙළෙඳ පොළ අර්ථ ක්‍රමයකදී එක පැත්තකින් ආර්ථිකයේ ශක්තිමත් ගමන අපට වැදගත් වනවා.

ආර්ථිකය තුළ ඉහළම ආදායම් ලබන කොටස වාගේම, පහළම ආදායම් ලබන කොටසත් ශක්තිමත් කරන්නේ කොහොමද කියන එක අපට වැදගත් වෙනවා. ලෝක ධනේශ්වරයේ ඉහළම රට විධියට අපි විශ්වාස කරන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයයි. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයකුව හිටපු ජෝන් එෆ්. කෙනඩි මැතිතුමා වරක් කිව්වා, "සමාජයක් තුළ යමක්-කමක් තිබෙන ඇති-හැකි අය ඉන්නේ ස්වල්ප දෙනායි. බහුතරයක් ඉන්නේ නැති-බැරි අය. අර ඇති-හැකි ස්වල්ප දෙනාට නැති-බැරි බහුතරය රකින්නට, ආරක්ෂා කරන්නට බැරි නම්, එවැනි සමාජ ක්‍රමයකට කවදාවත් ඉදිරියට යන්න බැහැ" කියලා. මේ අදහස දෙස බැලුවාම, මේක ටිකක් සමාජවාදයට ආසන්න අදහසක් බව පෙනී යනවා. හැබැයි, ඒක ඉදිරිපත් කළේ ලෝක ධනේශ්වරයේ ඉහළම ඇවරිය නියෝජනය කළ ඇමෙරිකා එක්සත් ජනපදය නියෝජනය කරපු හිටපු ජනාධිපතිවරයෙක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය තුළ එක පැත්තකින් ආර්ථිකය ශක්තිමත් කරන්න, අනෙක් පැත්තෙන් අධ්‍යාපනය ශක්තිමත් කරන්න, ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න, ඒ වාගේම සමාජය තුළ වටිනාකම්වලට - valuesවලට - තැනක් දෙන්න සමහර නීතිමය රාමු හදන්න අවශ්‍ය ප්‍රවේශයක් ලබා දීලා තිබෙනවා. 2015 ජනවාරි 08 වැනි දාත්, ඒ වාගේම 2015 අගෝස්තු මාසයේ 17 වැනි දාත් අපේ රටේ ජනතාව ජාතික ආණ්ඩුවක් බිහි කිරීමේ දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාත්, ජනාධිපති සහ අගමැති පුටු දෙකේ වාඩි කරවා බලාපොරොත්තු වුණු අපේක්ෂාවන් තිබුණා. එකක් තමයි, මේ මත්වතුර. මෙතැනදී මම "පැන්" කියන වචනය ඒ සඳහා පාවිච්චි කරන්නේ නැහැ. පැන් කියන වචනය පාවිච්චි කිරීම බෞද්ධයෙක් විධියට මගේ හෘදය සාක්ෂියට එකඟ නැති නිසා. ජනතාව විසඳුම් බලාපොරොත්තු වුණු එක ගැටලුවක් තමයි මත්වතුර සහ දුම්කොළ ආශ්‍රිත ප්‍රශ්නය. ඒ සම්බන්ධයෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එදා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් මේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂය පැත්තේ මගේ මතකයේ විධියට පළමුවැනි පේළියේ අර කොනේම තිබෙන පුටු හතරෙන් එකක සිටි වකවානුවේ දී, මම විපක්ෂය පැත්තේ දෙවැනි පේළියේ දෙවැනි පුටුවේ ඉඳගෙන 2013 අය වැය විවාදයේ දී ඒ ගැන කථා කළා මට මතකයි. එදා අපට ප්‍රශ්නයක් තිබුණා. සිගරැට් පැකට් එකට රූපමය අවවාද දෙන්න යනකොට, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විලංගු වැටුණා. හැබැයි, අපට එය ජයග්‍රාහී මානයක් දක්වා ගෙනයන්න පුළුවන් වුණා. අද සිගරැට් පෙට්ටියේ රූපමය අවවාද සියයට 80ක් වෙනකම් මුද්‍රණය වෙලා තිබෙනවා. ඒක අපට සතුටට කරුණක්. අපි ඒ සටන කළේ ඇයි? අවුරුද්දකට දුම්කොළ ආශ්‍රිත රෝගවලින් මේ රටේ 20,000ක් මැරෙනවා. ඒක දවස් 365න් බෙදුවාම, දවසකට 54.7යි. මම කියන ගණන calculator එකකින් බෙදලා බලන්න කෝ. හරියටම හරි, 54.7යි. ඒක ගණිතය අනුව ආසන්න පූර්ණ සංඛ්‍යාවට ගත්තාම, දවසකට 55දෙනෙක් මැරෙනවා.

LTTE ක්‍රියාමාර්ග තුළ තිස් අවුරුදු යුද්ධයක් පැවතුණා. අපි අද මේ කථා කරන්නේ 2019 මාර්තු මාසයේ 09 වැනි දානේ. එතකොට 30 අවුරුදු යුද්ධය පැවැති කාලයේ දී මාර්තු මාසයේ 09 වැනිදාවල් 30ක් තිබුණා. ඒ 30 තුළ LTTE යුද්ධය නිසා මැරුණු සංඛ්‍යාව බැලුවොත්, සාමාන්‍යයෙන් දවසකට මැරිලා තිබෙන්නේ 35ත්, 45ත් අතර සංඛ්‍යාවක්. හැබැයි, දුම්කොළ නිසා තිස් අවුරුද්දක් විතරක් නොවෙයි, මේ කථා කරන අද වනවිටත් දළ වශයෙන් 55 දෙනෙක් හැම දාම මැරෙනවා. දුම්කොළ කොම්පැනිවලට අපි සහන දුන්නා, LTTE දේපළ තහනම් කළා. එතකොට වැඩිපුර භයානක, 55 දෙනෙකු මරණ දුම්කොළ කොම්පැනිද, LTTE ක්‍රියාකාරකම්ද? ඒකෙන් කියන්නේ LTTE දෙවැනි තැනට දමා, දුම්කොළ කොම්පැනිය ත්‍රස්තවාදියෙක් කියන එක නොවෙයි. හැබැයි, දැන් ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු සමස්ත ආණ්ඩුවම තීරණයක් ගෙන තිබෙනවා, 2020 වනකොට දුම්කොළ වගාවෙන් රජය අයින් වෙන ක්‍රියාමාර්ගයකට යන්න. ඒක ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු රජය ගත් තීන්දුවක්.

මෙවර අය වැයෙන් සිගරට්, අරක්කු මත රුපියල් බිලියන 37ක නිෂ්පාදන බද්දක් පනවා තිබෙනවා. රේගු බද්ද රුපියල් බිලියන 20යි. එතකොට රුපියල් බිලියන 57ක් මෙතැනට එකතු වෙනවා. ඒ වාගේම කැසිනෝ පිළිබඳව කථා කරනවා නම්, - සමහර වෙලාවට අපි විශ්වාස කරනවා, මේවා සමාජය තුළ තහනම් කළ හැකියි කියලා. දැන් කෙනෙකු කියන්න පුළුවන්, "එක රැයකින් සිගරට්, අරක්කු තහනම් කළා නම්, එක රැයකින් කැසිනෝ තහනම් කළා නම් ඕක හරි ලෙහෙසි වැඩක් නේ" කියලා.

නැහැ. ඊට වඩා සමාජය තුළ ඒ ගැන ඇති ආකල්ප වෙනස් කළ යුතුයි. දැන් බලන්න කැසිනෝ සහ රෙජිනෝ බද්ද, රුපියල් බිලියන දෙකහමාරක්. එතකොට මේ සියල්ලෙන් අපි මේ සමාජයට මේ අය වැයෙන් දීලා තිබෙනවා යම් පණිවුඩයක්. ඒ පණිවුඩය තමයි අපි මේ බදු හරහා පෙන්නුම් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මනුෂ්‍යයකු ගොඩනැඟීමේදී ඔහු දැනුමෙන් පූර්ණ සහ ධනාත්මක ආකල්ප, පාරිශුද්ධ ආකල්පවලින් පොහොසත් මනුෂ්‍යයකු විය යුතුයි. සමාජ

හිතකාමී, කුසලතා අතින් පරිපූර්ණ මනුෂ්‍යයකු විය යුතුයි. නිකම් කුසලතා කියලා බැහැ, සමාජ හිතකාමී කුසලතා. බෝම්බයක් හදන එකත්, තුවක්කුවක් හදන එකත් කුසලතාවක් තමයි. හැබැයි, ඒක සමාජයට හානි කරන කුසලතාවක්. සමාජ හිතකාමී කුසලතාවන්ගෙන් පරිපූර්ණ මනුෂ්‍යයකු බිහි කළ යුතුයි. ඒ වාගේම සෞඛ්‍ය සම්පන්න විය යුතුයි. අපි මේ ගැන කල්පනා කර තිබෙනවා.

අපේ රතන ස්වාමින් වහන්සේ පවා "දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපනය" අගය කළා. උගත්කම වැඩි වුණු තරමට, - උගත්කම සහ බුද්ධිමත්කම කියන මේ දෙක සමපාත වෙන්නත් පුළුවන්; නොවෙන්නත් පුළුවන්. ඒ වාගේම අවස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කරන පුද්ගලයකු බිහි කරන්නට ඕනෑ. උගත් සමාජයක් බිහි කරන්නට ඕනෑ. 1980 දී දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වුණා, නොමිලේ පාසල් පෙළ පොත් ලබා දෙන වැඩසටහන. "නිදහස් අධ්‍යාපනය අර්ථවත් වෙන්න නම් නොමිලේ පොත් දෙන්න ඕනෑ" කියන යෝජනාව 1930 දශකයේ අවසානයේ නැත්නම්, 40 දශකයේ මුල් කාර්තුවේ එතුමා රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කළා. නමුත් ඒ යෝජනාව එතුමාට ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණේ, 1980. පාසල් පෙළ පොත් මුද්‍රණය කරලා නොමිලේ දීමත් එක්ක මොකක්ද සිද්ධ වුණේ? සිද්ධ වෙච්ච පරිවර්තනය තමයි, සමාජය තුළ පෙළ පොත් මිලදී ගෙන පාසල් යනවාට වඩා නොමිලේ පොත් ලබාදෙන වැඩ පිළිවෙළ තුළ දරුවාගේ අධ්‍යාපනයට තිබෙන හැකියාව වැඩි වෙන්න, ඒ හරහා ඔහුගේ නෛසර්ගික හැකියාවන් වර්ධනය කරන්න අවශ්‍ය ශක්තිය ලැබිච්ච එක. 1980 නොමිලේ පොත් දීම හරහා මහා සමාජ විප්ලවයක් ඇති වුණා. මේ සිටින සමහර අය වැරදිලාවත් අසූව දශකයේ හිටියා නම්, මේ පොත් දෙනවාට වඩා පොල් අතු ඉස්කෝලෙක පොල් අතු ටික අයින් කරලා ටකරන් ගහන එක හොඳයි කියයි. පොත් දෙන්න වියදම් කළ එක අපරාදේ, ඒ සල්ලිවලින් මැටි ඉස්කෝලවලට සිමෙන්ති ගොඩනැඟිල්ලක් හැදුවා නම් හොඳයි කියයි. මම කියන්නේ මැටි, පොල් අතු ඉස්කෝල දියුණු කරන්න ඕනෑ. මේ රටේ සමහර ඉස්කෝලවලට swimming pools ඉල්ලනවා. නමුත් සමහර ඉස්කෝලවල පන්ති කාමරය වහින දවසට swimming pool එකක් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ ඒ අත් දැකීම තමුන්නාන්සේට හොඳටම ඇති. හැබැයි, අපි දැනුමෙන් පරිපූර්ණ සමාජයක් කරා යන ගමනේදී දැන් පාසල් පෙළ පොත කියන යුගයෙන් ඊළඟට පොලා පනින්නේ කොතැනටද? Tab එක සහ laptop පරිගණක යුගයට.

දැන් අපිම කියනවා, මේ පොත් බෑගයේ බර දරුවාට දරා ගන්න බැරි බව. කිලෝ 5ක්, 6ක්, 7ක්, 8ක් බර පොත් බෑගයක් උස්සාගෙන යන්න සිදු වීමෙන් දරුවාගේ කශේරුකාවේ ගැටලු ඇති වෙන්න පුළුවන්; දරුවාට විවිධ අතුරු ආබාධ ඇති වෙන්න පුළුවන්. ඒ නිසා දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපනය අනිවාර්ය වෙනවාත් එක්කම ඊළඟට වැදගත් දේ තමයි, දරුවාගේ පොත් බෑගයේ බර අඩු කරන එක. දැන් මේ සියල්ලම ගන්න පුළුවන් පරිගණක chip එකකට. 1980 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ යුගයේ එතුමා දැකපු සංවර්ධනාත්මක, ධනාත්මක ඉතා හොඳ ප්‍රගතිශීලී වැඩසටහන තමයි, නොමිලේ පොත් ලබා දීම. දැන් නූතනත්වය තුළ පොත කියන තැනට පොලා පනින්නේ tab එක; එහෙම නැත්නම් laptop එක. අපි එවැනි පරිවර්තනයකට යා යුතුමයි. ඒ නිසා එම කාරණය ගැනත් සලකා බලන්නට ඕනෑ.

ඊළඟට, සනීපාරක්ෂක පහසුකම්. පුද්ගලයන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි කරන්න බිලියන 4ක් හා පොදු ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් වැඩි කරන්න බිලියනයක් වශයෙන් බිලියන 5ක් වෙන් කර තිබෙනවා. එය වැදගත්, ප්‍රගතිශීලී පියවරක් කියලා මා හිතනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පාසල්වල සනීපාරක්ෂක පහසුකම්වල තත්ත්වය බලන්න. මම වෛද්‍ය වාර්තා ටිකක් ගත්තා. අද පාසල් යන වයසේ පිරිමි දරුවෝ වාගේම ගැහැනු දරුවෝත් බරපතළ විධියට මුත්‍රා ආශ්‍රිතවත්, ආහාර මාර්ග පද්ධතිය ආශ්‍රිතවත් ලෙඩ රෝගවලට ගොදුරු වීමේ අවධානම වැඩි වෙලා තිබෙනවා.

ඇයි ඒ? දරුවන් උදේට පාසලට එන්නේ හැතැප්ම 10ක්, 15ක්, 20ක්, 30ක් විතර දුර ඉඳලා පාසල් වෑන් රථවලයි. උදේට යන්තම් කෑම පොඩ්ඩක් කාලා තමයි ඒ දරුවන් එන්නේ. සමහර වෙලාවට කෑම කාලත් නොවෙයි එන්නේ. විශේෂයෙන්, පිරිමි දරුවන්ට වඩා ගැහැනු දරුවෝ පාසලට ආවාම වතුර බොන්නේ නැහැ. මොකද, අතිබහුතරයක් පාසල්වල වැසිකිළි තිබෙන්නේ ඉතාම නරක තත්ත්වයකයි. ඒ නිසා තමයි, "ගම්පෙරළිය" වැඩසටහන යටතේ පාසල්වල වැසිකිළි නවීකරණය සඳහා මුදල් වෙන් කරන්නේ. පාසල්වල වැසිකිළි නරක තත්ත්වයක පවතින එකට ඒ ගම්වල ඉන්න අයත් වගකියන්න ඕනෑ. ඔබතුමන්ලා ගම්වල තිබෙන ඉස්කෝලවලට ගිහින් බලන්න. බහුතරයක් ගම්වල ඉස්කෝල වටේට වැටක් නැහැ; තාප්පයක් නැහැ. ගමේ මිනිස්සු බලු කුණ ගෙනැත් දමන්නේත් ඉස්කෝලේ ළිඳටයි; පොල් කෝම්බ ගෙනැත් දමන්නේත් ඉස්කෝලේ තිබෙන ළිඳටයි. වැසිකිළිය ඇතුළේ ගල් පුරවලා; කෝටු පුරවලා. "එහෙම නැහැ" කියන අයට මම කියනවා, ඉස්කෝලෙකට ගිහින් ඒ දරුවන් යන වැසිකිළියක තත්ත්වය බලන්න කියා. ඒ ඉස්කෝලවල දරුවන්ට යන්න වැසිකිළියක් නැහැ. ඒ නිසා දරුවෝ අඩුවෙන් තමයි වතුර බොන්නේ. ඒ හේතුව නිසා දරුවන් විවිධ රෝගාබාධලට ලක් වෙනවා. සමහර විට උදේ පාන්දරින් පාසල් වෑන් රථයක, පාසල් බස් රථයක එන නිසා ඔවුන් උදේට වැසිකිළි ගිහිල්ලා එන්නෙත් නැහැ. මොකද උදෙන්ම අම්මලා ඒ දරුවන් නැගිට්ටවනවා නේ. නැගිට්ටුව ගමන් දරුවෝ යාන්තම් මුහුණ කට සෝදා ගෙන ඉස්කෝලෙට දුවනවා. ඒ නිසා දරුවන්ට අර්ශස් ඇතුළු ආහාර ජීරණ පද්ධතියේ අපර කොටසේ අසනීපත්, ඒ වාගේම වකුගඩු ආශ්‍රිත අසනීපත් හැදෙනවා. ඒ නිසා පාසල් තුළත්, සමාජය තුළත් ඇති වැසිකිළි පද්ධති පවිත්‍රව සහ විධිමත්ව පවත්වාගෙන යන්න යම්කිසි සහන මුදලක් -ඉස්කෝලවල නොවෙයි අනෙක් තැන්වල- අය කර හෝ කටයුතු කරන්න.

බලන්න, නරේන්ද්‍ර මෝදි අග්‍රාමාත්‍යතුමා යටතේ ඉන්දියාවේ අද ඒ පරිවර්තනය ඇති වෙලා තිබෙනවා. සනීපාරක්ෂක පහසුකම් කියන කාරණයේදී අපට වඩා ගව් ගණනක් පිටුපසින් සිටි ඉන්දියාව තුළ අද පරිවර්තනීය වෙනසක් ඇති වෙලා තිබෙනවා. මෝදි මැතිතුමාගේ රජය ඒ පිළිබඳ ලොකු අවධානයක් යොමු කර තිබෙනවා. ඒ නිසා ඒ කාරණය ඉතා වැදගත්.

ඊළඟට, අපි මේ ආදායම් බුද්ධි ඒකකය ශක්තිමත් කළ යුතු වනවා. අපි රටක් විධියට රුපියල් බිලියන ගණනක් ණය ගෙවන්න ඕනෑ. මම කියන මේ කාරණය මේ අය වැය විවාදය තුළ මේ දවස් කිහිපයේ කථා නොකළ දෙයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට එන ආදායම් විශාල වශයෙන් අපි අහිමි කර ගන්නා අංශ කිහිපයක් තිබෙනවා. ඒ, මෙන්න මේවායි. අපේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බුද්ධි ඒකකය ශක්තිමත් කිරීම වාගේම, අපට මෙන්න මේ දේවලුත් කළ හැකියි. බොහෝ අය දන්නවා, යුද්ධය පැවැති කාලයේ, දෙහිවල ප්‍රදේශයෙන් කොළඹට එන වාහන ඔක්කෝම scan කරන්න පුළුවන් ක්‍රමවේදයක් සවි කළ බව. තවමත් ඒකේ නටබුන් දකින්න පුළුවන්. රේගුවෙන් එන දේවල් මේ විධියට බලන්න බැරි ඇයි? අර්තාපල් container එකක ගණන අඩුයි. සමහර වෙලාවට එන්නේ සපත්තු. හැබැයි, සඳහන් කරන්නේ අර්තාපල් කියායි. මෙවැනි දේවල් නිසා රටට විශාල බදු මුදලක් අහිමි වෙනවා. ඒ නිසා ආදායම් බුද්ධි ඒකකයට මුදල් වෙන් කළා වාගේම, මේ සඳහාත් අපි යම්කිසි ක්‍රමවේදයක් හදන්න ඕනෑ. රේගු බුද්ධි

[ගරු බුද්ධික පතිරණ මහතා]

ඒකකය විසින් සෑම -අහඹු ලෙස නොවෙයි; ඇරලා බලලා නොවෙයි; හිතුණොත් නොවෙයි- container එකක්ම පරීක්ෂා කරන්න ඕනෑ. අපි මේ පාර්ලිමේන්තුවට එනකොට මොනවා හෝ පාර්සලයක් ගෙනෙනවා නම්, අපි ඇතුළු වෙනකොටම එය පරීක්ෂා කර බලන්න ක්‍රමයක් තිබෙනවා නේ. අපි ලෝකයේ ඕනෑම රටකට VIP lounge එකෙන් ගියත්, අපව check කරන්නේ නැතිව යන්න පුළුවන්ද? අපව පරීක්ෂා කරන්න පුළුවන් නම් මේ දේවල් පරීක්ෂා කරන්න ක්‍රම නැද්ද? තිබෙනවා. හැබැයි, පරීක්ෂා කරලා විතරක් හරියන්නේ නැහැ. එහෙම පරීක්ෂා කරනවාත් එක්කම, ඒක රේගුවයි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවයි, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ මේ සම්බන්ධව duty waivers දෙන ස්ථානයි සියල්ල එකට සම්බන්ධ වෙන්න ඕනෑ. සමහර වෙලාවට කියනවා, කාබන් කොළය තියලා වහලා යවනවාය කියා. කාබන් කොළය තියලා යනවාද, නැද්ද කියා බලා ගන්න CCTV පද්ධති සවි කරන්න ඕනෑ. මේවායෙන් ගෙනෙන දේවල් මොනවාද කියා අපි හරියට බලන්න ඕනෑ. මේ බුද්ධි ඒකක අපි මීට වඩා ශක්තිමත් කරන්න ඕනෑ. එතකොට මේ හරහා කුඩු එනවා නම් ඒ දේවල් නතර කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ඒ අංශ පිළිබඳව අපි බරපතළ ලෙස කල්පනා කරන්න ඕනෑ. අපි නූතන තාක්ෂණය මේ ස්ථානවලට ගොනු නොකිරීම නිසා විශේෂයෙන්ම අපේ රටට විශාල වශයෙන් ආදායම අහිමි වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාවේ අන්තිම විනාඩි 5ක කාලය තුළදී පාසල් දරුවන්ට ලබා දෙන කිරි වීදුරුව පිළිබඳව කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා තව විනාඩි 4යි තිබෙන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
තවම මම විනාඩි 16යි, තත්පර 23යි නේ, කථා කර තිබෙන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා කථා කරන අතරේ මමත් වේලාව තියාගෙනයි හිටියේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

වැඩිහිටියෙක් වුණාට පසුවත් කිරි බොන ලෝකයේ එකම සතා තමයි මනු සතා. කොටියා ලොකු වුණාම කිරි බොනවාද? අලියා ලොකු වුණාම කිරි බොනවාද? බල්ලා ලොකු වුණාම කිරි බොනවාද? වඳුරා ලොකු වුණාම කිරි බොනවාද? තල්මසා කියන්නේත් ක්ෂීරපායී සතෙක්. තල්මසා ලොකු වුණාම කිරි බොනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා කල්පනා කර බලන්න, ලොකු සතෙක් කිරි බොනවා දැකලා තිබෙනවාද කියා. අපි කිරි දුන්නොත්, ඒ සතුන් බොනවා. එහෙම නැතිව, ඒ සතුන් ලොකු වුණාට පස්සේ කිරි එරෙන සතෙකුගෙන් කිරි බොනවා දැක තිබෙනවාද? එහෙම කිරි බොන එකම සතා මනු සතායි. ඇයි, මෙහෙම වෙලා තිබෙන්නේ? අපි මේකට ඇබ්බැහි වෙලා ඉන්නවා. අපි අපේ දරුවන් ඇබ්බැහි කර තිබෙනවා. අපේ දරුවන්ට කිරි වීදුරුවක් දෙනවාය කියන යෝජනාව මුදල් ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙනවා. කිරි වීදුරුවක් දෙන තැන කිරි වීදුරුවක් දෙන්නත්, අනෙක් පුළුවන් හැම තැනකම කොළ කැඳ වීදුරුවක්, කුරක්කන් කැඳ වීදුරුවක් දෙන්නත් පුළුවන්. මේක, "කිරි වීදුරුවක් දෙනවා" කියන තැනටම යන්න ඕනෑ නැහැ; ඒ සම්බන්ධයෙන් අපි concrete decision එකක ඉන්න ඕනෑ නැහැ. අපි මෙතැනින් එහාට යන්න ඕනෑ. මොකද, අද කිරි පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

ඊයේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වත්තල ප්‍රදේශයේදී එළගිතෙල් කෑන් 115ක තොගයක් අත්අඩංගුවට ගත්තා. ඒ පිළිබඳව වූ මාධ්‍ය නිවේදනයක් දැන් මා අතේ තිබෙනවා. මම ඒක **සභාගත*** කරනවා.

මෙට්‍රික් ටොන් 40ක එළගිතෙල් තොගයක් රේගුවෙන් නැවැත්තුවා. හැබැයි, ඒවා එළගිතෙල් නොවෙයි. මොනවාද මේ එළගිතෙල් කියා ගෙනැවිත් තිබෙන්නේ? Bovine animal fat. Bovine animal fat සහ Palm oil එකතු කරලා දැන් කෘත්‍රිම එළගිතෙල් හදනවා. [බාධා කිරීමක්] ඒකට ඊයේ වත්තල මහෙස්ත්‍රාත්තුමා රුපියල් 10,000ක දඩයක් ගැහුවා. අයිතිකාරයා කිව්වා ආපසු ඒ ටික නිදහස් කරන්නය කියා. මහෙස්ත්‍රාත්තුමා කිව්වා, "නිදහස් කරන්නේ නැහැ, ඒවා විනාශ කරන්න" කියා.

මේ එළගිතෙල් දමලා තමයි fried rice හදන්නේ; බුරියානි හදන්නේ; දුන්තෙල් බත් හදන්නේ. ඊයේ මේවා ඇල්ලුවා. මේ ජාවාරම තමන් 2012 වසරේ ඉඳලා කළාය කියා ඒ සිද්ධියට අදාළ පුද්ගලයා පිළිගත්තා. Bovine animal fat හදන්නේ කුර තිබෙන සතුන්ගේ හමට යටින් තිබෙන තෙල් තට්ටුව අරගෙනයි. එතකොට කුර තිබෙන්නේ කුමන සතුන්ටද? ඌරා, හරකා, එළුවා, ඔටුවා, බැටළුවා කියන සතුන්ට නේ, කුර තිබෙන්නේ. ඒ සතුන්ගේ කුර, හොම්බ, කන්, අං අරගෙන, ඊට අමතරව සම යට තිබෙන තෙල් අරගෙන Bovine animal fat හදනවා. Bovine animal fat සහ Palm oil දමලා කෘත්‍රිම එළගිතෙල් කියලා එවනවා. අපි ඒ එළගිතෙල් බෝතල් අරගෙන පහන් පත්තු කරනවා. පහන් පත්තු කිරීම පැත්තකින් තියමුකෝ. මේවා දමලා මුරුතැන් පූජාව හදනවා. අපි කෝවිලට ගියාම මුරුතැන් පූජාව කනවා. මෙච්චර කල් මේ විදියට තමයි මේවා හදලා තිබෙන්නේ. දැන් එළගිතෙල් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මම කිරි පිටිවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්න කළාම මුස්ලිම් සමාජය තැති ගත්තා. ඌරු තෙල් ගැන කිව්වාම මුස්ලිම් සමාජය තැති ගත්තා. [බාධා කිරීමක්] මට තොරතුරු තිබෙන නිසා, සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ ඔය කාරණාව ගැන සාක්ෂි ඇතිව, මගේ අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂයේදී මම පෙන්වනවා. මම ඉතා පැහැදිලිව කියනවා, මේ කිරි පිටි පිළිබඳ කාරණය මිත්‍යාවක් බව.

තව එක කාරණයක් කියලා මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පසුගිය දවස්වල කිරිපිටි කොම්පැනි අපට තර්ජනය කළා නේ. කිරි පිටිවලට මිල වැඩි කිරීමක් දුන්නේ නැත්නම් කිරි පිටි ගොඩ බාන්නේ නැහැය කිව්වා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ ගොල්ලන් හිතුවා, කිරි පිටි ගොඩ බාන්නේ නැහැ කිව්වාම මේ රටේ ලොකු සමාජ කම්පනයක් ඇති වේවි, ලොකු උද්ඝෝෂණයක් ඇති වේවි, මිනිස්සු එළියට

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

බහීව්, කිරි පිටි ඕනෑය කියා කියාවි කියා. දැන් අද සිගරට් මිල වැඩි කළාම, අරක්කු මිල වැඩි කළාම බල්ලෙක්වත් කථා කරන්නේ නැහැ නේ. හෙට කිරි පිටි මිල වැඩි කළත් බල්ලෙක්වත් ඒ ගැන කථා කරන්නේ නැහැ. අද සමහර කිරි පිටි වර්ග සුපිරි වෙළෙඳ සැල්වල වේළෙනවා. අපි හෙට අනිද්දාට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ගෙන්වනවා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හරහා මේ රටේ සුපිරි වෙළෙඳ සැල් ජාලයේ ප්‍රධානීන් හෙට අනිද්දාට ගෙන්වනවා. ඒ අය ගෙන්වා අපි අහනවා, සුපිරි වෙළෙඳ සැල්වල, "stallsවල අපේ ඇස් මට්ටමේ හැමදාම එකම එකම කිරි පිටි වර්ගයක් තිබෙන්නේ ඇයි?" කියා. ගිහින් බලන්නකෝ, සුපිරි වෙළෙඳ සැල්වල හැමදාම ඇස් මට්ටමේ තිබෙන්නේ එකම කිරි පිටි වර්ගයක් නේ. දේශීය කිරි පිටි වර්ග තිබෙන්නේ අස්සේ; හුඹහේ; පතුලේ. එහෙම වෙන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා වුණත් පුංචි දරුවන් එක්ක, මුණුබුරු මිනිබිරියන් එක්ක සුපිරි වෙළඳ සැල්වලට යනවා ඇති. බලන්න, Food Cityවල ටොෆි, චොකලට් තිබෙන තැන තමයි සිගරට් පෙට්ටි ටික තබා තිබෙන්නේ. මම කියන්නේ බොරු නම් අද ගිහින් බලන්න. අපි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හරහා සුපිරි වෙළඳ සැල් ජාලවල ප්‍රධානීන් ඔක්කෝම ගෙන්වා අහනවා, එහෙම වෙන්නේ කොහොමද කියා. පොඩි දරුවන්ගේ ටොෆි චොකට් සහ සිගරට් පෙට්ටි එකට තියන විද්‍යාත්මක ක්‍රමය මොකක්ද කියා අපි ඒ අයගෙන් අහනවා.

විදේශීය කොම්පැනිවල කිරි පිටි racksවල උඩ පේළිවල, ඇස් මට්ටමේ තබා තිබෙනවා. කොන්දේ අමාරු තිබෙන මනුස්සයාට නැමිලා ගන්න දේශීය කිරිපිටි ටික පහළින් තබනවා. එහෙම කරන්නේ කොහොමද? ඒ නිසා, අපි මේ සඳහා හොඳ යන්ත්‍රණය හදනවා. අපි ඖෂධ මාෆියාව බින්දා වාගේ, සිගරට් කොම්පැනි මාෆියාව බින්දා වාගේ, ත්‍රිවිධ හමුදාවට ආහාර දෙනකොට තිබුණු මාෆියාව අවුරුදු ගණනක් තිස්සේ කෑ ගහලා බින්ද වාගේ, ජාතික පාසල්වල විදුහල්පතිවරු පිස්සු නටපු මාෆියාව බින්දා වාගේ මේ මාෆියාවත් බිඳිනවා. ඒ ගැන අපට විශ්වාසයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැයෙන් අපි මේ රට පැහැදිලි මාර්ගයකට ප්‍රවිෂ්ට කර තිබෙනවා. අපි අවුරුදු 4ක් පුරා ආපු ගමනේදී සමහර තැන්වල තිබුණු අඩු පාඩුකම් හදා ගෙන, පළාත් පාලන මැතිවරණයේදී ජනතාව දුන් තීන්දු එක්ක ඉදිරියට යන්න සිදු වෙනවා. ඕනෑම දේශපාලනඥයකුගේ අතින් වැරැදි වෙන්න පුළුවන් වාගේම ඒ වැරදි නිවැරැදි කර ගන්නත් අයිතිය තිබෙනවා. ඒ නිසා තමයි දෙසැරයක් කැරලි ගැසූ ජනතා විමුක්ති පෙරමුණේ අය අද පාර්ලිමේන්තුවේ ඉන්නේ.

1970 - 1977 පෝළිම් යුගය වෙනස් කරගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ දේශපාලන ව්‍යාපාර ආපසු වතාවක් වෙළඳපොළ ක්‍රමයට අනුගත වෙන්නේ. ඒ නිසා ඕනෑම දේශපාලන ව්‍යාපාරයකින් වැරදි වෙනවා වාගේම ඒ වැරදි නිවැරදි කර ගන්නත් දේශපාලන ව්‍යාපාරවලට තිබෙන ශුද්ධ වූ අයිතියට අපි ගරු කරන්න ඕනෑ. ඒ නිසා පසුගිය මැතිවරණවලදී ජනතාව දුන් විවිධ පණිවිඩ, ඒ වාගේම ඔක්තෝබර් 26 වෙනිදායින් පසු කාලය තුළ අපට සන්නිවේදනය වුණු, අපට සංඥාපනය වුණු පණිවිඩ උකහා ගනිමින් අපි මෙවර අය වැය හරහා ඉදිරි ජනාධිපතිවරණය දක්වා කාලය තුළ අපේ ප්‍රතිපත්ති වඩාත් සංවිධිතව ජනතාව දක්වා -තෘණමූල මට්ටම දක්වා- ක්‍රියාත්මක කර ජනාධිපතිවරණයේදී අපි ජනතාව හමුවට ගිහිල්ලා අහනවා, අපි ගිය ගමන හරි ද වැරදිද කියා. ජනතා තීන්දුව ගැන අපේක්ෂාවෙන් තමයි අපි මේ ගමන යන්නේ. ඒ සඳහා තැබූ ඉතා සාධනීය පියවරක් විධියටයි මෙවර අය වැය ලේඛනය අපි දකින්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්තුතියි.

මීළඟට, ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

Before he starts, will an Hon. Member propose the Hon. K. Thurairetnasingam to the Chair?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
I propose that the Hon. K. Thurairetnasingam do now take the Chair.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. K. THURAIRETNASINGAM *took the Chair.*

[අ.භා.2.44]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුද්ධික පතිරණ මැතිතුමා නතර කළ තැනින් කථාව ආරම්භ කරන්න ඕනෑ කියා මා හිතුවා. එතුමා මුලින්ම සඳහා කළා, එතුමන්ලා 2013 -2014 ඉඳලා සමාජ වෙළඳපොළ ආර්ථිකයක් පිළිබඳව තමයි කථිකාවක් ඇති කර ගත්තේ; ඒ මත පදනම් වෙලා තමයි මෙවර අය වැය දැන් සකස් වෙලා තිබෙන්නේ කියා. හැබැයි, ඒ ගමන්ම එතුමා නව ලිබරල්වාදී ආර්ථිකයක් සම්බන්ධයෙන් සඳහන් කළා. විශේෂයෙන් අපේ රතන ස්වාමීන් වහන්සේ එක්සත් රාජධානියේ ලේබර් පක්ෂය දැන් ඉදිරිපත් කර තිබෙන ආර්ථිකය පිළිබඳ දැක්ම ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම ලෝකයේ නව ලිබරල්වාදී ආර්ථිකයක් එළි දකින්න පටන් ගත්තේ 1980 දශකයේ එක්සත් රාජධානියේ මාග්‍රට් තැචර් අගමැතිනියගේ නායකත්වයෙන් සහ ඊට සමගාමීව ඇමෙරිකාවේ රොනල්ඩ් රේගන් ජනාධිපතිතුමාගේ කාලවකවානු තුළ තමයි මේ සියලු ගමන දිගටම ආවේ. හැබැයි, එදා මෙතුමන්ලාගේ පක්ෂයේම නායක ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඒක කරපින්නාගෙන ගිය එක තමයි දිගටම කළේ. දැන් මෙතුමා සමාජ වෙළඳපොළ ආර්ථිකයක් ගැනයි සඳහන් කරන්නේ. නමුත් මට නම් පෙනෙන්නේ නැහැ, මෙවර ඉදිරිපත් කරපු අය වැයේ සමාජ වෙළඳපොළ ආර්ථිකයක් පිළිබඳව ඉඟියක්වත් තිබෙනවා කියා; දැක්මක්වත් තිබෙනවා කියා. ඒ නිසා ඉතාම පැහැදිලිව මා සඳහන් කරනවා මෙවර අය වැය ඉදිරි

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

දැක්මක් නැති, වැඩ පිළිවෙළක් නැති, කිසිම ආර්ථික න්‍යායකට සම්බන්ධ කළ නොහැකි අය වැයක් කියා. එතුමාගේ කථාවේ අවසානයේ කිව්වා වාගේ මේක තව මාස 10කින් පැමිණෙන ජනාධිපතිවරණයක් ඉලක්ක කරගෙන හදපු අය වැයක්. එහෙම නම්, මෙවර අය වැය ලේඛනයට වඩා හොඳයි ආදායම් වියදම් ගිණුමක් හදලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගත්තා නම්. මේ ඒකනේ කර තිබෙන්නේ. මාස දහයකටයි මෙවර අය වැය හදලා තිබෙන්නේ. රටක අය වැයක් හදන්නේ මාස දහයකට නොවෙයි. මේ රටේ ආර්ථිකය කඩාගෙන වැටිලා තිබෙනවා. අපි දැක්කා, අපේ මුදල් ඇමතිතුමා මෙවර අය වැය ඉදිරිපත් කරනකොට කිව්වා, "පසුගිය ආණ්ඩුව 2015දී භාරදුන් කාල බෝම්බය." කියා. කාල බෝම්බය පුපුරවා ගන්නේ නැතුව තියා ගත්තා කියා කිව්වා. හැබැයි, පළමුවෙනි කාල බෝම්බය පුපුරුවා ගත්තේ කවදා ද? 2015 ජනවාරි 08 වෙනිදා වෙනස සිද්ධ වුණා. 2015 පෙබරවාරි 27 වෙනිදා මහ බැංකුවේ කාල බෝම්බය පුපුරුවා ගත්තා. ඒ පුපුරුවා ගත් කාල බෝම්බයේ ප්‍රතිඵල තමයි මේ අවුරුදු හතර තිස්සේ ඉදිරියට ඇවිල්ලා, තවත් අවුරුදු 25කට ඉදිරියට යන්නේ. අවුරුදු 30ක් යනතුරු මේක යනවා, රටට වුණු පාඩුව සහ ආර්ථිකයට වුණු ට්‍රිලියන ගණනාවක පාඩුව ව්‍යවහාරික විගණනයකින් හඳුනා ගන්නාතුරු. මේ සියල්ලම ඒ පෙබරවාරි 27 වෙනිදා කාල බෝම්බයේ ප්‍රතිඵල නිසායි ඇති වුණේ. කාල බෝම්බය පත්තු කරන්න අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවේ ඉඳලා ලංකාවට ගෙනාවේ කවුද? රැක්කේ කවුද? උපදෙස් දුන්නේ කවුද? ආධාර සහ අනුබල දුන්නේ කවුද? අන්න ඒ අය තමයි මේ රටේ මේ අවුරුදු හතරේ ආර්ථිකය කඩා වැටීමට වග කියන්න ඕනෑ. අද රටේ පහළම මට්ටම ඉඳලා ඉහළම මට්ටම දක්වා සෑම පුරවැසියෙකුටම ජීවත්වීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. එදිනෙදා දරුවන් පාසල් යවන්නේ කොහොමද? කෑම වේල දෙන්නේ කොහොමද ? ජීවත් වෙන්නේ කොහොමද කියන එක ප්‍රශ්නයක්.

මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වැඩිය කොහේවත් යන්න ඕනෑ නැහැ. අපේ මේ ආපන ශාලාවට ගිහිල්ලා, ආපන ශාලාවේ සේවය කරන සේවකයොත් සමඟ කථා කරන්න. එහෙම කථා කර බලන්න. ජූලි මාසයේ පළමුවැනිදා ඉඳලා රජයේ සේවකයින්ට රුපියල් 2,500ක් වැඩි කර, මේ දෙසැම්බර් මාසයේ එන මැතිවරණය වෙනුවෙන් මැතිවරණ අල්ලසක් දීලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මේ මාස හතර යන්නේ කොහොමද? මේ මාස හතර ණය වෙලා යනවා. ජූලි පළමුවැනිදා සිට වැඩි කරන මුදල ගත්තාම ණය ටික ටික ගෙවනවා. එතකොට කුණු බැණුම් අහන්නයි වෙන්නේ. කුණුහරුප කිය කියා තමයි ඡන්ද පොළට යන්නේ. එදාට හම්බ වෙයි, ඡන්දය. එදාට හම්බ වෙයි, ඡන්දය! [බාධා කිරීමක්]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
අපි බලාගන්නම්.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
හරි, හරි. ඉස්සරවෙලා මේ ටික අහගෙන ඉන්න. [බාධා කිරීමක්] අහගෙන ඉන්න.

දැන් බුද්ධික පතිරණ මැතිතුමා මේ ගරු සභාවෙන් පිටව ගියා. හැබැයි, එතුමා මොකක්ද කිව්වේ? මත් වතුර. මත්පැන් කිව්වේ නැහැ. දුම්කොළ. මේවා පිළිබඳව එතුමා අවධානය යොමු කළා. සෞඛ්‍යයට හොඳ නැහැ, මතට තිත. මේ සියල්ල කිව්වා.

හොඳයි, මෙවර අය වැය කථාවේ 41 වෙනි පිටුව අරගෙන බලන්න, කොහොමද අය වැයක් පියවා ගන්න ආදායම හොයන්නේ කියා. දශලක්ෂ තිස්හත්දහසක් සිගරට්, අරක්කු සඳහා බදු පනවා තිබෙනවා. කොහොමද? මතට තිත තියන්න නේ කථා කළේ. මත්පැන් කියන්නවත් කැමැති වුණේ නැහැ, "මත් වතුර" කියායි කිව්වේ. අය වැයේ මොකක්ද කියන්නේ? ගල් අරක්කු හැර අනෙක් ඔක්කොම ඒවායේ මිල වැඩි කළා. කොහෙන්ද අය වැය පියවන්නේ? එතකොට මොකක්ද කරන්නේ? එහෙනම් මේ ටික ඔක්කෝම කපලා දැම්මාම ඉවරයිනේ. දශලක්ෂ තිස්හත්දහසක් එතකොට අය වැයට එන්නේ නැහැ. එතකොට රජයේ සේවකයින්ට රුපියල් 2,500ක් වැඩි කරන්න බැහැ. රුපියල් දශලක්ෂ තිස්හත්දහසක් කෝ, මාස හයට? ඒක නැති වෙනවා.

ඊළඟට බලන්න ආනයනය කරන දුම්කොළ, අරක්කුවලට තවත් මිලියන විසිදහසක් ආපහු බදු සංශෝධන ඇති කර තිබෙනවා. මේ දෙකේ එකතුව විතරක් දශලක්ෂ පනස්හත්දහසක්. දුම්වැටි සහ අරක්කුවලට. මහා උජාරුවට කිව්වා, "සිගරට් බීමෙන් වන සියයට අසූවක් හානිය ගැන සිගරට් පෙට්ටියේ ගහලා තිබෙනවා." කියා. හැබැයි, ඒ හානි වන දෙයින්ම තමයි අය වැය පියවන්න හදන්නේ. මේවා එකිනෙකට පරස්පර විරෝධී කථා.

ඊළඟට, ආර්ථිකය නැංවීම සඳහා තිබෙන යෝජනා මොනවාද? මෙන්න සේවා අංශයේ වර්ධනය. 2017 සියයට 3.2යි. 2018 වර්ෂයේ සියයට 4.4යි. මහා පැරකුම්බා යුගයට වඩා යුගයක් නේ දැන් ඇවිල්ලා තිබෙන්නේ.

රජය විසින් මුද්‍රණය කර අපට ලබා දුන් "රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව-2019." තමයි මේ තිබෙන්නේ. එහි මුල් පිටු ටිකේ සාරාංශය අරගෙන බලන්න, කොහොමද තිබෙන්නේ කියා. කෘෂිකර්ම අංශය 2017දී ඍණ 3.5යි. වර්ධනයක් නොවෙයි, ඍණ 3.5යි. 2018 වෙනකොට යම්තම් සියයට 4.3 දක්වා වැඩි වෙලා තිබෙනවා. කීයට තිබුණු කෘෂිකර්මයද මෙහෙම වැටිලා තිබෙන්නේ. හැබැයි, කථාව නම්, මහා පැරකුම්බා රජ්ජුරුවන්ට පස්සේ පැරකුම් යුගයක් බිහි වෙලා තිබෙනවා කියායි.

ඊළඟට, කර්මාන්ත අංශය 2017 සියයට 4.8යි. 2018 වෙනකොට සියයට 1.8යි. ඒ විධියට මේ පොතේ තමයි තිබෙන්නේ. මේක මුදල් අමාත්‍යාංශය විසින් මුද්‍රණය කරන ලද පොතක්. එහි සඳහන් ආකාරයට කර්මාන්ත අංශය බිඳ වැටිලා, දේශීය කර්මාන්තකරුවෝ බිඳ වැටිලා.

"Enterprise Sri Lanka" වැඩසටහන යටතේ ව්‍යවසායකයන් 30,000කට වඩා ප්‍රතිලාභ ලබා ගෙන ඇති අතර, මේ සඳහා රුපියල් මිලියන 60,000ක් වෙන් කර තිබෙනවා. රුපියල් මිලියන 2 ගණනේ දෙනවා කියමු. ඒක දෙනකොට දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් කී දෙනෙක් අද බිමට සමතලා වෙලා ගිහිල්ලාද? බැංකු පොලිය වැඩි වෙලා. අයිරාවක් ගන්න ගියොත්, පොලිය සියයට 24න් එහා. නිකම් ණයක් ගන්න ගියොත් පොලිය සියයට 19යි, 20යි, 21යි. අපේ ආණ්ඩු කාලයේ තනි ඉලක්කමේ තිබුණු පොලී අනුපාතය අද සියයට 20න් එහාට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා කර්මාන්තකරුවන්ට ණය ගන්න වැඩි පොලියක් ගෙවන්න ඕනෑ. භාණ්ඩ මිල ඉහළ යනවා. වැටුප් ගෙවාගන්න බැහැ. පෞද්ගලික අංශයේ සුළු හා මධ්‍ය පරිමාණයේ ආයතන පවත්වා ගෙන යන්න බැරි වෙලා, ආයතන කීයක් වසා දමා තිබෙනවාද කියා මම අහනවා.

මම උදාහරණයක් කියන්නම්. ඊ.බී. ක්‍රීසි සහ සමාගම අවුරුදු කිහිපයකට පෙර හඳුන්කූරු නිෂ්පාදනය කරන්න පටන් ගත්තා.

තුන්සියයකට වැඩි පිරිසක් එහි සේවය කරනවා. දැන් හඳුන්කූරු නිෂ්පාදනයත් වැටිලා. මොකද, දේවස්ථානවලට, විහාරස්ථානවලට, කෝවිල්වලට ගියාට හඳුන්කූරු පත්තු කරන්න වත්කමක් නැහැ. ඒවාට ගිහිල්ලා නිකම් වැඳලා එනවා. මේක තමයි තත්ත්වය. මේ ගොල්ලෝ කථා කරන්නේ කොහොමද? මහ බැංකුවට හෙණ ගැහුවාම, අනෙක් ඒවා කොහේද නවතින්නේ? දැන් ඒවා වහලා, ඒ සියල්ල වහලා. මහ බැංකුවට මොනවත් වෙලා නැහැ. අර්ජුන මහේන්ද්‍රන් ගැන කථාවක් නැහැ. දැන් කොකේන් කථා මතුපිටට එනවා. වෙන වෙන කථාවල් මාධ්‍ය උඩට ගන්නවා. එහෙම ගෙනෙන්න දෙනවා. මෙන්න මේ විධියට තමයි කටයුතු කෙරෙන්නේ.

දැන් ආර්ථික වර්ධන වේගය කීයද, මේ පොතේ හැටියට? සියයට 3 .5 - 4.00 අතර. කොහොමද රටක් මෙතැනින් එහාට යන්නේ? ආර්ථික සංවර්ධනය GDP එකෙන් සියයට 7න් එහාට නොගියොත් කවදාවත් රටක් සංවර්ධනය කරන්නට බැහැ. අපි ඒක තේරුම් ගන්නට ඕනෑ. ඒකට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? මොකක්ද, රටේ ආර්ථික සංවර්ධනය, කෘෂිකර්ම සංවර්ධනය, කර්මාන්ත සේවා අංශය ගැන මේ අය වැයේ ඇති පුරෝකථනය? මොකුත් නැහැ. දස ලක්ෂයක් තරුණයන්ට රැකියා දෙනවාය කිව්වා. මේ අවුරුදු 4 ඇතුළත කී දෙනෙකුට මේ රජය රැකියා දුන්නා ද, රැකියා කීයක් උත්පාදනය කළාද කියා මම අහනවා. කුරුණෑගල ගිහින් අක්කර 60ක පොල් ඉඩමක පොල් ගස් ටික කපා සමතලා කළා. මොකක් දාන්නද? වොක්ස්වැගන් කර්මාන්ත ශාලාවක් දාන්න. මේ ගොල්ලෝ දන්නේ නැහැ, වොක්ස්වැගන් එකේ ඒ ව්‍යාපෘතිය චීනයට විකුණලා. දැන් චීනයේ ෂැන්හායිවල පුඩොන් නිදහස් වෙළෙඳ කලාපයේ තමයි වොක්ස්වැගන් රථ නිෂ්පාදනය කරන කම්හල තිබෙන්නේ, බද්ධ ව්‍යාපාරයක් - joint venture එකක්- හැටියට. කෝ දැන් වොක්ස්වැගන්? මෙහෙම කොහොමද, රැකියා උත්පාදනය කරන්නේ?

ඊළඟට රුපියලේ අගය අවප්‍රමාණය වීම ගැන බලමු. රුපියලේ අගය අවප්‍රමාණය වීම නවත්වන්නට නම් සංචිත වැඩි කරන්න ඕනෑ; අපනයන වැඩි කරන්න ඕනෑ; ආනයනය සීමා කරන්නට ඕනෑ; දේශීය විකල්පයන් අපි ඇති කරන්නට ඕනෑ. කෝ වැඩ පිළිවෙළක්? මේ අය වැයෙන් කිසිදු යෝජනාවක් ඒකට නැහැ.

ග්‍රාමීය ආර්ථිකය සමතලා වෙලා ගිහිල්ලා. උදේ කථා කළ ගරු එස්.බී. දිසානායක මැතිතුමා කිව්වා, ගම්මිරිස්වලට වෙච්ච දෙය; කුරුඳුවලට වෙච්ච දෙය. ග්‍රාමීය ආර්ථිකය බිඳ වැටුණා. අද ගමේ මිනිසුන්ට ඔට්ටුපාලු ටිකක් එකතු කරලාවත් විකුණා ගන්නට බැරි තැනකට ඇවිත් තිබෙන්නේ.

ඉඩම් මිල ඉහළ ගිහිල්ලා. නමුත් ගන්න මිනිසුන් අතේ සල්ලි නැහැ. එම නිසා ඉඩම් විකිණෙන්නේ නැහැ. පෞද්ගලික අංශ බැංකුවෙන් ණය අර ගෙන apartments හැදුවා. පාරිභෝගිකයා දැන් ඒ කොටසටම නැවත ණයක් ගන්නවා. දැන් මේක බිඳ වැටුණාම ගිහිල්ලා කොහෙන්ද නවතින්නේ? ඒවාට වැඩ පිළිවෙළක් නැහැ. මුදල් සංසරණය වැටිලා.

දේශීය කර්මාන්තකරුවෝ මහා පරිමාණයෙන් සිටියා, Access Engineering, Sierra Construction,Tudawe Brothers and Maga Engineering වැනි අය. දැන් මේ අයට මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් මේ සියල්ල, මිලියන 500 තිබෙන කර්මාන්ත ඉදිකිරීම් පවා, විදේශ සමාගම්වලට ගිහිල්ලා. මේ අය වැයේ යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා, joint venture කරන්නට ඕනෑය කියා. දැනුයි මතක් වෙලා තිබෙන්නේ. දැන් මේ සියල්ල දෙන අයට දීලා ඉවරයි.

අද උප කොන්ත්‍රාත්කරුවන්ට මුදල් නැහැ, පෙදරේරුවන්ට ගෙවන්නට; කුලීකරුවන්ට ගෙවන්නට. අද ඒ තැනට ඔවුන් වැටිලා. මම මේ කියපු කරුණු සියල්ලම මේ වෙනකොට සිදුවෙලා හමාරයි.

ඊළඟට අපි බලමු, රැකීරක්ෂා දස ලක්ෂය ගැන. ඊළඟ ජනාධිපතිවරණය වෙනකොට මිලියන 1.5ක් තරුණයෝ අලුතෙන් එකතු වෙනවා. දැන් මොකක්ද, ඊළඟට ගිහින් කියන්නේ? එදා ලක්ෂ 10කට රැකියා දෙනවාය කිව්වා. දැන් ලක්ෂ15ක් අලුතෙන් ඇති වෙලා. එදා ලක්ෂ 12ක් තරුණයෝ සිටියා. ඒ අයගෙන් ඡන්දය ගන්නයි ලක්ෂ 10කට දෙනවාය කිව්වේ. දැන් කීයකට දෙන්න වෙනවාද? දැන් ලක්ෂ විසිපහකට දෙන්න වෙනවා. හැබැයි වැසීගෙන යන ප්‍රමාණයට enterprise කර හරියන්නේ නැහැ. තාක්ෂණ දැනුම කෝ? තාක්ෂණ දැනුම රටට ගෙන එන්න, අගය එකතු කරන්න තිබෙන වැඩ පිළිවෙළ කෝ?

මම ඒ කාලයේ ඛනිජ සම්පත් පිළිබඳ ප්‍රතිපත්තියක් මම ගෙන එන්න හැදුවා. ඒක තවම ගේන්න බැරි වුණා. අපේ රටේ ඉල්මනයිට් පස් පිටින් එහෙමම විදේශයට යනවා; ක්වාර්ට්ස් එහෙමම යනවා; මිනිරන් එහෙමම යනවා. කෝ ඒවාට අගය එකතු කිරීමට වැඩ පිළිවෙළක්? කෝ යෝජනා කර තිබෙනවා? කවදාවත් සාම්ප්‍රදායික අපනයන්ගෙන්, අපේ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණවලින් ණය ගැනීමෙන් මේ රටේ ආර්ථිකය හදන්නට පුළුවන්කමක් නැහැ. සිංගප්පූරුව අවුරුදු විස්සකට කලින් කළේ money market එක. දැන් අද කොහාටද ඒ අය ගිහින් තිබෙන්නේ? අද ඔවුන්ජෛව තාක්ෂණය ඔස්සේ ඖෂධ නිෂ්පාදනය කරන ඒ ලෝකයට තරගකාරී ලෙස ගිහින් ඉවරයි. අද ඒ රට ට්‍රිලියන ගණනක් ආදායම සොයනවා. රටේ ජනගහනය කොච්චර ද? රටේ ප්‍රමාණය කොච්චර ද? කෝ ඒ සඳහා අද අපට වැඩ පිළිවෙළක්? අඩුම තරමේ නැනෝ තාක්ෂණ විද්‍යාගාරයක්වත් හැදුවේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යටතේ. වෙන කිසි දෙයක් කරලා නැහැ. ලෝකයේ කිසිම රටක තාක්ෂණය නැතිව ආර්ථිකය සංවර්ධනය කරන්නට බැහැ. ඒ සඳහා අවශ්‍ය දැනුම තිබෙන අය අපේ රටේ ඉන්නවා; විද්‍යාඥයෝ ඉන්නවා; නිපැයුම්කරුවන් ඉන්නවා. කෝ නිපැයුම්කරුවන්ට "Enterprise Sri Lanka" දෙනවා? වාර්ෂිකව සම්මාන ගත් නව නිපැයුම්කරුවන් කී දෙනෙක් කොමිසමේ ලියාපදිංචි වෙලා තිබෙනවා ද? දැන් ඒ ගොල්ලන්ටද දෙන්නේ "Enterprise Sri Lanka" ?

ඊළඟට, රණවිරුවන් ගැන කථා කළා. රණවිරුවන් ජාත්‍යන්තර අධිකරණයට ගෙන යන අතරතුර මේ පැත්තෙන් දීමනා කිහිපයක් වැඩි කරලා කියනවා, "රණවිරුවන් ගැන කථා කරන්නේ අපියි." කියලා. අපට මතකයි, තොප්පිගල මුදාගන්නකොට කිව්වේ මොකක්ද කියලා. තොප්පිගල කියන්නේ මහ වනයක් කිව්වා. කවුද කිව්වේ? ඒ අය දැන් රණවිරුවෝ ගැන කථා කරනවා.

ඊළඟට, ගම්පෙරළිය ගැන කථා කරනවා. ගම්පෙරළිය වාගේ කී ගුණයක වැඩ අපේ ආණ්ඩුවෙන් අපි කළාද? ගම්පෙරළිය වැඩසටහන සඳහා මේ වසරේ රුපියල් දසලක්ෂ හතළිස්අටදහසක් වෙන් කරලා තිබෙනවා. අපි 2012, 2013, 2014 වසරවල ගම්පෙරළි කීයක් කළාද? ගම් පෙරළලා තිබුණේ. ආයේත් පෙරළන්න දෙයක් නැහැ. දැන් මිනිසුන් ගම පෙරළන්න බලාගෙන ඉන්නවා. ගම පිටින්ම පෙරළනවා. ඒකට ලෑස්ති වෙලා ඉන්නේ.

මෙන්න ආදායම් සොයන මාර්ග. මේ රුපියල් දසලක්ෂ හතළිස් අටදහස මොකක්ද? වාහනවලට සුඛෝපභෝගී tax එක ගහනවා. එතකොට මොකද වෙන්නේ? වාහන ආනයනය සීමා

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

වෙනවා. එතකොට විදේශ විනිමය යන්නේ නැහැ. එතකොට මේ බදු ආදායම, රුපියල් දසලක්ෂ හතළිස්අටදහස එන්නේ කොහොමද? මම ඔට්ටු දමලා කියනවා, මේ අවුරුද්ද තුළ මෙම දසලක්ෂ හතළිස්අටදහසෙන් භාගයක්වත් සොයන්න ලැබෙන්නේ නැහැ කියලා. එතකොට වියදම පියවන්නේ කොහොමද? රුපියල් 2,500 දීමනාව ගෙවන්නේ කොහොමද? ඒවා කරන්න පුළුවන්කමක් වෙන්නේ නැහැ.

සිගරට්, අරක්කුවලින් රුපියල් මිලියන 37,000යි, විදේශ ගමන් බලපත්‍රවල ගාස්තු වැඩි කිරීමෙන් රුපියල් මිලියන 8,000යි. විදේශ ගමන් බලපත්‍ර වැඩි හරියක් ගන්නේ කවුද? වර්ෂයකට එක්ලක්ෂ පනස්දහසක් පමණ රැකියා සඳහා විදේශගත වෙනවා. මේ, අය ඉහළ රැකියා කරන අය නොවෙයි; පහළම මට්ටමේ රැකියා කරන අය. ඒ ගොල්ලන්ට තමයි passport එකට මේ ගණන දෙන්න වෙන්නේ. රජයේ සේවා ගාස්තු වැඩි කරලා නැහැ කියලා, සියයට 15ක් වැඩි කරනවා. උප්පැන්න සහතිකය ගන්න ගියත්, මොන සහතිකය ගන්න ගියත් මේ යෝජනාවත් එක්ක ඉදිරියේදී සියයට 15ක් වැඩි වෙනවා. දුම්කොළ, අරක්කු සහ තේරාගත් භාණ්ඩ සඳහා රේගු ආනයන බද්ද රුපියල් මිලයන 20,000යි. තෝරා ගත් භාණ්ඩ සඳහා ආර්ථික සේවා ගාස්තු රුපියල් මිලියන 15,000ක් වෙනවා. මෙතැනින් රුපියල් දසලක්ෂ එක්ලක්ෂ හතළිස්හයදහසක් නැත්නම් රුපියල් බිලියන 146ක් එනවා. මේවා යථාර්ථයන් නොවෙයි; හුදු ඉලක්කම් පමණයි.

ශිෂ්‍යයින් 14දෙනෙකුට ශිෂ්‍යත්ව දෙනවා කිව්වා. ඒක දෙනවා කිව්වේ MIT එකටයි. අපි යැව්ව පළියට MIT එකට ගන්නේ නැහැ. MIT කියන්නේ මොකක්ද? මෙතැන ඉන්න මන්ත්‍රීවරු කියන්න බලන්න, MIT කියන්නේ මොකක්ද කියලා. මුදල් ඇමතිතුමා කිව්වා නේ. MIT කියන්නේ Massachusetts Institute of Technology. Harvard University එකට මෙහායින් ඒක තිබෙන්නේ. MIT එක තමයි ලෝකයේ පළමුවැනි දෙවැනි, තුන්වැනි ස්ථාන අතර හැම දාම ඉන්නේ. MIT එකට මෙහෙන් යැව්ව පළියට ගන්නේ නැහැ. ඒ ගොල්ලන් විභාගයක් තියලා, viva එකක් තියලා ඒ ගොල්ලන්ගේ කඩඉම් ලකුණු ගත්තොත් විතරයි ගන්නේ. මේවා මිනිසුන්ව නළවන්න කියන කථා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
යොමු කරන්න පුළුවන් නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
යොමු කරන්නවත් බැහැ. සල්ලි තිබුණු පළියට ගන්නේ නැහැ. එහෙම ගත්තා නම් MIT එක අද ඔය තැන තියෙන්නේ නැහැ. අපි දැකලා තිබෙනවා, අපි බලලා තිබෙනවා. ඒ මොකුත් නැතිව මෙතැන ඇවිත් දොඩවනවා. පුළුවන් නම් මුදල් ඇමතිතුමාට තමන්ගේ ජංගම ගිණුමේ reconciliation එක කරලා පෙන්වන්න කියලා කියන්න debit, credit දෙපැත්තට දාලා .

එම නිසා මම එකක් කියන්නම්. මේ රටේ ආර්ථිකය හදන්න, වැටිලා තිබුණු තැනින් ගොඩ ගන්න ජනාධිපතිවරණයක් ඉලක්ක කරගෙන මාස දහයකට අය වැයක් හදලා හරියන්නේ නැහැ. දැක්මක් ඇතිව, වැඩ පිළිවෙළක් එක්ක සමස්ත ජනතාව සහභාගි කරවා ගෙන, මේ රටේ සිටින විශේෂඥයන්, විද්‍යාඥයන්, ආර්ථික විද්‍යාඥයන්, බුද්ධිමතුන් එකතු කරගෙන තමයි අපට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙන්නේ. එවැනි සමාජයක් හැදුවේ නැත්නම්, එවැනි වැඩ පිළිවෙළකට ගියේ නැත්නම් මේක හදන්න බැහැ. ඒක කරන්න නම් ඔය කොකේන් ගහනවාය කියන කට්ටිය මේකෙන් එළියට දමන්න ඕනෑ.

බැඳුම්කර සිද්ධියේ වාර්තාවෙන් එළියට ආවා නේ මිලියනය, දෙක, තුන ගත්තා කියන අය. ඒ ගොල්ලන් අද කෝප් කමිටුවටත් ගිහිල්ලා ඉස්සරහ ඉන්නවා. මේ අය පැත්තකට දමලා ජනතාවට නියම මහජන නියෝජිතයන් තෝරා ගැනීමට හැකි වන ආකාරයට මහ මැතිවරණයක් පවත්වන්න කියා යෝජනා කරමින්, මෙවැනි කිසිදු තේරුමක් නැති අය වැයක් ඉදිරිපත් කරලා තවදුරටත් මේ රටේ ජනතාව පීඩනයට පත් කරන්න එපා කියන යෝජනාව කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.02]

**ගරු සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019 වර්ෂයේ අය වැය සම්බන්ධව අදහස් දැක්වීමට අවස්ථාව සලසා දීම ගැන පළමුකොට ඔබතුමාට මගේ ස්තුතිය පුද කරන්නට ඕනෑ.

මේ අය වැය ගැන නොයෙකුත් ආකාරයේ විවේචන එල්ල වෙලා තිබුණා වුණත්, මේ වාගේ සාධනීය අය වැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමාටත්, මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාටත් අපේ ස්තුතිය පළමුකොටම පිරිනමන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දින කිහිපය මුළුල්ලේම මේ අය වැය සම්බන්ධව සිදු කළ විවාදයේදී ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා පක්ෂ විපක්ෂව විවිධ අදහස් උදහස් දක්වන්න යෙදුණා. විශේෂයෙන්ම විරුද්ධ පක්ෂය නියෝජනය කරන ඒකාබද්ධ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ අය වැය සම්බන්ධව දැකපු කාරණා ගැන සහ කරපු විවේචන සම්බන්ධව යම්කිසි පිළිතුරක් ලබාදීම මේ අවස්ථාවේදී කාලෝචිතයි කියලා මම හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අය වැය ගැන කථා කරද්දී අපට 2015 අවුරුද්දේ ඉඳන් කථා කරන්න සිද්ධ වෙනවා. මොකද, 2015 අවුරුද්දේදී තමයි අපි නව රජයක් පිහිටුවලා, ජාතික ආණ්ඩුවක් ඇති කරලා, මේ ප්‍රශ්නවලට අවුරුදු තුනක, හතරක, පහක විධිමත් වැඩ පිළිවෙළක් යටතේ විශේෂ වැඩසටහනක් දියත් කළේ. අද දවසේ බොහෝ දෙනෙක් කථා කළේ 2015ට ඉස්සෙල්ලා රටේ තිබුණු තත්ත්වය ගැන අමතක කරලායි කියන එකත් මම කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2015 අවුරුද්දේ මේ ආණ්ඩුව බාර ගන්නකොට මේ රටේ තිබුණු තත්ත්වය මොකක්ද කියලා අපි දන්නවා. අද ආර්ථිකය ගැන කොතෙකුත් කථා කළා වුණත්, එදා ආර්ථිකය තිබුණු තත්ත්වය ගැන අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. මේ රට අපට ඔරොත්තු දෙන්නේ නැති ආකාරයේ ණය කන්දරාවක් අරගෙන, ඒ ණය ගෙවා ගන්න බැරිව තිබුණු ආකාරය ගැන අපි දන්නවා.

ජාත්‍යන්තර වශයෙන් විවිධ ප්‍රශ්නවලට මුහුණදීලා, මානව හිමිකම් ප්‍රශ්නවලට මුහුණදීලා නොයෙකුත් ආකාරයේ සම්බාධක පනවපු තත්ත්වයක් උඩ තමයි, 2015 අවුරුද්දේ මේ අය ආණ්ඩුව විසුරුවා ජනාධිපතිවරණයක් පවත්වන්න කටයුතු කළේ. එම අවස්ථාවේ තිබුණ ආර්ථික අර්බුදයටත්, ජාත්‍යන්තර ප්‍රශ්නවලටත්

මුහුණ දෙන්න බැරි නිසා තමයි ඒ වාගේ කඩිනම් මැතිවරණයකට එදා යන්න සිද්ධ වුණේ කියන එක අපි මතක් කරන්න ඕනෑ. ඊට පසුව අපි ජනාධිපතිවරණය ජයග්‍රහණය කරලා, පාර්ලිමේන්තු මැතිවරණයත් ජයග්‍රහණය කෙරුවාට පසුව අපේ රජයට ලොකු අභියෝගයක් තිබුණා. අපේ රටේ වැටිලා තිබුණු ආර්ථිකය ගොඩ ගන්නේ කොහොමද, පිට රටවලින් ගත්ත විදේශ ණය ගෙවන්නේ කොහොමද, ජාත්‍යන්තර වශයෙන් ගත්ත විදේශ ණය ටික ගෙවන්නේ කොහොමද කියන ප්‍රශ්නත් අප හමුවේ තිබුණා. ඒ වාගේම අපට තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි, මේ රට ජාත්‍යන්තර වශයෙන් පිළිගත්ත රටක් බවට පත් කරන්නේ කොහොමද කියන එක. ඒ වාගේම, අපේ රණ විරුවන්ටත්, දේශපාලන නායකයන්ටත් තිබුණු මානව හිමිකම් චෝදනා සම්බන්ධව යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන ලොකු අභියෝගයට මුහුණපාන්නත් අපට සිද්ධ වුණු බව කවුරුත් දන්නවා. ඊට පසුව අපට ක්‍රමානුකූලව ඒවාට මුහුණ දෙන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න සිද්ධ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ආර්ථිකය හදනවාට වඩා, අනෙකුත් දේවල් කරන්න ඉස්සෙල්ලා මූලික වශයෙන් කළ යුතු කාරණා කිහිපයක් අපට තිබුණා. මේ රට ජාත්‍යන්තර තලයට අරගෙන ගිහිල්ලා ජාත්‍යන්තර විශ්වාසය දිනා ගන්නේ කොහොමද කියන ප්‍රශ්නයත් අපට තිබුණා. ඒ වාගේම, අපට තිබුණු මානව හිමිකම් ප්‍රශ්නවලින් ගොඩ එන්නේ කොහොමද කියන ප්‍රශ්නයත් අපට තිබුණා. ඒ වාගේම, මේ රටේ තිබෙන ආර්ථික ප්‍රශ්නත්, ජාත්‍යන්තරයෙන් ලබා ගත්ත ණය කන්දරාව ගෙවන්නේ කොහොමද කියන අභියෝගයත් එදා අපට තිබුණු බව මම මතක් කරන්න ඕනෑ.

අද කවුරු කොහොම කිව්වා වුණත්, මේ අවුරුදු තුනහමාර, හතර ඇතුළතදී ඇත්ත වශයෙන්ම අපි ඒ අභියෝගයන්ට මුහුණ දුන්නා. විශේෂයෙන්ම මේ වෙනකොට අපට තිබෙන ලොකුම අභියෝගය තමයි, අපට තිබෙන ණය කන්දරාව ගෙවන්නේ කොහොමද කියන එක. මොන ප්‍රශ්න තිබුණත්, මොන දේවල් විවේචනය කළා වුණත්, මේ විශාල ණය ප්‍රමාණය ගෙවීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් පසුගිය අවුරුදු තුනක කාලසීමාව තුළදී අපි ක්‍රියාත්මක කළා කියන එකත් මම මතක් කරන්න ඕනෑ. ඊට අමතරව අපට තිබුණු අනෙක් අභියෝගය ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. 2012, 2013 සහ 2014 වසරවලදී හිටපු ජනාධිපතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයත්, විවිධ අයත් ඒ අවස්ථානුකූලව කිව්වා, "මේ රටේ අපට ලොකු අභියෝගයක් එල්ල වෙලා තිබෙනවා" කියලා. හිටපු ජනාධිපතිතුමාත් ප්‍රකාශ කළා, "ජාත්‍යන්තරය මැදිහත් වෙලා, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම මැදිහත් වෙලා, මාවත්, රණ විරුවනුත් දංගෙඩියට ගෙනියන්න උත්සාහ කරනවා." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ සැසි වාරය ආරම්භ කරනකොට මේ හැම කෙනාම, මේ රටේ හැම තැනම ගිහිල්ලා එදා ප්‍රචාරය කළේ, "අපට ජාත්‍යන්තර වශයෙන් බලපෑම් තිබෙනවා; අපිව දංගෙඩියට ගෙනියනවා; අපේ රණ විරුවෝ හිරේ දාන්න කටයුතු කරනවා." කියලායි. එහෙම අභියෝගයක් තිබුණා. ඇත්ත වශයෙන්ම අපි බලයට එනකොට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමෙන් යෝජනාවක් සම්මත කරලා, එවැනි තත්ත්වයකට පත් වෙමිනුයි තිබුණේ. නමුත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, ආර්ථික අර්බුදය කළමනාකරණය කරන ගමන් අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, අපේ ආණ්ඩුවත් එකතු වෙලා, ඒ අවස්ථාවේදී ජාතික ආණ්ඩුවක් හැටියට ජාත්‍යන්තරයට කරුණු පැහැදිලි කර දීලා, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ යෝජනා නිසා අපේ රට මුහුණ දී ඇති තත්ත්වයෙන් මුදවා ගන්න කටයුතු කළ බව. අද ජාත්‍යන්තර වශයෙන් අපේ රණ විරුවන්ටත්, හිටපු නායකයන්ටත් ඒ සම්බන්ධව අභියෝගයක් නැහැ කියන එක මම කියන්න ඕනෑ. රටක් හැටියට අපි මොකක්ද කෙරුවේ කියලා අහන අයට අපි ලබපු ඒ ලොකු ජයග්‍රහණය පිළිබඳව මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේලා දන්නවා, ඊට අමතරව අපට තිබුණු අනෙක් අභියෝගය මේ රටේ පාලනය සම්බන්ධව කියලා. ඒ කාලයේ රාජ්‍ය පරිපාලනය සම්බන්ධයෙන් තිබුණු දේශපාලන බලපෑම්, පොලීසිය සම්බන්ධයෙන් තිබුණු නොයෙකුත් ආකාරයේ චෝදනා, අධිකරණ ක්ෂේත්‍රයට තිබුණු බලපෑම් අප කවුරුත් දන්නවා. ඒ ගැන අපි අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. අද අධිකරණය ගැන කථා කෙරුවාට, පොලීසිය ගැන කථා කෙරුවාට, රාජ්‍ය සේවය ගැන කථා කෙරුවාට ඒ කාලයේ හිටපු මැති - ඇමතිවරුන්ගේත් ඒ වාගේම ජනාධිපතිතුමාගේත් ඒ වාගේම අනෙකුත් අයගේත් තිබුණු දේශපාලන බලපෑම් ගැන මම මෙතැනදී කියන්න අවශ්‍ය නැහැ. එවකට හිටපු අග්‍රවිනිශ්චයකාරවරියට විවිධ අස්ථාන චෝදනා එල්ල කරලා, මේ පාර්ලිමේන්තුවෙන් ඒවා විභාග කරලා එතුමියව ඉවත් කරන්න කටයුතු කරපු යුගයකුත් තිබුණා කියන එක මතක් කරන්න ඕනෑ. ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් නොයෙකුත් ප්‍රශ්න ඇති වුණා. මේ රටේ යහපාලනයක් නැහැ; මේ රටේ පාලනයේ විනිවිදභාවයක් නැහැ; අනෙකුත් රාජ්‍ය ආයතනවලට ස්වාධීනව කටයුතු කරන්න බැහැ කියන චෝදනාව තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තිබුණා ඒ සම්බන්ධව විශාල වැඩ කොටසක් කරන්න. ඒ වාගේම අපේ මැතිවරණ ප්‍රකාශයේත් තිබුණා, "මේ රටේ රාජ්‍ය සේවය ස්වාධීන කරනවා. ඒ වාගේම අධිකරණය ස්වාධීන කරන්න කටයුතු කරනවා. පොලීසිය ස්වාධීන කරන්න කටයුතු කරනවා" කියලා. ඒ නිසා අපට තිබුණු අභියෝගය තමයි ඒවා ස්වාධීන කරලා කොමිෂන් සභා ටික පිහිටුවලා මේ රට යථා තත්ත්වයට පත් කරන එක. ඒ වාගේම ජාත්‍යන්තර රටවල් එක්ක සංසන්දනය කරන කොට, ඒ රටවල් එක්ක කටයුතු කරද්දී අපේ රට ශිෂ්ට සම්පන්න රටක් බවට පත් කරන්න අපට ලොකු අභියෝගයක් තිබුණාය කියන එක මතක් කරන්න ඕනෑ. ඒ අභියෝගය අපි ජයග්‍රහණය කෙරුවා. ඒ වාගේම අද කොමිෂන් සභා ටික ක්‍රියාත්මක වෙනවා; අධිකරණයේ ස්වාධීනත්වයක් තිබෙනවා; පොලීසියේත් ස්වාධීනත්වයක් තිබෙනවාය කියන එක මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ.

මේ අය කථා කරනවා, විවිධ චෝදනා සම්බන්ධයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් කිසි හොරකමක්, වංචාවක් කරලා තිබෙනවා නම් එහෙම නැත්නම් වැරැදි වැඩක් කරලා තිබෙනවා නම් ඒවා සම්බන්ධව හොයන්නත් මේ හැම කෙනාටම ස්වාධීනව කටයුතු කරන්න අවස්ථාව තිබෙනවා. තොරතුරු දැන ගැනීමේ පනත ගෙනාවේත් වර්තමාන රජයෙන්. ඒවාත් අද ඉතාමත් සාධනීය ලක්ෂණ හැටියට අපට දකින්න පුළුවන්. වංචාව හා දූෂණය ගැන විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් හැම අවස්ථාවකදීම කථා කෙරුවා. ඒවා ගැන කථා කළා වුණත්, ඒවා ගැන හොයන්න බලන්න අවස්ථාව උදා කරලා තිබෙන්නේ වර්තමාන රජයේ යහපත් වැඩ පිළිවෙළ එහෙම නැත්නම් මේ ස්වාධීන වැඩ පිළිවෙළ යටතේ කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විශාල අභියෝගයත් එක්ක ආර්ථිකය කළමනාකරණය කරලා රටක් හැටියට ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියන අභියෝගය අපි හැමෝටම තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කවුරු කොහොම කථා කෙරුවා වුණත් අපට තිබුණු ඒ ණය ගෙවීමේ වැඩ පිළිවෙළ අපි සාර්ථකව කරගෙන ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව රටක් හැටියට ආර්ථික වශයෙන් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන කොට විශේෂයෙන්ම අපට තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි, අපනයන සම්බන්ධව තිබුණු ගැටලු. අද අපනයනය කොහොමද කියලා අහනවා; වැවිලි කර්මාන්තයෙන් ලැබෙන ආදායම කොහොමද කියලා අහනවා. ඒ වාගේම විදේශ ආයෝජන සම්බන්ධව අද මොනවාද වෙන්නේ කියලා

[ගරු සුජිත් සංජය පෙරේරා මහතා]

නොයෙකුත් ආකාරයේ චෝදනා පසු ගිය දවස්වල අපට අහන්න, බලන්න ලැබුණා. පසු ගිය ආණ්ඩුවේ වැඩ පිළිවෙළ නිසා ජාත්‍යන්තර වශයෙන් අපේ අපනයනයට හොඳ තත්ත්වයක් තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ මත්ස්‍ය නිෂ්පාදනය ඒ වාගේම අනෙකුත් නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳ පොළට යන කොට ඒවාට නිසි මිලක් අරගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඇඟලුම් කර්මාන්තයේ නිෂ්පාදන විදේශයට යවන කොට -ඒවා අපනයනය කරන කොට- නියම මිලක් ලබා ගැනීමේ ලොකු අපහසුතාවක් අපේ කර්මාන්තකරුවන්ට තිබුණා. අද කර්මාන්තකරුවෝ රකින එක ගැන කථා කරනවා. කර්මාන්තකරුවන්ට මොකක්ද කෙරුවේ කියලා අහනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වැඩ පිළිවෙළ ජාත්‍යන්තරය පිළිගත් නිසා අපට ජීඑස්පී සහනය ලබා ගන්න පුළුවන්කම ලැබුණා. ඒ තුළින් අපේ අපනයනය දිරි ගන්වන්න වාගේම අපනයන ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා ඉන්න උදවිය දිරි ගන්වන්න විශාල පිටුවහලක් වුණාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

වැඩියෙන්ම විවේචනය එල්ල වුණේ වැවිලි කර්මාන්තය සම්බන්ධවයි. වැවිලි අපනයනය සම්බන්ධව කථා කෙරුවා. තේ කර්මාන්තය ගැන කථා කෙරුවා. ඊට අමතරව රබර් කර්මාන්තය ගැන කථා කෙරුවා. ඒ වාගේම සුළු අපනයන භෝග ගැනත් කථා කරපු අවස්ථාවන් අපි දැක්කා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී වැඩි දෙනෙක් කථා කළේ නැහැ, තේ කර්මාන්තය ගැන. තේ මිල ගැන කථා කෙරුවේ නැහැ. කථා කෙරුවේම රබර් මිල ගැන පමණයි. කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම කියන්න ඕනෑ, තේ කර්මාන්තයේ නියැළිලා ඉන්න ඒ කර්මාන්තකරුවන්ට ඒ වාගේම ඒ ක්ෂේත්‍රයේ නියැළී ඉන්න හැම කෙනාටම විශාල ආදායමක් පසු ගිය කාල සීමාව තුළ ලබා ගන්න පුළුවන් වුණු බව. ඒ මොකක් නිසාද? ඒ අපේ ආර්ථික වැඩපිළිවෙළ නිසා. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන්ගේ මැදිහත් වීමත්, ගරු අගමැතිතුමාගේ මඟ පෙන්වීමත් අපට විශාල වශයෙන් තේ මිල වැඩි කර ගන්න පුළුවන්කම ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය කථා කරන උදවිය ආණ්ඩුව භාරදෙන කොට -2015දී- තේ දළු කිලෝ එකක මිලෙහි තිබුණු තත්ත්වය මොකක්ද කියලා කියන්න ඕනෑ. රුපියල් 56ත්, රුපියල් 60ත් අතර මුදලක් තමයි තේ දළු කිලෝ එකක් සඳහා පසු ගිය කාලයේ ගෙව්වේ. ඒ, 2015දී මේ අණ්ඩුව බලයට එන කොට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද ඉතාමත් සන්තෝෂයෙන් කියන්න ඕනෑ, තේ දළු කිලෝ එකක මිල අද රුපියල් 90යි; එහෙම නැත්නම් 100යි බව. ඒ අතර ගණනකට අද තේ දළු කිලෝ එකක් අළෙවි කරන්න අපේ තේ කර්මාන්තකරුවන්ට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒකත් අපි ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක්. ඒ අය මිල වැඩි වුණු එක ගැන කථා කරන්නේ නැහැ.

ඊළඟට, රබර් මිල ගැන කථා කළා. රබර් මිල ගැන නොයෙකුත් ආකාරයේ විවේචන එල්ල කළා. අද රබර් කර්මාන්තය කරන්නේ නැහැ. ඒක ඇත්ත, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් ඒක අද ඊයේ ඇති වුණු දෙයක් නොවෙයි. මා කියන්න ඕනෑ, 2014දී තමයි රබර් මිල පහත වැටුණේ කියලා. එහෙම නොවෙයි කියලා කාටවත් කියන්න පුළුවන්කමක් නැහැ. මීට පෙර රබර් මිල ඉහළ මට්ටමක තිබුණා. ඒ කාල වකවානුවේදී රබර් මිල රුපියල් 350ක්, රුපියල් 400ක් දක්වා ඉහළ ගිය අවස්ථා අපි දැක්කා. නමුත් දැන් තිබෙන තත්ත්වය 2014 සිටම තිබුණා.මෙය 2015 අපේ ආණ්ඩුව පත්වුණාට පස්සේ තිබුණු තත්ත්වයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2014දී තමයි මිල පහළ යෑම පටන් ගත්තේ. මේ මිල තිබුණේ ඒ මට්ටමට. ඊට පස්සේ 2015 අපේ ආණ්ඩුව පත්වුණාම රබර් ගොවීන්ට යම්කිසි සහනාධාරයක් ලබාදෙන්න කටයුතු කළේත් ඒ හේතුව නිසායි. ඒ නිසා රබර් මිල සම්බන්ධයෙන් මේ රජයට විතරක් චෝදනා කිරීම සාධාරණ නැහැ. රබර් කර්මාන්තය දියුණු කරන්න අපි විශාල වැඩපිළිවෙළක් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. වතු කම්කරුවන්ගේ වැටුප ගැනත් කථා කළා. ඒ සම්බන්ධව යමක් මා කියන්න ඕනෑ. විශේෂයෙන් වතු කම්කරුවන්ගේ වැටුප සම්බන්ධව අපි සාකච්ඡා කළා. වෘත්තීය සමිති එක්කත්, අපේ නවීන් දිසානායක ඇමතිතුමා එක්කත් සාකච්ඡා කළා. වතු කම්කරුවන්ගේ වැටුප අනිවාර්යයෙන්ම වැඩි කරන්න ඕනෑ. එය අපි හැමදෙනාම එක හා සමානව පිළිගන්නා දෙයක්. වතු කම්කරුවන්ගේ වැටුප් සම්බන්ධව අපි කිසිම අවස්ථාවක පැහැර හැරීමක් කරලා නැහැ. මා හිතන හැටියට අදටත් ඒ සම්බන්ධව වැවිලි සමාගම් එක්ක ඉතාම සාර්ථකව සාකච්ඡා පවත්වාගෙන යනවා. මා හිතන හැටියට ගරු අග්‍රාමාත්‍යතුමා ඊයේත් වැවිලි සමාගම් නියෝජිතයන් එක්ක සාකච්ඡා කර තිබෙනවා. අපේ වැවිලි කර්මාන්ත ඇමතිතුමාගේත් මැදිහත් වීමෙන් අද එකඟතාවකට පැමිණ තිබෙනවා. ලබන මාසය වනකොට අපේ වතු කම්කරුවන්ගේ වැටුප සාධාරණ ලෙස වැඩි කරන්න අවශ්‍ය කටයුතු කරන්න පුළුවන් කියන එක ගැනත් විශ්වාසය පළ කරන්න මා කැමැතියි.

ඊට අමතරව, දුප්පත්කම තුරන් කිරීම සම්බන්ධව කියන්න ඕනෑ. විශේෂයෙන්ම මා දැක්ක හැටියට දුප්පතුන් වැඩි කරන්න හදනවා. තවත් පවුල් 6,00,000කට පමණ සමෘද්ධි සහනාධාරය ලබාදෙන්න මේ අය වැයෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. අපි කල්පනා කරන්න ඕනෑ, මෙය කරන්න සිද්ධ වුණේ ඇයි කියලා. ඇත්ත වශයෙන් ඒ යෝජනාවට මා සියයට 100ක් එකඟ වෙන්නේ නැහැ හෘදය සාක්ෂියට අනුව. මා කියන්න ඕනෑ, මෙවැනි සහනාධාරයක් දීමෙන් කවදාවත් අපේ දුප්පත්කම නැති කරන්න පුළුවන්කමක් නැහැ කියලා. දුගී දුප්පත් ජනතාවට සමෘද්ධි සහනාධාරය ලබා දෙන්න දැනටත් අපි රුපියල් බිලියන 10කට, රුපියල් බිලියන 15කට අධික මුදලක් වැය කරනවා. සමෘද්ධි සහනාධාරය ලබන සාධාරණ අයත් ඉන්නවා. ඇත්ත වශයෙන්ම මේ සහනාධාරය ලබාදිය යුතු පවුල් ලක්ෂ ගණනක් ඉන්න එක ඇත්ත. නමුත් ඇත්ත වශයෙන් මේ සහනාධාරය වැඩි වශයෙන් ලැබෙන්නේ යමක් කමක් තිබෙන අයට. යමක් කමක් තිබෙන අය තමයි මේ සහනාධාරය තුළින් වැඩියෙන්ම ඵල ප්‍රයෝජන ලබන්නේ. ඒ නිසා මේ දීමනාව හරියාකාරව කළමනාකරණය කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)
මෙය කළමනාකරණය කිරීම අනිවාර්යයෙන් කරන්න ඕනෑ. මේ සමෘද්ධි ව්‍යාපාරය අපි කවුරුත් අවධානය යොමු කරන්න ඕනෑ ව්‍යාපාරයක්. සමෘද්ධි ව්‍යාපාරය පටන් ගත්තේ 1994 දී. අවුරුදු 20ක්, අවුරුදු 25ක් තිස්සේ ඒ එකම පවුල් ටික තමයි මෙයින් යැපෙන්නේ. සමාජ සවිබලගැන්වීම යටතේ පවුල් ඉවත් කරන්න නියමිතවෙලා තිබෙනවා. යම් දවසක පෞද්ගලිකව තනියම නැඟී සිටින්න පුළුවන් පවුලක් නිර්මාණය කිරීම තමයි

සමෘද්ධි ව්‍යාපාරයේ මූලික හරයවෙලා තිබෙන්නේ. නමුත් අද ඒක සිද්ධ වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා පක්ෂ විපක්ෂ අපි හැමදෙනාගේම අවධානය මේ කෙරෙහි යොමු වෙන්න ඕනෑ. සමෘද්ධි ව්‍යාපාරය තුළම මේ මිනිසුන් රඳවා තැබීමෙන් කවදාවත් මේ රටට සෙතක් වෙන්නේත් නැහැ, අපට සෙතක් වෙන්නේත් නැහැ. හැමදෙනාගෙන්ම ලබාගන්නා බදු මුදලින් විශාල මුදලක් සමෘද්ධි ව්‍යාපාරය වෙනුවෙන් වැය කරන්න සිද්ධවෙලා තිබෙනවා. ඒ නිසා මා කියන්නේ, සමෘද්ධි සහනාධාරය ලබාදීමට තවත් පවුල් එකතු කරනවාට වඩා සුදුස්සන් ටිකට නිසියාකාරව සමෘද්ධි සහනාධාරය ලබාදෙන්න කියලායි. මේ සඳහා රාජ්‍ය නිලධාරින්ගේ සහයෝගයත් අවශ්‍ය වෙනවා. අපි හැමදෙනාම එකතුවෙලා මේ තත්ත්වය යම්කිසි තරමකට පාලනය කරන්න අවශ්‍ය වෙනවා. එය ඉතාම වැදගත් වෙනවා. දේශපාලන පක්ෂ, පාට භේදයෙන් තොරව සර්ව සාධාරණව සමෘද්ධි සහනාධාරය ලැබිය යුතු පුද්ගලයන්ට ලබාදෙන්න කටයුතු කරන්න ඕනෑ කියන එක තමයි මා මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය පසුගිය අවුරුදු තුනක, අවුරුදු හතරක කාල සීමාව තුළ කළ සේවාව ගැන බොහෝදෙනෙක් කථා කළා. ඒ කාලය තුළ මොනවාද කළේ කියලා තමයි අහන්නේ. මේ රටේ යටිතල පහසුකම් සංවර්ධනය ගැන, මාර්ග සංවර්ධනය ගැන අද කථා කළා. පසුගිය කාලයේ යම්කිසි සංවර්ධන කටයුත්තක් සිද්ධ වෙන්න ඇති. නමුත් ඒ සඳහා ලබාගත් විශාල ණය කන්දරාව දිහා බලනකොට, ඒ මුදල් ගත්තේ ප්‍රයෝජනවත් වැඩකටද කියන එක තමයි අපි හිතන්න ඕනෑ. විශේෂයෙන්ම අපි දන්නවා අපට අවශ්‍ය නැති බොහෝ ව්‍යාපෘති මේ රටේ ක්‍රියාත්මක වූ බව. වරායක් අපට අවශ්‍ය වෙන්න පුළුවන්. නමුත් ඒක අපට මේ කාලයේදී අවශ්‍ය දෙයක් නොවෙයි. ඒ වාගේම, අපට මේ කාලයේ ගුවන් තොටුපොළක් කියන එක අවශ්‍ය නැති දෙයක්, ක්‍රීඩාංගණයක් කියන එක අවශ්‍ය නැති දෙයක්. සම්මන්ත්‍රණ ශාලාවක් කියන එක අත්‍යවශ්‍ය දෙයක් නොවෙයි. පසුගිය කාලයේ කෝටි ගණන් ණය අරගෙන ඒවා හදන්න තමයි කටයුතු කළේ. නමුත් තමුන්නාන්සේලා දන්නවා, අපි මේ වතාවේ කෝටි ගණන් වියදම් කළේ කාගේවත් අවධානය යොමු නොවුණු ගමේ පාරවල් ටික, ගමේ යටිතල පහසුකම් ටික දියුණු කරන්නට බව. ගමේ නිෂ්පාදන ටික, තේ දළු ටික, රබර් ටික වෙළෙඳ පොළට ගේන්න, එහෙම නැත්නම් කොළඹ ප්‍රදේශයට ප්‍රවාහනය කරන්න අපි නියෝජනය කරන ප්‍රදේශවල ජනතාවට තිබෙන දුෂ්කරතාව ගැන අපි දන්නවා. ඒ මාර්ග දුෂ්කරතාව ගැන අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි දුෂ්කර ප්‍රදේශවලට අද ගිහිල්ලා බැලුවොත් ඕනෑම කෙනෙකුට පෙනෙනවා, අපට ඒ ග්‍රාමීය මාර්ග ටික සම්පූර්ණ වශයෙන් හදන්න බැරි වුණත් අඩුම තරමින් සියයට 50ක් පමණවත් මේ වන විට ඒ වැඩ අවසන් කර ගන්න පුළුවන්වෙලා තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගම්පෙරළිය" වැඩසටහන ගැන දෙනෙකු විවේචනය කළාට, අද ගමට ගිහින් බැලුවාම පෙනෙනවා ඒක ගමේ හැම කෙනාම බොහොම ආදරයෙන් වැළඳ ගන්නා ව්‍යාපාරයක් බවට පත්වෙලා තිබෙන බව. ලංකා ඉතිහාසයේ කොයිම අවස්ථාවකවත් රුපියල් කෝටි 20ක් එක මැතිවරණ කොට්ඨාසයකට ලැබුණු යුගයක් ගැන අපි අහලාවත් නැහැ. නමුත් අද ඒ වාගේ යුගයක් ආරම්භවෙලා තිබෙනවා. අපි පසුගිය කාලයේත් මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න උත්සාහ ගත්තා. නමුත් දින පසුගිය "දින 52ක" කාලයක් අපේ රජය කුමන්ත්‍රණකාරී ලෙස ඉවත් කළ නිසා ඒ කටයුත්ත නිසි අයුරින් කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. නමුත් අද මේ කටයුතු ඉතාම සාර්ථකව රට පුරාම ක්‍රියාත්මක වෙමින් යනවා. මේ විධියට ගියොත් මේ රටේ යටිතල පහසුකම්, ග්‍රාමීය මාර්ග, කාගේවත් අවධානය යොමු නොවුණු ආගමික සිද්ධස්ථාන, ක්‍රීඩා පිටි ඇතුළු අනෙකුත් දේවල් සියල්ලම සංවර්ධන මාවතට යොමු කරන්න පුළුවන්කම ලැබෙනවාය කියන එක අප මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ගරු මංගල සමරවීර මැතිතුමාගේත්, ගරු අග්‍රාමාත්‍යතුමාගේ අදහසක් අනුව මේ රට පුරා ක්‍රියාත්මක කරන, මේ අය වැයෙන් ඉදිරිපත් කළ ඉතා හොඳ වැඩ පිළිවෙළ විධියට අපි දකින්නේ ගම්පෙරළිය වැඩසටහනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්වල යටිතල පහසුකම්, අධ්‍යාපනය, සෞඛ්‍ය තමයි මම හිතන විධියට අද රටේ විශේෂයෙන්ම දියුණු වෙන්න ඕනෑ ක්ෂේත්‍ර. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සෞඛ්‍ය පැත්තෙන් විශාල සංවර්ධනයක් වෙලා තිබෙනවා;අපේ ජනතාවට විශාල සේවයක් වෙලා තිබෙනවා. අපට මතකයි මීට අවුරුදු තුනකට හතරකට ඉස්සෙල්ලා ඖෂධ මිල තිබුණේ කොහොමද කියලා. ඒ ගැන අද කවුරුත් කථා කරන්නේ නැහැ. ඔබතුමා වුණත් පෞද්ගලිකව කල්පනා කරලා බැලුවොත් ඒ බව පෙනෙනවා. අද බෙහෙතක මිල එදා තිබුණු මිලට වඩා සියයට 50ක් පමණ අඩු කරන්නට පුළුවන්කම ලැබිලා තිබෙන්නේ වර්තමාන රජයේ ප්‍රතිපත්තිය සහ වැඩ පිළිවෙළ නිසාය කියන එක අපි මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේත් මම ගමක උත්සවයකට ගිහින් ආවා. ඒ ගම්වල අද "සුව සැරිය" ගිලන් රථ වැඩ පිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. එදා ගරු අග්‍රාමාත්‍යතුමා මේ යෝජනාව ගෙනෙන විට මොන තරම් විවේචන කළාද? මේ පාර්ලිමේන්තුවේදීත් ඒකට විවේචන ආවා. ඒක ඉන්දියන් රජයේ කුමන්ත්‍රණයක් කිව්වා, ඉන්දියන්කාරයන්ට රක්ෂා දෙන ව්‍යාපාරයක් කිව්වා. ඒ වාගේම, වෛද්‍ය සංගමයත් ඒක විවේචනය කළා. ඒ අය ලෙඩ්ඩු ඉස්පිරිතාලේට ගෙනියන්න දන්නේ නැහැ කිව්වා. ඒ වාගේ අස්ථාන චෝදනා කළා. අද මේ තුළින් වන සේවාව කියලා නිම කරන්න පුළුවන්කමක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තුළින් විශාල සේවාවක් වෙනවා. කථා කරන්න තව කරුණු කාරණා රාශියක් තිබුණත් කාල වේලාව ඉක්ම ගිහින් තිබෙනවා. එම නිසා මම වැඩි දුරටත් කථා කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම කියනවා මේ අය වැයෙන් ඉලක්ක කරලා තිබෙන්නේ ප්‍රශ්නවලට තාවකාලික පැලැස්තර දමන්න නොවෙයි, දිගු කාලීන විසඳුමකට යන ගමනක් බව. මේ අය වැය තුළින් ක්‍රමානුකූලව උසස් අධ්‍යාපනය දියුණු කරන්න බලාපොරොත්තු වෙනවා. ඉස්කෝලවලින් එළියට එන හැම කෙනාටම විශ්වවිද්‍යාලවලට යන්න බැහැ. ඒ අයට වෘත්තීය පුහුණුව ලබා ගන්නට හැකි, විද්‍යාපීඨවලට ඇතුළු වන අයට ණය මුදලක් ලබා ගන්නට හැකි, තරුණයන්ට රක්ෂා ලබා දෙන්න බැරි අවස්ථාවල විවිධ ක්ෂේත්‍ර සඳහා ණය ලබා දීම් කළ හැකි ආකාරයේ විශාල වැඩ පිළිවෙළක් සහිත අය වැයක් හැටියට තමයි අපි මේ අය වැය දකින්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අවසාන වශයෙන් මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු මංගල සමරවීර මුදල් අමාත්‍යතුමාටත් මේ වාගේ හොඳ, සාධනීය අය වැයක් දිගු දැක්මක් සහිතව ඉදිරිපත් කිරීම සම්බන්ධව. මුදල් අමාත්‍යතුමා, ලේකම්තුමා ඇතුළු මුදල් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට, අදාළ අමාත්‍යාංශවල ඇමතිවරුන්ට මේ වැඩ කටයුතු සාර්ථකව, කඩිනම්ව, කාර්යක්ෂමව කරගෙන යන්නට ශක්තිය, ධෛර්ය, වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.22]

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා "ජනතාවට ශක්තිය දුප්පතුන්ට රැකවරණය - එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" යන තේමාව මුල් කරගෙන රටේ ජනතාවගේ ආර්ථිකය නැංවීම සඳහා හොඳ වැඩ පිළිවෙළක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා.

ඇත්තටම ඒ වැඩ පිළිවෙළ හරියාකාරව ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබෙනවා නම්, එම වැඩ පිළිවෙළ ජනතාවට සහන ලැබෙන වැඩ පිළිවෙළක් හැටියට අපි දකිනවා. එයින් හොඳ ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන්කම ලැබෙයි. නමුත්, මෙම වැඩ පිළිවෙළ හරියාකාරව ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයිද කියන එක තමයි අපට ඇති වන සැකය. විශේෂයෙන්ම මම ඒ පිළිබඳව මතක් කරන්න ඕනෑ. මොනරාගලින් තමයි "Enterprise Sri Lanka" වැඩ පිළිවෙළ පළමුවෙන්ම ආරම්භ කළේ. මහා බිම් ප්‍රමාණයක ලොකු ප්‍රදර්ශනයක් පවත්වා, "Enterprise Sri Lanka" යටතේ රටේ ජනතාවගේ; විශේෂයෙන්ම ග්‍රාමීය දුගී දුප්පත් ජනතාවගේ ආර්ථිකය නැංවීම සඳහා ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවාය කියන එක පිළිබඳව ප්‍රදේශයේ ජනතාවත්, රටේ ජනතාවත් දැනුවත් කළා. ඇත්තටම එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට යෑම නිසා ජනතාව මේ වන විට ගැටලු සහ ප්‍රශ්න රාශියකට මුහුණ දී තිබෙනවාය කියන එකත් මතක් කරන්නට ඕනෑ.

මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා ජනතාවට සුබවාදී වැඩ පිළිවෙළක් හැටියට තමයි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අද මේ රටේ කෘෂි ආර්ථිකය බින්දුවටම බැහැලා. අද කවුරුත් කථා කළ ආකාරයට කෘෂි කර්මාන්තය, විශේෂයෙන්ම අපනයන කෘෂි කර්මාන්තය සම්පූර්ණයෙන්ම විනාශ වී යන තැනට වැටී තිබෙනවා. ගම්මිරිස්, රබර්, තේ, කුරුඳු වැනි වගාවන්වල මිල සම්පූර්ණයෙන්ම පහත වැටිලා, ඒවා වගා කළ ගොවීන්ට කිසිම ලාභයක් නැතිව ඉතාම අසරණ තත්ත්වයකට අද පත් වෙලා ඉන්නවා. මේ කථා කරන මමත් ගම්මිරිස් සහ විශේෂයෙන්ම රබර් වගා කර තිබෙන කෙනෙක්. මුලින්ම අපි රබර් වගාව ආරම්භ කළ කාලයේ රබර් කිරි ලීටරයක මිල රුපියල් 550ක්, 600ක් වගේ වුණා. නමුත්, අද වන විට රබර්වල මිල ඉතාම පහත වැටිලා තිබෙනවා. රබර් කිරි ලීටරයක මිල රුපියල් 150ක්, උපරිමය 190ක් වැනි ගණනකට වැටී තිබෙනවා. මේ සභාවේ කවුරුත් කථා කළා වගේ, ගම්මිරිස්වල මිල ගණන් මීට පෙර කවදාවත් පහත වැටුණේ නැහැ. අපි මීට පෙරත් මේ ගැන කථා කරලා තිබෙනවා. අපේ රටේ ගම්මිරිස්වලට විදේශීය රටවලින් විශේෂ ඉල්ලුමක් තිබුණා. අපේ රටේ ගම්මිරිස් ඉතාම හොඳ තත්ත්වයෙන්, ඉහළ මට්ටමක පැවැතුණු නිසා අපේ රටේ ගම්මිරිස්වලට හොඳ තැනක් තිබුණා. එම නිසා ගම්මිරිස් අපනයනය කිරීමේ දී ගමේ ගොවියාට කිලෝ එකක් සඳහා රුපියල් 1,500ක්, 1,600ක් වැනි මිලක් ලැබුණත්, අද වන විට එය රුපියල් 450ත්, 500ත් අතර මිලකට අඩුවෙලා තිබෙනවා. ඒකෙන්ම තේරෙනවා, ග්‍රාමීය ජනතාවගේ කෘෂි ආර්ථිකය පත්වෙලා තිබෙන තත්ත්වය. විශේෂයෙන්ම කුරුඳු සහ තේ ඇතුළු අපනයන බෝග වගාවන් තුළින් - තේවලට නම් යම් තරමක මිලක් ලැබුණත්, අනෙක් හැම වගාවක්ම අද ගොවීන් අත් හැර දමන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. මොකද, රබර්වලට මිලක් නැති නිසා රබර් කිරි කපන්නේ නැහැ. රබර් කිරි කැපීමේ දී කම්කරු ගාස්තු සහ අනෙකුත් වියදම් ගෙව්වාට පසු මුදලක් ඉතිරි වෙන්නේ නැහැ. ඒ වාගේම අද ගම්මිරිස් වගාවත් ගොවීන් අත් හැර දමා තිබෙන තත්ත්වය ගම්වලට ගියාම බලාගන්න පුළුවන්.

විශේෂයෙන්ම කෘෂි ආර්ථිකය නඟා සිටුවීම සහ වී ගොවියා ශක්තිමත් කිරීම සඳහා කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ සඳහා වී ගොවියාට අවශ්‍ය පොහොර ටික කලට වේලාවට ලබා දෙමින්, ඒ වාගේම කෘෂි රසායන ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය කලට වේලාවට සාධාරණ විධියට ලබා දෙන්න පුළුවන්කමක් තිබෙනවා නම් කෘෂි ආර්ථිකය මීට වඩා ශක්තිමත් කරන්න පුළුවන්කම තිබෙනවා. පසුගිය කාල වකවානුව තුළ දැඩි නියඟය වැනි රටේ පැවැති ස්වභාවික සිද්ධීන් නිසා වී ගොවිතැන පාළු වෙලා ගියා. නමුත් මෙවර වී ගොවිතැන යම් තරමකට සාර්ථක වෙලා තිබුණත්, එහි අස්වැන්න විකුණා ගැනීමට නොහැකිව අද ගොවීන් ඉතාම අසරණ තත්ත්වයකට පත්වෙලා ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

එම නිසා, "Enterprise Sri Lanka" යටතේ හෝ, නැත්නම් වෙනත් ක්‍රම යටතේ හෝ ගොවි ජනතාව ශක්තිමත් කරලා කෘෂි ආර්ථිකය දියුණු කළොත්; ශක්තිමත් කළොත් තමයි අපේ රටට, නැත්නම් ජනතාවට යම් කිසි සෙතක් වෙන්නේ කියන එක විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම පෞද්ගලික ව්‍යවසායන් නංවාලීම සඳහා ආර්ථික වර්ධනයක් ඇති කිරීම රජයේ අරමුණ බවත් මේ අය වැයේ සඳහන් කර තිබෙනවා. ඒ සඳහාත් "Enterprise Sri Lanka" වැඩ පිළිවෙළ යටතේ ණය ලබා දෙන්න කටයුතු කර තිබීම හොඳයි. නමුත්, මේ වනකොටත් ඒ ණය ලබා ගන්න ගිය බොහෝ දෙනෙකු කියන්නේ ඒ ණය ලබා ගැනීම අසීරු තත්ත්වයකට පත්ව තිබෙන බවයි. මොකද, බැංකුවලට ගියාම බැංකුවලට අවශ්‍ය ලියකියවිලි, සුරකුම්පත් සහ තවත් දේවල් ලබා දීමේ දී දුප්පත් මිනිසුන් නැත්නම්, ගමේ අහිංසක ජනතාව අසරණ තත්ත්වයට පත්වනවා. මේ පිළිබඳව ඊයේ දවසේ තලතා අතුකෝරල අමාත්‍යතුමියත් කථා කළා. මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්න නම්, ඒ ණය ලබා දෙන ආයතනවල -විශේෂයෙන් බැංකුවල- නිලධාරින්ගේ නොසැලකිලිමත්කම නිසා ඇතිවන මේ තත්ත්වය ප්‍රමාදවීම සහ ඉදිරියට මේ ණය ලබා ගැනීම එපාවන තත්ත්වයට පත් කිරීම නැති කරන්නට කටයුතු කරනවා නම් හොඳයි. බැංකු නිලධාරින්ගේ නොසැලකිලිමත්කම නිසා ඇති වන මේ තත්ත්වයන් නිරවුල් කිරීම සඳහා '1925' කියලා වෙනම දුරකථන අංකයක් ගරු අමාත්‍යතුමා හඳුන්වා දී තිබෙනවා. ඒක හොඳ වැඩ පිළිවෙළක්. ඒ විධියට හරියට ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා නම් හොඳයි.

මම මුලින් සඳහන් කළා වාගේ රබර්, පොල්, කුරුඳු වැනි වගාවන් තුළින් නැවත වතාවක් දේශීය ගොවියා ශක්තිමත් කරලා ඒවා දියුණු කරලා ඉස්සරහට ගෙන යනවා නම්, ග්‍රාමීය ජනතාවට හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම සේවකයන් 250කට වැඩි සංඛ්‍යාවක් සහිත වාණිජ ආයතනවල දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා යෝජනා කර තිබීම ඉතාම හොඳයි. ඒ සඳහා පෞද්ගලික අංශවලට ණය ලබා දීමට කටයුතු කරනවා කියලා මෙම අය වැයේ සඳහන්ව තිබෙනවා. නමුත්, ඒ ණය ලබා ගැනීමේ දී ඇතිවන ගැටලු තමයි මම විශේෂයෙන්ම සඳහන් කළේ. ඒ අසීරුතාවන් මඟ හැර ඉක්මනින් ඒ ණය ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ගරු අමාත්‍යතුමාට විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. මේ වැඩ

පිළිවෙළ ක්‍රියාත්මක කරන්න නම්, ඒ කටයුතු ඉක්මන් කළ යුතු වෙනවා.

රටේ ආර්ථිකයට කාන්තාවන්ගෙන් ලැබෙන දායකත්වය මේ වනකොට සීමා වෙලා තිබෙනවා. අද ගොඩක් දුරට බැංකු ඇතුළු අනෙකුත් ආයතනවලට කාන්තාවන් බඳවා ගැනීම බොහෝ සේ අඩු වෙලා තිබෙනවා. පාසල් ගුරුවරු වැඩිදෙනෙක් ඉන්නේ කාන්තාවෝ. ඒ අයට ප්‍රසූත නිවාඩු ලබා ගන්න ගියාම ප්‍රශ්න ඇති වුණා. නමුත්, අපේ රජය කාලයේත් අපි වැටුප් සහිතව ප්‍රසූත නිවාඩු මාස තුනක කාලයකට ලබා දුන්නා. ඊට පස්සේ අඩ වැටුප් සහ වැටුප් රහිතවත් මාස නවයක පමණ කාලයක් නිවාඩු ලබා දීලා තිබෙනවා. ඒ තත්ත්වයන් තුළ පෞද්ගලික අංශයට කාන්තාවන් බඳවා ගැනීමට ටිකක් අදිමදි කරන තත්ත්වයක් තිබෙනවා. අපේ රටේ කාන්තාවන්ගේ දායකත්වය වැඩි කිරීම සඳහා ඔවුන්ට පහසු වෙලාවල වැඩ කිරීමටත්, ඒ වාගේම නිවාස තුළ තබාගෙන වැඩ කිරීමටත් අවස්ථාව ලබා දෙන්න ගරු අමාත්‍යතුමා නීති සංශෝධනය කරන්න යන බව සඳහන් කරලා තිබෙනවා. ඒක හොඳ වැඩක්. මේවා විදේශ රටවල විශේෂයෙන් ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළවල්. කාන්තාවන් වෙනුවෙන් එවැනි වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරනවා නම්, එය හොඳ දෙයක් විධියට අපි දකිනවා.

ආබාධිත අය වෙනුවෙන් ලබා දෙන දීමනාව රුපියල් 5,000ක් දක්වා වැඩි කර තිබෙනවා. පූර්ණ ආබාධිත පුද්ගලයන්ට තමයි, මේ රුපියල් 3,000ක දීමනාවක් ලබා දෙන්නේ. ගරු අමාත්‍යතුමනි, මෙම දීමනාව ලබා දීමට සුදුසු තවත් විශාල පිරිසක් ඉන්නවා. සීමිත කොටසකට තමයි මේ රුපියල් 3,000 දීමනාව ලබා දෙන්නේ. මේ දීමනාව ලැබිය යුතු, ලැබීමට සුදුසු තවත් විශාල පිරිසක් සිටිනවා. එම නිසා ඒ ලබා දෙන දීමනාව රුපියල් 5,000ක් දක්වා වැඩි කරනවාට වැඩිය, මෙම දීමනාව ගන්න සුදුසු තත්ත්වයේ සිටින අනෙක් අයටත් රුපියල් 3,000ක් හෝ ලබා දෙන එක හොඳයි කියන එකත් මා මතක් කරන්න කැමැතියි.

ඊයේ දවසේ පාර්ලිමේන්තුව තුළදීත් ආබාධිත සංගම්වල නියෝජිතයින් කිහිපදෙනෙක් මට මුණ ගැසුණා. මම කාන්තා අභිවෘද්ධි හා සමාජ සුභසාධන අමාත්‍යාවරිය විධියට කටයුතු කරන කාලය තුළ මම ඒ අයත් එක්ක විශාල කාර්ය භාරයක් කළා. ආබාධිත වුණත්, වෘත්තීය පුහුණුව ලැබූ හොඳ දක්ෂයින් ඉන්නවා. ඒ අයට කරන්න පුළුවන් විශේෂ රැකියා තිබෙනවා. ඒ රැකියාවලින් ඒ ගොල්ලන් විශාල මුදලක්, ඒ කියන්නේ ඒ අයගේ ශක්තියෙන් සාමාන්‍ය මුදලක් උපයනවා. මොකද, ඒ ගොල්ලන් සංගම් පිහිටුවා තිබෙනවා. ඒ සංගම් පිහිටුවා ගෙන ඒ උපයන මුදල බැංකුවල තැන්පත් කර ඒ මුදල් ආබාධිත අය වෙනුවෙන්ම යොදවන්න තමයි ඒ ගොල්ලන් කටයුතු කරන්නේ. මේ මුදල් තැන්පත් කරලා ඒ මුදලින් සුභසාධන කටයුතු කරන්නයි මේ අය බලාපොරොත්තු වන්නේ. ඒ ගොල්ලන් විශේෂයෙන්ම රෝද පුටු, අත්වාරු, කිහිලිකරු වාගේ දේවල්, තවත් විවිධ දේවල් නිෂ්පාදනය කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, කාලය අවසානයි.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. ඒ ගොල්ලන් ඒ කටයුතු රැකියාවක් විධියට කර ගෙන යනවා. රටට බරක් නැතිව ඒ අය කර ගෙන යන මේ ව්‍යාපාර තුළින් ඒ අය යම් කිසි මුදලක් උපයා බැංකුවල තැන්පත් කරනවා. ඒ තැන්පත් කළ මුදලටත් මේ බදු ක්‍රමය යටතේ අද බදු ගහනවා. එසේ බදු ගැසීම නිසා ඒ අය අන්ත අසරණ තත්ත්වයට පත් වෙනවා. ඒ නිසාම බොහෝදෙනෙක් මගෙන් ඉල්ලීම් කළා, ආබාධිත අයගේ -ඒ අසරණ අයගේ- තැන්පත් මුදල්වලට අය කරන බද්ද ඉවත් කර දෙන්නය කියා. ඒ අයට ඒ සහනය ලබා දෙන්නය කියා මා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමෘද්ධි සහනාධාරය තවත් ලක්ෂ 6කට ලබා දීමට කටයුතු කරන්න යෝජනා කිරීම හොඳයි. අපිත් දැක්කා, සමෘද්ධි සහනාධාරය ලැබිය යුතු, නමුත් එය නොලැබෙන ඉතාම අසරණ, විශාල පිරිසක් සමාජයේ බොහෝ තැන්වල ඉන්න බව. කවුරුත් කථා කළා වාගේ, සමෘද්ධි සහනාධාරය 2004 වර්ෂයේ සිට ලැබූ අයගේ ආර්ථිකය දියුණු වෙලා නැහැය කියා කාටවත් කියන්න බැහැ. හොඳ ආර්ථිකයක් තිබෙන අය වුණත්, ඒ අය එය අත් හරින්න කැමැති නැහැ. ඒ, සමෘද්ධිය තුළ තවත් දීමනා රාශියක් තිබෙන නිසායි. මමත් යෝජනා කරන්න කැමැතියි, එවැනි අයගෙන් සමෘද්ධි සහනාධාරය ඉවත් කරලා නැති බැරි, අහිංසක ජනතාවට සමෘද්ධිය ලබා දීමට කටයුතු කරනවා නම් ඉතාම හොඳයි කියා. මා ඒ පිළිබඳව විශේෂයෙන්ම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශගතව සිටින ශ්‍රමිකයන් වෙනුවෙන් "සිහින මාළිගා" ණය ව්‍යාපෘතිය, අලුතින් විවාහ වන අයට ණය ලබා දීලා නිවාස ඉදි කර ගැනීමට අවස්ථාව ලබා දීම ආදී දේවල් ඇත්තටම හොඳයි. ඒ සඳහා බැංකුවලට රජයෙන් - මහා භාණ්ඩාගාරයෙන්- ලබා දිය යුතු මුදල ලබා දෙන්න රජයට මුදල් තිබෙනවාද කියන එක පිළිබඳව අපට සැකයක් තිබෙනවා. රජයට මුදල් නැතිව, පොලී සහන දීලා එම ණය මුදල් ලබා දෙන්නේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පසුගිය කාලය තුළ වරාය හැදුවා, ගුවන් තොටුපොළවල් හැදුවා, සම්මන්ත්‍රණශාලා හැදුවා. ඒවායෙන් වැඩක් නැහැ, ප්‍රයෝජනයක් නැහැ" කියන කථාව එක්සත් ජාතික පක්ෂයේ අය ඇතුළුව ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිතුමන්ලා කිව්වා. නමුත් ඒ කාලයේ විදේශ රටවලින් ණය ලබාගෙන රටට පෙනෙන්න, ජනතාවට දැනෙන්න වැඩක් මේ රට තුළ කළා; විවිධ ඉදි කිරීම් කළා. ඒ විතරක් නොවෙයි, හැම නගරයකම පාරවල් බොහොමයක් ඉදිකර තිබෙනවා.

එදා ඒ විධියට හරියාකාරව වැඩක් කෙරුණා. නමුත් පසුගිය කාලය තුළ අර්ජුන මහේන්ද්‍රන්ලා සිදු කළ මහා භාණ්ඩාගාර මංකොල්ලය නිසා අද රටේම ජනතාව අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. හැම කෙනාටම වැඩි බදු බරක් පටවා තිබීම නිසා සාමාන්‍ය ජනතාවත්, මධ්‍යම පාන්තික ජනතාවත්, ව්‍යාපාරිකයාත්, කම්කරුවාත් ඉතාම දුක්ඛිත තත්ත්වයකට ඇද වැටී තිබෙනවා. අද ඉදිකිරීම් සිදු වන්නේ නැහැ. මේ රජයේ ගොඩනැඟිලි ඉදි කිරීම් කළ අය අදාළ මුදල් ලබා ගන්න බැරිව වසර ගණන් බලාගෙන ඉන්නවා. කම්කරුවන්ට, ව්‍යාපාරිකයන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ඉංජිනේරුවන්ට රැකියා නැති රටක් බවට අද මේ රට පත් වී තිබෙනවා. ඒ තත්ත්වය නැති කරලා, මේ රට නැවත හොඳ රටක් බවට පත් කරන්න ඕනෑ. ඒ වාගේම මහා භාණ්ඩාගාරය ශක්තිමත් කරන්න ඕනෑ. එය කළ යුත්තේ දුප්පත්, අහිංසක මිනිසුන්ගෙන් බදු අය කිරීම තුළින් නොවෙයි. රටේ ආර්ථිකය දියුණු කරලා ඒ තුළින් රටේ සංවර්ධනය ඇති කිරීම තමයි ඉතාම වැදගත් වෙන්නේ. කථා කරන්න තවත් දේවල් තිබුණත්, කාලය නොමැති නිසා මගේ කථාව මෙයින් අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you. මීළඟට, ගරු වෛද්‍ය තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට නියමිත කාලය විනාඩි 20යි.

[අ.භා. 3.36]

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஷிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මුදල් ඇමතිතුමා 2019 වසර සඳහා වූ අය වැය මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ ගැන කථා කරන්න මටත් අවස්ථාවක් ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 2018 ඔක්තෝබර් 26වන දා මේ රටේ ඇති වූ ව්‍යාකූලත්වය සමඟින්, එතැන් සිට මාස තුනහමාරක් ඇවිල්ලා ආර්ථිකය අද යම්තාක් දුරට හෝ ස්ථාවර තත්ත්වයට පත් වෙලා තිබෙන එක ගැන ලාංකික ජනතාව විධියට අපි සතුටු වෙනවා. මෙවර අය වැයේ තේමාව වන්නේ, "ජනතාවට ශක්තිය; දුප්පතුන්ට රැකවරණය" යන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ අවස්ථාවේදී ගරු සභාවට මේ කාරණය ඉදිරිපත් කරන්න කැමැතියි. කෙටි කාලීන, මධ්‍ය කාලීන, දීර්ඝ කාලීන විසඳුම් ලෙස තමයි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. ඊට අමතරව, මේ අය වැය යෝජනාවලිය තුළ මුල් ළමා වියේ පසු වන දරුවාගේ සිට, පාසල් දරුවා, තරුණයා, වැඩිහිටියා දක්වා වූ හැම තලයකටම යම් පහසුකමක්, යම් සහනයක් සලසා දී තිබෙනවා.

මෙවර අය වැය තුළ අපි දකින සුවිශේෂී ලක්ෂණයක් තමයි, කාන්තාවන්ට විශේෂ තැනක් ලබා දී තිබීම. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් විධියට අපි ඉල්ලන්නේ කාන්තාවන්ට නිසි තැන ලබා දෙන්න කියන එක විතරයි. කාන්තාවන්ට නිසි තැන ලබා දීමේදී, ඒ අයගේ සුබසාධනය වෙනුවෙන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන්ම කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් හා ඔවුන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා මෙවර අය වැය තුළින් යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. අද වනවිට අධ්‍යාපනය, සෞඛ්‍යය, පරිපාලනය වැනි ක්ෂේත්‍රවල කාන්තාවන් ඉදිරියෙන් සිටින ආකාරය අපි දැක තිබෙනවා. විශ්වවිද්‍යාලවලත්, අධ්‍යාපනය ලබන ආයතනවලත් කාන්තාවන් සියයට 60ක්, 70ක් වශයෙන් ඉදිරියෙන් හිටියත්, ශ්‍රම බලකායේ කාන්තා දායකත්වය අඩුවෙලා තිබෙන බව අපිට පෙනෙනවා. ශ්‍රම බලකායේ කාන්තා දායකත්වය සියයට 30ක් ලෙසයි අපි වර්තමානයේදී හඳුනාගෙන තිබෙන්නේ. ශ්‍රම බලකායේ කාන්තා දායකත්වය අඩු ඇයි කියන කාරණය අද අපිට ගැටලුවක් වෙලා තිබෙනවා. මොකද, අද කාන්තාවන් ඉගෙන ගත්තත්, උගත්කම තිබුණත්, වෙනත් කටයුත්තක් විධියට මව් කෙනෙකු වශයෙන් දරුවන් රැක බලා ගැනීමේ කාර්යයත් ඔවුන්ට පැවරී තිබෙන බව අපි දන්නවා. මේ නිසා එයට විකල්පයක් විධියට, කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය ඉහළ දැමීම සඳහා සේවකයන් 250කට වැඩියෙන් ඉන්න වාණිජ ආයතනවල ළමා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම දිරිමත් කිරීම සඳහා වූ ආධාර ක්‍රමයක් මෙවර අය වැය යෝජනා තුළින් ඉදිරිපත් කර තිබෙනවා.

පාසල් නිවාඩු දිනවලදී සහ පාසල් වෙලාවෙන් පසු දරුවන් රැක බලා ගන්නා ළමා සුරැකුම් මධ්‍යස්ථාන තෝරා ගත් පාසල්වල ගොඩනැඟීමට ආධාර ලබා දීම සඳහාත් මේ අය වැය තුළින් අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. මාස තුනක ප්‍රසූත නිවාඩුව මේ වනතුරු රාජ්‍ය සේවයේ කාන්තාවන්ට පමණයි ලැබිලා තිබෙන්නේ. ඒකට එක හේතුවක් තමයි, වැටුප්වල තිබෙන ගැටලුවත් එක්ක පෞද්ගලික ආයතන මෙම මාස තුනේ ප්‍රසූත නිවාඩුව ලබා දෙන්න මැලිකමක් දැක්වීම. පෞද්ගලික ආයතනවල සේවය කරන මව්වරුන්ට ඔවුන් ප්‍රසූත නිවාඩු ලබා ගන්නා අදාළ මාස සඳහා වැටුප් ගෙවීමටත්, එය සමාගම් බද්දෙන් අතිරේක අඩු කිරීමක් ලෙස සැලකීමටත් මෙවර අය වැය තුළින් අවධානය යොමු කර තිබෙනවා. ඔවුන්ට මාස හතරක් වනතුරු ප්‍රසූත නිවාඩු ලබා දෙනවා නම්, හතරවන මාසය සඳහා අතිරේක අඩු කිරීම සියයට සියයක් දක්වා ලබා දීමකුත් මෙවර අය වැය තුළින් යෝජනා කර තිබෙනවා.

ඊළඟට ආර්ථිකයට කාන්තා දායකත්වය ගත්තාම, මම මුලින් ඔබතුමන්ලාට කරුණු ඉදිරිපත් කළා වාගේ, සමහර ක්ෂේත්‍රවල කාන්තා නියෝජනයේ අඩුවීමක් තිබෙන බව අපි දැක තිබෙනවා. විශේෂයෙන්ම දේශපාලනයත් එහි එක් අංගයක්. කෙසේ නමුත්, ව්‍යාපාරික අංශය හා අධ්‍යක්ෂ මණ්ඩලවල කාන්තා දායකත්වය ඉහළ නැංවීම සඳහාත් මෙවර අය වැයෙන් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ තුළින්, එම ක්ෂේත්‍රවල කාන්තා දායකත්වය සියයට 30කින්වත් ඉහළ දැමීම තමයි ඉලක්ක කර තිබෙන්නේ.

කාන්තාවන් ගැන කථා කරනකොට මා මේ කාරණයත් කියන්න කැමතියි. කාන්තාවන්ගේ සේවය වැඩි කිරීම සඳහා ඔවුන්ට පහසු වේලාවන් තුළ වැඩ කිරීමටත්, නම්‍යශීලී වැඩ කරන වේලාවන් ලබා දෙන්නත් මෙවර අය වැයෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. අපේ රටේ නැති වුණත්, මේ වනවිට වෙනත් රටවල මේ ක්‍රමවේදය භාවිත කරනවා. රාජකාරි කිරීමේදී target එක achieve කරන්න පුළුවන් නම්, ඔවුන්ට ගෙදර ඉඳලා රාජකාරි කරන්න පුළුවන් ක්‍රවේදයක් ඇති කිරීමේ යෝජනාවක් අපේ මුදල් අමාත්‍යතුමා මෙවර අය වැයට එකතු කර තිබෙනවා. මේ තුළින් කාන්තා ශ්‍රම බලකාය වැඩි කරන්න අපිට අවස්ථාවක් උදාවෙලා තිබෙනවාය කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනවිට රටේ වැඩිහිටි ජනගහනය වැඩි වෙමින් පවතින බව අපි දන්නවා. 2040 වනකොට මේ රටේ ජනගහනයේ වැඩිම ප්‍රජාව විධියට -සියයට 60ක් විතර- අපිට වැඩිහිටියන් තමයි දකින්න ලැබෙන්නේ. ඒ නිසා වැඩිහිටියන් ගැන අපේ අවධානය යොමු කරන්න අවශ්‍යයි. සමහර වෙලාවට අද වැඩිහිටියන් ඔවුන්ගේ දරුවන් නැතිව තනි වුණු අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට වැඩිහිටියන්ට රැකවරණයක් නැහැ. ඔවුන් තනිවෙලා ඉන්නවා. ඔවුන් වැඩිහිටි නිවාසවලට කොටුවෙලා ඉන්න මොහොතක, ඒ අයගේ රැකවරණය වෙනුවෙන් අපි නිසි නියාමනයක් ඇති කළ යුතුයි. ඒ සඳහා, ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය ශක්තිමත් කළ යුතුයි කියන යෝජනාව මේ අය වැය මඟින් ඉදිරිපත් කර තිබෙනවා. ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය ශක්තිමත් කර, නියාමනය කරන්න නම් එයට බලතල දීලා, ඒ අවශ්‍ය පහසුකම් ලබා දෙන්න ඕනෑ වාගේම, ඒ සඳහා අපි ප්‍රතිපාදනත් ලබා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩිහිටියන් රැක ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් දියුණු කිරීමට රජයට විතරක් නොව පෞද්ගලික අංශයටත් දායකත්වය ලබා දෙන්න පුළුවන් බව අපි දන්නවා. ආයෝජකයෝ විධියට වැඩිහිටි නිවාස ප්‍රමිතියකට අනුව ආරම්භ කර ආයෝජනය කිරීම සඳහා පෞද්ගලික ව්‍යවසායකයින්ට ණය ලබාදෙන ක්‍රමවේදයක් හඳුන්න මේ වනකොට රජය සූදානම් වෙලා තිබෙනවා. ඒ අනුව "Enterprise Sri Lanka" වැඩසටහන යටතේ "රැකවරණය" වැනි ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

වැඩිහිටියෝ හුදෙකලාවීමත් සමඟ, ජීවිතයේ අවසාන භාගයේ සැඳෑ කාලයේදී ඇති වන මානසික ආතතියත් සමඟ සමහර

වේලාවට ඔවුන් විවිධ තීන්දු-තීරණ ගන්නා බව අපි දන්නවා. සමහර අවස්ථාවල මේ වැඩිහිටියෝ මානසික ආතතිය නිසා, සියදිවි නසා ගෙන ජීවිතයෙන් සමු ගැනීමට පවා පෙලඹෙන අවස්ථා පවා මා දැක තිබෙනවා. ඒ නිසා ඔවුන් තනි කරන්න හොඳ නැහැ. ඔවුන්ට දරුවන්ගේ රැකවරණය, සෙනෙහස අවශ්‍ය වෙනවා. සමහර වේලාවට දරුවන්ට තිබෙන කාර්ය බහුලත්වයත් සමඟ, එහෙම නැත්නම් දරුවෝ වෙනත් රටවල රැකියාවල නිරත වෙනකොට, වැඩිහිටියන් ලංකාවේ තනි වෙනවා. එතකොට, ඔවුන්ගේ සමාජ තලයේ සිටිනා, ඔවුන්ගේ වයසේ සිටිනා සමකාලීන මිතුරු-මිතුරියන් සමඟ කාලය ගත කරන්න අවස්ථාව සැලසෙන ක්‍රමවේදයක් සැකසිය යුතුයි. ඔවුන්ට ඒ සඳහා සුදුසු පරිසරය හදා දෙන එක රජයක් විධියට අපේ යුතුකමක්. ඒ නිසා වැඩිහිටි රැකවරණයේදී එම කාර්ය භාරය සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු කාලය දැන් එළඹ තිබෙනවා කියා මා හිතනවා. ඉදිරියේදී වැඩිහිටි ජනගහනය කියන එක අපට ලොකු ප්‍රශ්නයක් වෙනවා. මොකද, එන්න එන්නම වැඩිහිටි ජනගහනයේ වැඩිවීමක් තමයි අපි බලාපොරොත්තු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ විශේෂ හැකියා සහිත පුද්ගලයෝ සිටිනවා. විශේෂ හැකියා සහිත පුද්ගලයන්ට ලබා දෙන රුපියල් 3,000 මාසික දීමනාව රුපියල් 5,000ක් දක්වා වැඩිකර දීමට මෙවර අය වැයෙන් යෝජනා කර තිබෙනවා. ඒක බොහොම හොඳ කාරණයක්. ඒ වාගේම මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගෙන් විශාල සංඛ්‍යාවක්, මම හිතන විධියට භාගෙට භාගයක් -සියයට 50ක්- විතර පොරොත්තු ලේඛනයේ සිටින බව. මෙසේ පොරොත්තු ලේඛනයේ සිටිනා පිරිස කොහොම හරි අඩු කරන්න මෙවර අය වැයේදී මුදල් වියදම් කිරීමට බලාපොරොත්තු වෙනවා. සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරියක් විධියට කටයුතු කරන මහජන නියෝජිතවරියක් විධියට මා දන්නවා, මේ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ රක්ෂණ ක්‍රමයක් තිබෙන බව. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයෝ ඒ රක්ෂණ ක්‍රමයටත් ඇතුළත් කළොත්, ඒ තුළින් වඩාත් ඵලදායීතාවක් ගන්න පුළුවන්. මොකද, විශේෂ අවශ්‍යතා තිබෙන එවැනි දරුවන්ගේ රැකවරණයට සිටිනා දෙමව්පියන් ලොකු අපහසුතාවකින් තමයි ඔවුන් බලාගන්නේ. මේ නිසා සමාජ ආරක්ෂණ ක්‍රමයක් සමඟ තිබෙන මේ රක්ෂණ ක්‍රමය තුළින් ඒ දරුවන්ට අවශ්‍ය පහසුව ලබා දෙන්න අපට පුළුවන් නම් වඩාත් යෝග්‍යයි කියා මා හිතනවා.

එම අමාත්‍යාංශයේ වැඩ කරන මන්ත්‍රීවරියක් විධියට මම දැක තිබෙන තවත් දෙයක් තමයි, සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය තුළට විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් එන බව. ඔවුන්ගෙන් සමහර අය යැපීම් මානසිකත්වයෙන් මිදෙන්න කැමැතියි. ඒ නිසා ඔවුන්ගේ ආර්ථිකය සවිබල ගැන්වීමට අවශ්‍ය කරන පහසුකම් ටික සපයා, ඔවුන්ගේ ආර්ථිකය ගොඩනඟා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයක් හදනවා නම්, වඩාත් සුදුසුයි කියා මා හිතනවා. මොකද, සමහර පුද්ගලයින් සිටිනවා, අපි ඔවුන්ට අනුකම්පා කරනවාටත් ඒ අය කැමැති නැහැ. ඒ නිසා තමන්ම තනියෙන් නැඟිටින්න උත්සාහ කරන පිරිසක් වන ඒ අයට එකී යැපීම් මානසිකත්වයෙන් මිදෙන්න අපි සහයෝගය දෙනවා නම්, වඩාත් උචිතයි කියා මා හිතනවා. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට රාජ්‍ය අංශයේ සියයට තුනක රැකියා අවස්ථා ලබා දීම සඳහා නිකුත් කළ චක්‍රලේඛයක් තිබෙනවා. අඩු ගණනේ පෞද්ගලික අංශය එවැන්නන් පස්දෙනෙකුවත් සේවයට ඇතුළත් කර ගන්නවා නම්, රුපියල් 15,000ක උපරිමයකට යටත්ව සියයට 50ක වැටුප් සහනාධාරයක් අවුරුදු දෙකක් දක්වා රජයෙන් ලබා දීමේ යෝජනාවක් මෙවර අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධව මෙවර අය වැයේ අවධානය යොමු කර ඇති අංශ ඉතා වැදගත් කියා මා හිතනවා.

අද නිදන්ගත වකුගඩු රෝගය අපට බරපතළ ගැටලුවක් වෙලා තිබෙනවා. මේ වන විට රෝගීන් 21,000ක් පමණ හඳුනාගෙන ඇති අතර, ඒ අයට රුපියල් 5,000ක මාසික දීමනාවක් දෙනවා. මම හිතන විධියට මෙම දීමනාව තවත් වැඩි කළ යුතුයි. මොකද, නිදන්ගත වකුගඩු රෝගය සඳහා ප්‍රතිකාර ගැනීමට පොරොත්තු ලේඛනයේ විශාල සංඛ්‍යාවක් සිටිනවා. ඒ වාගේම මෙම රෝගයෙන් පෙළෙන, ඒත් ප්‍රතිලාභය ලැබෙන්නේ නැති රෝගීනුත් සිටිනවා. මොකද, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මෙම රෝගීන් තෝරාගෙන තිබෙන්නේ සමහර පළාත්වලින් විතරයි. උදාහරණයක් විධියට රත්නපුර දිස්ත්‍රික්කය ගනිමු. රත්නපුර දිස්ත්‍රික්කයේ නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ට මේ ප්‍රතිලාභය ලබන්න අවස්ථාවක් නැහැ. හැබැයි, රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රදේශයේ මෙම ප්‍රතිලාභය ලබන නිදන්ගත වකුගඩු රෝගීන් සිටිනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය මේ ගැන අවධානය යොමු කර, මෙය ක්‍රමානුකූලව යථාවත් කරනවා නම් ඉතාමත් වැදගත්. රත්නපුර දිස්ත්‍රික්කයේ සමහර ගම්මානවල නිදන්ගත වකුගඩු රෝගීන් සිටිනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කිරීම ඉතා වැදගත්.

ඊළඟට, රුධිර කාන්දුකරණ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම ගැන කථා කර තිබෙනවා. රුධිර කාන්දුකරණ මධ්‍යස්ථාන කියන්නේ, dialysis units. රුධිර කාන්දුකරණ උපකරණ සමඟ ඉස්පිරිතාල 45ක රුධිර කාන්දුකරණ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීමට අය වැයෙන් යෝජනා කර තිබෙනවා. අද අපේ රටේ නැති වුණත්, වෙනත් රටවල dialysis unit එක kit එකක් විධියට -ඇඳුමක් විධියට- ගෙවල්වලටම ලබා දෙන ක්‍රමවේදයක් තිබෙනවා. එම ක්‍රමවේදය ලංකාවටත් හඳුන්වා දෙන්න අපේ සෞඛ්‍ය ඇමතිතුමා සූදානම් වෙලා තිබෙනවා. මෙම ක්‍රමවේදය නිසා, රාජකාරිවල නියුතු වන නිදන්ගත වකුගඩු රෝගියෙකුට රාත්‍රියේදී මේ kit එක පැළඳගෙන ප්‍රතිකාර ලබාගෙන, පසුවදා නිරෝගී පුද්ගලයෙකු විධියට රාජකාරියට යන්න පුළුවන් තත්ත්වයක් උදා වනවා.

ඊළඟට, ජලභීතිකා රෝගය ගැන කථා කර තිබෙනවා. පසුගිය කාලයේ ජලභීතිකා රෝගයෙන් සිදු වූ මරණ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි අයාලෙ යන සුනඛයින් වැඩි වෙලා තිබෙනවා. සුනඛයින් විනාශ කිරීමේ වැඩසටහන් පසුගිය කාලයේ තිබුණාට, දැන් සුනඛයෝ විනාශ කරන්න බැහැ. ඒ නිසා අයාලෙ යන සුනඛයින් පාලනය කිරීම සඳහා වන්ධ්‍යාකරණය ඇතුළු මර්දන වැඩ පිළිවෙළට මෙවර අය වැයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. එය ඉතා කාලෝචිතයි. මොකද, ජලභීතිකා රෝගය නිසා මෑතකදී මිය යෑම් සිද්ධ වුණ බව අපට වාර්තා වෙලා තිබෙනවා. අයාලෙ යන සුනඛයින් සපා කෑ අවස්ථාවල සුනඛයින්ගේ මොළය පරීක්ෂා කිරීමේදී, එම සුනඛයින් rabies positive බව වාර්තා වෙලා තිබෙනවා. ඒ නිසා මෙය ලොකු ගැටලුවක් වෙලා තිබෙනවා. ජලභීතිකා රෝගය මර්දනය කරන්න වන්ධ්‍යාකරණය කිරීම කෙරෙහි හෝ අවධානය යොමු වීම ඉතා වැදගත්.

සෞඛ්‍ය අමාත්‍යතුමාගේ E-Health Card වැඩසටහනට අන්තර්ජාලයෙන් සියලුම රෝහල් සම්බන්ධ වන බැවින්, යම් රෝගියෙක් රජයේ රෝහලකට ගියාම ඔහුගේ රෝග ඉතිහාසයත් සමඟ ඔහු භාවිත කරන බෙහෙත් වර්ග පවා දැන ගැනීමේ හැකියාව තිබෙනවා. ඒක licence එකක් වාගේ තමන්ගේ සාක්කුවේ තබා ගන්න පුළුවන්. යම් රෝගියෙකුගේ රෝග විනිශ්චය පොත, එහෙම නැත්නම් clinic කාඩ්පත අස්ථානගත වුණොත්, යන යන තැන අරගෙන නොගියොත් එම රෝගියාගේ ජීවිතය පවා අවදානම් තත්ත්වයට පත් වන බව අපි දන්නවා. නමුත්, තමන්ගේ සාක්කුවේ තිබෙන E-Health Card එක නිසා, මේ රටේ ඕනෑම රෝහලකට ගියාම අන්තර්ජාලය තුළින් ඔහුගේ රෝග ඉතිහාසය, පාවිච්චි කරන බෙහෙත් යනාදි ඒ දත්ත

[ගරු (වෛද්‍යා) තුසිතා විජේමාන්න මහත්මිය]

සියල්ලම විස්තරාත්මකව එනවා. එම වැඩසටහන සඳහාත් මෙවර අය වැයෙන් මුදල් වෙන් කිරීමක් සිද්ධ කර තිබෙනවා. එය ඉතා වටිනා වැඩසටහනක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැන කථා කළොත්, අපි හිතන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ණය අරගෙන තිබෙන්නේ උතුරු-නැඟෙනහිර පළාත්වල අය විතරක් බවයි.

සමහර වෙලාවට කියනවා, වැඩියෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ණය අරගෙන තිබෙන්නේ කාන්තාවන් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෑතක දී -දින කිහිපයකට කලින්- දැක්කා, මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලේ හිරවෙච්ච අයගේ 170 වෙනියා විධියට මහත්මයෙක් මිය ගිහිල්ලා තිබෙනවා කියලා සඳහන්ව තිබෙනවා. මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලේ හිරවුණු 24 ලක්ෂයක් ගැන වාර්තා වෙලා තිබෙනවා. ඒ නිසා මේ ක්‍ෂුද්‍ර මූල්‍ය ණය උගුලෙන් අපේ ජනතාව බේරා ගන්න විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරවන්න කැමතියි, රබර් කර්මාන්තය ගැන. රබර් ආශ්‍රිතව ජීවත් වෙන දිස්ත්‍රික්කයක මහජන නියෝජිතවරියක් විධියට මම කියන්න කැමතියි, ලංකාවේ රබර් ආශ්‍රිතව ජීවත් වෙන බහුතර ජනතාවක් ඉන්නේ කළුතර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල බව. අද කුඩා රබර් වතු හිමියන්ට ලොකු ගැටලුවක් ඇවිල්ලා තිබෙනවා. මම ආණ්ඩුව නියෝජනය කළත් පැහැදිලිව කියන්න ඕනෑ, රබර් ආශ්‍රිතව නිෂ්පාදනයේ යෙදෙන ජනතාව බොහෝ අසරණ තත්ත්වයට පත් වෙලා සිටිනවාය කියන එක. සමහර වෙලාවට අපි මේ ගැන ඉහළ අය දැනුවත් කරන්න ගියාම ඔවුන් අපට කියන දෙයක් තමයි "වියට්නාමයෙන් වෙළෙඳ පොළට රබර් අමුකිරි විශාල ප්‍රමාණයක් නිකුත් වෙනවා. ඒ නිසා මෙහිදී අපට රුපියල් 230ක මිලක් තමයි මේ rubber sheet එකකට දෙන්න වෙන්නේ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැනදී මම දකින දෙයක් තමයි මේ රබර් කර්මාන්තය හා ආශ්‍රිතව රබර් පර්යේෂණ ආයතනයක් තිබෙනවා; රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවක් තිබෙනවා. මෙම රබර් පර්යේෂණ ආයතනවල කාර්ය භාරය වෙන්න ඕනෑ, අස්වැන්න වැඩි කිරීමේ ක්‍රමවේදයක් ගෙන ඒමයි. මොකද, තාක්ෂණය තිබෙනවා; research කරනවා. එම නිසා මේ තාක්ෂණයත් එක්ක අස්වැන්න වැඩි කිරීමේ ක්‍රමවේදයක් ඇති කරන්න ඕනෑ. මම දන්නේ නැහැ, පසුගිය අවුරුදු 10ක වාගේ ඉතිහාසයක් ගත්තාම මෙහෙම අස්වැන්න වැඩි කිරීමේ ක්‍රමවේදයක්වත් ඇති කරලා තිබෙනවාද කියලා. මෙය බොහොම කනගාටුදායක තත්ත්වයක්. මොකද, මට මගේ දිස්ත්‍රික්කයේ රබර් කර්මාන්තයේ නිරත වන ජනතාව වෙනුවෙන් පෙනී සිටින්න වෙනවා. ඒ වාගේම පිටරටින් රබර් අමු කිරි -latex- ගෙන්වනවා නම්, එක්කෝ ඒ සඳහා බදු වැඩි කරන්න ඕනෑ, එහෙම නැත්නම් ඒ ආනයනය සීමා කරන්න ඕනෑ. එහෙම නැත්නම් රබර් කර්මාන්තයේ නිරත වෙලා ඉන්න අපේ අසල්වාසීන්, ඒ වාගේම මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ජනතාව බොහොම අසරණ තත්ත්වයකට පත් වෙනවා. විශේෂයෙන්ම අද දින ඔබතුමා මූලාසනයේ ඉන්න මොහොතේ අය වැය පිළිබඳ අදහස් දැක්වීමට මා හට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා. මෙවර ඉදිරිපත් කළ අය වැයේ තිබෙන කරුණු කාරණා ගැන කවුරු කොහොම කිව්වත් ඒ යෝජනා සාක්ෂාත් කර ගන්න ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, මලිත් ජයතිලක මහතා කථා කරන්න.

[අ.භා. 3.56]

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හට කථා කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම 2019 අය වැය ඉදිරිපත් වෙලා තිබෙන අවස්ථාවේදී එම අය වැය සම්බන්ධයෙන් කථා කරන්න කලින් මා දෙයක් කිවයුතු වනවා. 1948 වර්ෂයේදී අපේ රට නිදහස ලබපු දවසේ සිටම, ඒ පැවතුණු ආණ්ඩු වාර්ෂිකව අය වැය ලේඛනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි දන්නා දවසේ සිටම, ඉස්කෝලේ යන දවසේ සිටම හැමදාමත් කිව්වේත්, අපේ සමාජ අධ්‍යයනය පොතේ ලියලා තිබුණේත්, "ශ්‍රී ලංකාව තුන්වන ලෝකයේ රටක්; සංවර්ධනය වෙමින් පවතින රටක්" කියලායි. අපි දැන් ඉස්කෝලේ යෑම අවසන් කර, තව තවත් වැඩ ගොඩාක් කරලා පාර්ලිමේන්තුත් ඇවිල්ලා පස්වෙනි අවුරුද්දටත් ළඟා වෙමින් ඉන්නවා. නමුත්, අපේ රට තවමත් සංවර්ධනය වෙමින් පවතින රටක්. එහෙමනම් මම හිතන්නේ අපේ රටේ හැමදාමත් ඉදිරිපත් කරලා තිබුණු අය වැයවල හෝ, එහෙමත් නැත්නම් අපේ රටේ ඒ ඒ පැවතුණු ආණ්ඩු අනුගමනය කරලා තිබුණු ආර්ථික ප්‍රතිපත්තින්ගේ හෝ මොනවා හෝ විශාල අඩුපාඩුවක් තිබිලා තිබෙනවා. නැත්නම් එහෙම වෙන්න බැහැ. අපි හැමදාම මේ වාගේ සංවර්ධනය වෙමින් පවතින, එහෙමත් නැත්නම් තුන්වන ලෝකයේ රටක් හැටියට හැමදාමත් මේ විධියටම label වැදිලා මේ විධියටම ඉන්න අපේ මොකක් හෝ වරදක් තිබිලා තිබෙනවා. ඒ කියන්නේ, පාලකයන්ගේ හෝ ප්‍රතිපත්ති තීරකයන්ගේ විශාල වරදක්, මොනවා හෝ අඩුපාඩුවක් තිබිලා තිබෙනවා. කොහොම වුණත්, භූමි කම්පාවක් ඇති වුණාම මධ්‍ය ලක්ෂය -epicentre- හොයා ගන්නවා වාගේ, තවමත් රටක්, ජාතියක් හැටියට අපේ රටේ පවතින ආර්ථික අර්බුද ප්‍රශ්නයේ අපිකේන්ද්‍රය හොයා ගන්න අපි සමත් වෙලාද කියන ප්‍රශ්නය මතු වෙනවා.

කොහොම වුණත් මෙවර ඉදිරිපත් කර තිබෙන අය වැයත්, ඕනෑම ආණ්ඩුවක් සාම්ප්‍රදායික විධියට තමන්ගේ අවසාන අවුරුද්දේ ඉදිරිපත් කරන, ජාතික මැතිවරණයක් ආසන්නයේ තබාගෙන ඉදිරිපත් කරන අය වැයක්. අනිවාර්යයෙන්ම මැතිවරණයක් ඉලක්ක කරලයි මෙවැනි අය වැයක් ඉදිරිපත් කරන්නේ. අතීතයේත් ඒක කරලා තිබෙනවා. ඒ විධියට මේ ආණ්ඩුවත් තව මාස කිහිපයකින් හෝ අවුරුද්දකින් එන්න පුළුවන් මැතිවරණයක් ඉලක්ක කරලායි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ කියන එක අපට නම් පැහැදිලිව පෙනෙනවා. නමුත්, ආණ්ඩුවෙන් පුන පුනා කියනවා, එහෙම නැහැ කියලා. කොහොම වුණත් මේකට දාලා තිබෙන නම දිහා බැලුවාමත් අපට පෙනෙනවා, මේක මැතිවරණ අය වැයක් කියලා. "ජනතාවට ශක්තිය - දුප්පතුන්ට රැකවරණය" කියලයි නම දාලා තිබෙන්නේ. "හිඟන්නාගේ තුවාලය" වාගේ මේ අය වැයෙනුත් දුප්පතාට රැකවරණය දෙනවායි කියලා සඳහන් කරලා ඒ තුළ මැතිවරණයට අවශ්‍ය පූර්ව කටයුතු සූදානම් කර ගැනීමකුයි මේ තේමා පාඨයෙන්ම අපට පෙනෙන්නේ.

අසූව දශකය පුරාම අපේ රට පාලනය කළේ අද වාගේම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්. අපි දන්නා විධියට අද ආර්ථික සමෘද්ධිය කරා ළඟා වෙලා ඉන්න ලෝකයේ බොහෝ රටවල්, උතුරු ඇමෙරිකාව සහ බටහිර යුරෝපයෙන් මෙපිට ලෝකයේ ආර්ථික සමෘද්ධිය ලබා ගත්ත බොහෝ රටවල් ඒකට පදනම දමා ගත්තේ අසූව දශකයේයි. එලෙසින් වූ රටවල් කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම නැඟෙනහිර ආසියාවේ රටවල් කණ්ඩායමක් තමයි අසූව දශකයේ ඒ ආර්ථික සංවර්ධනය ලබා

ගත්තේ. ඒ සංවර්ධනය ලබා ගත් සියලුම රටවල් ඒකට පදනම, අඩිතාලම දමා ගත්තේ අසූව දශකයේයි. විශේෂයෙන් ආර්ථිකය තුළ ආසියානු ව්‍යාඝ්‍රයින් -"Asian Tigers"- කියලා අපි හඳුන්වන ඒ රටවල්, විශේෂයෙන් තායිවානය, හොංකොං, සිංගප්පූරුව සහ දකුණු කොරියාව වැනි රටවල් 1980 දශකයේ තමයි ඒ ආර්ථික අඩිතාලම දමා ගත්තේ. නමුත්, 1980 දශකය අපේ ඉතිහාසයට අහිමි දශකයක් හැටියටයි ගණන් ගන්න වෙන්නේ. සමහර විට ඒකට යුද්ධය හේතු වෙන්නත් පුළුවන්. කොහොම නමුත්, අපට අන්තිමට ඉතිරි වුණේ, අද වන කොටත් අපට ඉතිරි වෙලා තිබෙන්නේ, ලංකාවේ කාන්තාවන් විසින් හසුරුවන ආර්ථිකයක්. විශේෂයෙන් ග්‍රාමීය, දුප්පත්, සාපේක්ෂව අඩු අධ්‍යාපන මට්ටමක් සහිත කාන්තාවන් තමයි මේ වන විට අපේ ජාතික ආර්ථිකයේ ප්‍රධාන මාර්ග හසුරුවන්නේ. විශේෂයෙන්ම මැද පෙරදිග ආශ්‍රිතව, ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිතව සහ තේ කර්මාන්තය ආශ්‍රිතව කටයුතු කරන්නේ කාන්තාවන්. මේ ක්ෂේත්‍ර තුන තමයි අපේ රටේ ජාතික ආර්ථිකයේ ප්‍රධාන ආදායම් මාර්ග බවට පත් වෙලා තිබෙන්නේ. එම නිසා අපේ රට කාන්තාවන් විසින් හසුරුවන රටක් හැටියටයි අපට අකැමැත්තෙන් වුවත් හඳුන්වන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතක විධියට ඔක්තෝබර් මාසයේ දෙවැනි සතියේදී විතර, -ඒ වන කොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩුව එක්ක හිටියේ.- ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් අපේ මන්ත්‍රී කණ්ඩායම මුණ ගැහෙන අවස්ථාවකදී මුදල් ඇමතිතුමා කිව්වා, මෙවර ඉදිරිපත් කරන්නේ caring Budget එකක්ය කියලා. ඒ වෙලාවේ ඉදිරිපත් කරන්න හිටපු අය වැය ගැනයි එතුමා ඒ කිව්වේ. ඒකම තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේත්. පොඩි පොඩි වෙනස්කම් ටිකක් විතරයි කරලා තිබෙන්නේ. මැතිවරණයට අවශ්‍ය මූලික අඩිතාලම දැමීම පමණයි මාස හතරකට පස්සේ ඉදිරිපත් කරන මේ අය වැයට ඇතුළත් කර තිබෙන්නේ. කොහොම වුණත් කලින් මුදල් ඇමතිතුමා කිව්වේ මේක caring Budget එකක් කියලයි. ඒකේ caring කොටස් හැටියට විස්තර කළාම පාර්ලිමේන්තු මන්ත්‍රී අපේ ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා ගත් කටටම ඇහුවා, "ඒ කොටසත් හොඳයි. ඔය sanitary facilities වාගේ ඒවාත් හොඳයි. ඒ වුණාට 21වන සියවසේ අපි ලෝකයට රටක්, ජාතියක් හැටියට මුහුණ දෙන විධිය ගැනත් මොනවා හෝ ඇතුළත් කරන්න ඕනෑ නේද, මුදල් ඇමතිතුමනි?" කියලා. ඒ ප්‍රශ්නය එතුමා ජනාධිපතිතුමා ඉදිරියේදීම ඇහුවා. එතුමා එදා අහපු ප්‍රශ්නය තමයි දැන් අපට අහන්න තිබෙන්නෙත්.

මම හිතන්නේ Caring Budget එකේ අය වැය විශේෂාංගය හැටියට ඉදිරිපත් වෙලා තිබෙන්නේ වැසිකිළි පහසුකම් -sanitary facilities- සැපයීම කියන එකයි. එය අත්‍යවශ්‍ය මූලික මිනිස් අයිතියක්. අය වැයේ වැඩිම කථාබහට ලක්වෙන කොටස බවට අද එය පත් වෙලා තිබෙනවා. 21වන සියවසේ නූතන සංවර්ධිත රටක් බවට අපි පත්වන්නේ කොහොමද කියනවාට වැඩිය මේ වාගේ පොඩි ප්‍රශ්නත් එක්ක අපි කොටුවෙලා ඉන්නවා කියන කාරණය මට ඉස්මතු කරන්න වෙනවා. කොහොම වුණත්, මම මුලින්ම කිව්වා වාගේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය මැතිවරණ අය වැයක් කියලා ඔප්පු කරන්න කරුණු ගණනාවක්ම අපට තියෙනවා. එකක් තමයි ගම්පෙරළිය වැඩසටහනට මිලියන 48,000ක් වෙන් කිරීම. සාමාන්‍යයෙන් එක්සත් ජාතික පක්ෂයට පොඩි භීතිකාවක් තිබෙනවා, ගම තවම විපක්ෂයේ; එක්සත් ජාතික පක්ෂයට නැහැ කියලා. ඒ නිසා ඡන්ද සීරුමාරු කර ගැනීම සඳහා තමයි මේ ආකාරයට ගම්පෙරළිය වාගේ වැඩසටහනකට මේ අය වැයේ මූලිකම ස්ථානය ලබා දෙන්නේ. එහෙම නැත්නම් අනාගතයට රට ගෙනියන්නේ කොහොමද, ආර්ථික අර්බුදයට මුහුණ දෙන්නේ කොහොමද කියන කරුණුවලට වඩා එක්සත් ජාතික පක්ෂයට ගම හරවා ගැනීම සඳහා වන වැඩ පිළිවෙළක් හැටියටයි ගම්පෙරළිය වැඩසටහන මම දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය මැතිවරණ අය වැයක් කියලා තවදුරටත් අපට පෙනෙනවා, එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන ජාතික තරුණ සේවා සභාව වටා ගොනු කර තිබීමෙන්. මම අපේ මුදල් ඇමතිතුමාට කියා සිටිනවා, තරුණ ව්‍යවසායකයන් හදන්න ඇත්තටම අවශ්‍ය නම්, අපට ඒ සඳහා ආයතන තිබෙන බව. වෘත්තීය පුහුණු අධිකාරිය, NAITA, කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ඒ වාගේම විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය ආශ්‍රිතව අපේ නව නිපැයුම්කරුවන් විශාල පිරිසක් පේටන් බලපත්‍ර අරගෙන ඉන්නවා. මෙන්න මේ අය එකතු කර ගෙන, මේ අය මූලික කරගෙන මේ එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්න කියලා මම යෝජනා කරනවා. ජාතික තරුණ සේවා සභාව වටා විශාල තරුණයන් පිරිසක් ඉන්න පුළුවන්. මම දන්නේ නැහැ, ඒ අයට නව තරුණ ව්‍යවසායකයන් හැටියට වර්ධනය වෙන්න අවශ්‍ය ද කියලා. කොහොම වුණත් මේ තුළත් පෙනෙනවා, තරුණ සේවා සභාව ආශ්‍රිතව ඉන්නා ලක්ෂ ගණනක තරුණයන් පිරිස එකතු කරගෙන ඉදිරි මැතිවරණයකට මුහුණ දීමේ අවශ්‍යතාවය එතුමන්ලාට තිබෙන ආකාරය. මා මුලින්ම කිව්වා වාගේ ලක්ෂ දහයකට වැසිකිළි පහසුකම් නැහැ කියන එක ගැන තමයි හැම තිස්සේම කථා කරන්නේ. නමුත් මේ සංඛ්‍යාව යම්කිසි ආකාරයක exaggeration එකක් හැටියට තමයි පෙනෙන්නේ. මොකද, ජාතික අය වැයක මේ වාගේ කරුණු අපි ජාතික මට්ටමින්, මහා පරිමාණයෙන් කථා කළ යුතු ද කියන ප්‍රශ්නයත් පැන නගිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාගේ කාලය අවසානයි.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

මේ අය වැයේ මේ වාගේ කරුණු ගණනාවක් තිබෙනවා. ලංකාව දූපතක්. වෙරළ ආශ්‍රිතව පවුල් විශාල සංඛ්‍යාවක් ජීවත් වෙනවා. භූමියේ පිහිටීම අනුව ඒ අයට වැසිකිළි හදා ගන්න බැරුව ඇති. මේ ලක්ෂ දහයක සංඛ්‍යාව එතැනින් හැදෙනවාද කියලාත් මට සැකයක් ඇති වෙනවා. ඒ ගැනත් අපි අවධානය යොමු කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පවුල් ලක්ෂ 6කට සමෘද්ධි දීමනාව ලබාදීම සම්පූර්ණයෙන්ම මැතිවරණය ඉලක්ක කර ගත් දෙයක් හැටියටයි මම දකින්නේ. හැමදාම එක්සත් ජාතික පක්ෂය සමෘද්ධි ව්‍යාපාරය දෙස බැලුවේ වෛරී දෘෂ්ටි කෝණයකින්. නමුත් මේ අවස්ථාවේදී පමණක් ප්‍රේමයයි වෛරයයි වාගේ දැන් ඒක මිශ්‍ර වෙලා සමෘද්ධි ව්‍යාපාරයට ආදරය කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ ගැන එක පැත්තකින් අපි සතුටු වෙනවා. 1994දී චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව ගොඩ නඟපු මේ සමෘද්ධි ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන යන්න එක්සත් ජාතික පක්ෂය ඒ ගනු ලබන කාර්යභාරය ගැන අපි සතුටු වෙනවා. කොහොම වුණත්, මේ ආකාරයෙන් බලනකොට මේ අය වැය තුළින් ලංකාවේ අනාගතය පිළිබඳව කිසිදු අවධානයක් යොමු කරලා නැහැ.මේ අය වැය අවධානය යොමු කරලා තිබෙන්නේ 2019 හෝ 2020 ඉදිරි මැතිවරණයක් වෙනුවෙනුයි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඒ.ඒ. විජේතුංග මන්ත්‍රීතුමා.

[අ.භා. 4.08]

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැමදෙනාටම සතුටු විය හැකි අය වැයක් ගෙන ඒම සම්බන්ධයෙන් අපේ රජයටත්, මුදල් ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වනවා. මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා, "මේක මැතිවරණ අය වැයක්" කියලා. මම හිතන විධියට මැතිවරණ අය වැයක් නම් මීට වැඩිය වෙනස් වෙන්න ඕනෑ. පසුගිය කාලයේ රුපියල් 10,000කින් රාජ්‍ය සේවකයින්ට පඩි වැඩි කළේ මැතිවරණ බලාගෙන නොවෙයි කියා අපි එතුමන්ලාට කියන්නට ඕනෑ. ඖෂධ මිල සියයට 40කින් අඩු කළා. "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය ඇති කළා. මා දන්නා හැටියට එයින් විශාල යහපතක් සිද්ධ වුණා. මහා මාර්ග, අධ්‍යාපනය, සෞඛ්‍ය අංශයෙන් පසුගිය අවුරුදු තුන තුළ දියුණුවක් ඇති වුණු බව කියන්න පුළුවන්.

මීට පෙර කථා කළ සමහර මන්ත්‍රීවරු "ගම් පෙරළිය" වැඩසටහන ගැන කථා කරමින් අපහාස, උපහාස කළා. පසුගිය අවුරුද්ද තුළ රුපියල් ලක්ෂ සියය බැගින් මන්ත්‍රීවරුන්ට දුන්නා, තමන්ගේ මැතිවරණ කොට්ඨාසය දියුණු කරන්න. මම මගේ මැතිවරණ කොට්ඨාසයේ ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් ආරම්භ කර අවසන් කළා. පැවති ආණ්ඩුව ටික කාලයකට බලෙන් ඉවත් කළ නිසා සමහර ස්වේච්ඡා සංවිධාන කටයුතු නොකිරීම නිසා මේ මුදල් අපතේ ගියා.

මෙවරත් අය වැයෙන් වැඩ රාශියකට මුදල් වෙන් කරලා තිබෙනවා. මම මන්ත්‍රීවරයෙක් වුණාට පස්සේ ගමට ගිහිල්ලා කොන්ද කෙළින් තියාගෙන වැඩක් කරන්න පුළුවන් ආකාරයට මුදල් ප්‍රතිපාදන අපට ලබා දුන්නා. ඒ පිළිබඳව මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. අපට ගමේ පන්සල් හදන්න පුළුවන්; ක්‍රීඩා පිටි හදන්න පුළුවන්; මාර්ග හදන්න පුළුවන්; සනීපාරක්ෂක පහසුකම් ලබා දෙන්න පුළුවන්.

අපේ හිටපු ගරු අමාත්‍යතුමා මේ ගරු සභාවේදී කිව්වා, එතුමන්ලා අවුරුදු ගණනක් ගම සංවර්ධනය කළා; නමුත් ගම් පෙරළියෙන් වැඩක් කෙරෙන්නේ නැහැ කියා. අනෙක් දිස්ත්‍රික්ක ගැන කියන්න මම දන්නේ නැහැ. පසුගිය රජයේ කාලයේ අපේ දිස්ත්‍රික්කයේ පාරවල් හදා තිබුණේ අඟල් හතරට. ඒ නිසා විශාල පාරවල් විශාල වශයෙන් කැඩිලා බිඳිලා ගිහිල්ලා, සමහර තැන්වල පාරක් තිබුණු තැනක්වත් සොයාගන්න නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි හදන පාරවල් අඟල් හයයි. ඒවායේ වැඩ කරන කොට අපි හොයලා බලනවා. වංචා කරලා, හොරකම් කරලා අපි සල්ලි ගන්නේ නැහැ; අපි එහෙම සල්ලි ගන්න දෙන්නේත් නැහැ. ගම් පෙරළිය ව්‍යාපෘතිය සෑම ගමකටම යනවා. ඊයේ අපේ ආසනයේ ගම් පෙරළිය ව්‍යාපෘති 170ක් එක දවසේ, එක වෙලාවට පටන් ගත්තා. ආර්ථික සංවර්ධන නිලධාරි මහත්වරුන්ට මම ඒ ව්‍යාපෘති කරන්න භාර දුන්නා. සමෘද්ධි නියාමක මහත්වරුන්ට සහ ග්‍රාම නිලධාරි මහත්වරුන්ට කිව්වා, කවුරු කොන්ත්‍රාත් කළත් හොඳට කරනවාද කියලා ඒවා ගැන බලන්න කියලා. හැබැයි, පසුගිය රජය කාලයේ මේ විධියට කළේ නැහැ. ආර්ථික සංවර්ධන නිලධාරි මහත්වරු ඒ ගැන සාක්ෂියට ඉන්නවා. ඒ කාලයේ බලපෑම් තිබුණා. ග්‍රාම නිලධාරිවරයාට බලපෑම් තිබුණා. පාරවල් ටික කැඩී ගියා. අපි ඇත්ත ඇති සැටියෙන් කථා කරන්න ඕනෑ. අපි කවුරුවත් විවේචනය කරනවා නොවෙයි. පසුගිය අවුරුදු දෙක තුනේ අඟල් හයට හදපු පාරවල් හොඳට, ලස්සනට තිබෙනවා. 2017 අවුරුද්දේ විශාල ගංවතුරක් ආවා. තිබුණු පාරවල් ටික ඔක්කෝම කැඩිලා ගියා. ඒ වෙලාවේ විශාල වශයෙන් පාරවල් හදන්න සිද්ධ වුණා. මේ රජයෙන් රටේ මොකක්ද වුණේ, සංවර්ධනයක් වුණාද කියලා විපක්ෂයෙන් අහනවා. විශේෂයෙන් රත්නපුර මගේ කොට්ඨාසයේ කැබිනට් ඇමතිතුමන්ලා පවා හිටියා. කිසි දවසක කරන්න බැරි වුණු සංවර්ධන වැඩසටහන් රාශියක් මම කරගත්තා. රත්නපුර නගරය වටේ එකම කාපට් පාරක්වත් හදලා තිබුණේ නැහැ. අපි ඒ පාරවල් හදා ගත්තා. රත්නපුර දිස්ත්‍රික්කයේ ලොකුම ව්‍යාපෘතිය වන හත්වතාවක් මුල්ගල තියපු පාලම හදලා, ලබන මාසයේ අගමැතිතුමා අතින් විවෘත වෙනවා. රත්නපුර නගරය කියන්නේ, මා දන්නා හැටියට ප්‍රධාන විකල්ප මාර්ගයක්. අවුරුදු ගණනක් bypass එකක් ඉල්ලා මුදල් වෙන් කර ඒ වෙනුවෙන් මුල්ගලත් තිබ්බා. පසුගිය අය වැය එනතුරු ඒක කරගන්න විශ්වාසයක් තිබුණේ නැහැ. මම හිතන විධියට රුපියල් බිලියන 9ක් රත්නපුර bypass එක වෙනුවෙන් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒක රත්නපුර දිස්ත්‍රික්කයේම ජනතාවට ලැබෙන සහනයක්. විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ පාරවල් සෑදීමට ප්‍රතිපාදන වෙන් කිරීම වෙනුවෙන් මුදල් ඇමතිතුමාටත්, මහා මාර්ග ඇමතිතුමාටත් අපි ස්තුතිවන්ත වෙනවා. රත්නපුරේ තේ ආර්ථිකය තිබෙනවා; මැණික් ආර්ථිකය තිබෙනවා; රබර් ආර්ථිකය තිබෙනවා. නමුත්, තිබෙන පාරවල් බොහොම දුර්වලයි. රත්නපුර අධිවේගී මාර්ගයත් මේ අවුරුද්දේ පටන් ගන්නවා කියා තිබෙනවා. ඒ වෙනුවෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. කවදාවත් මෙවැනි දේවල් රත්නපුර පටන් ගත්තේ නැහැ. ගම් පෙරළිය වැඩසටහනට කිසිම කෙනෙකුට අත පොවන්න ඉඩක් නැහැ. හැම ගමකටම ගිහින් අපි යෝජනා ලබා ගත්තා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්ද, පොහොට්ටුවෙන්ද -ඒ ඔක්කොමගෙන්- යොජනා ගත්තා. ඒ යෝජනා පොදුවේ අපි ක්‍රියාත්මක කර තිබෙනවා. අපට ගරු අගමැතිතුමා උපදෙස් දීලා තිබෙන්නේ ඒ ආකාරයට. මා දන්නා හැටියට පක්ෂ භේදයක් නැතිව ඒ වැඩ කටයුතු කෙරෙනවා. මගේ දිස්ත්‍රික්කයේ ඒ ව්‍යාපෘති දෙක ඒ විධියටයි ක්‍රියාත්මක කළේ. අප්‍රේල් 1වැනිදා සිට අප්‍රේල් 30 වැනි දා වෙන විට අපි විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා, මේ ඊයේ පෙරේදා පටන් ගත්ත ඒ සියලු ව්‍යාපෘති. සාමාන්‍යයෙන් පාරවල් සවි වෙන්නත් කාලයක් යනවානේ. ඒ කටයුතු ඉටු කර දීම ගැන මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් සමෘද්ධි වැඩසටහන ගැන කථා කළා. සමෘද්ධිලාභීන් 14 ලක්ෂයක් ඉන්නවා වෙන්න පුළුවන්. මම වගකීමක් ඇතිව කියනවා, හරි විධියට සමීක්ෂණයක් කළොත් සමෘද්ධි ගන්න සුදුසු උදවිය දසලක්ෂයක් නැහැ කියලා. මම දේශපාලන වශයෙන් කථා කරනවා නොවෙයි මේ. පහුගිය කාලයේ සමහර කණ්ඩායමකට මේ සහනාධාර ලබා දුන්නේම නැහැ. මෙවර තව හයලක්ෂයකට දෙන්න හදනවා. මම මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, සමෘද්ධි ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, සියලු පක්ෂවල නියෝජිතයන් යොදලා, කොමිටියක් පත් කරලා, ප්‍රසිද්ධ පන්සලකට නැත්නම් පාසලකට ගෙනැල්ලා සුදුසු අය තෝරන්න කියලා. එහෙම තේරුවොත් මේ අයගෙන් හුඟක් කට්ටියට අයින් වෙන්න වෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ අපේ ආසනයේ තේ අක්කර 10ක් තිබෙන අයටත් සමෘද්ධිය තිබෙනවා; ලොරි හතරක් තිබෙන අයට සමෘද්ධිය ලැබෙනවා. මා ළඟ ඒ ලැයිස්තුව තිබෙනවා. මේ තමයි සමෘද්ධි ව්‍යාපාරයේ තත්ත්වය. නැති එක්කෙනාට කොහොමටවත් ලැබිලා නැහැ. අද සමෘද්ධිය දෙන්න එපා, අලුතින් තෝරන්න එපා කියලා තිබෙනවා. අපේ මැතිවරණ කොට්ඨාසයේ එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක සමෘද්ධි නියාමකට මන්ත්‍රීවරයෙක් සම්බන්ධ වෙලා මාසයට වරක් දෙකක් සමෘද්ධි සහනාධාර දෙන්න යනවා. වැඩිහිටි දීමනාව දෙනවා. අපි දන්නේ නැහැ කොහෙන් දෙනවාද කියලා. ඒ නිසා මේවා සාධාරණ වෙන්න ඕනෑ.

අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා ලක්ෂ 10කට වැසිකිළි නැහැ කියලා. රත්නපුර නගරයේ, මහ නගර සභා සීමාව ඇතුළේ, ෆාම් ගාඩ්න් වතුයායේ නිවාස 65කට තිබෙන්නේ වැසිකිළි දෙකයි; වහළත් තෙමෙනවා. මම දීපු දේවල් මේ කියන්නේ. මම පෞද්ගලිකව ටකරන් පහ පහ අරගෙන දුන්නා. පසුගිය ආණ්ඩුවෙන් දුන්නේත් නැහැ. අපේ ආණ්ඩුව කාලයේත් දෙන්න බැරි වුණා, දැන් දෙන්න යනවා. දැන් ඒ සියලු නිවාසවලට අපි අමානෝ ෂීට් දෙන්න යනවා. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ තට්ටු නිවාස හදන්න ඕනෑ. හදලා ඒ ගොල්ලන්ට භාර දෙන්න ඕනෑ. පර්චස් 7ක් දෙන එකත් හොඳ වැඩ පිළිවෙළක්; හොඳම වැඩ පිළිවෙළක්. වතු නිවාස 65කට තිබෙන්නේ වැසිකිළි දෙකයි! අපේ රජය කාලයේත් ඒ ගැන බලලා වළවල් භාරන්න ගියා, නමුත් තවම කෙරුණේ නැහැ. වතු යටිතල පහසුකම් ඇමතිවරයා ඉන්නවා. තවත් ගොඩක් ඇමතිතුමන්ලා ඉන්නවා. හරිම කනගාටුදායක විධියට තමයි ඒ වතුවල ජනතාව ජීවත් වෙන්නේ. මේවා ගැන ඡන්ද කාලයට කියනවා. අපිත් කියනවා, අනෙක් පක්ෂවල අයත් කියනවා. මේවා ගැන ඇත්ත ඇති සැටියෙන් කියන්න ඕනෑ. ඕනෑනම් ගිහින් බලන්න පුළුවන්.

සමෘද්ධියෙන්, ගම්පෙරළියෙන් කිසි දෙයක් වෙන්නේ නැහැ කියනවානේ. එන්න, අපි පෙන්වන්නම් අපේ දිස්ත්‍රික්කයේ අපි කරන වැඩ. අරයා මෙයා ගැන විවේචනය කිරීමෙන් වැඩක් නැහැ.

මේක ඡන්ද අය වැයක් කිව්වා. ඡන්ද අය වැයක් නම් මීට වඩා වෙනස් විධියකට ඉදිරිපත් කරනවා. එහෙනම් එතුමන්ලා දන්නවා, ඒ කාලයේ ඡන්දයක් එනකොට මේවාගේ අය වැයක් ඉදිරිපත් කළා කියලා. අද එතුමන්ලාට බියක් ඇති වෙලා. මේ අය වැය හොඳයි කියන්න බැරි නිසා මැතිවරණ අය වැයක් කියලා කියනවා. ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා, මිනිසුන්ට කොච්චර කන්න දුන්නත් ඡන්දය දෙන්නේ නැහැ කියලා. ඒ වෙලාවට පිටින් ගිහිල්ලා හෝ කවුරු හරි මොනවා හරි කිව්වොත්, දුන්නොත් - මම කියන්නේ නැහැ කවුද කියලා - එයාට තමයි ඡන්දය දෙන්නේ. මොනවා හරි බොරු ටිකක් කියන්න ඕනෑ.

පසුගිය ජනාධිපතිවරණයේදී මුළු රටම වර්තමාන ජනාධිපතිතුමාට ඡන්දය දුන්නා., රටේ තිබුණු අසහනය හා යම් යම් අඩුපාඩු නිසා. පොඩි පොඩි ප්‍රශ්න ඇති වෙලා එතුමාත් වෙනස් වුණා. ඒ දේශපාලනයේ හැටි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම තරම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කරන්න වෙහෙසුණ කණ්ඩායමක් නැහැ. ඒක අමතක කරන්න පුළුවන්. පසුගිය ඉතිහාසයේ එක්සත් ජාතික පාක්ෂිකයන්ට අසාධාරණයක් සිද්ධ වුණේ.

රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත්, තේ, රබර් ඇරුණාම වැඩියෙන්ම ආදායම තිබෙන්නේ මැණික් කර්මාන්තයෙන්. පසුගිය ගංවතුරේදී ඇළ දොළ ගංගා විනාශ වෙලා ගියා.

අපි ආචාර්ය එන්.ඇම්. පෙරේරා මැතිතුමා සිහිපත් කරන්නට ඕනෑ. රහසිගත කර්මාන්තයක් විධියට තිබුණු මැණික් කර්මාන්තය එළියට ගත්තේ දිවංගත ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමායි. එතුමා සීමාසහිත, අතලොස්සක් අතේ තිබුණු මැණික් ව්‍යාපාරය සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනා අතට දීලා, මුළු ලෝකයටම සම්බන්ධ වෙන්න කටයුතු කරලා මැණික් සංස්ථාව පිහිටෙව්වා. විවෘත ආර්ථිකය නිසා අහක දාපු, විසි කරපු මැණික් කැලිවලටත් අද වන විට ඉල්ලුමක් තිබෙනවා. ලෝක ඉතිහාසයේ කිසිම දවසක නොතිබුණු වටිනාකමක් පසුගිය මාස තුනේ, හතරේ මැණික්වලට ලැබී තිබෙනවා.

රජයක් හැටියට, මේ කටයුතු භාර ඇමතිතුමා හැටියට ජනාධිපතිතුමා මැණික් කර්මාන්තයට හරියට අත ගැහුවොත් විශාල වශයෙන් දියුණු කරන්න පුළුවන් වෙයි. අපේ පළාතේ දහස් ගණනක් මැණික් කර්මාන්තයෙන් ජීවත් වෙනවා. අවුරුදු 2,000ක්, 2,500ක් තිස්සේ මේ රටේ ජනතාව ගංගාවල, ඇළ දොළවල පොඩි වැටියක් ගහලා, උදැල්ල දමලා, කූඩේ දමලා මැණික් ගරන තත්ත්වයක් තිබුණා. පසුගිය කාලයේ තිබුණු යම් යම් අපහසුතා නිසා, ප්‍රශ්න නිසා ඒවා නවත්වලා ජනාධිපතිතුමා මැණික් කර්මාන්තයට නීතියක් දැම්මා. පස්සේ අපි ජනාධිපතිතුමාට ඒ ගැන කථා කළා. පක්ෂ, විපක්ෂ ඔක්කොම කථා කළා. මැණික් ගරනකොට පොලීසියෙන් අල්ලනවා; එක්කෙනකුට රුපියල් 50,000ක් දඩ ගහනවා. ඒක දැන් තාවකාලිකව නැති කරලා තිබෙන්නේ. හැබැයි, මැණික් ගලක් දැකලා නැති, පතලකට බැහැලා නැති, ගහක් නොදැකපු රාජ්‍ය නිලධාරින් තවම නීති තද කරගෙන ඉන්නවා. උදැල්ල නැතිව වැලි අරගෙන කූඩේට දමන්න බැහැ. එතුමන්ලා කියනවා ජනාධිපතිතුමා කිව්වාලු, "උදැල්ල දමන්න එපා" කියලා. ජනාධිපතිතුමා පිස්සෙක් නොවෙයි, හොඳ බුද්ධිමතෙක්. එතුමා මේ මෑතකදීත් අපට හමු වෙලා කිව්වා,"ඔයගොල්ලන්ගේ ඉල්ලීම මම ඉටු කළා" කියලා. උදැල්ලෙන්, කූඩෙන් මැණික් ගරන්න පුළුවන් කිව්වා. නමුත් මැණික් ගරනකොට දැනුත් පොලීසියෙන් පනිනවා. ඉස්සරහට අවුරුදු කාලේ එන්නේ. ජනතාව සිය දහස් ගණනක් ගඟට බැහැලා, ඇළවල්වලට බැහැලා උදැල්ල දමලා මැණික් ගරනවා. ගඟ අවහිර කරනවාට අපි විරුද්ධයි. ගඟේ ඉවුර කඩන එකට අපි විරුද්ධයි. බැකෝ ගඟට දමනවාට අපි විරුද්ධයි. ගමේ දුප්පත් මිනිස්සු වැලි ටිකක් ගොඩ දා ගන්නවා. විශේෂ කාර්ය බලකාය ගිහින් අල්ලනවා. මේ ඊයේ පෙරේදා දහදෙනෙකුට රුපියල් පන්ලක්ෂ ගාණනක් දඩ ගැහුවා. තුන්දෙනෙක්ද කොහෙද බේරිලා තිබෙනවා. අපි ගොඩක් කට්ටිය එකතු වෙලා තමයිඡ් සල්ලි ගෙව්වේ. විශේෂ කාර්ය බලකාය දමන්න ඕනෑ පතල් කම්කරුවන් අල්ලන්න නොවෙයි, කුඩුකාරයෝ අල්ලන්න, ගංජාකාරයෝ අල්ලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ දී ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. K. THURAIRETNASINGAM *left the Chair, and* THE HON. ANURA SIDNEY JAYARATHNE *took the Chair.*

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි නැවත මේ ගැන ජනාධිපතිතුමා දැනුවත් කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙය අසාධාරණයි. මා හිතන විධියට මේ අය ඇල්ලුවාම විශේෂ කාර්ය බලකායට ගනුදෙනුවක් ලැබෙනවා. ඒ නිසා තමයි මේ මිනිස්සු අත් අඩංගුවට ගන්නේ. අසාධාරණ විධියට දඩ ගැහුවාම මේ මිනිසුන්ට ගෙවන්න බැහැ. මේ අවුරුදු 2,000ක්, 2,500ක් තිස්සේ කරගෙන ආපු රස්සාව. ගහ හොඳට තිබුණා. ඒ කාලයේ ඉවුරු කැඩුණේ නැහැ. දිගටම කරගෙන ආපු රස්සාව ළඟදී නැති වුණා. රත්නපුරේ ජනතාව වැඩිපුරම ජීවත් වෙන්නේ මැණික් කර්මාන්තයෙන්. ගොඩක් තරුණයන් ඒ වැඩ කරනවා. තරුණියන් පවා ඒ කටයුතුවලට සම්බන්ධ වෙලා වැඩ කරනවා. ඒ වාගේම ඒ දෙමව්පියන් සම්බන්ධ වෙනවා. මම මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, උදැල්ල දමලා, කූඩේ දමලා අදින එක පොලිසිය දමලා අල්ලන එක නවත්වන්න කියලා. මේ ඉල්ලීම ජනාධිපතිතුමා ළඟට යන්න ඇති. මේ ළඟදී උත්සවයකදී හමුවුණාම එතුමා කථා කළා. "අන්න මැණික් කර්මාන්තයට අවසර දුන්නා" කියලා එතුමා කිව්වා. අදාළ ඇමතිතුමා සමඟ සාකච්ඡා කරලා මේ ගැන විශේෂ අවධානය යොමු කරන ලෙස ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා හිතන විධියට ලෝකයේ හොඳම මැණික් ගල් ලැබෙන්නේ ලංකාවෙන්, ඉතිහාසයේ වාගේම වර්තමානයේත්. මා දන්නා හැටියට අනාගතයේත් එහෙම තමයි.

ජාත්‍යන්තර මැණික් වෙළෙඳ පොළ තිබෙන්නේ තායිලන්තයේ බැංකොක්වල. ඒ රට මැණික් ලැබෙන්නේ නැති රටක්. මෙහේ තිබෙන ගල් ටික ඔක්කොම එහාට අරගෙන යනවා. අනෙක් රටවලිනුත් ගෙනෙනවා. ලංකාවේ මැණික් කැපුම් කර්මාන්තයේ නියුතු අය ලක්ෂ හතරක් පමණ ඉන්නවා. අපේ පැත්තේ මැණික් කර්මාන්තයේ යෙදෙන ලක්ෂ 10, 15ක්, 20ක් ඉන්නවා. මේ කර්මාන්තයට සාධාරණයක් කරන්න. අවුරුදු ගණනාවක් තිස්සේ මැණික් වෙළෙඳ පොළකට ගොඩනැඟිල්ලක් හදනවා. අපි යෝජනා කරලා ඒක ආරම්භ කළා. මම හිතන විධියට දැන් ඒකත් අඩ පණ වෙලා තිබෙනවා.

මේ සම්බන්ධයෙනුත් විශේෂ අවධානය යොමු කරවන්න ඕනෑ. ඒ වාගේම, රත්නපුර නව නගරයේ අක්කර 10ක් මැණික් කර්මාන්තය සඳහා වෙන් කරලා තිබෙනවා. එතැන හොඳ ගොඩනැඟිල්ලක් හදන්න පුළුවන්. මම හිතන විධියට choppers බාන්න තැනක් එතැන හදන්න පුළුවන්. සාමාන්‍යයෙන් කුඩා හොඳ වෙළෙඳ මධ්‍යස්ථාන ටිකක් හදන්න පුළුවන්. ඒ වාගේම, සංචාරක හෝටල් කිහිපයක් එතැන හැදුවොත්, ලංකාවේ නොවෙයි, ලෝකයේ තිබෙන හොඳම නගරවලින් එකක් බවට රත්නපුර නගරය පත් වේවි. ජනාධිපතිතුමා අපට සම්බන්ධ වෙලා සිටි කාලයේ මම එතුමාට මේ යෝජනා ටික ඉදිරිපත් කළා. ඒ ඔක්කොම යට ගිහිල්ලා තිබෙනවා. ඒ ඔක්කොම දැන් යට ගිහිල්ලාද මම දන්නේ නැහැ. අපේ රටේ මැණික් කර්මාන්තය හරියට දියුණු කළොත්, විදේශ විනිමය ඉපැයීමට පමණක් නොවෙයි, අය වැය පියවන්න පුළුවන් තත්ත්වයට ගන්නත් පුළුවන්. ලංකාවේ මැණික් කර්මාන්තය හරි විධියට ගොඩ නැඟුවොත්, අපේ රට කාටවත් ණය වෙන්න ඕනෑ නැහැ. ඒ තරම් වටිනා මැණික් ගල් අපේ මහ පොළොවේ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් මැණික් කර්මාන්තයේ යෙදිලා තිබෙනවා. ඒ නිසා, දැනුත් ඒ කර්මාන්තයේ යෙදෙන්න පුළුවන් වුණොත් මම කරනවා. ලෝක ඉතිහාසයේ කවදාකවත් නැති ආකාරයට අද ජාත්‍යන්තරයේ මැණික් මිල ඉහළට ගිහිල්ලා තිබෙනවා. සමහර වෙලාවට අපේ මැණික් ගරන්න බැරි නිසා, licence එකක් ගන්න ප්‍රමාද වන නිසා කපලා ඔප දමා නැති rough ගල් පිට රටින් ගේනවා. ඒවාටත් බද්දක් අය කරනවා. ඒ නිසා මේ කර්මාන්තය මහත් අර්බුදයකට මුහුණ පාලා තිබෙනවා. එම නිසා මම මුදල් ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කළා, ඒ සම්බන්ධව සාකච්ඡා කරලා, පිට රටින් අපේ අය ගෙනෙන rough ගල්වලට සහනයක් හැටියට බද්දක් අය කරන්න එපා කියලා. එයින් විශාල සහනයක් ලැබේවි කියලා මම හිතනවා. අය වැය පොතේ 16වැනි පිටුවේ අංක 83 යටතේ සඳහන්ව තිබෙනවා, "කපා ඔප දමන මැණික් බද්දෙන් නිදහස් කරනවා" කියලා. කපා ඔප දමන මැණික් ගල් බද්දෙන් නිදහස් කරන්න ඕනෑ.

පසුගිය ගංවතුරට අපේ පළාතම විනාශ වුණා. ඒ වෙනුවෙන් ආධාර දුන්නා. ඒකේදීත් අපේ ප්‍රදේශවල සමහර අයට අසාධාරණකම් සිද්ධ වුණා. මම දන්න හැටියට ලක්ෂවලින් ගත්තොත්, රුපියල් ලක්ෂ 97,500ක් ආධාර දීලා තිබෙනවා. සමහර අයට ලක්ෂයක් දුන්නා. සමහර අයට ලක්ෂ 12ක් දුන්නා. සමහර අයට ලක්ෂ 4ක් දුන්නා, ඉඩමක් ගන්න. වතු අධිකාරය නිසා, වතු කොම්පැනිකාරයන්ගේ බලවත් අසාධාරණකම් නිසා පවුල් කිහිපයකට ඉඩම් ලබා දෙන්න තවමත් අපට බැරි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව කාරක සභා අවස්ථාවේ දී මා කථා කරන්න බලාපොරොත්තු වෙනවා. සමහර ග්‍රාම නිලධාරින්, ආර්ථික සංවර්ධන නිලධාරින් සහ අනෙකුත් සමහර රාජ්‍ය නිලධාරින් ඒ වෙලාවේදී හොඳට කටයුතු කළා. නමුත්, සමහර නිලධාරින් දේශපාලන බලපෑම් අනුව කටයුතු කළා. ගංවතුරට හසුවෙලා රුපියල් 10,000ක වත් ආධාර මුදලක් නොලබපු අයත් තව ඉන්නවා. අපි ඒ අයට කියලා තිබෙනවා, අභියාචනා කරන්න කියලා. ලොකු ගණනක් නොවෙයි; පවුල් හාරසියයක්, පන්සියයක්, දහසක් විතර ඉන්නවා. ඒ අයට මේ වනතෙක් කිසිම ආධාරයක් ලැබිලා නැහැ. මම මේ සම්බන්ධයෙන් ගරු අගමැතිතුමාට කිව්වා. එතුමා කිව්වා, අභියාචනා ඉදිරිපත් කරන්න කියලා. එම අහිංසක ජනතාවට ඒ මුදල ලැබෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම රත්නපුර නගරය සංවර්ධනය කරන්න; bypass එක ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)

පසුගිය කාලයේ ඉඩමක් වෙන් කරගෙන එහි වෛද්‍ය විද්‍යාලයක් හදනවා කිව්වත්, හැදුවේ නැහැ. අපේ ගරු තලතා අතුකෝරල ඇමතිතුමියත්, ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාත්, එවකට උසස් අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් සම්බන්ධ වෙලා, විගණන දෙපාර්තමේන්තුවෙන් හදලා තිබුණු කෝටි ගණනක ගොඩනැඟිල්ලක් මුදල් ගෙවලා අරගෙන, සබරගමුවේ වෛද්‍ය විද්‍යාලය අපි ආරම්භ කළා. ඒ ගැන අපි රජයටත්, අපේ ගරු ඇමතිතුමන්ලාටත් ස්තුතිවන්ත වෙනවා. අපි එම රෝහල ශික්ෂණ රෝහලක් කළා. ඒ වාගේම, අවුරුදු ගණනාවක් තිස්සේ කැඩිලා තිබුණු පාලම් ටික හදා ගත්තා; පාරවල් ටික හදා ගත්තා. තවත් පාරවල් රාශියක්ම හදන්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන වශයෙන්ම අපේ මැණික් කර්මාන්තය දියුණු කරගෙන, මාර්ග ටික දියුණු කර ගත්තොත්, රත්නපුර දිස්ත්‍රික්කය ලෝකයේ තිබෙන හොඳම, වටිනාම දිස්ත්‍රික්කවලින් එකක් බවටත්, හොඳ සල්ලිකාර දිස්ත්‍රික්කයක් බවටත් පත් කරගන්න පුළුවන් බව මම විශේෂයෙන්ම මතක් කර දෙන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාරක සභා අවස්ථාවේ දී අනෙකුත් දේවල් පිළිබඳව කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. නමුත් මේ කාරණය ගැනත් මා කියන්නම ඕනෑ. අපි ගංවතුර ගලන කාලයට විතරක් යම් යම් දේවල් දෙන්න සාකච්ඡා කරනවා. සමහර තැන්වල ඔරු, අඟුලක් නැහැ. එම නිසා ඒ ප්‍රදේශවල ජනතාව විශාල ලෙස අපහසුතාවට පත් වෙනවා. ඔරු, අඟුල් සියයක් අපි ඉල්ලා තිබෙනවා. රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ ඇමතිතුමාට කියලා, අඩු තරමින් ඊළඟ ගංවතුර එන්න ඉස්සෙල්ලාවත් මේ ඔරු, අඟුල් සියය ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

අපි සියලුදෙනාත් එක්කම සහයෝගයෙන් කටයුතු කරගෙන යනවා. අද වන විට රුවන්පුර අධිවේගී මාර්ගය හැදීගෙන එනවා. අතුරු පාරවල් සංවර්ධනය වෙලා තිබෙනවා. පාලම් හදලා තිබෙනවා. මේක අය වැයක් කියලා කිව්වාට, දේශපාලන අය වැයක් නොවෙයි; ඡන්ද අය වැයකුත් නොවෙයි. ඡන්දයෙන් කවුද දිනන්නේ, කවුද පරදින්නේ කියලා ජනතාව තීරණය කරයි. ඡන්දය කියන එක බලෙන් ගන්න බැහැ; චන්ඩිකමින් ගන්න බැහැ; මිනී මරලා ගන්න බැහැ. ඒවා කොපමණ කළත්, එහෙම දිනන්නත් බැහැ. ඕනෑම පුද්ගලයෙකුට මිනිසුන් ඡන්දය දෙන්නේ, කැමති නම් විතරයි. කසිප්පුකාරයන් ඉන්න පුළුවන්. මම නම් මගේ ගෙදරට කසිප්පුකාරයන්ට, ගංජාකාරයන්ට, කුඩුකාරයන්ට, සොරුන්ට එන්න එපා කියලා තිබෙනවා. පසුගිය කාලයේ මරණයකුත් සිදු වුණා. කසිප්පු ගැන පොලීසියට ඔත්තුවක් දුන්න ළමයෙකුට කසිප්පු මුදලාලි පිහියෙන් ඇන්නෙව්වා. ඕක තමයි දැන් රටේ තත්ත්වය. විශේෂ කාර්ය බලකාය මඟින් අල්ලන නිසා දැන් අපේ රටේ විශාල වශයෙන් ගංජා, කුඩු අඩු වෙනවා. රත්නපුරයේ පාසල් ළමුන් පවා, දැන් පෙත්තකට පුරුදුවෙලා තිබෙනවා. ඒ පාසල් ගැන කියන්න මම කැමැති නැහැ. ඒ පෙත්ත මොකක්ද කියලා මම දන්නේ නැහැ. ඒකත් නැති කරන්න අපි රාජ්‍ය ඇමතිතුමා එක්ක සාකච්ඡා කරමින් යනවා. විශේෂයෙන්ම කුඩු, කසිප්පු මේ රටින් නැති කරන්න ඕනෑ. ඊට අපේ සහයෝගය දෙනවා. ජනාධිපතිතුමා කියලා තිබුණා, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ, කුඩු ජාවාරම්කරුවෝ එල්ලනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. මේක අපේ ආණ්ඩු පක්ෂයේ තීරණයක්වත්, වෙන කාගේවත් තීරණයක් නොවෙයි. කුඩුකාරයන් එල්ලන්න ඕනෑය කියලා මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනාවොත්, මම තනි පුද්ගලයකු හැටියට තීරණයක් ගන්නවා, එයට පක්ෂව මට ඡන්ද දෙකක් දෙන්න පුළුවන් නම් දෙකම දෙනවා කියලා.

කියන්න කනගාටුයි, රත්නපුර දිස්ත්‍රික්කයේ කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරන කෙනෙකුගේ වටිනා දරුවෙක් -මම නම කියන්නේ නැහැ.- කුඩු පාවිච්චි කිරීමට ඇබ්බැහි වී සිටීම නිසා එල්ලිලා මැරුණා. මේ ගැන අවධානය යොමු කරලා දේශපාලනය ගැන බලන්නේ නැතිව සියලු දෙනාම එකතු වෙලා මේවා නැති කරන්න ඕනෑය කියලා ඉල්ලා සිටිනවා. මේ අවුරුදු තුනේදී කැබිනට් ඇමතිවරුන්ට කරන්න බැරි වුණු වැඩ ටික කළා. ඒ සම්බන්ධයෙන් අපේ ගරු අගමැතිතුමාටත්, මුදල් ඇමතිතුමාටත් මගේ ස්තුතිය, ගෞරවය පුද කරමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.28]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කීමත්, කිරීමත් අතර ලොකු වෙනසක් තිබෙනවා කියලා කියමනක් තිබෙනවා. එතැනින් තමයි මගේ කථාව මම පටන් ගන්න යන්නේ. ඒ මන්ද, මේ අය වැය විශ්ලේෂණය කරලා බලන කොට කසාද බැන්ද අයට එහෙම නැත්නම් තවත් ව්‍යාපාර පටන් ගන්න අයට, නොයෙකු අයට විශාල වශයෙන් ණය දෙනවා කියලා මුදල් ඇමතිතුමා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ණය ගිය අවුරුද්දේ අය වැයෙනුත් ලබා දුන්නා. හැබැයි, ගිය අවුරුද්දේ අය වැයෙන් "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ ණය කොච්චර ප්‍රමාණයක් ලබා දුන්නාද, ඒ ලබා දුන්නු අයගෙන් කොච්චර ප්‍රමාණයක් එය සාර්ථකව කරනවාද කියන එක ඉතාමත්ම ගැටලුවක්. ඒ මන්ද, මේ ණය ගන්න ගියාට පස්සේ කිසිම බැංකුවකින් සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියා පටිපාටියට බැහැරව ඒ බැංකු කළමනාකරුවෝ ණය නිකුත් කරන්නේ නැහැ. එහෙම තිබෙද්දී තමයි නැවත වතාවක් මේ අලුත බැඳපු ජෝඩුවලට, එහෙම නැත්නම් අලුතෙන් පටන් ගන්න අයට ණය දෙනවා කියන එක මේ අය වැයෙන් මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළේ. ඒක හොඳ වැඩක්.

අදහස හොඳයි. ඒකයි මම කිව්වේ, කීමත්, කෙරීමත් අතර ලොකු වෙනසක් තිබෙනවා කියලා. කොයි ආණ්ඩුව තිබුණත් රටක අය වැයක් ගෙනෙන්නේ රටේ සමස්ත ජනතාවගේ යහපත පිණිසයි; රටේ සමස්ත සංවර්ධනය උදෙසායි. හැබැයි, මේ වර්ෂය අවසාන වන විට, එහෙම නැත්නම් ලබන අවුරුද්ද වන කොට රටේ සංවර්ධනය මෙච්චර ප්‍රමාණයක ඉලක්කයක් කරා යනවා කියන එක මේ අය වැයේ කොහේද තිබෙන්නේ කියලා මට කියන්න. කෘෂි කර්මාන්තයෙන් අපි යන ඉලක්කය මොකක්ද, ධීවර කර්මාන්තයෙන් අපි යන ඉලක්කය මොකක්ද, අපේ ගව සම්පත ආරක්ෂා කරගනිමින් දියර කිරි කර්මාන්තය ඉලක්ක කරන්නේ කොහොමද, අපි පිට රටින් ගෙනෙන සියලුම දේ මේ රටේ වගා කරන්නේ කොහොමද, අපි ඒවා කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක ගැන මේ අය වැය ලේඛනය කියෙව්වාට මට නම් දැන ගන්නට ලැබුණේ නැහැ. ඒක නිසා තමයි මම කිව්වේ, අපට කියන්න පුළුවන්, කරන්න තමයි අමාරු කියලා.

විශේෂයෙන්ම මගේ දිස්ත්‍රික්කයේ සහෝදර මන්ත්‍රීතුමා; අපේ විජේතුංග මැතිතුමා කථා කරනවා මම අහගෙන සිටියා. එතුමා ඉතාමත්ම වැදගත් විධියට තමන්ගේ මැණික් කර්මාන්තය -දිස්ත්‍රික්කයේ තිබෙන කර්මාන්තය- පිළිබඳව අදහස් ප්‍රකාශ කළා. ඒක මම ඉතාමත් අගය කොට සලකනවා. මොකද එතුමාත්, මාත්, මගේ පියාත්, අපි ඔක්කෝම ඒ කර්මාන්තය කළා. දැන් මට ඒක කරන්න විධියක් නැහැ. මොකද මම දැන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් එහි කටයුතු කරන නිසා.

අපේ දිස්ත්‍රික්කය ධීවර කර්මාන්තය කරන ඒ වාගේම වී ගොවිතැන කරන සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් විශාල වන ගහනයකින් යුත් දිස්ත්‍රික්කයක්. අපේ දිස්ත්‍රික්කයේ ප්‍රධානම ප්‍රශ්නය තමයි, ගොවි ජනතාවට නිසි කලට වැස්ස නැති

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

වීම. අපේ දිස්ත්‍රික්කය තුළ විශාල වැව් ප්‍රමාණයක් තිබෙනවා. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සහ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වැව් තිබෙනවා.

අපේ දිස්ත්‍රික්කයේ තිබෙන මේ වැව් ටික ගොඩනඟලා දෙනවා නම්, ඒ ජනතාවට වී වගාව, ගොඩ භෝග වගාව, මිරිදිය ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමට හැකියාව ලැබෙනවා. ඒ තුළින්, ඒ ජනතාවට තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කරගෙන, තමන්ගේ දරුවන්, දෙමවුපියන් රැකගෙන ඒ පවුල් නඩත්තු කිරීමේ හැකියාව ලැබෙනවා. නමුත් මේ අයට ණය ගන්න අවස්ථාවක් නැහැ. මා හිතන හැටියට අපේ දිස්ත්‍රික්කයේ, සමස්ත නැඟෙනහිර පළාතේ, එහෙමත් නැත්නම් උතුරු නැඟෙනහිර ප්‍රදේශවල කිසි කෙනකුට - සියයට 1කට, 2කටවත්- මේ සඳහා අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. මොකද, අපේ දිස්ත්‍රික්කය තුළ සිටින ජනතාව අවුරුදු 30ක් තිස්සේ තිබූ යුද්ධයක කටුක අත් දැකීම් විඳි ජනතාවක් නිසා, තමන් අවුරුදු 30ක් තිස්සේ ජීවත් වූ ඉඩමට ඔප්පුවක් නැහැ; බල පත්‍රයක් නැහැ; මොනම ලියවිල්ලක්වත් නැහැ. හැබැයි දෙවන, තුන්වන පරම්පරාව ඉන්නවා; 1950 ගණන්වල පැමිණි උදවිය ඉන්නවා. සේරුවිල ප්‍රදේශයේ ඒ උදවියගේ ගම් බිම් ගත්තොත්, අද ඒවා වනජීවී කලාප ලෙස ගැසට් කර තිබෙනවා. ඒ බව ඒ මිනිස්සු දන්නේත් නැහැ. මෙවැනි මිනිසුන්ට මේ කියන ණය ක්‍රමය හීනයක්ම පමණයි. මේ හැම කෙනකුටම දක්ෂතා තිබෙනවා. කන්තලේ, මොරවැව ඇතුළු අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බහුතරයක් ප්‍රදේශවල වී නිෂ්පාදනය විශාල වශයෙන් සිදුවෙනවා. නමුත් ඒ නිෂ්පාදන ඒ වෙලාවේදීම වෙළෙන්දකුට කීයකට හෝ දීලා ඒ මිනිසුන්ගේ එදා වේල ගැට ගසා ගන්න තමයි සිද්ධවෙලා තිබෙන්නේ. ඒ අයට කර්මාන්තයක් කරන්න හැකියාවක් නැහැ. මොකද, ඒ අයට ණයක් ගන්න ක්‍රමයක් නැහැ; ඒ සඳහා හැකියාවක් නැහැ. ඒ ගොල්ලන්ට පෞද්ගලිකව කිසිම දේපොළක් නැහැ. ඒ නිසා බැංකුවකින්වත්, මොනම ආයතනයකින්වත් ණයක් ගන්න විධියක් නැහැ. ඒ නිසා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ඇතුළු උතුරු නැඟෙනහිර බහුතරයක් ජනතාව දවසේ ලෝන්, සතියේ ලෝන්, එහෙම නැත්නම් මාසයේ ලෝන් දෙන රකුසන්ට යටවෙලා ඉන්නවා. අපේ දිස්ත්‍රික්කයේ බොහෝ ගෙවල්වල දවාලට කවුරුවත් නැහැ. මොකද, ඒ අයට එම loan ගෙවා ගන්න බැරි වුණාම ඒ loan දුන්න ආයතනවල නියෝජිතයෝ ඇවිල්ලා ගෙවල්වල දොරවල්වලට තට්ටු කරනවා. එහෙම නැත්නම් ගෙදර ඉස්සරහ වාඩිවෙලා ඉන්නවා. ඒ නිසා දරුවන් පාසල්වලට දමා ගෙවල්වලට එන දෙමවුපියන්ගෙන් බහුතරයක් හැන්දෑ වනතුරු ගෙවල්වලට එන්නේ නැහැ. මොකද, සති loan ගෙවා ගන්න බැරි වුණොත්, ඒ ගොල්ලන්ගේ ගෙවල් ඇරලා තිබුණොත්, ණය දුන් ආයතනවල නියෝජිතයෝ ඇවිල්ලා ඒ ගෙවල්වල තිබෙන හිරමණය හෝ මොකක් හෝ අහුවන දෙයක් උස්සාගෙන යනවා. මුලින්ම මේවාට විසඳුම් ලබාදෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාගේ වර්තමාන ආණ්ඩුව පිහිටවපු දවසේ සිට අද දක්වා වූ කාලය තුළ මහා පරිමාණයේ ව්‍යාපාරිකයාගේ, මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයාගේ සහ කුඩා පරිමාණයේ ව්‍යාපාරිකයාගේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වැටී තිබෙනවා. මහා පරිමාණයේ ව්‍යාපාරිකයාත් ඉවරයි, මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයාත් ඉවරයි, ඒ වාගේම සුළු පරිමාණයේ ව්‍යාපාරිකයාත් ඉවරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක පමණ කාලයක් තිබෙනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බැංකුවකින් යම් ණය මුදලක් අරගෙනයි ඒ අය ඒ ව්‍යාපාර කරගෙන යන්නේ. නමුත් ඒ ගොල්ලන්ට අද ඒ ව්‍යාපාර කරගෙන යන්න විධියක් නැහැ. ඒ ව්‍යාපාර සියල්ලම අද වැටිලායි තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද CRIB එකට ගිහින් ඉන්නවා නම්, එහෙම නැත්නම් බැංකුවකින් ණයක් ගන්න බැරි පුද්ගලයන් ඉන්නවා නම්, මුලින්ම ඒ අයට ඒකෙන් ගොඩ වෙන්න ක්‍රමයක් සකස් කරන්නය කියා මා විශේෂයෙන්ම මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එහෙම කළොත් තමයි, මුදල් ඇමතිතුමාගේ මේ සිහින අය වැයේ ණය ක්‍රමයෙන් ඒ මිනිසුන්ට ගොඩ එන්න හැකියාවක් ලැබෙන්නේ. මේක තමයි තිත්ත ඇත්ත. මා මුලින් කිව්වා වාගේ කීමත්, කිරීමත් අතර ලොකු වෙනසක් තිබෙනවා. මේ වචන කිහිපයට හෝ ඇහුම් කන් දීලා, ගරු මුදල් ඇමතිතුමා ඇතුළු රජයේ වග කිව යුතු අය මේ ක්‍රමවේදය වෙනස් කරන්න කටයුතු කරාවි කියා අප හිතනවා. මේ රටේ සමස්ත ජනතාවට මේ ණය තුළින් තමන්ගේ ජීවිත යහපත්භාවයට, සාර්ථකභාවයට පත්කර ගන්නට අවස්ථාව සැලසේවා!යි කියා ප්‍රර්ථනා කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි භාගයක් හෝ වැඩිපුර ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිය පළ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.38]

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අය වැය පිළිබඳව බොහෝදෙනා නොයෙකුත් මත ඉදිරිපත් කරනවා. මම මුලින්ම ප්‍රකාශ කරන්න කැමැතියි, මේ අය වැය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ හොඳම අය වැයක් වශයෙන් හඳුන්වන්න පුළුවන් බව. මේ අය වැයට විරුද්ධව නොයෙකුත් මතවාද තිබුණාට, මෙය ඡන්දය ඉලක්ක කරගෙන ඉදිරිපත් කළ අය වැයක් නොවෙයි. මෙය ජනප්‍රිය අය වැයක් නොවෙන්න පුළුවන්. එක්සත් ජාතික පක්ෂය මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ ප්‍රධාන වශයෙන්ම රටේ ආර්ථිකය සහ මේ රටේ අනාගතය භාර ගන්නා දරුවන් වෙනුවෙනුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ දැවැන්ත ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම අපේ තරුණ තරුණියන් රැකියා බලාපොරොත්තු වෙනවා. මේ රට සංවර්ධනය කරන්න නම්, හැකියාවක් තිබෙන හැම දරුවකුම, විශ්වවිද්‍යාලයෙන් එළියට එන හැම දරුවකුම මේ ආර්ථිකයට සම්බන්ධ කර ගන්න ඕනෑ; ඔවුන්ට රැකියා අවස්ථා ලබා දෙන්න ඕනෑ. නමුත් ආණ්ඩුවේ රැකියා පමණක් ලබා දීමට උත්සාහ කරනවා නම්, දේශපාලන කෝණයෙන් පමණක් බලලා ඒ දරුවන්ට රැකියා අවස්ථා ලබා දෙන්න උත්සාහ කරනවා නම්; අවුරුදු ගණනාවක් මේ රට පාලනය කළ අනෙකුත් දේශපාලන පක්ෂ කළ දෙයම එක්සත් ජාතික පක්ෂයත් කරන්න උත්සාහ කරනවා නම් -දේශපාලනිකව එක්සත් ජාතික පක්ෂයට හොඳ අනාගතයක් තිබුණාට- මේ අය වැයෙන් බලාපොරොත්තු වන, රටේ අනාගතය සහ ආර්ථිකය

හදන සැලැස්ම සාර්ථක කර ගන්න බැරි වෙනවා. අපේ නායක, අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා බලාපොරොත්තු වන්නේ, නිදහස් වෙළෙඳ කලාප හදලා, අපේ තරුණ තරුණියන්ට ඒවායේ රැකියා ලබාදීලා ඒ තුළින් රටේ සංවර්ධනයට ඔවුන් දායක කරගන්නයි. ඒ වාගේම, ආසන මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්තශාලා හදලා රටේ ආර්ථිකය නඟා සිටුවීමට, සංවර්ධන කටයුතු කිරීමට තරුණ තරුණියන්ට පුහුණුව ලබා දීලා, ඒ අය ඒ සඳහා යොමු කරලා මේ රටේ අනාගතය හදන්නයි එතුමා අපේක්ෂා කරන්නේ. මම හිතන විධියට ඒක හොඳ දර්ශනයක්. අපේ මුදල් ඇමතිතුමා, ඒ දර්ශනය මේ රටේ ස්ථාපිත කරන්න මේ අය වැයෙන් යම්කිසි පියවර අරගෙන තිබෙනවා.

මම විශේෂයෙන්ම මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා මේ රටට "ජන සවිය" වැඩ පිළිවෙළ හඳුන්වා දුන්නා. එතුමා බලාපොරොත්තු වුණේ, අවුරුදු දෙකක් දුගී දුප්පත් ජනතාවට "ජන සවිය" ලබා දීලා, ඒ කාලය තුළ ඒ පවුල්වලට අවශ්‍ය රැකියා පුහුණුවක් සහ ශක්තිය ලබා දීලා, ඒ පවුල්වල ආර්ථිකය නඟා සිටුවීමයි. අද සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම අපට පෙනෙනවා, "ජන සවිය" නමින් තිබුණු එම වැඩසටහන "සමෘද්ධිය" ලෙසින් ක්‍රියාත්මක වන බව. "ජන සවිය" ලැබූ සියයට 83ක් පමණ පවුල් අවුරුදු 15ක් තිස්සේ දැන් සමෘද්ධිලාභීන් බවට පත්වෙලා තිබෙනවා. මේ සමෘද්ධිලාභීන්ගෙන් සියයට 30ක් පමණ වසර 20කට වැඩි කාලයක් සමෘද්ධිලාභීන් ලෙසම ඉඳලා තිබෙනවා. සමෘද්ධිය කියන වැඩ පිළිවෙළ සාර්ථකද, නැද්ද කියන එක ගැන අපට වෙන වෙලාවක කථා කරන්න පුළුවන්. ලක්ෂ 6ක පිරිසකට අලුතින් සමෘද්ධිය ලබාදීමට මේ අය වැය තුළින් යෝජනා කර තිබෙනවා. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා.

අපි දන්නවා, පසුගිය ආණ්ඩු කළ දේශපාලන පක්ෂ මේ රටේ දේශපාලනය කළේ සමෘද්ධිලාභීන් හරහා බව. අපි සමෘද්ධිය හරහා ඒ විධියට දේශපාලනය කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඇත්තටම ආර්ථිකය හදන්න අවශ්‍යයි නම්, මේ සමෘද්ධි සහනාධාරය අවශ්‍යම දුගී දුප්පත් පවුල්වලට ලබා දෙන්න ඕනෑය කියන කාරණයත් මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, brain drain ගැනත් මම යමක් කියන්න ඕනෑ. මම කුඩා කාලයේ ලංකාවේ ඉගෙන ගෙන පිට රට විශ්වවිද්‍යාලයකට ගියා. මමත් සමඟ ඒ විශ්වවිද්‍යාලවලට ගිය සම වයසේ යහළුවන් ඒ විශ්වවිද්‍යාලවලින් උපාධිය අරගෙන එළියට ඇවිත් නැවත වරක් ලංකාවට එන්න කල්පනා කළේ නැහැ.

කොහොම හරි ඒ රටේ රැකියාවක් සොයාගෙන, ඒ රටේ නිවසක් අරගෙන, ඒ රටේම පදිංචි වෙලා, වාහන අරගෙන ඉන්න තමයි උත්සාහ කරන්නේ. නැවත කවදාවත් ලංකාවට එන්න ඒ ගොල්ලන්ගේ අදහසක් නැහැ. මගේ සමකාලීන යාළුවන් දිහා බැලුවාම වැඩි පිරිසක් ඉන්නේ පිට රටවල. ඒ අය හොඳ රැකියා කරනවා, හොඳ ආයතනවල වැඩ කරනවා, හොඳ නිවාස ලබාගෙන තිබෙනවා, හොඳ වාහන ලබාගෙන තිබෙනවා. මට මතකයි, මම 1999දී විශ්වවිද්‍යාලයෙන් එළියට ඇවිල්ලා ලංකාවට එන්න අදහස් කරනකොට මගේ මව වන ශ්‍රීමා දිසානායක මැතිනිය මට කිව්වා, "පුතා, නරක නැද්ද තව අවුරුද්දක් දෙකක් ඔහේ වැඩ කර, අත් දැකීම් අරගෙන, MBA එකක් අරගෙන, ඊට පස්සේ ලැහැස්ති පිට ලංකාවට එන එක." කියා. නමුත් එදා, 1999 අග භාගය වන විට ජනාධිපතිවරණයක් ආවා. දේශපාලනය කරන්න අපේ ලේවල කැක්කුමක් තිබෙනවා. අපේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා ජනාධිපති අපේක්ෂකයා හැටියට ඉදිරිපත් වුණා. ඊට පස්සේ මගේ වැඩිමල් සහෝදරයා වන නවීන් දිසානායක මැතිතුමා නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් එක්සත් ජාතික පක්ෂයෙන් ප්‍රථම වරට ඉදිරිපත් වුණා. අපි ඉබේම එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ඒ මැතිවරණවලට සහාය ලබා දුන්නා. පාඩම් කරන්න මම කවදාවත් නැවත පිට රට ගියේ නැහැ. ලංකාවට ඇවිල්ලා දිගටම ලංකාවේ දේශපාලනය කරගෙන ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එදා දියුණු වෙමින් තිබුණු රටවල් දෙස බැලුවොත්, විශේෂයෙන්ම රුසියාව වාගේ රටවල් දෙස බැලුවොත්, ඒ රටේ දරුවන් ඇමෙරිකාව වාගේ රටවලට යවලා, යුරෝපා රටවලට යවලා අවශ්‍ය කරන දැනුම සහ තාක්ෂණය ලබා දීමෙන් රුසියාව තාක්ෂණය දියුණු කර ගත්තා. චීනය දිහා බැලුවොත්, චීනයේ දරුවෝ ඇමෙරිකාවේ සහ යුරෝපයේ හොඳ විශ්වවිද්‍යාලවලට යවලා ඒ දරුවන්ට අවශ්‍ය කරන දැනුම සහ තාක්ෂණය ලබා දුන්නා. විශේෂයෙන්ම මැද පෙරදිග රටවල තරුණ කුමාරවරු ඇමෙරිකාවේ තිබෙන හොඳම විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගෙන, තාක්ෂණික දැනුම ලබාගෙන, පරිපාලනය ඉගෙන ගෙන, නැවත වරක් ඔවුන්ගේ රටවලට ගිහිල්ලා තමයි ඒ රටවල් දියුණු කළේ. අපේ මුදල් ඇමතිතුමාත් එවැනිම යෝජනාවක් මෙවර අය වැයෙන් ඉදිරිපත් කර තිබෙනවා. ලංකාවේ සිටින දක්ෂ තරුණ තරුණියන් පිට රටවලට යවන්න අවශ්‍ය කරන සම්පත් ඒ අයට ලබා දීලා, ඒ විශ්වවිද්‍යාලවලට ගිහින් අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා ගත්තාට පස්සේ අනිවාර්යයෙන්ම නැවත වරක් ලංකාවට ඇවිල්ලා අවුරුදු 10ක් වැඩ කරන්න ඕනෑ කියා කොන්දේසියක් දමා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක හොඳ යෝජනාවක්. මේ යෝජනාව මීට අවුරුදු 10කට, 15කට කලින් කළා නම්, එවකට හිටපු නායකයන්ට මේ අදහස තිබුණා නම්, මේ වෙනකොට ඒ තරුණ තරුණියන් එම විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාගෙන ලංකාවට ඇවිල්ලා සිටියා නම්, අද වන විට ඒ දැනුම ලංකාවට ලබා දෙන්න තිබුණාය කියන එක මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

"ගම් පෙරළිය" වැඩසටහන සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 300ක් ලබා දෙනවා. අපේ දිස්ත්‍රික්කවලින්, අපේ ආසනවලින් අපි යෝජනා ලබා ගන්නවා. එක්සත් ජාතික පාක්ෂිකයන්ගෙන් පමණක් අපට බොහොම ලෙහෙසියෙන් ඒ යෝජනා ලබා ගන්න පුළුවන්. නමුත්, අපි එහෙම කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දේශපාලන කෝණයකින් බලන්නේ නැතුව තමයි ගමට අවශ්‍ය කරන දේ හඳුනාගෙන, ගමේ ජනතාව සමිතියක් හැටියට එකතු කර, ගම්වල තිබෙන අවශ්‍යතා මොනවාද -පාරද, විදුලිබලයද- කියා අවශ්‍ය යටිතල පහසුකම් හඳුනාගෙන අපි ඒවා ලබා දෙනවා. මීට ඉස්සෙල්ලා වුණේ එහෙම නොවෙයි. "අර තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ ගම්මානයක්, එම නිසා අපි ඒ ගම්මානයේ පාරවල් හදන්න අවශ්‍ය නැහැ. අර තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ ජනතාව සිටින ගම්මානයක්, නගරයක්, එම නිසා විදුලිබලය ලබා දෙන්න අවශ්‍ය නැහැ, වතුර ටික ලබා දෙන්න අවශ්‍ය නැහැ." කියා තනිකරම දේශපාලන කෝණයකින් බලා තමයි අවශ්‍ය කරන යටිතල පහසුකම් ලබා දුන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කය දෙස බැලුවාම, 2015දී මැතිවරණයට එන්න ඉස්සෙල්ලා මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවට පොරොන්දුවක් දුන්නා, අනිවාර්යයෙන්ම අපි නුවර-කොළඹ අධිවේගී මාර්ගය හදනවා කියා. අපේ දිස්ත්‍රික් නායක සහ රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍ය ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් ප්‍රධානත්වයෙන් මුල් ගල තියලා නුවර-කොළඹ අධිවේගී මාර්ගය සෑදීම ආරම්භ කළා.

මීට සති දෙක තුනකට කලින් අස්ගිරි-මල්වතු අනුනායක හාමුදුරුවන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙන්, ජනමාධ්‍යයත්

[ගරු මයන්ත දිසානායක මහතා]

ගෙන්වා අපි ජනතාවට පෙන්වූවා මේ අවුරුදු තුන හමාර, හතර ඇතුළත නුවර - කොළඹ අධිවේගී මාර්ගයේ සාර්ථකත්වය. මගේ පියා 1994 ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ අවස්ථාවේදී ප්‍රකාශ කළා, අනිවාර්යයෙන්ම නුවර - කොළඹ අධිවේගී මාර්ගයක් අපි හදන්න ඕනෑය කියා. මේ රටේ සංවර්ධනය ඇති වන්නේ ඒ වාගේ අධිවේගී මාර්ග හැදුවොත් පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැය හරහා නිදහස් වෙළෙඳ කලාප ඇති කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම තරුණ තරුණියන්ට ඒ කර්මාන්තශාලාවල වැඩ කරන්න අවස්ථාව ලබා දෙන්නත්, අධ්‍යාපනය ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වනවා. අපේ ආණ්ඩුව බලයට එනකොට විපක්ෂයෙන් කිව්ව දෙයක් තමයි, කවදාවත් මේ දේවල් කරන්න බැහැ, මේවා සිහින පමණයි කියා. නමුත්, එක්සත් ජාතික පක්ෂය මේ රටේ නායකත්වය භාර ගෙන අවුරුදු හතරක් ගත වුණාට පස්සේ -විශේෂයෙන් මේ සුළු කාලය තුළ- ඩොලරයේ අගය දෙස බැලුවාම, රටට එන විදේශ ආයෝජන දෙස බැලුවාම අපට කියන්න පුළුවන්, ඉතා පැහැදිලිව ඍජු නායකත්වයක් තිබෙනවා නම්, මේ රට සාර්ථකව දියුණු කරන්න පුළුවන්ය කියන එක. එයත් සඳහන් කරමින්, මගේ ඉතිරි කාලය ගරු තිලකරාජා මන්ත්‍රීතුමාට ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, විශේෂයෙන් අපේ මංගල සමරවීර ඇමතිතුමා, රාජ්‍ය ඇමතිතුමා ඇතුළු ඒ අමාත්‍යාංශයේ සියලුම නිලධාරින්ටත් මගේ ස්තුතිය හා ප්‍රණාමය පුද කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් මගේ ස්තුතිය හා ප්‍රණාමය මා පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. තෙරුවන් සරණයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මී ළඟට, ගරු ටී.බී. ඒකනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක පමණ කාලයක් තිබෙනවා.

[අ.භා. 4.50]

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, රටක අය වැය ඉදිරිපත් කළාම අපි දකින්නේ ඒ රජයේ වැඩ පිළිවෙළ සහ දැක්ම පිළිබඳ කාරණයයි. ඕනෑම අය වැයක ආර්ථික දේහය තමයි, මේ ගණන් හිලව් එකතුවත් සමඟ විවිධ මට්ටමින් රට තුළ මතුවන්නේ. මෙවර අය වැය ලේඛනය දිහා බැලුවාම අපට දැක්මක් පෙනෙන්නේ නැහැ. එක්කෝ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ වෙන්න ඕනෑ, එහෙම නැත්නම් කර්මාන්ත ක්ෂේත්‍රයේ වෙන්න ඕනෑ, එහෙම නැත්නම් නිෂ්පාදන ක්‍රියාවලිය නංවා රට නිෂ්පාදිත ප්‍රවේශයකට ගොඩ නැඟෙන ඉලක්කගත වැඩ පිළිවෙළක් බවට අය වැය පත්වන්න ඕනෑ. එහෙම දැක්මක් රට හමුවේ තබා තිබෙනවාය කියන එක අපට මේ අය වැයේදී පෙනෙන්නේ නැහැ.

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය පැවැති පසුගිය කාලය තුළ අර්බුද රාශියකට අපි මුහුණ දුන්නා. විශේෂයෙන් උතුරු නැඟෙනහිර ත්‍රස්තවාදී අර්බුදය, ඛනිජ තෙල් අර්බුදය, ලෝක ආහාර අර්බුදය, ලෝක මූල්‍ය ප්‍රසාරණය පිළිබඳ අර්බුදය, රාජ්‍ය ණය අර්බුදය කියන මේ සියල්ල හමුවේ දැක්මක් ඇති වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර යෝජනා මාලාවන් රාශියක් ක්‍රියාත්මක කරන්න අපට පුළුවන් වුණා. එහිදී ආරම්භ කළ ව්‍යාපෘති කිහිපයක් ගැන මම සඳහන් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හම්බන්තොට මාගම්පුර වරාය ඇමෙරිකානු ඩොලර් මිලියන 1,400යි, නොරොච්චෝලේ තාප බලාගාරය ඇමෙරිකානු ඩොලර් මිලියන 900යි, කොළඹ - ගාල්ල අධිවේගී මාර්ගය ඇමෙරිකානු ඩොලර් මිලියන 740යි, උතුරු නැඟෙනහිර මාර්ග සංවර්ධනය ඇමෙරිකානු ඩොලර් මිලියන 700යි, ශ්‍රීලන්කන් ගුවන් සේවය ඇමෙරිකානු ඩොලර් මිලියන 393යි, මත්තල ගුවන් තොටුපොළ ඇමෙරිකානු ඩොලර් මිලියන 240යි, ගාල්ල - මාතර අධිවේගී මාර්ගයට ඇමෙරිකානු ඩොලර් මිලියන 152යි, අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ඇමෙරිකානු ඩොලර් මිලියන 146යි, මිහින්ලංකා ගුවන් සේවය ඇමෙරිකානු ඩොලර් මිලියන115යි, නෙළුම් කුලුන ඇමෙරිකානු ඩොලර් මිලියන 77යි, හම්බන්තොට සම්මන්ත්‍රණශාලාව ඇමෙරිකානු ඩොලර් මිලියන 30යි, සූරියවැව - කැකුනගොල්ල කලාපයට ඇමෙරිකානු ඩොලර් මිලියන 03යි.

මේ අනුව ව්‍යාපෘති සඳහා රජයේ මුළු වියදම ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 4,896ක් ඒ කාලයේ පැවැති අර්බුද හමුවේ පවා අපි වියදම් කර තිබෙනවා. දැන් හැම තිස්සේම එක්සත් ජාතික පක්ෂය කියන දෙයක් තමයි, "මහින්ද රාජපක්ෂ ණය කන්දරාව" කියන එක. 2014 වර්ෂය වන විට රජයේ ණය ප්‍රමාණය ට්‍රිලියන 7යි. ඉන් පසු අවුරුදු ගණනාව තුළ එය වැඩි වී තිබෙනවා, ට්‍රිලියන 5කින්. එනම්, බිලියන 5,000කින්. එවිට එකතුව ට්‍රිලියන 12ට ආසන්නව තිබුණා. මේ අනුව බැලුවාම පෙනෙනවා, මහින්ද රාජපක්ෂ වසර 12ක් මුළුල්ලේ ගත් ණය ප්‍රමාණය මේ වසර තුන තුළ මේ රජය ගෙන තිබෙන බව. නමුත් ඒ ණය අරගෙන ක්‍රියාත්මක කරපු වැඩසටහන්, යෝජනාවලි පිළිබඳව මේ රටේ ජනතාවට මේ රටේ බුද්ධිමතුන්, විද්වතුන් නිරන්තරයෙන් කතා කරන අවස්ථාවලදී කියා සිටින බවක් පෙනෙන්නට නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මංගල සමරවීර ඇමතිතුමා ඉදිරිපත් කරපු අය වැය යෝජනාවලිය ගැන එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විධියට කොච්චර උනන්දුවක් තිබෙනවාද කියා කිව්වොත්, පාර්ලිමේන්තුව නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් එක්කෙනකු පමණයි දැන් පාර්ලිමේන්තු සභා ගර්භය තුළ මේ අවස්ථාවේදී ඉන්නේ. එක්සත් ජාතික පක්ෂය එච්චරටම උනන්දුයි, තමන් විසින් ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනය ගැන. අප ආණ්ඩුව නියෝජනය කරපු කාලවලදී අය වැය පිළිබඳව ගුණ අගුණ දෙකම ගැන කතා කරමින් ඒවායෙහි ආර්ථික දැක්ම පිළිබඳව නිරන්තරයෙන් පෙනී සිටීමට අපට පුළුවන්කම ලැබුණා. ඒක තමයි වැදගත්ම සාධකය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධන ක්‍රියාවලිය ගැන විවිධ කෝණයන්ගෙන් සාකච්ඡා කළ යුතු වෙනවා. සංවර්ධන ක්‍රියාවලිය ගැන කතා කරද්දී එක්සත් ජාතික පක්ෂය පසුගිය කාලයේ නිරන්තරයෙන් කියපු දෙයක් තමයි මේ රට තුළ රැකියා ලක්ෂ 10ක් ලබා දෙන්න කටයුතු කරනවා කියන එක. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "මාස 60කින් අලුත් රටක් හදන පංච විධ ක්‍රියාවලිය" අනුව -පාර්ලිමේන්තු මැතිවරණයට පෙරාතුව එක්සත් ජාතික පක්ෂය ජනතාව සමඟ ඇති කරගෙන ඇති සම්මුතිය අනුව,- සඳහන් කළා, රැකියා දසලක්ෂයක් බිහි කිරීම අරමුණු කොට ගෙන අපනයන වෙළෙඳ පොළ පුළුල් කිරීම ඇතුළු කාරණා ගණනාවක් ක්‍රියාත්මක කරන්න අප කැමැතියි කියා. නමුත් අපි දන්නවා, පාර්ලිමේන්තුවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් වැඩි දෙනෙක් අප හමු වුණාම කියන දේ. එතුමන්ලා කියන්නේ, "රැකියා ලබා දීමේ ක්‍රමවේදයක් අපට නැහැ. අපේ කාර්යාල දවසේ අපව හමු වෙන්න

එන අයට කියන්න දෙයක් අපට නැහැ" කියායි. එතුමන්ලා සමඟ කරන සාකච්ඡාවලදී, මේ ගැන නිරන්තරයෙන් ප්‍රකාශ වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2019" තුළ ආර්ථික වර්ධන වේගය පිළිබඳව වාර්තා වෙනවා. එම වාර්තාවට අනුව පෙනෙනවා, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් මුහුණ දුන් අභියෝග මධ්‍යයේ 2018 වසරේ සියයට 3.3ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරන බව. එය ඉතා අඩු වර්ධන වේගයක් ලෙසයි සඳහන් කරන්න වන්නේ.

ඒ වාර්තාවේම සඳහන් වන තවත් කාරණයක් තිබෙනවා, 2017 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී කෘෂිකාර්මික අංශයේ සියයට 3.5ක පසු බෑමක් ගැන. ඒ බව "රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2019" තුළ පැහැදිලි කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ගෙන්වා ගත්තා, "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ විවිධ බැංකුවලින් ලබා දී ඇති ණය ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු. ඒ අනුව පෙනෙනවා, වැඩියෙන්ම ලබා දී තිබෙන්නේ, නිවාස සඳහා වන ලක්ෂ හතරේ ණය බව.

ව්‍යාපාර ආරම්භ කරපු ඒවාට ලැබිලා තිබෙන ප්‍රමුඛත්වය අඩුයි. ඒ වාගේම ඉල්ලා තිබෙන ණය ප්‍රමාණයට වඩා හුඟක් අඩුවෙන් ලබා දී තිබෙන බව තමයි මේ ලබා දී තිබෙන මූල්‍ය වාර්තාවට අනුව සඳහන් වන්නේ. තමන්ගේ අනන්‍යතාව මත ණය ලබා දීමේදී, කවුරු මොනවා කිව්වත්, මොන වාර්තාව ඉදිරිපත් කළත් ණය ඉල්ලුම්කරුගේ ස්වභාවය අනුව තමයි ණය නිකුත් කරන්නේ. ඒ නිසා හුඟක් අවස්ථාවලදී මේ ඉලක්ක ජය ගන්න පුළුවන්කමක් ලැබිලා නැති බව මම විශේෂයෙන් කියන්න කැමැතියි. රජයේ නොගෙවූ ණය ප්‍රමාණය ඇතුළත් ලේඛනය සහ අනෙකුත් වාර්තා මම මේ අවස්ථාවේදී **සභාගත*** කරන්න කැමතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාර්තාව බැලුවාම මේ පිළිබඳව කටයුතු කාරණා ක්‍රියාත්මක කරන්න පුළුවන් වේවි.

මේ අය වැයේදී විවිධ යෝජනා රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා. පසුගිය දවස්වල ගරු විපක්ෂ නායකතුමා -මහින්ද රාජපක්ෂ මැතිතුමා,- කලා ක්ෂේත්‍රය පිළිබඳ කාරණා ගණනාවක් සම්බන්ධයෙන් ඉල්ලීමක් කළා. එදා ඒ විෂයය භාර ඇමතිතුමා කිව්වා, "ඉදිරියේදී ඒකට උත්තර දෙන්නම්" කියලා. නමුත් තවමත් ඒකට උත්තරයක් ලබා දුන්නේ නැහැ. ජෝන් ද සිල්වා සමරු රඟහල ඉතාම නවීන පහසුකම් සහිතව තට්ටු තුනකින් ඉදිකිරීමේ කටයුතු අපි ආරම්භ කළා. අද ඒකේ වැඩ නැවතිලා තිබෙනවා. නමුත් මෙවර අය වැය ලේඛනයේදී ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරනවා, "ජෝන් ද සිල්වා රඟහලේ නවීන උපකරණ සවිකිරීමත් සමඟ සියලු අලුත්වැඩියා කටයුතු 2020දී අවසන් කරනවා"ය කියලා. වෙන් කරපු මුදලක් නැහැ; වැය ශීර්ෂයක් නැහැ; නමුත් සියලු අලුත්වැඩියා කටයුතු 2020දී අවසන් කරනවා කියලා තිබෙනවා. හැබැයි, මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න නම් අය වැයෙන් මුදලක් වෙන් වෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2020දී නවීන උපකරණ සහිතව මේ ජෝන් ද සිල්වා රඟහල විවෘත කරනවාය කියලා අදහසක් විතරයි තිබෙන්නේ. "නව අංශයකින් සමන්විත වන පරිදි ජාතික කලා භවන නවීකරණය කිරීමට කටයුතු කරනවා"ය කියලා තවදුරටත් එහි සඳහන් වනවා. එච්චරයි තිබෙන්නේ. ඒ වෙනුවෙන් මුදලක්, යෝජනාවලියක්, ඇස්තමේන්තුවක් කිසිවක් නැහැ.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම සංස්කෘතික හා කලා කටයුතු ඇමතිවරයා හැටියට හිටපු මොහොතේ මුල්ගල් තියලා, ජාතික කලා භවනත්, ජෝන් ද සිල්වා සමරු රඟහලත් ආරම්භ කරලා එහි වැඩ බොහොමයක් මේ වනකොට අවසන් කරලා තිබෙන බව මම කියන්න කැමැතියි. හැබැයි, මේ වනකොට ඒ කොන්ත්‍රාත්කරුවාටවත් සල්ලි ගෙවලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කොන්ත්‍රාත්කරුට රුපියල් මිලියන ගණනක් ගෙවන්න තිබෙනවා. අලුතින් මුදල් යොදනවා තියා කරපු වැඩවලටවත් තවම ඔවුන්ට මුදල් ගෙවා ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒක තමයි දැක්ම.

විශේෂයෙන් "කලාව, සංස්කෘතිය සහ ආගම" කියන අය වැය ලේඛනයේ ශීර්ෂය ගත්තාම, "මේ කටයුතු කරනවා" කියලා ඒ ශීර්ෂය යටතේ කියනවා මිසක්, ඒ වෙනුවෙන් වෙන් වෙච්ච මුදලක් ගැන සඳහන් කරලා නැහැ.

මෙවර අය වැය තුළින් තවත් ලක්ෂ හයකට සමෘද්ධි දීමනාව ලබා දෙනවාය කියලා කියනවා. සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කළේ දිළිඳුකම පිටුදැකීමක් විධියට ඔවුන් සවිබල ගන්වන්නයි. ඔවුන්ට අත දීමක් වශයෙන් ණය දීලා, ව්‍යාපෘති ආරම්භ කරලා, කුඩා කණ්ඩායම් හදලා, ඒ කුඩා කණ්ඩායම්වලින් ඔවුන් ශක්තිමත් වෙලා ආදායම් තත්ත්වය වැඩි වුණාම ඔහුගෙන් සමෘද්ධි ආධාර ඉවත් වෙනවා. එතකොට ඔහු සවිබල ගැන්වුණු කොටස්කරුවෙකු විධියට තමයි එතැනින් ඉවත් වෙන්නේ. එතකොට මේ මුදල ආපසු බැංකුවට යනවා. නමුත් එක්සත් ජාතික පක්ෂය විසින් ඉදිරිපත් කරපු අය වැය යෝජනාවෙන් කියන්නේ, අලුතින් ආපසු ලක්ෂ හයකට සමෘද්ධි දීමනාව ලබා දෙනවාය කියලායි. ඒකෙන් කියන්නේ, ආපසු දුප්පත්කම වැඩිවෙලා තිබෙනවාය කියන එකයි. සමෘද්ධි දීමනාව ලබා දෙන්නේ යමක් කමක් තිබෙන අයට නොවෙයිනේ. සමෘද්ධි දීමනාව ලබා දෙන්නේ අඩු ආදායම්ලාභීන්ට ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරලා, ඔහු ශක්තිමත් කිරීමේ යෝජනාවක් විධියටයි. "ලක්ෂ හයකට සමෘද්ධි දීමනාව ලබා දීම සුදුසු බවට සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මහ බැංකුවට කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකෙන් හැඟවෙන සරල කාරණය තමයි, දැන් ලක්ෂ හයක් දක්වා අලුතින් අඩු ආදායම්ලාභීන් මතු වෙලා තිබෙනවාය කියන එක, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා මේ කාරණයේ දෙපැත්තක් තිබෙනවා. එක් කාරණයක් තමයි, සමෘද්ධිය ගැන එක්සත් ජාතික පක්ෂය නිරන්තරයෙන් දකින්නේ දේශපාලන වැඩ පිළිවෙළක් විධියටයි. ඇත්ත වශයෙන්ම ගමේ කණ්ඩායම් ගොඩ නඟලා, ඒ අයගේ තොරතුරු වාර්තා කරගෙන, ප්‍රාදේශීය ලේකම් හා සමෘද්ධි කළමනාකරු මැදිහත්වෙලා, සමෘද්ධි බැංකුවේ අනුසාරයෙන් තමයි මේ අඩු ආදායම්ලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නේ. අදත් මේ සම්බන්ධයෙන් විවිධ දේශපාලන මතයන් දරන අය ඉන්නවා.

ඒ නිසා මේක යළිත් එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායමට සන්තෝසම් ලබා දීම සඳහා, ඒ අයට යම්කිසි ආධාරයක් ලබා දීම සඳහා, ඒ අය සමඟ හිතවත්කමක්, මිත්‍රශීලීකමක් ගොඩනඟා ගැනීම සඳහා ක්‍රියාත්මක කරනවාදෝ කියන අදහස සමෘද්ධි කළමනාකරුවන් තුළත්, ඒ වාගේම මේ ක්ෂේත්‍රයේ ඉන්නා අය තුළත් ඇති වී තිබෙනවා.

විශේෂයෙන්ම රටේ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව මේ යෝජනාවලියේ කිසිවක් සඳහන් වන්නේ නැහැ. මෙම අය වැය ලේඛනය තුළ අපේ රටේ තිබෙන මහ පරිමාණ නිෂ්පාදන ස්ථාන ගණනාවක් ගැන කථා වෙන්නේ නැහැ. කන්තලේ සීනි ෆැක්ටරිය අවුරුදු ගණනාවක් තිස්සේ වසා දමා තිබෙනවා. එහි අක්කර 28,000ක භූමි ප්‍රමාණයක් තිබෙනවා. කන්තලේ වැවට

[ගරු ටී. බී. ඒකනායක මහතා]

මොරගහකන්දෙන් වතුර හම්බ වෙනවා. මොරගහකන්දෙන් වතුර හම්බ වුණාම, අක්කර 28,000ක භූමි ප්‍රමාණය තුළ සෘජුව වගා කරලා උක් කර්මාන්තයෙන් සීනි නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒ වාගේම ඊතයිල්, මීතයිල් සඳහා වැය වන විදේශ විනිමයත් ඉතුරු වෙනවා. නමුත් අද වෙනකම් එම භූමි ප්‍රමාණයට අත තබා නැහැ. ඒ වාගේම අද අපේ රටේ කාර්යාලවල අපතේ යන කඩදාසි එකතු කරලා ඉන්දියාවට යවනවා. ආපසු ලංකාවට කඩදාසි විධියට එන්නේ එසේ යවන ඒවා තමයි. ඒ තත්ත්වයට අපි බංකොලොත් වෙලා තිබෙනවා. ඒ සඳහා අපිට වැඩ පිළිවෙළක්, ක්‍රමවේදයක් නැහැ. වාලච්චේන කඩදාසි කර්මාන්ත ශාලාව වසා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම පරන්තන්හි පිහිටි රසායනික කර්මාන්ත ශාලාව, ඒ වාගේම ගොවිපොළවල් රාශියක් සම්බන්ධයෙන් මේ අය වැය තුළින් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා නැහැ. ඒවා සම්බන්ධවෙන් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමත් එක්ක තමයි රටේ ආදායම් වැඩි කරගන්න පුළුවන් වෙන්නේ. නමුත් එහෙම ආදායම් වැඩි කරන කිසිම යෝජනාවලියක් මේ අය වැය ලේඛනය තුළ නැහැ. ඒ නිසා අපි මුදල් අමාත්‍යතුමාට කියන්න කැමැතියි, අප්‍රේල් පස්වැනි දා දක්වා විවාද වෙන මේ අය වැය විවාදය තුළදී විශේෂයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් මේ රටේ නිෂ්පාදන තත්ත්වය නංවාලීමට, රටේ ආදායම වැඩි කිරීමට, රටේ පුද්ගලයන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීමට ඉදිරිපත් කරන යෝජනා පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දොළහක පමණ කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 5.06]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ඉදිරිපත් කරපු දවසේ මම තීන්දු කළා, මේ අය වැය විවාදයට මම සහභාගි වෙනකොට, මේ තුළ තිබෙන හොඳ කාරණා සහ නරක කාරණා කියන දෙක පිළිබඳවම අධ්‍යයනයක් කරලා කථා කරන්නට ඕනෑය කියලා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මේ අය වැය අධ්‍යයනය කළොත් හරියටම පෙනෙනවා, මේක "අය" නැති අය වැයක් කියන කාරණය. මේක වැය විතරක් තිබෙන අය වැයක්. මේකේ අය වෙනුවට තිබෙන්නේ ණය. ඒ නිසා මේ අය වැය ඇත්තටම, "ණය වැය" අය වැයක්. අයක් නැහැ. ඒ නිසා මේක අය නැති අය වැයක්. ඒ කියන්නේ ආදායම් නැහැ. ආදායම් පියවන්නේ ණය අරගෙන. ගත්ත ණය ගෙවන්නේත් ණය අරගෙන. ගත්ත ණයවල වාරික ගෙවන්නේත් ණය අරගෙන. ඒ නිසා මේක ඓතිහාසික අය වැයක් වෙනවා. මොකද, මේක අය නැති අය වැයක්. ඇත්තටම යථාර්ථවාදීව බැලුවොත්, මේක ණය වැයක් පමණයි. මම කල්පනා කළා, ණය වැය තුළ වුවත් යම් යම් හොඳ දේවල් තිබෙනවාද කියලා බලන්න.

පසුගිය මාස ගණනාවක් මුළුල්ලේ සිට අපේ රටේ මුදලේ අගය බාල්දු වෙන බව අපි දන්නවා. මුදලේ අගය පහළ වැටීමත් සමඟම, මේ රටේ සිටින සියලු ආර්ථික විශේෂඥයින් කියන්න ගත්තා, දැන්වත් අපේ ආනයන වියදම අඩු කරලා අපේ අපනයන ආදායම වැඩි කර ගැනීම සඳහා අපනයන ක්ෂේත්‍රය දිරි ගන්වන්න කියලා. හැබැයි, මේ ණය වැය දිහා බැලුවාම පැහැදිලිව පෙනෙනවා, අපේ අපනයන ආදායම වාගේ දෙගුණයක් අපේ ආනයන වියදම තිබෙන බව.

ඒ නිසා දිගින් දිගටම රුපියලේ අගය පහළ යනවා විනා, අපනයන දිරිගැන්වීමක් නැහැ. අනෙක් පැත්තෙන් කෘෂි කර්මාන්තය. අපේ රට කෘෂි කර්මාන්තයෙන් ජීවත් වන රටක්. මම නියෝජනය කරන්නේ, කෘෂි කර්මාන්තය සහ වැවිලි කර්මාන්තය පදනම් කරගත් ජනතාවක් ජීවත්වන දිස්ත්‍රික්කයක්. මහින්ද රාජපක්ෂ අපේ විපක්ෂ නායකතුමාට පින්සිද්ධ වෙන්න ඕනෑ. එතුමාගේ දින 52ක ආණ්ඩුව කාලයේ එතුමා අග්‍රාමාත්‍යවරයා සහ මුදල් ඇමතිවරයා ලෙස මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේත් ආශිර්වාදය ඇතිව කෘෂි කර්මාන්තයට සහ කර්මාන්ත ක්ෂේත්‍රයට දුන්නු සහනවත් මේ ණය වැයේ නැහැ. අදත් මේ රටේ ගොවියා - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගොවියා වේවා, එක්සත් ජාතික පක්ෂයේ ගොවියා වේවා, පොදුජන පෙරමුණේ ගොවියා වේවා, සිංහල හෝ දෙමළ හෝ මුස්ලිම් හෝ ගොවියෝ වේවා,- නැවත පොහොර සහනාධාරය යම් ප්‍රමාණයකට භුක්ති විඳින්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, ඒ දින 52 ආණ්ඩුව තුළ හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිවරයා ලෙසත් දුන්නු ඒ පොහොර සහනාධාරය හරහාමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය යැයි කියා ගන්නා ලේඛනය දිහා මම කොයි විධියට බැලුවත්, මෙහි ආදායම හොයා ගන්නත් බැහැ. අනෙක් පැත්තෙන් කෘෂිකර්මාන්ත හා කර්මාන්ත ක්ෂේත්‍රය විතරක් නොවෙයි. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට පවා මෙයින් සහන ලබා දීලා නැහැ.

මටපසුව කථා කරන්න ඉන්නවා අපේ වැවිලි ක්ෂේත්‍රය නියෝජනය කරන ගරු තිලකරාජා මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, දින 52 ආණ්ඩු කාලය තුළ ඔබතුමන්ලා අපි කෙරෙහි විශ්වාසය නොතැබුවාට වතුකරයේ කම්කරුවන්ගේ පඩිය රුපියල් 900 දක්වා ගෙන එන්න අවශ්‍ය කරන සාකච්ඡා සාර්ථක වෙමින් පැවතුණා. ඒ ගැන වතුකරයේ වෘත්තීය සමිති නායකයින්ගෙන් අහන්න. ඒ සකාච්ඡා හරහා වතු කම්කරුවන්ගේ පඩිය රුපියල් 900 දක්වා වැඩි කරන්න අවශ්‍ය කරන සාකච්ඡා ඉතාම සාර්ථක මට්ටමේ පැවතුණා. ඔබතුමා නොවෙයි, නමුත් ආණ්ඩුවට සම්බන්ධ ඇමතිකම පමණක් ආරක්ෂා කර ගන්න කෑ ගහන වතුකරයේ නායකයෙක් කිව්වා, " 900 නොවෙයි. 1,000ක් දෙනවා. ඒ නිසා රනිල් වික්‍රමසිංහ මහත්තයාට අපේ විශ්වාසය පළ කරනවා කියලා අත්සන් කරන්න" කියලා. අත්සන් කළා. අද, දින 52 ආණ්ඩුව වතු කම්කරුවන්ට දෙන්න ගිය රුපියල් 900ත් නැහැ; පොරොන්දු වූ රුපියල් 1,000ත් නැහැ. දැන් රුපියල් 750ක් එල්ලන්න යනවා. ඒ ගැනවත් මේ ණය වැයේ කථාවක් නැහැ. හැබැයි, ඊයේ වතුකරය නියෝජනය කරන ආණ්ඩුවේ ඉන්න ප්‍රධාන පෙළේ ඇමතිවරයෙක් කිව්වා, "මේක tip-top අය වැයක්" කියලා. Tip-top අය වැයක් කියන්නේ, තමන්ට ඡන්දය දුන්නු වතුකරයේ ජනතාවගේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම අමතක කර දාලා. මේ ණය වැය තුළ, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට මුකුත් නැහැ; කෘෂි කර්මාන්තයට මුකුත් නැහැ; කර්මාන්ත ක්ෂේත්‍රයට මුකුත් නැහැ. මම හිතුවා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉන්න කම්කරුවන් පැත්තකට දාලා අඩු ගානේ කුඩා තේ වතු හිමියන්, රබර් වතු හිමියන්, පොල් කර්මාන්තයේ නියැළෙන කට්ටිය ගැනවත් යම් ප්‍රමාණයකට බලයි කියලා. ඒත් නැහැ. කුඩා තේ වතු හිමියන් ගැන කිසිම ආකාරයකින් මේ ණය වැය තුළ බලලා නැහැ. අඩු ගානේ ඔබතුමන්ලා දෙනවාය කියන සිහිනයක්වත් ඒ මිනිසුන්ට දෙන්න. එහෙම සිහිනයක්වත් නැහැ. ඒ නිසා මංගල සමරවීර මහත්තයා මේ ඉදිරිපත් කරපු ණය වැය සම්බන්ධයෙන් කොයි පැත්තකින් බැලුවත් කිසිම විධියකින් ප්‍රශංසා කරන්නට මම කොච්චර උත්සාහ කළත් ඒකට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න ඕනෑ නැහැ. මුදල් ඇමතිතුමා පම්පෝරි ගහමින්, විපක්ෂ නායකතුමාට උසුළු විසුළු කරමින් කිව්වා, "හම්බන්තොට දිස්ත්‍රික්කය ඇතුළු රටේ නිවාස ලක්ෂ 10කට වැසිකිළි පහසුකම් නැහැ" කියා. මේක කිව්වා නම් කමක් නැහැ රනිල් වික්‍රමසිංහ මහත්තයා අගමැති වුණේ ඊයේ -පෙරේදා නම්. මේක කිව්වා නම් කමක් නැහැ, පසුගිය අවුරුදු තුනහමාරේ-හතරේ හිටියේ එක්සත් ජාතික පක්ෂයේ මුදල් ඇමතිවරු නොවෙයි නම්. පසුගිය අවුරුදු තුනහමාරේ-හතරේ සහ දැනුත් අගමැති හැටියට ඉන්නේ රනිල් වික්‍රමසිංහ මහත්තයා. ආර්ථික ඇමති එතුමා. ප්‍රතිපත්ති කටයුතු ඇමති එතුමා. දින 52 ආණ්ඩුවේ මහින්ද රාජපක්ෂ මහත්තයා හැරුණාම, මුදල් ඇමතිවරු දෙදෙනෙක් හිටියා. ඒ දෙදෙනාම එක්සත් ජාතික පක්ෂයේ.

හැබැයි, මහා සාඩම්බරයෙන් කියනවා, ලක්ෂ 10කට වැසිකිළි නැහැ කියලා. ඒකෙන්ම එක්සත් ජාතික පක්ෂය පිළිගන්නවා එතුමන්ලාගේ ආණ්ඩු කාලය අසමත් -fail- කියලා. අග්‍රාමාත්‍යතුමා ඇතුළු එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුවට පසුගිය අවුරුදු තුනහමාරක කාලය ඇතුළත අඩුම ගණනේ වැසිකිළියක් හදලා දෙන්න පුළුවන් වෙලා නැහැ.

ඊළඟට, තවත් පම්පෝරියක් කියනවා. තවත් ලක්ෂ හයකට සමෘද්ධිය දෙනවා ලු. අපේ දිවංගත ගාමිණී දිසානායක මැතිතුමාගේ ආදරණීය පුත්‍රයා, මයන්ත දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, "හරි සන්තෝෂයි" කියලා. මට නම් කිසිම සතුටක් නැහැ. අවුරුදු හතරක කාලයක් ආණ්ඩු කළත් තවත් ලක්ෂ හයක් දුප්පත්කමට වැටිලා ඉන්නවා. මුදල් ඇමතිවරයා කිව්වා නම්, "ඔන්න දුප්පත්කමේ සීමාවේ ඉන්න අපේ සමෘද්ධිලාභීන් ලක්ෂ තුනක් ගලවා ගත්තා" කියලා, එහෙමනම් සන්තෝෂ වෙන්න පුළුවන්. නමුත්, එහෙම නොවෙයි සිද්ධ වෙලා තිබෙන්නේ. දුප්පත්කමේ සිටින අයට අමතරව තවත් ලක්ෂ හයක් දුප්පත් වෙලා. ඒ වාගේම, ලක්ෂ දහයකට වැසිකිළි නැහැ. වැවිලි කර්මාන්තයට සහන නැහැ. කර්මාන්තකරුවන්ට සහන නැහැ. අපි වතු කම්කරු වැටුප හැටියට රුපියල් 900ක් දෙන්න ගියා. ඒක රුපියල් 1,000ක් කරනවා කිව්වා. දැන් රුපියල් 900ත් නැහැ; 1,000ත් නැහැ. දැන් ලැබෙන්නේ රුපියල් 750යි. ඒ ගැනත් මේ අය වැයේ කථාවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසානයේ පසුගිය අවුරුදු හතරක ආණ්ඩු කාලය තුළ ජනාධිපතිතුමාට පින්සිද්ධ වෙන්න මොරගහකන්ද ව්‍යාපෘතිය ආරම්භ කළා. ඒ වාගේම, ජනාධිපතිතුමා ආරම්භ කළා වකුගඩු රෝගීන් පිළිබඳ ව්‍යාපෘතිය සහ දැනට ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙන අපේ රටේ මහා භයානකම උවදුර වෙච්ච මත්ද්‍රව්‍ය නිවාරණ ව්‍යාපෘතිය. ඒ හැරුණු කොට, එක්සත් ජාතික පක්ෂයට පසුගිය අවුරුදු 4ක කාලය තුළ එතුමන්ලා ශේෂ පත්‍රයේ ධනාත්මක පැත්තේ ඉතිරි වෙලා තිබෙන්නේ බිංදුවක් පමණයි.

අද දුප්පත්කම වැඩි වෙලා, අපනයන ආදායම අඩු වෙලා, ආනයන වියදම අපනයන ආදායම වාගේ දෙගුණයක් වෙලා, වැසිකිළියක් හදා ගන්නවත් බැරි පවුල් සංඛ්‍යාව ලක්ෂ 10 පැනලා. ඊට අමතරව, මත් උවදුර සීඝ්‍රයෙන් වැඩි වෙන තත්ත්වය තුළ, ඒ උවදුර මැඩලීම සඳහා ජනාධිපතිතුමාගේ යටතේ ඉන්න පොලීසියට අමතරව ආරක්ෂක අංශත් දැන් කැඳවන්න වෙලා තිබෙනවා. මෙතෙක් කල් පොලිස් දෙපාර්තමේන්තුව තිබුණේත් එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරුන් භාරයේ. නමුත් ඒ කටයුතු හරියට කර ගන්න බැරි වුණා. කෙනෙකුට හිතන්න පුළුවන් මේ ඇඟිල්ල දික් කරන්නේ එක්සත් ජාතික පක්ෂයට කියලා. නැහැ, එහෙම නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "සුවසැරිය" වැඩසටහන ඉතාම හොඳ වැඩසටහනක් කියලා මම අවංකවමයි කියන්නේ. ඒ වැඩසටහන ආරම්භයේදී විපක්ෂයෙන් චෝදනා එල්ල වුණාට, ඒ වැඩසටහන ඉතා හොඳින් ක්‍රියාත්මක වැඩසටහනක්. එවැනි හොඳ දේවල් තිබෙනවා නම් අපි ඒවාට හොඳයි කියන්න කැමතියි. නමුත්, හොඳ දේවල් නැති කොට, අපට හොඳ දේවල් මවලා කියන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරපු ලේඛනය ගැන කියනවා නම්, -මම ඒකට අය වැයක් කියලා කියන්නේ නැහැ, ඒක අයක් නැති වැයක් පමණක් තිබෙන එකක් නිසා- ඒ දිහා බැලුවාම පෙනෙනවා, සාමාන්‍යයෙන් ඒක පාර්ලිමේන්තුවක ඉදිරිපත් කරන අය වැය ලේඛනයක් නොවෙයි, මැතිවරණයක් සඳහා ඉදිරිපත් කරන ඡන්ද පොරොන්දු මාලාවක් බව. සාමාන්‍යයෙන් මැතිවරණයක් සඳහා ඉදිරිපත් කරන ඡන්ද පොරොන්දු මාලාවක වුවත් ප්‍රායෝගික බවක් තිබෙනවා. ඒක කියවනකොට සමහර අයට දැනෙනවා ඒක කරන්න පුළුවන් එකක්ද, බැරි එකක්ද කියලා. හැබැයි, මේ ලේඛනය දිහා බැලුවාම පැහැදිලිවම "සිහින" විතරයි තිබෙන්නේ. ඒක මහපොළොවේ යථාර්ථයක් වෙන්නේ නැහැ. හැබැයි, හොඳ මාතෘකාවක් දාලා තිබෙනවා. මොකක්ද? "ජනතාවට ශක්තිය; දුප්පතුන්ට රැකවරණය - එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" කියලා. ඒ කියන්නේ පසුගිය අවුරුදු හතරහමාරක කාලය තුළම එක්සත් ජාතික පක්ෂයට බැරි වෙලා තිබෙනවා, ජනතාවට ශක්තියක් දෙන්න, දුප්පතුන්ට රැකවරණයක් දෙන්න. ඒ නිසායි දැන් මේ හදිසියේම ජනතාවට ශක්තිය දෙන්න මතක් වෙලා තිබෙන්නේ, හදිසියේම දුප්පතුන්ට රැකවරණය දෙන්න මතක් වෙලා තිබෙන්නේ. හැබැයි, මංගල සමරවීර ඇමතිතුමාට අමතක වෙලා තිබෙනවා, පසුගිය අවුරුදු හතරේම මේ රටේ මුදල් ඇමතිවරු හිටියේත් එක්සත් ජාතික පක්ෂයෙන්; අග්‍රාමාත්‍යතුමා හැටියට කටයුතු කළේත් මේ අග්‍රාමාත්‍යතුමාමයි කියන එක. ඒ නිසා ඒ අය වචනයෙන් පිළි නොගත්තාට ක්‍රියාවලියෙන් පිළි ගන්නවා, "ඔව්, දුප්පතුන්ට රැකවරණයක් දෙන්න අපට බැරි වුණා, අපි ෆේල්. ඔව්, ජනතාවට ශක්තියක් දෙන්න අපට බැරි වුණා, අපි ෆේල්. ඔව්, ලක්ෂ 10කට වැසිකිළි හදන්න අපට බැරි වුණා, අපි ෆේල්. ඔව්, දුප්පත්කම නැති කරන්න අපට බැරි වුණා, අපි ෆේල්, ඒ නිසා තව ලක්ෂ 6කට අලුතින් සමෘද්ධිය දෙනවා" කියලා. ඒ අනුව හැම පැත්තෙන්ම ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා. එහෙම අසමත් තැනක ඉඳගෙන මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට මට හිතුණේ, මංගල සමරවීර මහත්මයා මේ කියවන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ අවමංගල වාර්තාවද කියලායි. මේක කියෙව්වේ මංගල සමරවීර මහත්මයා වුණාට, මේක ආණ්ඩුවේ අවමංගල්‍යය ගැන කථා කරන ලේඛනය කියලායි මට හිතුණේ. මොකද, මොන පැත්තෙන් ගත්තත්, ඒ ලේඛනය තුළ තිබුණේ සෑම ක්ෂේත්‍රයකම අසාර්ථකභාවය කියා පෑමක් මිස සාර්ථකභාවය කියා පෑමක් නොවෙයි.

මේ රටේ ජනතාව ඉතාම බුද්ධිමත්. ඉස්සර අපි පුංචි කාලයේ දැකපු අය වැය ලේඛන නොවෙයි දැන් තිබෙන්නේ. ජනතාව දන්නවා, දැන් අය වැය ලේඛනවල තිබෙන්නේ කියන දේවල් නොවෙයි කියන එක. මීට කලිනුත් කවුරුන් හෝ කිව්වා වාගේ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් ලියා දෙන දේවල් විතරයි දැන් අය වැය ලේඛනයේ තිබෙන්නේ. අපි පුංචි කාලයේ පාසලේදී කියවන විට ලිවීම පාඩම කරනවා. පන්තියේ ගුරුතුමා හෝ ගුරුතුමිය කියවනවා; අපි ලියනවා. දැන් අය වැය ලේඛනය ඉදිරිපත් කරද්දීත් කවුරුන් හෝ ලියා දීපු දෙයක් කියවන්නයි පුරුදු වෙලා තිබෙන්නේ. ඒ කියවන දේවල් සමහර විට සිහින පමණයි, ප්‍රායෝගික දේවල් නොවෙයි. ඒ නිසා මේ අය වැය ගැන කථා කරලා වැඩක් නැති නිසා මා කල්පනා කළා, මගේ කථාවේ අවසාන තත්පර කිහිපය තුළ මගේ පළාතට අදාළ වන කාරණා කිහිපයක් සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමා දැනුවත් කරන්න ඕනෑය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන හාලිඇල මැතිවරණ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 59ක් තිබෙනවා. කාලයක් තිස්සේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

අමාත්‍යතුමාගෙන් ඉල්ලීම් කරනවා, ඇටම්පිටිය නමින් නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්, දෙහිවින්න කෝරළේ තිබෙන ග්‍රාම නිලධාරි වසම් එකතු කරගෙන ඇති කරන්න කියලා. මේ පිළිබඳව සීමා නිර්ණ වාර්තාවක් ලබා ගෙන, බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙනුත් එයට අනුමැතිය ලබා ගත්තා මීට අවුරුදු 5කට පෙර. නමුත්, ඇටම්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මහ පොළොවේ ස්ථාපිත වීම විවිධ පටු පරමාර්ථ පෙරදැරි කරගත් සමහර අයගේ වුවමනා නිසා යට යමින් පවතිනවා. ඡන්ද ගන්න ඕනෑ නම් කරන්න ඕනෑ මෙන්න ඒ වාගේ වැඩ. මේ වාගේ අසත්‍ය ලේබන ඉදිරිපත් කරන්නේ නැතිව කරන්න ඕනෑ ඒ වාගේ දේවල්. ජනතාව කොකේන් ගහලා නොවෙයි ඉන්නේ. රන්ජන් රාමනායක මහත්මයා කියන විධියට එක්සත් ජාතික පක්ෂයේ සමහර අය කොකේන් ගහලා හිටියාට, ජනතාව කොකේන් ගහලා නොවෙයි ඉන්නේ. ජනතාව හොඳ අවධියෙන් ඉන්නේ. ඒ නිසා හැලිඇල මැතිවරණ කොට්ඨාසයේ අලුතින් ඇටම්පිටිය නමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ඇති කරලා, ඒ ජනතාවට පහසු වන ආකාරයට කටයුතු කරගන්න අවස්ථාව හදලා දුන්නොත්, අන්න ඒක ඡන්ද ගන්න පුළුවන් ක්‍රමයක්.

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහත්මයා මහාමාර්ග ඇමති හැටියට කාලයක් හිටියා. ඊට පෙර මහින්ද රාජපක්ෂ මහත්මයාත් කාලයක් මහමාර්ග ඇමති වෙලා හිටියා. නැවත එතුමා අගමැති හැටියට හිටපු කාලයේත් මහාමාර්ග ඇමති හැටියට හිටියා. එතුමාගේ කාලයේ පුළුවන් තරම් මේ සභාවේ මේ ගැන කථා කරලා, කථා කරලා එතුමාගේ කාලයේ අන්තිම අවුරුද්දේ මට පුළුවන් වුණා, බදුල්ල - මහනුවර රජ මාවතේ වැඩ කටයුතු ආරම්භ කරන්න. මාත් මහාමාර්ග රාජ්‍ය ඇමතිතුමා හැටියට හිටපු කාලයේ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාට ඇවටිලි කරලා, කරලා යන්තමින් ඒ රජ මාවතේ නැවතී තිබුණු කටයුතු නැවත ආරම්භ කරන්න රාජ්‍ය ණය අරගෙන කටයුතු කළා. දැන් ඒ කටයුතු නැවතත් ඇණහිට තිබෙනවා, මා විරුද්ධ පක්ෂයට ආවාට පස්සේ. බාලගිරි දෝෂය ලබා තිබෙන බදුල්ල සිට හාලිඇල හරහා නුවරට යන ඒ පරණ රජ මාවතේ කටයුතු ඉක්මනට අවසන් කරන්න. එතකොට බදුල්ල සහ නුවර අතර දුර ප්‍රමාණය කිලෝ මීටර් 31කින් අඩු වෙනවා. මේක බාලගිරි දෝෂය ලබා තිබෙන ව්‍යාපෘතියක්. මේ ගැන අවධානය යොමු කරන්න කියලා මුදල් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිතුමියට පින් සිද්ධ වෙන්නත්, නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා-අපි කරපු දැවැන්ත අරගළයක ප්‍රතිඵලයක් හැටියටත් අපට හැකියාව ලැබුණා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලය තුළ අවශ්‍ය කරන මුදල් අරගෙන, එතුමාටත් පින් සිදු වෙන්න ඌවට වෙනම විශ්වවිද්‍යාලයක් ලබා දෙන්න. ලංකාවේ හැම පළාතකම විශ්වවිද්‍යාල හදන කොට, සමහර පළාත්වල විශ්වවිද්‍යාල එකක් නොවෙයි, දෙක, තුන බැගින් හැදෙන කොට ඌවට විශ්වවිද්‍යාලයක් ආවේ පරක්කු වෙලායි. නමුත්, ඒ විශ්වවිද්‍යාලය අපි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ ඉතාම ලස්සන පරිසරයක නිර්මාණය කළා. පේරාදෙනිය විශ්වවිද්‍යාලයට පසු ලස්සනම පරිසරයක් තිබෙන විශ්වවිද්‍යාලයක් හැටියට එය නිර්මාණය කරන්න හැකියාව ලැබුණා. ඌව විශ්වවිද්‍යාලය ඉතාම හොඳ පරිසරයකයි තිබෙන්නේ. මේ වන විට ඌව විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා සහ ඒ විශ්වවිද්‍යාලයේ සේවය කරන නිපුණතා තිබෙන සියලු විශේෂඥයන් කියන්නේ ඌව විශ්වවිද්‍යාලයට ඉතාම ඉක්මනින් වෛද්‍ය පීඨයක් ලබා දිය යුතුය කියලයි.

ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවෙත් විවිධ දේශපාලන පක්ෂවලට අයත් සමහර උදවිය කථා පවත්වා තිබෙනවා. නමුත් ඒවා කථා සාප්පුවලට පමණක් සීමා වෙලා තිබෙනවා. ඌව විශ්වවිද්‍යාලයට වෛද්‍ය පීඨයක් ලබා දීමේ කටයුත්ත ඉක්මන් කරන්නය කියන ඉල්ලීම මම මේ වෙලාවේ මුදල් ඇමතිතුමාටත් ඒ වාගේම මේ ආණ්ඩුවේ අලුතෙන් පත් වූ උසස් අධ්‍යාපන අමාත්‍ය රවුෆ් හකීම් මැතිතුමාටත් කියන්න කැමැතියි. සිංහල, දෙමළ මුස්ලිම් ජනතාව විතරක් නොවෙයි, වතුකරයේ ජනතාවත් විශාල වශයෙන් ජීවත් වෙන ප්‍රදේශයක තමයි ඌව විශ්වවිද්‍යාලය පිහිටා තිබෙන්නේ. මම ඉතාම කෙටි කාලයක් වතු යටිතල පහසුකම් කැබිනට් ඇමතිවරයා හැටියට හිටියා. එදා මම කැබිනට් එකට යෝජනාවක් ගෙන ආවා, වතුකරයේ ජනතාවට වෙනම විශ්වවිද්‍යාලයක් ගෙනෙන්න කියලා. මම එවැනි යෝජනාවක් ගෙනාවත්, ඊට පසුව කිසිම අය වැයකින් එම යෝජනාව ගැන සාකච්ඡා වුණේ නැහැ. මෙවර අය වැයෙත් එහෙම යෝජනාවක් නැහැ. අඩු ගණනේ වතුකරයේ ජනතාවට වෙනම විශ්වවිද්‍යාලයක් දෙන්න බැරි නම්, වතුකරයේ ජනතාවට සහනයක් වෙන විධියට වතුකරයේ ජනතාව නියෝජනය වන ප්‍රදේශයක ඇති ඌව විශ්වවිද්‍යාලයට වෛද්‍ය පීඨයක් ලබාදීමේ කටයුත්ත මේ අවුරුද්ද තුළ වහාම කඩිනම් කරලා කරන්න කියන ඉල්ලීම මා කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සම්මුතිවාදී ආණ්ඩුවේ සිටි කෙටි කාලය තුළ බාලගිරි දෝෂ ලබා තිබ්බ්ච වෙන්කල්අඩි මාර්ගය බදුල්ලේ සිට කිලෝමීටර 140ක් නැවත ආරම්භ කිරීමේ කටයුත්ත කරන්න මට හැකියාව ලැබුණා. ඒක පියවර හයකින් කරන්න ආරම්භ කරලා ඉතාම කඩිනමින් ක්‍රියාත්මක කරගෙන ගියා. නමුත් දැන් එම වැඩ පිළිවෙළේ මන්දගාමී ස්වරූපයක් තිබෙනවා. ඒ මන්දගාමී ස්වරූපය වහාම නවත්වන්න ඕනෑ. මොකද, ඒ සඳහා දැනට අවශ්‍ය කරන මුදල් වෙන් වෙලා තිබෙනවා. එහි මුදල් පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා එම කොනත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා කරලා, වෙන්කල්අඩි මාර්ගයේ කටයුතු වහාම ඉක්මන් කරන්න කියලා වර්තමාන මහාමාර්ග ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ඒ වාගේම උතුර සහ නැඟෙනහිරට පමණක් සීමාවෙලා තිබුණු iRoad ව්‍යාපෘතිය ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා සමඟ සාකච්ඡා කරලා ඌව පළාතට ගෙන එන්න මට හැකියාව ලැබුණා. ඒ තුළින් මොනරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කයේ තවත් කිලෝමීටර 1,300ක් කාපට් මාර්ග හැටියට සංවර්ධනය කිරීමේ අවස්ථාව ලබාගැනීමට හැකියාව ලැබුණා. ඒ කාපට් මාර්ග ව්‍යාපෘතියත් බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වීමේ දී විවිධ අනවශ්‍ය දේශපාලන බලපෑම් නිසා මන්දගාමී ස්වරූපයක් ලබා තිබෙනවා. ඕනෑම කෙනෙක් ලකුණු දමා ගන්න, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මා අවසාන කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ පළාතේ මිනිසුන් දන්නවා, ඒ ව්‍යාපෘතිය ආවේ කොහොමද කියලා. ඒ නිසා ඕනෑ කෙනෙක් ලකුණු දමා ගත්තාට කමක් නැහැ. හැබැයි, "ඒ ව්‍යාපෘතිය ආරම්භ කළේ ඩිලාන් පෙරේරා මැතිතුමා රාජ්‍ය ඇමතිතුමා කාලයේ; ඒ ව්‍යාපෘතිය ආරම්භ කළේ ඩිලාන් පෙරේරා මැතිතුමා රාජ්‍ය ඇමති කාලයේ ඌව පළාත් සභාවේ සන්ධාන මහ ඇමතිතුමාත් එක්ක ගිවිසුමක් ගහලා; ඒ නිසා මේකෙන් දේශපාලන ලකුණු නැහැ" කියන කාරණය පැත්තකට දමලා පාර හදන්න. මොකද, පාර හැදුවාම හැම පක්ෂයේම ජනතාව ඔය පාරේ ගමන් කරනවා. ඒ නිසා iRoad ව්‍යාපෘතියේ

තිබෙන මන්දගාමී ස්වභාවය පිළිබඳවත් සලකා බලන්න. එම ව්‍යාපෘතියටත් සල්ලි ඇවිල්ලා තිබෙනවා. සල්ලිවල කිසිම ගැටලුවක් නැහැ. ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු මංගල සමරවීර ඇමතිතුමා මා කාලයක සිට දන්නා හඳුනන මැතිතුමෙක්. එතුමා අපේ පක්ෂයේ හිටපු භාණ්ඩාගාරිකතුමා. එතුමා මුදල් ඇමතිතුමා හැටියට ඉදිරිපත් කරපු පළමු අය වැය ලේඛනය ගැන අප යම් බලාපොරොත්තුවක් තියාගෙන සිටියා. මොකද, එතුමා යම්කිසි දැක්මක් ඇතුව ගමනක් යන්න උත්සාහයක් දරන නිසා. නමුත් කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, ඒ උත්සාහයන් සියල්ල පැත්තකට දමලා, මෙවර මංගල ඇමතිතුමාගේ මේ අය වැය ලේඛනය යැයි කියා ගන්නා අයක් නැති ණය වැය ලේඛනය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ අවමංගල්‍ය ලේඛනය බවට පත්වී බව. ඒ කාරණයත් මතක් කරමින්, මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක පමණ කාලයක් තිබෙනවා.

**[අ.භා. 5.26]**

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019 අය වැය ලේඛනය සම්බන්ධයෙන් දෙවන වර කියවීමේ විවාදය අවස්ථාවේ දී මටත් කථා කිරීමට වේලාව වෙන්කර දීම සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා වතුකරයට අවශ්‍යම වූ කාරණයක් වන විශ්වවිද්‍යාලය ගැන මතක් කළා. එතුමා වතු යටිතල පහසුකම් අමාත්‍ය ධුරය දැරූ කාලයේ ඒ සම්බන්ධයෙන් ගත් උත්සාහය අපි අගයකොට සලකනවා. ඒ සංකල්පය තවමත් අපේ සිත් තුළ තිබෙනවා. නමුත් ඒ අතර, අපට තව වැඩකොටසක් කරන්න සිද්ධ වුණා. ඒ ටික අපි කරගෙන යනවා. ඒ වැඩකටයුතු ඉෂ්ට වන දවසේ දී අනිවාර්යෙන්ම එතුමාවත් අපි සිහිපත් කරනවා කියන කාරණය මතක් කරමින් අය වැය සම්බන්ධයෙන් මගේ අදහස් දැක්වීමට මා බලාපොරොත්තු වනවා.

சபைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, இந்த வரவு செலவுத்திட்ட அறிக்கையில், பெருந்தோட்டப் பகுதிக்கு எத்தகைய ஒதுக்கீடுகள் செய்யப்பட்டிருக்கின்றது அல்லது எதற்குரிய ஒதுக்கீடுகள் செய்யப்படவில்லை என்பது சம்பந்தமாக, என்றுமில்லாதவாறு, இந்தப் பாராளுமன்றத்தில் அங்கம் வகிக்கும் பெரும்பாலான பாராளுமன்ற உறுப்பினர்கள் தங்களது உரையின்போது கருத்துத்தெரிவித்திருக்கின்றமை எங்களுக்கு மகிழ்ச் சியளிக்கின்றது. காரணம், இந்தப் பெருந்தோட்டத் துறைசார்ந்த மக்கள் தொடர்பான விடயம் அல்லது பெருந்தோட்டத் துறையென்பது இந்த நாட்டில் 200 வருடகால வரலாற்றைக் கொண்டது என்கின்ற அடிப்படையில், இந்த 200 வருட காலத்திலெல்லாம் இல்லாத அக்கறை இப்போது இந்தப் பாராளுமன்றத்திற்கு வந்திருக்கின்றதென்பதை எங்களுடைய அரசியற் காலத்தில் நாங்கள் ஏற்படுத்திய ஒரு மறுமலர்ச்சி என்பதாகவே நான் பார்க்கின்றேன். பெரும்பாலான பாராளுமன்ற உறுப்பினர்கள் இந்த விடயத்தைத் தொட்டுப்பேசுவது வரவேற்கக்கூடியதாக இருக்கின்ற அதேநேரத்தில், ஆச்சரியமாகவும் இருக்கின்றது. எதற்காக இதனைத் தொட்டுப் பேசுகின்றார்கள் என்பது தொடர்பாக நாங்கள் சிந்திக்கவேண்டியிருக்கின்றது. ஆளும்கட்சிப் பாராளுமன்ற உறுப்பினராக இருக்கட்டும் அல்லது எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினராக இருக்கட்டும், போகிறபோக்கில் அவர்களது உரையிலொரு பகுதியாக இந்தப் பெருந்தோட்ட விவகாரங்களையும் தொட்டுப் பேசுகின்ற பாங்கு பலரிடத்தில் காணப்படுகின்றது. அதுவே அவர்கள் இருப்பது எதிர்க்கட்சி வரிசையாக இருந்தால், ஆளும் கட்சி அரசாங்கத்தையோ அல்லது ஆளும் கட்சியின் அங்கத்தவ உறுப்பினர்களாக இருக்கக்கூடிய எங்களையோ குறை சொல்லிவிடுவதற்கான ஒரு உபாயமாக இந்த விடயத்தைத் தொட்டுச் செல்வதையும் நாங்கள் அவதானிக்க முடிகின்றது. அவ்வாறே இந்தக் கால ஓட்டத்தோடு ஏதேனும் ஒரு வசனத்தைப் பேசிவிடுவதன்மூலமாக ஊடகக் கவனத்தைப் பெற்றுவிடலாம் என்ற நோக்கத்தில் சிலர் பேசுவதும் தெரிகின்றது. "நாங்கள் இருந்தால் அப்படிச் செய்திருப்போம்; இப்படிச் செய்திருப்போம், சம்பளத்தை அப்படிப் பெற்றுக்கொடுத்திருப்போம்" என்று சொல்பவர்கள் கடந்த 30 ஆண்டுகளாக இந்தப் பாராளுமன்றத்தில் இருப்பவர்கள்தான்.

මම මේ කාරණයත් මතක් කරන්නට ඕනෑ. මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී, මහින්දානන්ද අලුත්ගමගේ මහතා ඇහුවා, "මෙවර අය වැයෙන් වතු කම්කරුවන්ගේ වැටුප ගැන කිසිම දෙයක් කියලා නැහැ. වතු කම්කරුවන් නියෝජනය කරන මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් ඇඳුම් ඇඳගෙනද මීට පසුව පාර්ලිමේන්තුවට එන්නේ?" කියලා. පසුගිය ඔක්තෝබර් මාසයේ හොරෙන් ආණ්ඩුව අල්ලා ගන්න ගිහිල්ලා එයින් fail වෙලා, දැන් මොන ඇඳුම් ඇඳගෙනද එතුමන්ලා පාර්ලිමේන්තුවට එන්නේ කියලා මම එතුමාගෙන් අහන්න කැමැතියි. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පමණයි. නාවලපිටිය ආසනය නියෝජනය කරන එතුමා, පසුගිය කාලයේ ඇමති ධුර දරමින් වතු කම්කරුවන් වෙනුවෙන් ගෙන ගිය වැඩසටහන් මොනවාද? ඒ ජනතාවට ඉඩම් අයිතිය ලබා දෙන්න එතුමා කොයිතරම් දායකත්වයක් දැක්වූවාද? එවැනි ප්‍රශ්න රාශියක් එතුමාගෙන් අහන්න තිබෙනවා. නමුත් හෙට-අනිද්දා වන විට ආණ්ඩුව පොරොන්දු වුණු රුපියල් 50ක දෛනික වැටුප් වැඩිවීම වතු කම්කරුවන්ට ලබා දෙන කොට, අපි ඇඳුම් ඇඳගෙන එනවා නම් එතුමා මේ පාර්ලිමේන්තුවට එන්නේ කොහොමද කියලායි අපි බලාගෙන ඉන්නේ.

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டத்தின் பல்வேறு அம்சங்களையும் பார்க்கின்றபோது, எல்லோரும் பேசுவதுபோல அல்லது எல்லோரும் கருத்துத் தெரிவிப் பதுபோல, இது மக்களுக்குச் சக்தி வழங்குகின்ற, அதேபோல வறுமையில் இருப்போருக்குப் பாதுகாப்பு வழங்குகின்ற ஒரு வரவு செலவுத்திட்டமாகத் தென்படுகின்றது என்பதில் மாற்றுக் கருத்து இல்லை. ஆனால், நாம் மலையக மக்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்றவர்கள் என்ற வகையிலே, இந்த வரவு செலவுத்திட்ட அறிக்கையினூடாக அறிவிக்கப் பட்டிருக்கும் விடயங்களை எவ்வாறு அந்த மக்களுக்குப் பெற்றுக்கொடுக்கப்போகிறோம்? என்பதில்தான் எங்களுக்குச் சவால் இருக்கிறது. காரணம், இவ்வாறான வரவு செலவுத்திட்டங்களில் முன்மொழியப்படுகின்ற நிகழ்ச்சித் திட்டங்களினூடாகச் சம்பளம் முதல் அபிவிருத்தி நடவடிக் கைகள் வரையான எந்த வேலைத்திட்டமும் சென்று சேராத

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

மக்கள் கூட்டமாகவே இந்த நாட்டில் அந்த மக்கள் வைக்கப்பட்டுள்ளார்கள்.

2019ஆம் ஆண்டின் வரவு செலவுத்திட்டத்தில் எது இருக்கிறது, எது இல்லை? எனக் கோஷமிட்டுக் கொள்பவர்களுக்கு நான் பிரதானமாக ஒன்றைச் சுட்டிக்காட்ட விரும்புகிறேன் அல்லது வாசித்துக் காட்ட விரும்புகிறேன். இந்த வரவு செலவுத்திட்ட அறிக்கை மாத்திரமல்ல, அதனோடு கூடவே மூன்று தொகுதிகள் அடங்கிய மதிப்பீட்டு அறிக்கையும் எங்களுக்குச் சமர்ப்பிக்கப்படுகின்றது. இந்த மதிப்பீட்டு அறிக்கை எந்தளவுக்கு வெளியே உள்ளவர்களுக்கு வாசிக்கக் கிடைக்கும் என்பது தெரியாது. அப்படிக் கிடைக்காவிடின், இணையத்தளங்களில் வாசிக்கலாம் என்று நினைக்கின்றேன். அந்த மதிப்பீட்டு அறிக்கையிலே ஒவ்வோர் அமைச்சு தொடர்பாகவும் அதன் பிரதான பணிகள் தொடர்பாகவும் அதற்குக் கீழ் வரக்கூடிய நிறுவனங்கள் தொடர்பாகவும் குறிப்பிடப்பட்டிருக்கும். அந்த அறிக்கை வெளியே வராததன் காரணமாக, இந்த மலையக மக்களுக்கென உருவாக்கப்பட்டு இருக்கக்கூடிய அமைச்சின் பிரதான பணிகளையும் அதற்குக் கீழ் வரக்கூடிய நிறுவனங்கள் தொடர்பாகவும் சற்றே நான் வாசித்துக் காட்ட விரும்புகிறேன்.

" மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி பற்றிய விடயங்களுடன் தொடர்புபட்ட கொள்கைகளையும் நிகழ்ச்சித்திட்டங்களையும் கருத்திட்டங்களையும் வகுத்தமைத்தலும் கண்காணித்தலும் மதிப்பிடுதலும் தோட்டத்துறையைச் சேர்ந்த சமூகத்தின் சமூக - பொருளாதார நிலைமையினை விருத்தி செய்தல், அரச மற்றும் தனியார் பெருந்தோட்டக் கம்பனிகளில் சேவையாற்றும் காணிகள் இல்லாத மக்களுக்காக வீடமைப்பு மற்றும் உட்கட்டமைப்பு வசதிகளை அபிவிருத்தி செய்யும் நோக்கில் புதிய கிராமங்களையும் நகரங்களையும் உருவாக்குதல், தோட்டத்துறையைச் சேர்ந்த மக்களை வலுவூட்டுவதற்காக வாழ்வாதார முறைகளை உருவாக்கும் கருத்திட்டங்களைச் செயற்படுத்தல், கிராமியத் தோட்டத்துறைகளில் உட்கட்டமைப்பு வசதிகளை விருத்தி செய்தல்" என்பனவே இந்த அமைச்சின் பிரதான பணிகளாக இருக்கின்றன.

சபைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, நான் இந்த விடயம் தொடர்பில் குறிப்பாக ஒரு விடயத்தை ஞாபகப்படுத்த விரும்புகின்றேன். நாங்கள் கடந்த 70 ஆண்டு கால வரவு செலவுத்திட்ட அறிக்கைகளைப் பற்றிப் பேசுகிறோம். இதற்கு முன்னர் இந்த மலையக மக்களுக்கு சேவையாற்றுவதற்கென இத்தகைய ஓர் அமைச்சு உருவாக்கப்பட்டிருந்ததா? அல்லது அத்தகைய அமைச்சுக்கு இத்தகைய பிரதான பணிகள் வழங்கப்பட்டிருந்ததா? என்பது தொடர்பாக, இதுபற்றி விமர்சனத்தை முன்வைப்போர் திரும்பிப் பார்க்க வேண்டிய காலகட்டமாக இது இருக்கின்றது. கடந்த 2016ஆம் ஆண்டுக்குப் பின்னரான வரவு செலவுத்திட்ட மதிப்பீட்டு அறிக்கையில்தான் இத்தகைய ஓர் அமைச்சும் அமைச்சின் பிரதான பணிகளும் குறிப்பிடப்பட்டிருகின்றது என்பதை நாங்கள் நினைவுபடுத்த வேண்டியிருக்கின்றது. எனவே, கடந்த 72 வரவு செலவுத்திட்ட அறிக்கைகளை புரட்டிப்பார்த்துதான் இந்த விமர்சனங்களை முன்வைப்போர் இதைப்பற்றிப் பேசவேண்டியவர்களாக இருக்கின்றார்கள். அந்த வகையில், இந்த 2019ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட மதிப்பீட்டு அறிக்கையில் இந்த மக்களுக்காக இந்த அமைச்சின்கீழ் சேவை ஆற்றுவதற்காகவுள்ள நிறுவனங்களின் விசேட அம்சம் இருப்பதை நான் சுட்டிக்காட்ட விரும்புகிறேன்.

இதுவரை காலமும் அந்த மக்களுக்குச் சேவையாற்றுவதற்கென அரசாங்கத்தில் பொறுப்புடைய - பாராளுமன்றத்திற்குப் பொறுப்புக்கூறக்கூடிய ஒரு நிறுவனம் இல்லாத நிலையில்தான் இந்த அமைச்சுக்கள் இயங்கி வந்திருக்கின்றன. கடந்த காலங்களிலே இந்த மக்களின் வாக்குகளைப் பெற்று இந்தப் பாராளுமன்றத்திற்கு வந்தவர்கள், கால்நடை அபிவிருத்தி அமைச்சைத்தான் கேட்டுப் பெற்றுக்கொண்டார்கள். அதுகூட மக்களுக்கு சேவை செய்வதற்காக அல்ல. அந்தக் கால்நடை அமைச்சினூடாக அதிக இலாபங்களை ஈட்டிக்கொள்வதற்காக. அப்படி அந்த அமைச்சுக்களைப் பெற்றுக்கொண்டவர்கள் அதன்மூலமாக அந்த மக்கள் நன்மை பெறக்கூடிய வகையில் ஒரு பண்ணையைக்கூட அமைத்துக் கொடுத்தது கிடையாது. இந்த நிலையில்தான் இந்த மக்களுக்கு சேவையாற்றுவதற்கு அரசாங்கம் பொறுப்புக்கூறக்கூடிய ஒரு நிறுவனம் என்கின்ற வகையிலே இந்த 2019ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்திலே பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபை உள்வாங்கப்பட்டிருக்கின்றதென்பதை நாங்கள் பெருமையோடு கூறிக் கொள்வதோடு, அதற்காக அரசாங்கத்திற்கு நன்றி தெரிவிக்கவும் கடமைப்பட்டிருக்கிறோம். இலங்கை சுதந்திரமடைந்ததன் பின்னர், அரசாங்கம் இந்த 2019ஆம் ஆண்டு வரவு செலவுத்திட்ட அறிக்கையில்தான் இந்த மக்களின் அபிவிருத்தியைப் பொறுப்பேற்று நடத்துவதற்கான ஒரு நிறுவனத்தை உருவாக்கிய முதலாவது சந்தர்ப்பமாக இது வரலாற்றிலே இடம்பிடித்திருக்கின்றது. இதுபோன்ற அடைவுகள் இன்னும் பலவற்றை நாங்கள் எய்தவேண்டி இருக்கின்றது.

பாராளுமன்ற உறுப்பினர் கௌரவ டிலான் பெரேரா அவர்கள் பேசும்போது, பதுளை மாவட்டத்தின் ஹாலிஎல பிரதேச செயலகத்திற்குகீழ் இருக்கும் அட்டம்பிட்டியை ஒரு பிரதேச செயலகமாக மாற்றவேண்டுமென்ற கருத்தைத் தெரிவித்தார், அங்கே உள்ள கிராம சேவையாளர் பிரிவுகளின் எண்ணிக்கை 59 எனவும் குறிப்பிட்டார். அதனை இரண்டாகப் பிரித்து இரண்டு பிரதேச செயலகங்களாகக் கேட்டிருந்தார். நாங்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற நுவரெலியா மாவட்டத்தின் அம்பகமுவ பிரதேச செயலகத்தில் 250,000 சனத்தொகைக்கு ஒரு பிரதேச சபையை வைத்துக்கொண்டு இருந்தோம். இப்போது 3 வருட கால எங்களது செயற்பாடுகளினூடாக அங்கு மேலும் இரண்டு பிரதேச சபைகளை உருவாக்குவதற்கான சந்தர்ப்பம் எங்களுக்கு கிடைத்தது. அதேபோல, நுவரெலியா பிரதேச செயலகத்திலும் 250,000 சனத்தொகைக்கு ஒரு பிரதேச சபை என்கின்ற நிலை இருந்தது. இப்பொழுது நாங்கள் அங்கு மேலதிகமாக இரண்டு பிரதேச செலயகங்களை உருவாக்கி இருக்கிறோம். இதுவெல்லாம் இந்தக் குறிப்பிட்ட 3 ஆண்டு காலப்பகுதியில் நடந்தவைதான். எனவே, எங்களது அடுத்த இலக்காக இருப்பது பிரசேத சபைகள் எவ்வாறு அதிகரிக்கப்பட்டனவோ அதேபோல பிரதேச செயலகங்களையும் அதிகரிப்பதுதான். ஏற்கனவே, நாங்கள் நுவரெலியா மாவட்டத்திற்கு மேலதிகமாக ஐந்து பிரதேச செயலகங்களைப் பெறுவதற்கான அமைச்சரவைப் பத்திரத்தை சமர்ப்பித்து, அந்த அமைச்சரவைப் பத்திரத்தினூடாக அதனை வென்றெடுப்பதற்கான வேலைத்திட்டங்களைச் செய்திருக்கிறோம். இப்போதைக்கு அது நிதி அமைச்சின் மேற்பார்வைக்காக வைக்கப்பட்டிருக்கின்றது. நிச்சயமாக நாங்கள் இந்த ஆண்டு காலப்பகுதிக்குள் நுவரெலியா மாவட்டத்தினுள் பிரதேச செயலங்களை அதிகரிப்பதற்கான நடவடிக்கைகளை எடுப்போம்.

இதுபோல, நாங்கள் அரசாங்கத்தின் பொறுப்புடன் இயங்கக்கூடிய நிறுவனங்களை உருவாக்குவதிலும் அதனை செயற்படுத்துவதற்கான வழிமுறைகளையும் தனியாரிடத்திலே ஒப்படைத்துத் தனித்துவிடப்பட்டிருக்கின்ற இந்த மக்கள் கூட்டத்தை தேசிய நீரோட்டத்தில் இணைக்கின்ற வேலைத்திட்டத்தையும் மற்றும் அடிப்படைத் தேவைகளுக் கான வேலைத்திட்டங்களையும் செய்து வருகின்ற காலகட்டத் தில்தான் இந்த வரவு செலவுத்திட்ட அறிக்கையினூடாக முன்மொழியப்பட்டிருக்கின்ற 'கம்பெறளிய' வேலைத் திட்டங்களையும் நாம் நேரடியாக எமது பெருந்தோட்டப் பகுதிகளுக்கு கொண்டு செல்லக்கூடியதாக இருக்கின்றது. முன்னைய காலத்தில் 'கம்பெறளிய' வேலைத்திட்டங்கள் அரசாங்கத்தினால் முன்மொழியப்பட்டிருந்தாலும்கூட, அவற் றைத் தோட்டப்பகுதிகளுக்கு கொண்டு சென்று வேலை செய்யமுடியாத அளவுக்குதான் இந்த நாட்டின் பிரதேச சபைகள் சட்டம் இருந்தது. இந்தப் பிரதேச சபைச் சட்டத்தின்கீழ் பெருந்தோட்டப்பகுதிகளுக்கு வேலை செய்ய முடியாதிருந்த நிலைமை இன்று நேற்று இருந்ததல்ல! சுமார் 30 வருட காலமாகவே இருந்தது. 1987ஆம் ஆண்டு அந்த சட்டம் இயற்றப்பட்டதிலிருந்து கடந்த 2018ஆம் ஆண்டு செப்ரெம்பர் 19ஆம் திகதி அது பாராளுமன்றத்தில் திருத்தப்படும் வரை, அந்தச் சட்டத்தை திருத்த வேண்டுமென்ற உணர்வு - வலி - மலையக மக்களுக்காக குரல் எழுப்புகின்றோம், மலையக மக்களின் சம்பளப் பிரச்சினையைப் பேசுகின்றோம் என இங்கே தமது அரசியல் சுயலாபத்திற்காக கூக்குரலிடும் இந்த உறுப்பினர்களுக்கு ஏன் எழவில்லையெனக் கேட்கத் தோன்றுகிறது.

1987ஆம் ஆண்டு பாடசாலைக்குச் சென்ற நான், 2015ஆம் ஆண்டு இந்தப் பாராளுமன்றத்திற்கு வந்து, அந்தச் சட்டத்தைத் திருத்துங்கள்! என்று பிரேரணை கொண்டுவந்துதான் அதைச் செய்ய வேண்டியிருந்தது. எல்லோரும் தங்கள் அரசியல் இலாபங்களுக்காகப் போகிற போக்கில் ஓரிரு வசனங்களை இந்த மக்கள் சார்ந்து பேசிவிட்டுப் போகலாம். ஆனால், அதன் உண்மையான வலி தெரிந்த, அந்தப் பிரச்சினையின் தாற்பரியம் புரிந்த நாங்கள் வந்து, பிரேரணைகளை முன்வைத்து, அந்தச் சட்டத்தைத் திருத்த வேண்டிய நிலைமைதான் இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்றது. இங்கே இருக்கின்ற உறுப்பினர்கள் எவரும் அத்தகையதொரு பிரேரணையை முன்வைத்தவர்களாக இல்லை என்பதை நான் நினைவுபடுத்த விரும்புகின்றேன். பிரதேச சபைச் சட்டத்தின் குறித்த 33ஆவது சரத்தினைத் திருத்திய பிறகுதான் 'கம்பெறலிய' போன்ற வேலைத் திட்டங்களைச் செயற்படுத் துவதற்குப் பிரதேச சபைகள் தோட்டங்களுக்குள் இறங்கியிருக் கின்றன. இப்போதுதான் இந்தப் பாராளுமன்றத்தில் அங்கம் வகிக்கின்ற பாராளுமன்ற உறுப்பினர்களுக்குக் கிடைக்கின்ற அபிவிருத்தி சார்ந்த நிதிகளைத் தோட்டப் பகுதிகளுக்குச் செலவிடக்கூடியதான சந்தர்ப்பம் உருவாக்கப்பட்டிருக்கின்றது. எனவே, பிரதேச சபைகள் சட்டத்தைத் திருத்திய இந்த அரசியல் காலப்பகுதியை மறந்துவிட்டு வேறு விடயங்களைப் பேசுவது தவறானதாகிவிடும்.

இதேபோல, பெருந்தோட்டப்பகுதிக் கல்வித்துறை சார்ந்த விடயங்களில் 'அருகிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை' என்கின்ற திட்டத்தின்கீழ், பெருந்தோட்டப் பகுதிகளில் இருக்கின்ற பல்வேறு பாடசாலைகளின் அபிவிருத்திக்கான நிதிகள் பெற்றுக் கொடுக்கப்பட்டிருக்கின்றன. அதேபோல, இந்த வரவு செலவுத் திட்டத்திலும் 345 மில்லியன் ரூபாய் இந்தப் பெருந்தோட்டப் பகுதிப் பாடசாலைகளின் அபிவிருத்திக்கென ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதை இந்த மதிப்பீட்டறிக்கையினூடாக நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அதேபோல, நுவரெலியா மாவட்டத்தில் ஒரு தேசியப் பாடசாலைகூட இல்லாத நிலையிலே, நானுஓயா நகரை அண்மித்து மும்மொழித் தேசியப் பாடாசலையொன்றை அமைப்பதற்கும் இந்த வரவு செலவுத் திட்டத்தினூடாக 400 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது என்பதையும் நாங்கள் குறிப்பிட்டுக் காட்டவேண்டியிருக்கின்றது.

மேலும், இவ்வாறு தேசிய வரவு செலவுத்திட்டத்தினூடாகப் பெருந்தோட்டப்பகுதிப் பாடசாலைகளுக்கு ஒதுக்கப்படுகின்ற நிதி மாகாண சபைகளினூடாக இயங்குகின்ற பாடசாலைகளுக்குப் பிரித்துக் கொடுக்கப்படுகின்றபோது, அங்கே தமிழ் மொழிமூலப் பாடசாலைகளுக்கும் சிங்கள மொழிமூலப் பாடசாலைகளுக்குமிடையே வளப் பகிர்வில் பல்வேறு சிக்கல்கள் இருப்பது சம்பந்தமாக எங்களுக்கு முறைப்பாடுகள் கிடைத்திருக்கின்றன. எனவே, இந்த ஒதுக்கீடுகளுக்காக நாங்கள் நிதி அமைச்சர் அவர்களுக்கும் கல்வி அமைச்சர் அவர்களுக்கும் நன்றி தெரிவிப்பதோடு, அத்தகைய வளப் பகிர்வுகள் சரியாக இடம்பெறுகின்றனவா? என்பது தொடர்பாக மேற்பார்வை செய்வதற்கு ஒரு முறைமையை ஏற்படுத்துவதற்கும் கல்வி அமைச்சு நடவடிக்கை எடுக்கவேண்டும் என்பதை நான் இந்தக் கட்டத்திலே அரசாங்கத்திடம் கூறிவைக்க விரும்புகின்றேன்.

அதேபோல. ஆசிரியர்களுக்கான கல்வியை விருத்தி செய்வதற்காக, மஹரகம தேசியக் கல்வியியற் கல்லூரி, ஹாப்பிற்றிகம தேசியக் கல்வியியற் கல்லூரி, அட்டாளைச்சேனைத் தேசியக் கல்வியியற் கல்லூரி ஆகியவற்றினை அபிவிருத்தி செய்வதற்காக இந்த வரவு செலவுத் திட்டத்தில் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. அதேநேரத்தில், நான் பிரதிநிதித்துவம் செய்கின்ற நுவரெலியா மாவட்டத்தில் அமைந்திருக்கின்ற ஸ்ரீபாத தேசியக் கல்வியியற் கல்லூரியைத் தரமுயர்த்துவதற்கான, அதன் தரத்தை வலுப்படுத்துவதற்கான தேவைப்பாடிருக்கின்றது என்பதையும் அதற்கான நிதி ஒதுக்கீடுகளை நிதி அமைச்சானது கல்வி அமைச்சினூடாக ஏற்படுத்த வேண்டும் என்பதையும் நான் கோரிக்கையாக முன்வைக்க வேண்டியவனாக இருக்கின்றேன். காரணம், கடந்த காலத்திலே அந்த ஸ்ரீபாத கல்வியியற் கல்லூரியிலே சமையலறை, அதன் சுற்றுப்புறம் என்பன சுத்தமாக இல்லை என்கின்ற காரணத்தை அடிப்படையாகக் கொண்டு பொதுச் சுகாதார அதிகாரிகள் அந்தச் சமையலறையை மூடி *'சீல்'* வைத்த சம்பவம் இடம்பெற்றது. அதனோடு இணைந்ததாக அந்தக் கல்லூரியில் பல்வேறு பிரச்சினைகள் இப்போது எழுந்துள்ளன. அந்தப் பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டியிருக்கின்றன.

அண்மையிலே நாங்கள் பாராளுமன்றத்தின் கல்வியமைச்சின் மேற்பார்வைக் குழுவுக்கு அந்தக் கல்லூரியின் அதிபர், கல்வியியற் கல்லூரிக்குப் பொறுப்பாளராக இருக்கின்ற ஆணையாளர் உள்ளிட்ட அதிகாரிகளை அழைத்து, அவர்களிடம் இது தொடர்பான விளக்கங்களைக் கோரியிருக்கின்றோம். அந்தக் கல்வியியற் கல்லூரிக்கு 75 வீதம் மலையகப் பெருந்தோட்டத் தமிழ் மாணவர்களும் 25 வீதம் சிங்கள மொழிமூல மாணவர்களும் உள்வாங்கப்பட வேண்டும் என்கின்ற சுற்று நிருபம் வர்த்தமானியில் வெளியிடப்பட்டிருக்கின்றபோதும்கூட, அது முறையாகப் பேணப்படாமை பற்றிப் பல்வேறு குற்றச்சாட்டுக்கள் எழுந்திருக்கின்றன. எதிர்வரும் காலத்தில் 2 தொகுதியினரை ஒரே தடவையாக அந்தக் கல்லூரிக்கு உள்வாங்குகின்ற ஏற்பாடுகள் செய்யப்படுகின்றபோது, இந்த விகிதாசாரம் சரியாகப் பேணப்படாத சந்தர்ப்பத்தில் அங்கே தமிழ் மாணவர்கள் இன்னும் குறைவாக

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

உள்வாங்கப்படுவதற்கான சந்தர்ப்பங்கள் இருக்கின்றன. அது தொடர்பான விளக்கம் கோரலையும் நாங்கள் இந்த மேற்பார்வைக் குழுவினூடாகக் கோரியிருக்கின்றோம்.

இந்தச் சுகாதாரம் சம்பந்தப்பட்ட விடயங்கள் மாத்திரமல்லாமல், 2 தொகுதிகளிலும் அவர்கள் கல்லூரிக்கு உள்வாங்கப்படுகின்ற சந்தர்ப்பத்தில், அங்கே மாணவர்களின் விடுதிகளுக்கான வசதிகள் குறைவாக இருப்பதன் காரணமாக, அதனை அபிவிருத்தி செய்யவேண்டிய தேவையுமிருக்கின்றது. அந்தக் கல்லூரியின் அதிபரும் பதிவாளரும் எங்களிடம் ஏற்கனவே அதுதொடர்பான கோரிக்கையை முன்வைத் திருக்கிறார்கள். எனவேதான், இந்த வரவு - செலவுத்திட்ட விவாதவேளையில் கல்வியமைச்சரின் கவனத்திற்குக் இதனைக் கொண்டுவருகின்றேன். அந்தக் கல்லூரியில் அடிக்கடி ஏற்படக்கூடிய பிரச்சினைகளைத் தவிர்ப்பதற்காக, அதற்கு முறையான வளங்களைப் பெற்றுக்கொடுப்பதனூடாக அந்தப் பிரச்சினைக்கான தீர்வினைக் காண்பதோடு, அங்கே இந்த மாணவர்களைச் சேர்த்துக்கொள்ளும் விகிதாசாரத்தையும் கவனத்திலெடுத்து நடவடிக்கைகள் மேற்கொள்ள வேண்டுமென்கின்ற விடயத்தையும் நாங்கள் சொல்லிவைக்க விரும்புகின்றோம்.

அதேபோல, பெருந்தோட்டத்துறைக்கான சுகாதாரம் சம்பந்தமாகவும் நாங்கள் குறிப்பிடவேண்டியிருக்கிறது. கடந்த காலங்களிலே, இந்தப் பெருந்தோட்டத்துறைச் சுகாதாரம் சம்பந்தமாகப் பல்வேறு சந்தர்ப்பங்களில் நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் எங்கள் கருத்துக்களைத் தெரிவித்திருக் கின்றோம். அந்தவகையிற் பார்க்கும்போது, இம்முறை இந்த வரவு செலவுத்திட்ட அறிக்கையினூடாக, இந்தச் சுகாதாரம் சம்பந்தப்பட்ட விடயத்தில் ஊவா, சப்ரகமுவ, மத்திய மற்றும் வடமத்திய மாகாணங்களின் ஆரம்பச் சுகாதார அலகுகளை ஸ்திரப்படுத்தும் நோக்கத்துடன் 1,625 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. இந்த ஊவா, சப்ரகமுவ, மத்திய மாகாணங்கள் மூன்றையும் எடுத்துக்கொண்டால், இந்த 3 மாவட்டங்களும்தான் அதிகளவிலான பெருந்தோட்டப் பிரதேசங்கள் அடங்குகின்ற மாகாணங்களாக இருக்கின்றன. ஏற்கனவே எங்களது தொடர்ச்சியான வேண்டுகோளுக் கிணங்கச் சுகாதார அமைச்சர் அவர்கள் இந்தப் பெருந்தோட்ட சுகாதார நிலையங்களையும் வைத்திய நிலையங்களையும் மாகாண அரசாங்கத்திற்கோ அல்லது அரசாங்கத்தின் தேசிய சுகாதார முறைமைக்குள்ளேயோ கொண்டுவருவதற்கான அமைச்சரவைப் பத்திரத்தைப் பெற்றுக்கொண்டுள்ளார். அதனை நடைமுறைப்படுத்தவேண்டிய முறைமைபற்றி இப்பொழுது பேசப்பட்டுக் கொண்டிருக்கின்றது. மலைநாட்டுப் புதிய கிராமங்கள் அமைச்சுக்குக்கீழாக இருக்கக்கூடிய பெருந்தோட்ட மனிதவள நிதியந்தான் இப்போதைக்குப் பெருந்தோட்டப் பகுதிச் சுகாதாரத்திற்குப் பொறுப்பாக இருக்கின்றது. அவர்களையும் இணைத்து இந்தப் பாராளுமன்றக் குழு அறையிலே நாங்கள் பல்வேறு கலந்துரையாடல்களை செய்திருக்கின்றோம். எனவே, இப்போது அமைச்சரவை அனுமதியும் கிடைத்திருக்கின்ற நிலையில், இந்த ஆரம்ப சுகாதார நிலையங்களை அபிவிருத்தி செய்வதற்காக ஊவா, சப்ரகமுவ, மத்திய மாகாணங்களுக்கு இந்த வரவு செலவுத் திட்டத்திலே 1,625 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டிருப்பதனை, பெருந்தோட்டச் சுகாதாரத்தைத் தேசிய சுகாதார முறைமைக்குள் கொண்டுவருவதற்கான ஆரம்ப அடித்தளமாகக் கொள்ளவேண்டும். அதனைச் சுகாதார அமைச்சு முறையாக நடத்த வேண்டும் என்கின்ற கோரிக் கையை நாங்கள் முன்வைப்பதோடு, இந்த வரவு செலவுத்திட்ட ஒதுக்கீடுகளை அடிப்படையாகக்கொண்டு, அந்த மாகாணங்கள் தவிர மேல் மற்றும் வடமத்திய மாகாணங்களிலும் உள்ள பெருந்தோட்டத்துறை சார்ந்த சுகாதார நிலையங்களை அல்லது வைத்திய நிலையங்களைத் தேசிய சுகாதார முறைமைக்குக் கொண்டுவருவதற்கான ஏற்பாடுகளைச் செய்யவேண்டும் என்ற கோரிக்கையையும் முன்வைக்க வேண்டியவர்களாக இருக்கின்றோம்.

சபைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, இந்த வரவு செலவுத்திட்ட அறிக்கையோடு இன்று பரவலாகப் பேசப்படுகின்ற ஒரு விடயம்தான், கடந்த காலத்தில் பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினையைப் பாராளுமன்றத்துக்குக் கொண்டுவந்து, பாராளுமன்றத்தினூடாக அந்த முறைமையை மாற்றியமைப்பது தொடர்பான கதையாடல்கள். இவை இன்று இந்த வரவு செலவுத் திட்டத்தினூடாகத் தோட்டத் தொழிலாளர்களுக்கு எவ்வளவு பெற்றுக்கொடுக்கப் படப்போகின்றது என்கின்ற எதிர்பார்ப்பை உருவாக்கி இருக்கின்றன. இங்கு பேசுகின்ற பாராளுமன்ற உறுப்பினர்கள் எல்லோரும் அதனை முன்வைத்துத்தான் கருத்துத் தெரிவிக்கின்றார்கள் என்கின்ற அடிப்படையில், நாங்கள் தொடர்ச்சியாகப் பேசிப் பேசி, இந்த விடயத்தைப் பாராளுமன்றத்தில் ஒரு பேசு பொருளாக்கி இருக்கிறோம் என்பதை எமது பெரும் வெற்றியாகக் கருதுகிறோம். பெருந்தோட்டக் கம்பனிகளுக்கும் தொழிற்சங்கங்களுக்கும் இடையிலான பேச்சுவார்த்தை மட்டத்தில் அவர்களிடையே செய்துகொள்ளப்படுகின்ற கூட்டு ஒப்பந்த விடயமாக மாத்திரமே அது மட்டுப்படுத்தப்பட்டு வந்திருந்த நிலையில், இப்போது அரசாங்கம் இந்த விடயத்தில் தலையிடவேண்டும் என்று வலுப்படுத்துகின்ற பல்வேறு கோரிக்கைகளும் இந்தப் பாராளுமன்றத்தில் ஒலிப்பதைக் கேட்கக் கூடியதாக இருக்கின்றது. நான் பாராளுமன்ற உறுப்பினராக இந்த அவையில் அங்கம் வகித்த மூன்று வருட காலத்தில், இரண்டு தடவைகள் இந்தப் பெருந்தோட்டத்துறை மக்களின் சம்பள மீளாய்வு சம்பந்தமாக ஒத்திவைப்பு வேளைப் பிரேரணையை முன்வைத்திருக்கிறேன். எதிர்வரும் காலத்தில் இந்த முறைமையில் மாற்றம் செய்யவேண்டும் என்பது தொடர்பில் தனிநபர் பிரேரணை ஒன்றையும் கொண்டுவருவதற்குத் தயாராக இருக்கிறேன்.

கடந்த மாதம் மக்கள் விடுதலை முன்னணியின் தலைவர் அநுர குமார திஸாநாயக்க அவர்கள் இந்தப் பாராளுமன் றத்தில் ஒரு பிரேரணையை முன்வைத்தார். இதன்போதும் பலரும் பலவிதமான கருத்துக்களைச் சொல்லியிருந்தார்கள். கூட்டு ஒப்பந்த முறைமையெனத் தனியார்வசம் ஒப்படைத்துவிடப்பட்டிருக்கிற இந்தப் பெருந்தோட்ட மக்களின் சம்பள விடயமானது கண்டுகொள்ளப்படாமல் இருப்பதன் காரணமாக இதற்கு அரசாங்கத்தின் தலையீடுகள் அவசியம் என நாங்கள் தொடர்ச்சியாக வலியுறுத்தினோம்; அதுவே எங்களுடைய கோரிக்கையாக இருந்தது. அந்த அழுத்தத்தின் காரணமாக, கூட்டு ஒப்பந்தம் செய்கின்ற தரப்பு ஏதோ ஒரு விதத்தில் அரசாங்கத்தின் தலையீட்டோடு அதனை மேற்கொண்டபோது ஏற்படுத்திய அல்லது ஏற்படுத்தப்பட்ட பல்வேறு குளறுபடியான நிலைமைகளினூடாக, நாங்கள் அரசாங்கத்துடன் பேச்சுவார்த்தை நடாத்தி, அரசாங்கத்துக்குக் கொடுத்த அழுத்தத்தின் காரணமாக 50 ரூபாய் நாளாந்தக் கொடுப்பனவென்றை மானியமாகப் பெற்றுக்கொடுப்பதற்கு அரசாங்கம் உடன்பட்டது. நாங்கள் அந்தப் பேச்சுவார்த்தையில் கலந்துகொண்ட அடுத்த நாள், பெருந்தோட்டத்துறை அமைச்சர் நவீன் திஸாநாயக்க அவர்கள் அதனைப் பெற்றுக்கொடுக்கின்ற முறைமை சம்பந்தமாக, அதன் தொகை

சம்பந்தமாக, ஊடாக மாநாடு ஒன்றினூடாகத் தெரிவித்திருந்தார். அதன் பிரதிபலிப்பு இந்த வரவு செலவுத்திட்ட அறிக்கையிலே காணப்படுகின்றபோதிலும்கூட, 50 ரூபாய் என்ற அடையாளத்தைத் தேடிக்கொண்டவர்களால், அது எவ்வாறு இங்கு குறிப்பிடப்பட்டிருக்கின்றது என்பது சம்பந்தமாகப் புரிந்துகொள்வதற்கு வாய்ப்பு இல்லாமல் போயிருக்கிறது என்று நினைக்கின்றேன். எங்களைப் பொறுத்தவரைக்கும், நாளை மறுதினம் திங்கட்கிழமை மீண்டும் பெருந்தோட்டத்துறை அமைச்சர் நவீன் திஸாநாயக்க அவர்கள் இதனைப் பெற்றுக்கொடுக்கின்ற முறைமை சம்பந்தமாக மீண்டும் ஓர் ஊடக மாநாட்டிலோ அல்லது இந்தப் பாராளுமன்றத்திலோ கருத்துத் தெரிவிக்கக்கூடிய சந்தர்ப்பம் இருக்கிறது எனக் கருதுகின்றோம்.

இந்த வரவு செலவுத்திட்ட அறிக்கையின் 35ஆவது விடயத்தின்கீழ் சொல்லப்பட்டிருக்கின்ற, "பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினையைத் தீர்ப்பதற்குத் தேயிலைச் சபையுடனான கலந்துரையாடலுடன் உடனடியாகத் தீர்வைப் பெற்றுக்கொள்ளுதல்" என்பதன் அடிப்படையில், அது எதிர்வரும் 12ஆம் திகதி நடைபெறவிருக்கின்ற இந்த வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் வாசிப்பு மீதான வாக்கெடுப்புக்கு முன்பதாக நிகழ்த்தப்படவேண்டும் என்கின்ற வலியுறுத்தலை நேற்று முன்தினம் நாங்கள் கௌரவ பிரதமர் அவர்களைச் சந்தித்து வேண்டுகோளாக விடுத்திருக்கிறோம். அதன்படி, எதிர்வரும் திங்கட்கிழமை அல்லது செவ்வாய்க்கிழமை இது தொடர்பான தீர்க்கமான அறிவித்தலொன்று கிடைக்கப்பெறும். ஏற்கெனவே, அரசாங்கம் உறுதியளித்தவாறு 50 ரூபாய் நாளாந்தக் கொடுப்பனவைப் பெற்றுக்கொடுப்பதற்கு ஏற்பாடு செய்யும்! செய்ய வேண்டும்! என்ற கோரிக்கையை நாங்கள் முன்வைப்பதோடு, அது கிடைக்கும் என்ற உறுதிப்பாட்டையும் அரசாங்கம் ஏற்கெனவே அறிவித்தவாறு அதனை நிறைவேற்றும் என்பதையும் தெரிவித்துக்கொள்ள நாங்கள் கடமைப்பட்டு இருக்கிறோம். ஆயினும், இத்தோடு இந்தப் பிரச்சினை தீர்ந்துவிடப்போவதில்லை. நாங்கள் இது சம்பந்தமாகத் தொடர்ச்சியாகக் கவனத்திற்கொண்டிருப்போம்.

பெருந்தோட்டத்துறை முறைமை மாற்றம் செய்யப் படவேண்டுமாக இருந்தால் அது இந்தப் பாராளுமன்றத்தில் தெரிவுக் குழு ஒன்றினூடாக இடம்பெற வேண்டுமென்ற முன்மொழிவு, கடந்த மாதம் பாராளுமன்ற உறுப்பினர் கௌரவ சுனில் ஹந்துன்னெத்தி அவர்களால் முன்வைக்கப்பட்டது. நாங்கள் அத்தகைய செயற்பாட்டை முன்னெடுப்பதற்குத் தயாராக இருக்கின்றோம் என்ற அடிப்படையில் இந்தப் பாராளுமன்றத்தில் ஒரு தெரிவுக்குழு அமைக்கப்படுவதற்கான பேச்சுவார்த்தைகளை இப்போது நடாத்திக்கொண்டிருக்கின்றோம். அதேபோல, இது தனியே தோட்டத் தொழிலாளர்களின் பிரச்சினை மாத்திரமல்ல, இந்த நாட்டின் பிரதான பொருளாதாரத்துறை சார்ந்த பிரச்சினை என்கின்ற அடிப்படையில் நாங்கள் கொள்கை சார்ந்த தீர்மானம் எடுக்க வேண்டியிருக்கிறது. நான் இது தொடர்பாக தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சராக இருந்த (கலாநிதி) ஹர்ஷ த சில்வா அவர்களுடன் பேச்சுவார்த்தை நடாத்தி இருந்தேன். கொள்கை மட்ட தீர்மானமொன்றை மேற்கொண்டு, எவ்வாறு இந்த முறைமை மாற்றத்தில் எங்களது தலையீடுகளைச் செய்யலாம் என்பது தொடர்பாக நாங்கள் இப்போது சிந்தித்து வருகிறோம். எனவே, நாங்கள் இத்தகைய முறைமை மாற்றம் தொடர்பாக தொடர்ச்சியாக கவனத்திலே இருப்போம். இப்போது, ஒரு நாளைக்கு 50 ரூபாய் வீதம் சுமார் 1,200 மில்லியன் ரூபாய் மதிப்பீட்டினை அரசாங்கம் செய்திருக்கின்றது. எனவே, வரவு செலவுத் திட்டத்தினூடாக வருடாந்தம் 1,000 மில்லியனுக்கு மேற்பட்ட ஒரு தொகையை அரசாங்கம் சுமக்க நேரிடுகின்றபோதுதான் உண்மையிலேயே இதன் பாரதூரம் என்ன? இதில் எந்தளவுதூரம் தாங்கள் தலையீட்டு இந்த முறைமை மாற்றத்தை செய்ய வேண்டும் என்பது சம்பந்தமாக அரசாங்கம் சிந்திக்கத் தொடங்கியிருக்கின்றது. எனவே, நான் ஒரு விடயத்தை ஞாபகப்படுத்த விரும்புகின்றேன். இந்தப் பெருந்தோட்டத்துறை சம்பந்தமாகவும் பெருந்தோட்ட தொழிலாளர்களின் சம்பளம் தொடர்பாகவும் காலங்காலமாக இழுத்தடிக்கப்பட்டு வருகின்ற பிரச்சினையை இதுவரை காலமும் கண்டுகொள்ளாதிருந்த அரசாங்கம், இப்போது தாங்கள் தலையிட்டு ஒரு முறைமை மாற்றத்தினூடாக இதனை செய்ய வேண்டுமென்ற நிலைக்கு வந்திருக்கிறது. நாங்கள் அந்த நிலைமையைக் கொண்டு வந்திருக்கிறோம். எனவே, இந்தப் பெருந்தோட்டத்துறை சம்பள விடயத்தில், பெருந்தோட்டத்துறை முறைமைமாற்று விடயத்தில் அரசாங்கத்தையும் இணைத்துள்ளதன்மூலம் நாணயச் சுழற்சியில் இப்போது வெற்றி பெற்றிருக்கின்றோம். இனி அடுத்த இலக்கை அடைவதிலும் வெற்றி பெறவேண்டியதுதான் எமது குறிக்கோளாக இருக்கிறது. அதனையும் செய்து முடிக்க வேண்டிய தேவைப்பாடு எங்களுக்கு இருக்கிறது. நாங்கள் அந்த வெற்றியை அடையும்வரை தொடர்ச்சியாக அரசாங்கத்திற்குப் போதுமான அழுத்தத்தையும் அதனைச் செய்வதற்கான பொறிமுறையையும் இந்தப் பாராளுமன்றத்தினூடாக வழங்குவதற்குத் தயாராக இருக்கிறோம். அது தொடர்பாக எங்களுடைய முழுமையான பங்களிப்பினை செலுத்திக்கொண்டுதான் இருப்போம். அப்போது இந்தத் தொகையை வைத்துக்கொண்டு விமர்சன ரீதியாகப் பார்ப்பவர்கள் எங்களது முயற்சியும் அழுத்தமும் எதை இலக்காகக் கொண்டது என்பது பற்றிப் புரிந்துகொள்வார்கள். அந்த நாளில் இந்தப் பெருந்தோட்டத் துறை முறைமை மாற்றத்தினூடாக அடையப் போகின்ற மாற்றங்களைப் பற்றியும் மக்கள் புரிந்துகொள்வார்கள்.

இறுதியாக ஒரு முக்கியமான விடயத்தைச் சொல்ல வேண்டும். நாங்கள் முன்னெடுத்துவரும் பெருந்தோட்ட மக்களின் வீடமைப்பு விடயங்களுக்காகக் கடந்த 2017 - 2019 வரையான 3 வருட காலப்பகுதியின் நிதியீட்டமானது வரவு செலவுத் திட்டத்திலே தொடர்ச்சியாக அதிகரிக்கப்பட்டு வந்தது. 2017ஆம் ஆண்டு 3,084 மில்லியன் ஒதுக்கீடு செய்த அரசாங்கம் கடந்த ஆண்டு 3,463 மில்லியனை ஒதுக்கீடு செய்திருக்கின்ற அதே சந்தர்ப்பத்தில் இந்த 2019ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தில் 3,680 மில்லியன் தொகையை இந்த மக்களின் வீடமைப்பு விடயங்களுக்காக ஒதுக்கீடு செய்திருக்கின்றதென்பதையும் நான் இங்கே சுட்டிக்காட்ட விரும்புகிறேன். இதைத்தவிர, நாங்கள் இந்திய அரசாங்கத்தினூடாக 14,000 வீடுகளை அமைக்கின்ற வேலைத் திட்டங்களை மிக வேகமாக முன்னெடுத்து செல்கிறோம். இதுவரை நாங்கள் பெரிய கிராமங்கள் மூன்றைத் திறந்து வைத்திருக்கிறோம். நுவரெலியா, பதுளை மற்றும் ஏனைய மாவட்டங்களுக்கும் இதனை விஸ்தரித்துக் கொண்டிருக்கின்றோம். இப்பொழுது, இந்தியா அரசாங்கத்தினதும் இலங்கை அரசாங்கத்தினதும் பல்வேறு வீட்டுத் திட்டங்கள் மாத்தளை மாவட்டம் தொடக்கம் மாத்தறை மாவட்ட தெனியாய வரை நடைபெற்றுக்கொண்டிருக்கின்றன. அதனால், பல புதிய கிராமங்கள் உருவாக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. கௌரவ பிரதமர் அவர்களும் காணி அமைச்சர் அவர்களும் வருகை தந்து வீடமைப்புத் திட்டத்தை ஆரம்பித்து, கிராமங்களை உருவாக்கிக் கொடுத்தது மாத்திரமல்லாமல் அவர்கள் மூலமாக அந்த வீடுகள் அமைக்கின்ற காணிகளுக்கு முதன்முறையாக முழு

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

உரித்துடனான காணி உறுதிகளையும் நாங்கள் பெற்றுக் கொடுத்திருக்கின்றோம்.

இப்போது, இந்தச் சபையிலே பேசிய வணக்கத்துக்குரிய அதுரலியே ரதன தேரர் அவர்கள் இந்த மக்களுக்கு மாடி வீடு அமைப்பது சம்பந்தமாக இப்போதுதான் பேசுகிறார். இத்தனை வருட காலமாக இந்த நாட்டின் பொருளாதாரத்துக்குத் தங்களது உதிரத்தை வழங்கிய மக்களுக்கு அவர் முன்மொழிகின்ற முன்மொழிவைப் பார்க்கும்போது எனக்கு ஆச்சிரியமாக இருக்கின்றது. இருக்கின்ற 'லயன்'களுக்கு முன்பாகவே மாடி வீடுகளைக் கட்டுவதற்கு இடம் ஒதுக்க வேண்டுமாம். கௌரவ அத்துரலியே ரதன தேரர் அவர்கள் ஒரேயொரு முறையாவது ஒரு பாராளுமன்ற உறுப்பினராக அந்த 'லயன்'களுக்குச் செல்ல வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அந்த 'லயன்'களுக்குச் சென்று, அவர் எதிர்பார்க்கின்ற அந்தக் கட்டிடத்தையும் அந்தக் காணியையும் அந்த லயத்தின் எந்த மூலையிலிருந்து அவர் பெற்றுக் கொடுக்கப்போகிறார் என்பதைப் பார்க்க வேண்டும். எனவே, வாழ்க்கையில் ஒரு முறையேனும் அந்தப் பகுதிக்குச் சென்றிராதவர் இந்தப் பாராளுமன்றத்தில் பேசுகிறோம் என்பதற்காக யதார்த்தமில்லாத, நடைமுறைச் சாத்தியமில்லாத அநாவசியமான அல்லது பொருத்தமற்ற கருத்தைக் கூறுவதைத் தவிர்த்து, இந்த நாட்டின் மலையக மக்களுக்கும் காணியுரிமை இருக்கின்றது என்கின்ற அடிப்படையில், அவர்களுக்கு இப்போதாவது குறைந்தபட்சமாகக் கிடைக்கின்ற 7 பேர்ச்சஸ் காணியைப் பெற்றுக் கொடுப்பதைத் தடுப்பதற்கான எந்தவிதமான மாற்று யோசனைகளையும் முன்வைக்காது, அதனை எவ்வாறு அவர்களுக்குப் பெற்றுக் கொடுக்கலாம் என்பது பற்றியே சிந்திக்க வேண்டிய கடப்பாடிருக்கின்றது. அவர் ஓர் பாராளுமன்ற உறுப்பினராக மாத்திரமல்ல, ஒரு மதகுரு என்ற அடிப்படையில் மனிதாபிமான அடிப்படையில் சிந்திக்க வேண்டும். எந்த வகையிலும் ஒரு 'லயன்' வீட்டிற்கு முன்பாகவும் 7 பேர்ச் காணியைப் பெற்றுக் கொடுப்பதற்கான யதார்த்த சூழ்நிலை அங்கே கிடையாது.

இந்த நிலையில்தான் நாங்கள் தேயிலைக் காணிகளுக்கும் பாதிப்பில்லாத வகையிலே புதிய கிராமங்களை உருவாக்கி, அதில் ஒரு பகுதி மக்களைக் குடியேற்றிவிட்டு, அவர்கள் முன்னர் இருந்த லயன்களை அழித்து, அந்த இடத்திலும் மீண்டும் தனிவீடு அமைப்பதற்கான ஒரு திட்டத்தினை முன்மொழிந்து, குறைந்தபட்ச இட ஒதுக்கீட்டின் ஊடாக அந்த வேலைத்திட்டத்தைச் செய்வதற்கு நடவடிக்கைகளை முன்னெடுத்து வருகின்றோம். இப்போதைக்குப் பெருந்தோட்டப்பகுதியில் அமைந்திருக்கின்ற இரண்டு இலட்சம் ஹெக்டயர் நிலப்பரப்பில் இந்த வீடமைப்புத் திட்டத்திற்காகச் செலவிடக்கூடிய நிலம் என்பது 5 - 7 வீதமான அளவு மாத்திரம்தான் என்பதை அவருக்கு நினைவுபடுத்த விரும்புகின்றேன். எனவே, எஞ்சிய 93 வீதமான நிலப்பகுதிகள் அவ்வாறேதான் இருக்கப்போகின்றன. அதற்குள் வேண்டியளவிற்குப் பெருந்தோட்டத்துறையை நவீனமயப் படுத்துவதற்கோ அல்லது மாற்றுப் பயிரிடுகையை மேற்கொள்வதற்கோ அல்லது வனப்பாதுகாப்பு விடயங்களுக்கு அந்தக் காணிகளை ஒதுக்குவதற்கோ எங்களுக்கு எந்தவிதமான ஆட்சேபனையும் கிடையாது. ஆனால், அவற்றிற்காக இப்போதுதான் இந்த நாட்டில் பெருந்தோட்டப்பகுதி மக்களுக்குக் கிடைத்திருக்கின்ற குறைந்தபட்ச காணியுரிமையை இல்லாமலாக்குவதற்கான மாற்றுத் திட்டத்தை நான் வன்மையாக எதிர்க்கின்றேன். எனவே, யதார்த்தபூர்வமாக இந்தச் சபையிலே கருத்துக்கள் முன்வைக்கப்பட வேண்டும். முன்வைக்கப்படுகின்ற கருத்துக்கள் அந்த மக்களின் நலன்சார்ந்த அபிவிருத்திக்கான தாகவும் இந்த நாட்டின் பொருளாதாரத்தின் முக்கிய அம்சமாக இருக்கின்ற பெருந்தோட்டத்துறையை முன்னேற்றுவதற்கான ஒரு யோசனையாகவும் இருக்க வேண்டுமெனக் கேட்டுக்கொண்டு, கடந்த காலங்களிலே இந்த மக்கள் தொடர்பாக முன்வைக்கப்பட்டிருக்கின்ற பிரச்சினைகள், பொதுவாக இருக்கின்ற பிரச்சினைகள் எவ்வாறிருக்கின்றன என்பது சம்பந்தமாக இதே வரவு செலவுத் திட்டத்தில் இறுதியம்சத்தில் சொல்லப்பட்டிருக்கின்ற ஒரு விடயத்தைச் சுட்டிக்காட்டி எனது உரையை நிறைவுசெய்யலாமென நினைக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
අවසන් කරන්නම්.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதே வரவு செலவுத்திட்டத்தில் கடைசியாக நிதியமைச்சர் அவர்கள் கூறியிருக்கின்ற ஒரு விடயத்தை நான் இங்கே வாசித்துக் காட்ட நினைக்கின்றேன்; "கௌரவ சபாநாயகர் அவர்களே, எமது பொருளாதாரக் கொள்கைகள் காலத்திற்குக்காலம் குறுகியகால வழிகாட்டல்களின்மூலம் உருவாக்கப் பட்டுள்ளதுடன் எமது பொருளாதார முறைமையில் நிச்சயமற்ற தன்மையினையும் பெரும் குழப்ப நிலையினையும் ஏற்படுத்தியுள்ளது. நாட்டின் உண்மையான ஆற்றல்களின் பலனை அனுபவிப்பதையிட்டும் இவை தடுத்தன. உண்மையில் எமது மக்கள் ஒப்பந்தமொன்றில் கைச்சாத்திட்டுள்ளனர்" - இதுதான் இந்த வரவு செலவுத்திட்ட அறிக்கையோடு சம்பந்தமாக இந்த நாட்டின் பொருளாதார முறைமை குறித்து, பொருளாதாரக் கொள்கை குறித்து நிதி அமைச்சர் அவர்கள் சொல்லியிருக்கின்ற கருத்து. "ஒப்பந்தமொன்றில் கைச்சாத்திட்டுள்ளனர்" என அவர் பொதுவாகச் சொல்ல வருகின்ற கருத்து இந்த நாட்டு மக்கள் அவ்வாறு பிணைக்கப்பட்டுள்ளார்கள் என்று சொல்ல வந்தாலும்கூட, உண்மையிலேயே இந்த நாட்டின் மலையகப் பெருந்தோட்ட மக்களெனச் சொல்லப்படுபவர்கள் அரசாங்கத்துடன் அன்றித் தனியார் கம்பனிகளுடன் ஒப்பந்தம் செய்யப்பட்டு ஒப்படைக்கப்பட்டவர்களாக இருக்கின்றார்கள். இந்தப் பொருளாதார முறைமையும் முறைமையற்றதாக இருக்கின்றது என்கின்ற கூற்றும் நிதியமைச்சர் அவர்களினால் வெளிப்படுத்தப்பட்டிருக்கின்றது. எனவே, முறைமையற்ற ஒரு பொருளாதார முறைமையின்கீழ் அரசாங்கத்தின் பொறுப்பின்கீழும் இல்லாது தனியார் கம்பனி வசம் ஒப்பந்தம் மூலமாக ஒப்படைக்கப்பட்டிருக்கின்ற இந்த மக்களை அதிலிருந்து மீட்டெடுக்கும் வரை எங்களது அரசியற் செயற்பாடுகள் தொடரும். எந்த அரசாங்கமாயினும் அந்த அரசாங்கத்தோடு எங்களது போராட்டத்தைத் தொடர்ச்சியாக ஜனநாயக ரீதியாக இந்தப் பாராளுமன்றத்தினூடாக முன்னெடுத்து, எதிர்காலத்தில் எங்கள் உரிமைகளைத் தொடர்ச்சியாக வென்றெடுப்பதற்கு எங்களது அரசியல் குரலைத் தொடர்ச்சியாக ஒலிக்கச் செய்வோம் எனக்கூறிக்கொண்டு, இந்த இரண்டாம் வாசிப்பின் மீதான விவாதத்தில் எனக்கு உரையாற்ற வாய்ப்பளித்த உங்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වීරකුමාර දිසානායක මන්ත්‍රීතුමා.

[අ.භා.6.01]

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ගැන එක්සත් ජාතික පක්ෂයේ බොහෝ මැති ඇමතිවරුන් එතුමන්ලාගේ අදහස් දැක්වීමේදී ඉදිරිපත් කළ කරුණ තමයි, දැනට ඉදිරිපත් කර තිබෙන මේ අය වැය, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් යටතේ ඉදිරිපත් වන මංගල අය වැය කියලා.

2015න් පසුව අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ මෙතුමන්ලා තමයි කැබිනට් මණ්ඩලය නියෝජනය කරමින් ආණ්ඩු ක්‍රියාවලිය රට තුළ ඉදිරියට අරගෙන ආවේ. ඒ නිසා එක්සත් ජාතික පක්ෂයට පුළුවන්කමක් නැහැ, පසුගිය අය වැය තමන්ගේ නොවෙයි කියන්න. එහෙම නම් ප්‍රශ්නයක් මතු වෙනවා, ඒ අය වැය සහ පසුගිය කාලය තුළ රට පාලනය කළ ක්‍රමවේදය අසාර්ථකයි කියා එක්සත් ජාතික පක්ෂය පිළිගන්නවාද කියා. එහෙම නැත්නම්, මේ ගැන කියන්න අකමැති ස්වභාවයක් තිබෙනවාද? එහෙමත් නැත්නම්, පසුගිය 2015න් පසු වසර හතර තුළ රට ගමන් කළ; රට අරගෙන ආ ක්‍රමවේදයේ යම් අඩුවක් තිබෙනවාය කියා එක්සත් ජාතික පක්ෂයම පිළිගන්නනවාද කියන ප්‍රශ්නය ඇති වෙනවා. මොකද, කැබිනට් අමාත්‍ය ධුර ප්‍රමාණය වැඩි කර ගැනීමේ අවශ්‍යතාව එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට ඇති වූ වෙලාවේ, මීට මාස කිහිපයකට කලින් ජාතික ආණ්ඩු සංකල්පයක් නැවත හදන්න උත්සාහ කළා. ඊට මාස දෙක, තුනකට පසුව අය වැයට එනකොට නැවත ප්‍රකාශ කරනවා, "මේ අය වැය, අපේ මංගල අය වැය" කියලා.

අනෙක් පැත්තෙන් මම දැකපු ප්‍රධානම දේ තමයි, මේ අය වැය සාකච්ඡාවේ වැඩිපුරම "වැසිකිළි" යන වචනය කියැවුණු බව. මේ අය වැයේ වැසිකිළි කියන වචනය තමයි වැඩිපුර පාවිච්චි වුණේ; වැඩිපුර කථා බහ කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමාට හිතාගන්න පුළුවන් මේ අය වැය ලේඛනයයි, රටක් විධියට අපි සිටින තැනයි කොතැනද කියලා. මේ, 1960 දශකය, 70 දශකය, 80 දශකය වාගේ කථා කරන්න ඕනෑ මාතෘකාවක්. එතැනින් මෙහා අපි කවුරු රට පාලනය කළත් හැමෝම වග කිව යුතු තත්ත්වයක් රටේ උද්ගත වෙලා තිබෙනවා. ඒක මේ අය වැයේ විශේෂ මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. එසේ හෝ මෙය මාතෘකාවක් බවට පත් වීම ගැන අපි සතුටු වෙනවා. මොකද, එහෙම අඩුපාඩුකම් සහිතව ජීවත් වන මිනිස්සු අපේ ගම්වලත් දිස්ත්‍රික්කවලත් ඉන්නවා. ඒ ගැන අවධානය යොමු වීම වැදගත්.

ඊළඟට මෙම අය වැයේ සඳහන් ප්‍රධාන කරුණු ලෙස අපි දකිනවා,"Enterprise Sri Lanka", සිහින මාළිගා, උපාධිධාරීන්ට දෙන ණය යෝජනා ක්‍රම ආදිය. අය වැයකින් කථා කරනවාට වඩා ප්‍රායෝගිකව ක්‍රියාවට නඟන්නට පුළුවන් වුණත් අය වැය ලේඛනයේ සඳහන් කර ඒ ගැන කථා කරපු නිසා මේ ගැන ගරු මුදල් ඇමතිතුමාගේ සහ රජයේ අවධානය යොමු කරවන්නට කැමතියි. මෙවැනි යෝජනා ක්‍රම ගැන - "Enterprise Sri Lanka" ප්‍රායෝගිකව ක්‍රියාවට නඟද්දී මේ ගැන සමහරවිට මුදල් ඇමතිතුමාගේ හෝ රජයේ අවධානය යොමු වෙලා තිබෙනවාද මම දන්නේ නැහැ- අපිත් ආණ්ඩුවේ ඉන්න කාලයේ කථා කළා; දැනුත් කථා කරනවා. මේවා ක්‍රියාවට නඟන්න ගියාම විශේෂයෙන්ම බැංකු ක්‍රියාවලිය ඇතුළේ විශාල ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. තරුණයන්ට දෙන ණය යෝජනා ක්‍රමය වෙන්නට පුළුවන්. අලුත විවාහ වූ අයට දෙන නිවාස ණය යෝජනා ක්‍රමය වෙන්නට පුළුවන්. යෝජනා ක්‍රම අපට කොළවල ඕනෑතරම් ලියන්නට පුළුවන්කම තිබෙනවා; මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඕනෑතරම් කථා කරන්නට පුළුවන්කම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මාත් දන්නවා, අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හුඟක් ඉන්නේ බලපත්‍ර ඉඩම් තිබෙන අයයි. මේ ඉඩම් බලපත්‍රයක් තිබෙන කෙනෙකුට බැංකුවකට ගිහින් ණයක් ගන්න පුළුවන්ද? පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් එහෙමයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේත් එහෙමයි. වයඹ පළාතෙත් එහෙමයි. උතුරු පළාතෙත් එහෙමයි. නැඟෙනහිරත් එහෙමයි. ඉඩම් ඔප්පු හැමෝටම නැහැ. හුඟක් දරිද්‍රතාවය -දුප්පත්කම- තිබෙන්නේ අපේ ඈත ගම්වල ඉන්න මිනිසුන්ට. අනුරාධපුර නගරයේ තිබෙන කිසිම තැනකට ඔප්පුවක් නැහැ. අපිට ඔප්පු දෙන්න බැරි වෙලා තිබෙනවා. නමුත් බැංකුවකට ගියාම ඉල්ලන්නේ මොකක්ද? ඔප්පුව. බැංකුවත් සුරක්ෂිතතාවය බලනවා. පුළුවන් නම් මේ අය වැය විවාදය යන මාසය තුළ බැංකුවලට කියන්න කොන්දේසි ටික දාලා advertisement එකක් දාන්නය කියා. ලබන සතියේ දාන්න කියන්න, මේවා කරන්න පුළුවන්ද බැරිද කියා. මම අභියෝග කරනවා, මේවා කරන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව වැනි රාජ්‍ය බැංකුවලින් නම්, ඒ බැංකුවල කොන්දේසි ටික දාලා පත්තරයක පිටුවක advertisement එකක් දාන්නය කියා. එතකොට බලාගන්න පුළුවන් ප්‍රායෝගිකව මේක ඇත්තද නැත්තද කියා. මහ බැංකුව නැත්නම් කොහේ හෝ ආයතනයක්, රජය වග කිව්වාට මේ ණය දෙන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ කථා කළාට බැංකුව ණය දෙන්නේ නැහැ. බැංකුවට දෙන්න බැහැ. ඒකට බැංකුවට වග කියන්න බැහැ. බැංකුවක් ඇතුළේ නීතිරීති තිබෙනවා. එම නිසා, මිනිසුන්ගේ අවශ්‍යතාත් එක්ක අපි සෙල්ලම් කරන්න නරකයි. අවශ්‍යතාවය තිබෙනවා. කර්මාන්තයක් කරන කෙනෙකුට ණය ගන්න ඕනෑකම තිබෙනවා; ණය ගන්න විධියක් නැහැ. මේ යෝජනාව හරි. යෝජනාව සම්බන්ධව ප්‍රශ්නයක් නැහැ. හැබැයි ප්‍රායෝගිකව ක්‍රියාවට නඟන්න ගියාම කවුද ඒකට වග කියන්නේ? ගමේ ඉන්න ව්‍යාපාරයක් ආරම්භ කරන්න සිහිනයක් දකින අහිංසක මනුෂ්‍යයාට බැහැ; සිහිනයක් දකින ගෙදර ඉන්න අහිංසක තරුණ තරුණියන්ට බැහැ බැංකුවකට ගිහින් තමන්ගේ අවශ්‍යතාත් එක්ක හැප්පෙන්න. අපට පාර්ලිමේන්තුවේ කියා තිබෙනවා; මුදල් ඇමතිතුමා කියා තිබෙනවා; අගමැතිතුමා කියා තිබෙනවා; අසවල් ඇමතිවරයා කියා තිබෙනවා; අපේ මන්ත්‍රීතුමා අපට කිව්වා කියලා බැංකුවට ගිහින් කිව්වාට ණය ලැබෙන්නේ නැහැ. " ඔයා ගිහින් ඔයගොල්ලන්ගේ මන්ත්‍රීතුමාත් එක්ක කථා කර ගන්න. ඔයා ගිහින් ඔයාගේ ඇමතිතුමාත් එක්ක කථා කර ගන්න. බැංකුවට ඒක අදාළ නැහැ" කියා කියනවා. ඕකයි බැංකුව දෙන උත්තරය. බැංකුව ඇතුළේ තිබෙන්නේ මේ ප්‍රායෝගික යථාර්ථය නම් අපි මේ කථා කරන ඒවා වැඩක් තිබෙනවාද? දැන් දවස් කීයක් මේ ගැන කථා කළාද? මේ අච්චු ගසා තිබෙන කොළ, මේ අච්චු ගසා තිබෙන ලේඛන මේවායින් ඇති වැඩක් තිබෙනවාද? මොකක්ද මේකේ යථාර්ථය? මේ යෝජනායි මහජනයාගේ අවශ්‍යතායි බැංකු ක්‍රියාවලියයි අතර තිබෙන්නේ අහසයි පොළොවයි වාගේ පරතරයක්.

ඒක තමයි මෙතැන තිබෙන ඇත්ත. අද රට දියුණු කරන්න ආණ්ඩුව කථා කරනවා. නමුත් මම කියන්නේ රට දියුණු කරන්න අපි කොච්චර ණය ගත්තත් බැහැ කියලායි. අපි ලෝකයට කොපමණ ණය වුණත් රට දියුණු වෙන්නේ නැහැ. ලෝකයට ණය වෙලා දියුණු කරපු රටකුත් නැහැ. ඒ සඳහා රටේ ක්‍රියාවලිය හරියට සකස් විය යුතුව තිබෙනවා. සමෘද්ධි සහනාධාරය ලක්ෂ හයකට නොවෙයි, ලක්ෂ විසිපහකට දුන්නත් රට දියුණු වෙන්නේ

[ගරු වීරකුමාර දිසානායක මහතා]

නැහැ. ඒකෙන් රට දියුණු කරන්න බැහැ. දෙකෝටියක් වන ජනගහනයේ සියලුදෙනාට සහනාධාර දුන්නත් රට දියුණු වෙන්නේ නැහැ. රට දියුණු කරන්න රට දුවන පීල්ල වෙනස් කරන්න ඕනෑ. අපි පසුගිය අවුරුදු පහේ අය වැය ගත්තොත්, ඊට කලින් අය වැය ගත්තොත්, ඒවා හරියට කෝච්චිය ස්ටේෂන්වල නවත්ත, නවත්ත යනවා වාගේ තමයි. එකම දේ තමයි සිද්ධ වෙන්නේ. ස්ටේෂන් මාස්ටර් කිව්වාම, එහෙම නැත්නම් සිග්නල් එක දුන්නාම කෝච්චිය යනවා. හැබැයි, හැම දාම එකම කෝච්චිය තමයි යන්නේ. මේ අය වැයත් එහෙමයි. මීට කලින් අය වැයත් එහෙමයි. මේ අය වැයේ කිසිම තැනක රටේ දියුණුව ඉලක්ක කරපු බවක් අපි දැක්කේ නැහැ.

මේ අය වැයේ ජනප්‍රිය වචන තිබෙනවා. "සිහින මාළිගා", "Enterprise Sri Lanka", ඒ වචන ඔක්කොම ජනප්‍රියයි. අදහසත් හොඳයි. හැබැයි, ප්‍රායෝගිකව ක්‍රියාවට නඟන්න බැහැ.

මේ අය වැයෙන් මහජනතාවගේ වැසිකිළි ප්‍රශ්නය -මිනිසුන්ට වැසිකිළිත් නැහැ කියන එක- ප්‍රධාන මාතෘකාවක් කර ගත්තා. ඉතින්, අපි රටක් විධියට කනගාටු වෙන්න ඕනෑ. අපි රටක් විධියට අඬන්න ඕනෑ; පාර්ලිමේන්තුව විධියට අඬන්න ඕනෑ. මිනිසුන්ට වැසිකිළි නැහැ කියලා අපි හූහක් කෑගහනවා. ඊළඟ අවුරුද්දේ කවුරු ආණ්ඩු කළත්, එතකොට මේ ගණන මීට වඩා වැඩි වෙනවා මිස, වඩා අඩු වෙන්නේ නැහැ. අද මෙතැන කථා කරලා ගියාට රට හදන වැඩසටහනක් නැහැ; ක්‍රියාවලියක් නැහැ. හැබැයි, ආණ්ඩුවක් මේවා දැකලා හරියට ක්‍රියාවට නඟනවා නම්, පළාත් සභාවලට දෙන මුදල්වලින්, ප්‍රාදේශීය සභාවලට දෙන මුදල්වලින් මේ වැඩ කර ගන්න පුළුවන්. මේ ප්‍රශ්න මේ විධියට තිබෙනවා කියලා මේ රටේ පෞද්ගලික අංශයේ ආයතන දැන ගත්තා නම්, ආයෝජනය කරලා ගම්වල ඒ වැඩ කරනවා, ඕනෑතරම්. පෞද්ගලික ආයෝජකයන්ට භාර දුන්නොත් ඔවුන් ඇවිත් මේ වැඩ කරනවා. කොහේ හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක පවුල් 400කට වැසිකිළි 400ක් හදලා දෙන්න කිව්වොත්, ඒක භාර ගන්න මේ රටේ මිනිසුන් 400ක් ඉන්න බව මම දන්නවා. හැබැයි, අපට එවැනි ක්‍රමවේදයක් නැහැ. අපි හදලා දෙන්නම් කියලා මිනිසුන් 400ක් වැඩේ භාර ගනියි. ගංවතුර ගැලුවාම සහනාධාර දෙනවා වාගේ ඒකත් කරලා දෙයි. හැබැයි, ඒ සම්බන්ධ ක්‍රමවේදයක්, සම්බන්ධීකරණයක්, අවශ්‍යතා ගැන සාකච්ඡාවක් නැහැ.

මේ ලේඛනයෙන් මේ රටේ තිබෙන සල්ලි ටිකයි, ගන්න ණය ටිකයි, ඒවා වියදම් කර ගන්න ආකාරයයි ගැන මේ පාර්ලිමේන්තුවේ නීත්‍යානුකූලභාවය හදා ගන්න එක විතරයි කරන්නේ. මේ ලේඛනයට මෙතැනින් නීත්‍යානුකූල බවක් හදා ගන්නවා. එතැනින් එහාට මොනවාද වෙන්නේ කියලා කවුරුවත් දන්නේ නැහැ. අමාත්‍යාංශයේ ඉන්න ඇමති දන්නේ නැහැ, අමාත්‍යාංශයේ තිබෙන සල්ලි ටිකට මොකද වෙන්නේ කියලා. කොහේ හරි ආයතනයක සභාපතිවරයෙක් ඒ ආයතනයේ මුදල් ටික උඩදාගෙන වියදම් කරනවා. ඇමති දන්නේ නැහැ ඒ ව්‍යාපෘතිය මොකක්ද කියලා. ලේකම් කෙනෙක් ළඟට ගියාම, ලේකම් කියනවා, "සර්, අර නීතිය යටතේ මේක කරන්න බැහැ. මේ නීතිය යටතේ මේක කරන්න බැහැ. මේ නීතිය යටතේ මේක කරන්න බැහැ" කියලා. වියදම් කරන්න ගියාම නීති පොත් 100ක් විතර ගෙනෙනවා; රට හිර වෙලා. මේ තමයි ඇත්ත යථාර්ථය. ඒක පසුගිය අය වැයටත් එහෙමයි. 2015ට පස්සේ ආපු අය වැයටත් එහෙමයි. 2015ට කලින් ආපු අය වැයටත් එහෙමයි. රට දුවන්නේ නිසි ක්‍රමවේදයකට නොවෙයි. මේ තත්ත්වය වෙනස් නොකර රටට ඉදිරියට යන්න බැහැ. මේක තමයි ඇත්ත තත්ත්වය. මේක තේරුම් නොගෙන කටයුතු කරන්න බැහැ.

දැන් බලන්න, අපි කර්මාන්තපුර ගැන කථා කරනවා. දැන් කර්මාන්තපුර කීයක් වැහිලාද? අග්‍රාමාත්‍යතුමාත් පසුගිය කාලයේ ගිහින් අලුතින් කර්මාන්තපුරයක් පටන් ගත්තා. අද රට වටේ කර්මාන්තපුර කීයක් තිබෙනවාද වැහිලා? ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ ඉඳලා හදන්න ගත්ත ඒවා තිබෙනවා. හැම තැනම ඒ ගොඩනැඟිලි තිබෙනවා. ඒක ඔබතුමාත් දන්නවා. අපේ දිස්ත්‍රික්කයේ එක එක අමාත්‍යාංශවලට අයිති ඒවා තිබෙනවා. IDB එකේ ඒවා තිබෙනවා; කර්මාන්ත අමාත්‍යාංශයේ ඒවා තිබෙනවා. මේ ඔක්කොම වැහිලා. ඒවාට යන්න පාරක් නැහැ; ලයිට් එකක් නැහැ. අපි මෙච්චර ආර්ථිකය ඉහළට ගෙනැත් තියනවා කියලා හඳුපුවා පැත්තක තිබියදී, අද කුඩා කර්මාන්තකරුවන්, [බාධා කිරීමක්] ඔව්, මම හිටියා. ඒක තමයි මම මේ කියන්නේ. ඒ කාලේත් එහෙමයි. මේ කාලේත් එහෙමයි. ඔබතුමා මේ නීති-රීති පද්ධතියත් එක්ක අධ්‍යයනය කරලා බලන්න. මේක ආණ්ඩුවල ප්‍රශ්නයක් නොවෙයි. මේ රටේ තිබෙන ක්‍රියාවලිය ගලාගෙන යෑමේ ප්‍රශ්නය තමයි මේ තිබෙන්නේ. ඒක තේරුම් නොගෙන කාගේවත් කනට ගහලා වැඩක් නැහැ. ඔබතුමන්ලා, අපි ඔක්කෝම එකතු වෙලා මේකට වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. නැත්නම් ඉස්සරහට යන්න බැහැ. මේ අපි හැමෝම උගුලක හිර කර ගෙන ඉන්නේ රට. මම කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ හිටපු නිසා දන්නවා, ඒ යටතේ තිබුණු ආයතන, ඒ ආණ්ඩුව යටතේත් ගොඩගන්න බැරි වුණා.

ඊළඟට, ඇඟලුම් ක්ෂේත්‍රය. අද හැන්ඩ්ලූම්වලට ලොකු ඉල්ලුමක් තිබෙනවා. අද වන විට ගම්වල තිබෙන ජේෂ කර්මාන්ත ඔක්කොම වැහිලා. ඒ සේරම වැහිලා තිබෙන්නේ. අද අපි රටේ ආර්ථිකය දියුණු කරන්න ඕනෑ කියලා කථා කරනවා. මෙන්න මේ වාගේ කර්මාන්තවලට සල්ලි යොදවලා, ගම්වල මිනිසුන්ට පුහුණුව දීලා, මේ ක්ෂේත්‍රය අපේ අතට ගන්නවා නම් කර්මාන්ත ඉස්සරහට ගන්න පුළුවන්කම තිබෙනවා. අද කුඩා වී මෝල් ටික ඔක්කොම වැහිලා. මූලාසනාරූඪ ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ, අපේ දිස්ත්‍රික්කයේ මිනිසුන්ට අද ඉස්සරහට යන්න බැහැ. බැංකුවට ගිහිල්ලා ලෝන් එකක් ගන්න බැහැ. ඒ තරම් බැංකු පොලී අනුපාතය ඉහළ ගිහිල්ලා. මේවා තමයි මේ කර්මාන්තවලට තිබෙන ප්‍රධාන ප්‍රශ්න. ඒ නිසා බැංකු පොලී අනුපාත ටික අඩු කරලා දෙන්න. අය වැයෙන් වෙන මොනවත් කරන්න ඕනෑ නැහැ, මේ පොලී අනුපාත ටික අඩු කරන්න. මිනිසුන් ගෙවල් හදා ගනියි. වෙන ණය දෙන්න ඕනෑ නැහැ, මිනිසුන් කර්මාන්ත පටන් ගනියි, රටේ ආර්ථිකය දුවයි. ඒකට මහ ලොකු තීරණයක් ගන්න ඕනෑ නැහැ. පුළුවන් නම්, මේ අය වැයෙන් බැංකු පොලී අනුපාත ටික පහළ දමන ක්‍රමවේදයක් හදලා දෙන්න, වෙන මොකුත් කරන්න ඕනෑ නැහැ. මේ ඔක්කොම බොරු කයිවාරු. වෙන මොකුත් කරන්න ඕනෑ නැහැ, බැංකු පොලී අනුපාත අඩු කරලා දෙන්න. එතකොට කර්මාන්තත් නැඟිටිනවා, සියලු දේවල් ටික එකට නැඟිටිනවා; සියලු ව්‍යවසාය නැඟිටිනවා. ඒ සඳහා එක වැඩයි කරන්න ඕනෑ. පුළුවන් නම් මේ ලේඛන ඔක්කොම ටික පැත්තකට දාලා, බැංකු පොලී අනුපාත පහළට දමන්න. බැංකු පොලී අනුපාත පහළට දැම්මොත් මේ සියලු දේ මිනිසුන් කර ගනියි. අපට කරන්න දෙයක් ඉතිරි වන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසන්.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. ඒ වාගේම, විසිතුරු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත, උළු මෝල්,

මැටි කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත ඇතුළු සියලු කර්මාන්ත අද වැහිලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව එකම එක ගැටලුවක් තිබෙනවා. ඒ තමයි, අපේ රටේ හරි නීති රීති පද්ධතියක් නැතිකම. එම නිසා මුලින්ම අපේ රටට හොඳ නීති රීති පද්ධතියක් ඕනෑ. මේ කුඩා ව්‍යාපාරිකයා සොයා ගෙන එක්කෝ කම්කරු ආයතනවලින් යනවා. නැත්නම්, ටැක්ස් නිලධාරින් යනවා. ඒ විධියට මේ නීති රීති පද්ධතිවලින් අපේ කුඩා ව්‍යාපාරිකයා හිර කරලා තිබෙන්නේ. ඒ ව්‍යාපාරිකයා ගැට ගහලා තිබෙන්නේ; බැඳලා තිබෙන්නේ. ඒ නිසා මේ නීති රීති පද්ධති ක්‍රියාත්මක වෙනකම් කවදාවත් මේ රට ගොඩගන්න බැහැ. එක මිනිහෙක් ව්‍යාපාරයක් පටන් ගන්නකොට නිලධාරින් 10 දෙනෙක් විතර බලන්න යනවා. ඒ 10 දෙනාම ගිහිල්ලා මේ ව්‍යාපාරිකයාට ගහනවා. එහෙම වෙනකොට මේ ව්‍යාපාරිකයාට ඉස්සරහට ගන්න බැහැ. ඒ තරමටම මේ පද්ධති හිර කරලා තිබෙන්නේ. එම නිසා ආර්ථිකය හදනවා නම්, මේ නීති රීති ටික ලිහිල් කරලා, බැංකු පොලී අනුපාත පහළට දමන්න. එතකොට රටේ ආර්ථිකය නැඟිටිනවා. ඒකට අදාළ ක්‍රමවේදයක් හදන්න. එච්චරයි කරන්න තිබෙන්නේ. මිනිසුන්ට සහනාධාර අවශ්‍ය නැහැ, නැඟිටින්න අවශ්‍ය කරන අත්වැල දෙන්න, අත දෙන්න කියන යෝජනාව කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 14ක පමණ කාලයක් තිබෙනවා.

[අ.භා. 6.16]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අය වැය, රටේ ජනතාවට විශාල බලාපොරොත්තු ගොන්නක් ලබා දීපු, ඔවුන් ඉදිරිපිට විශාල සිහින මාළිගා ඉදි කරපු අය වැයක් බව බොහොම කනස්සල්ලෙන් වුණත් කියන්න වෙනවා. වර්තමාන ආණ්ඩුව අවසාන වතාවට ඉදිරිපත් කරපු මේ අය වැය පිළිබඳව අධ්‍යයනය කරගෙන යද්දී, සොයා බලාගෙන යද්දී, මේ අය වැය සිහින සාප්පුවක් විතරයි කියන එකත් මම කියනවා. අපේ ගීතයකින් කියැවෙනවා, "හීන තිබුණට කෝටියක්, අතේ නැහැ එක රුපියලක්" කියලා. ඒ තත්ත්වයට අද ආණ්ඩුව පත් වෙලා, දැන් සිහින දෙමින් ඉන්නවා. අපට මතකයි නේ, අගමැතිතුමා ආණ්ඩුව ගන්න කලින් කාර් ෆැක්ටරි දමන්න තමයි කථා කළේ. වොක්ස් වැගන් කර්මාන්තශාලාව කුලියාපිටියේ දමන්න තමයි කථා කළේ. හැබැයි, අද වෙද්දී ආණ්ඩුව ඒක "වික්ටෝරියා සීක්‍රට්" ජංගිය මහන තැනට ගෙනැල්ලා තිබෙනවා. අපි විපක්ෂයක් විධියටම මේ චෝදනා කරනවා නොවෙයි. මේ හැම දෙයින්ම ආණ්ඩුව උත්සාහ කරන්නේ, තමුන්ගේ ගජ මිතුරන් ටික රැක ගන්නයි. තමුන්ගේ ගජ මිතුරන් ටික ආරක්ෂා කර ගන්නයි. තමුන්ගේ පැළැන්තිය බලා ගන්න, රැක ගන්නයි. මේ ගෙනාපු යෝජනා ගොන්නේ බදු වශයෙන් එකතු කරන ආදායම හැරුණාම, මේ මහ පොළොවේ පෙන්වන්න පුළුවන් වැඩ පිළිවෙළක් නැහැ. මේ මහ පොළොවට දැනෙන යථාර්ථයක් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් නැහැ. අපි "ගම්පෙරළිය" වැඩසටහන ගනිමු කෝ. දැන් "ගම්පෙරළිය" පටන් අරගෙන, මුදල් වියදම් කරන්න ව්‍යාපෘති ටික ගමට එවනවා.

ඒ ව්‍යාපෘති ගමට එවපුවාම, එක ග්‍රාම නිලධාරි වසමකට එහෙම නැත්නම් එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ලබා දෙන මුදල මිලියන 100යි කියනවා; 200යි කියනවා; 300යි කියනවා. හැබැයි, මේ තුළ ග්‍රාමීය ආර්ථිකය ගොඩනඟන්න වැඩ පිළිවෙළක් නැහැ. ඉබාගාතේ සල්ලි බෙදා ගෙන යනවා මිසක්, ඉබාගාතේ කොන්ත්‍රාත්කාරයෝ බිහිකර ගෙන යනවා මිසක්, ඉබාගාතේ අනවශ්‍ය දේවල්වලට සල්ලි දෙනවා මිසක් වෙනත් වැඩ පිළිවෙළක් නැහැ. "ගම් පෙරළිය" යෝජනා කරන ඔබ තමුන්නාන්සේලා මේ අය වැයේ කිසිම තැනක පළාත් පාලන ආයතන වෙනුවෙන් මුදල් වෙන් කරලා නැහැ. පළාත් පාලන ආයතනවල බලය තිබෙන්නේ සියයට 75කට වැඩිය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණටයි. ආණ්ඩුවට නැති පළාත් පාලන ආයතනවලට මුදල් වෙන් කරන්නේ නැහැ. මේ බලය බෙදලා දෙන්න යන්නේ ඇයි? බලය බෙදලා දෙන්න කථා කරන ඔබ තමුන්නාන්සේලා උතුරට එකක් කියනවා; දකුණට වෙන දෙයක් කරනවා.

ඊයේ - පෙරේදා උතුරු පළාත් සභාවේ හිටපු මහ ඇමතිට, හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන්ට, උතුරේ, නැඟෙනහිර පළාත් සභාවන්හි හිටපු විපක්ෂ නායකතුමන්ලාට සදාකාලික වරප්‍රසාද දීලා තිබෙනවා. ඇයි? මොකක්ද හේතුව? දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන් 16දෙනා, එහෙම නැත්නම් 15දෙනා ඕනෑ වෙනවා ඔබතුමන්ලාට මේ අය වැය ගොඩ දමා ගන්න. ඔබතුමන්ලා හැම වතාවකම; හැම අය වැයකින්ම දරුණු විධියට තරුණයා රැවටුවා. නංගි, මල්ලි බුලත් විට කන්න එපා, චුයිංගම් දෙන්නම් කිව්වා. ඒ වාගේ රටකට ගෙන යන්නම් කිව්වා. ටැබ්ලට් එකක් පළඳවන්නම් කිව්වා. Free Wi-Fi දෙන්නම් කිව්වා. පුංචි කාර් එකක් දෙන්නම් කිව්වා. දැන් සිහින මාළිගා ගෙනැල්ලා තිබෙනවා. ඒ, "Home Sweet Home". කසාද බඳින්න, එතකොට ලක්ෂ 100ක් දෙනවා. ලක්ෂ 100 අය කරගන්නේ කොහොමද? ලක්ෂ 100 අයකර ගන්න රජයේ වැඩ පිළිවෙළ මොකක්ද? පොලිය සියයට හයයි කියනවා. ලක්ෂ 100ක් නැතුව අද ගෙයක් හදන්න බැහැ. කාමර හතරක, පහක හොඳ තත්ත්වයේ ගෙයක් හදනවා නම්, අඩුම තරමේ ලක්ෂ 75ක්, 100ක් ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලුම අමුද්‍රව්‍යවල මිල වැඩි වෙලා. හැබැයි, මම දන්නා විධියට අවුරුදු 25ක් තිස්සේ ගෙව්වත්, ලක්ෂ 100ක් ගන්න පුද්ගලයා ණය වාරිකය සහ පොලියත් සමඟ ගෙවද්දී මාසයකට රුපියල් 75,000ක්, 80,000ක් ගෙවන්න වෙනවා. එවැනි මුදලක් ගෙවන්න පුළුවන් මට්ටමේ වැටුපක් ලබන තරුණයෙක් අද රටේ ඉන්නවාද? මේ හැම සිහිනයකම තරුණයන් අතරමං කරන්නේ ඇයි? තරුණ ඡන්දදායකයෝ, තරුණ ව්‍යවසායකයෝ, තරුණ ප්‍රජාව මේ විධියට අතරමං කරන්නේ ඇයි? මේ රටේ ව්‍යවසායකත්වයට, එහෙම නැත්නම් රටේ පාලනයට, එහෙම නැත්නම් රටේ අනාගතයට යන තරුණයාව මේ විධියට අතරමං කරන්නේ ඇයි? මේ වාගේ පොරොන්දු ගණනාවක් දීලා ජනගත කරන්න හදන්නේ මොකක්ද?

පසු ගිය අය වැය තුළ "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩ සටහන තිබුණා. උපාධිධාරීන්ට තමන්ගේම කියලා ව්‍යාපාරයක් පටන් ගන්න ණය පහසුකම් දෙනවා කිව්වා. ඒ හින්දා රජයේ රැකියා පස්සේ එන්නේ එපා කිව්වා. රජයේ රැකියා හොයාගෙන එන්න එපා කිව්වා. රජයේ රැකියාවට වැඩිය තමන්ගේ අධ්‍යාපන මට්ටමින් සහ තමන්ගේ හැකියාවෙන් තමන්ගේම ව්‍යාපාරයක් කරන්න කිව්වා. ඒ සඳහා ණයක් ලබා දෙනවා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ -ජනාධිපතිතුමාගේ දිස්ත්‍රික්කයේ - උපාධිධාරීන් කී දෙනෙකුට මේ මුදල ලබා දීලා තිබෙනවාද කියලා මම අහනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ නම් දහදෙනාටත් අඩුයි. ඒ නිසා, තරුණයාව මුලාවේ දමන්න එපා. තරුණයාව ඒ මුලාවේ දමලා; උපාධිධාරියාව ඒ මුලාවේ දමලා, මේ වෙද්දී රටේ උපාධිධාරීන් 60,000ක්, 75,000ක් රැකියා පෝලිමේ ඉන්නවා.

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

ඔබතුමන්ලා දන්නවා, සංවර්ධනයට අවශ්‍ය කරන ඔළු ගෙඩි ටික, රටේ දෙයක් කරන්න පුළුවන් හැකියාව තිබෙන උගත් පිරිස අද පෝලිම් ගස්සවා තිබෙනවාය කියලා. ඒ ගොල්ලන්ට රැකියා නිර්මාණය වෙලා නැහැ. රැකියා ලක්ෂ 10ක් දෙන්නයි ආවේ. රැකියා ලක්ෂ 10ක් දෙන්න ආපු තමුන්නාන්සේලා අද වෙද්දී ග්‍රාමීය රැකියා, සාමාන්‍ය තත්ත්වයේ රැකියා, රටේ ආයතනවල රැකියා, එහෙම නැත්නම් පෞද්ගලික අංශයේ රැකියා ලක්ෂ 5කට වඩා නැති කරලා තිබෙනවා. අද ආයෝජකයෝ රට දමලා යනවා. රජයේ රැකියා දෙන්න ඔබතුමන්ලාට වැඩ පිළිවෙළක් නැති බව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව තුළින් අපි දකිනවා.

රජය සතු වාණිජ ව්‍යවසායකයන්ගේ ඵලදායීත්වය ගැන සොයා බලද්දී විශාල ලාභයක් ලැබූ රක්ෂණ සංස්ථාවේ ආදායම මේ වෙද්දී රුපියල් මිලියන 3,000ක් දක්වා අඩුවෙලා තිබෙනවා. රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කරලා තිබියදී මහින්ද රාජපක්ෂ මහත්මයා රක්ෂණ සංස්ථාව රජයට පවරා ගත්තා. ඊට පස්සේ රක්ෂණ සංස්ථාවෙන් රුපියල් මිලියන 20,000ක, රුපියල් මිලියන 25,000ක, රුපියල් මිලියන 30,000ක ආදායමක් ඉපැයුවා.

ඔබතුමන්ලා ඊයේ පෙරේදා කිව්වා, සුරක්ෂා රක්ෂණය ළමයින්ට දෙනවාය කියලා. සුරක්ෂා රක්ෂණයේ රුපියල් මිලියන 2,300ක වංචාවක් සම්බන්ධයෙන් මේ වෙද්දී මේ ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිතුමාට විරුද්ධව නඩු පවරා තිබෙනවා. සුරක්ෂා රක්ෂණය සම්බන්ධයෙන් මේ ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිතුමාට විරුද්ධව නඩු පවරා තිබෙනවා. දැන් ඒ වන්දිය දරුවන්ට ගෙවන්නේ නැහැ. අද මේ රටේ තාත්තලා නැති දරුවෝ 2,000කට, 2,500කට වඩා ඉන්නවා. ඔබතුමන්ලා මේ රක්ෂණය පටන් ගත් දවසේ සිට ඒ කිසිම කෙනකුට මේ රක්ෂණය ලබා දෙන්නේ නැහැ. ඔබතුමන්ලා රක්ෂණ සංස්ථාව පෞද්ගලික අංශයට විකුණුවා; පෞද්ගලික අංශයට භාර දුන්නා. රටේ තිබෙන සම්පත් එල්ටීටීඊ ඩයස්පෝරාවට හෝ ජාවාරම්කාරයන්ට හෝ කවුරුන් හෝ අතට පත්වෙනවා.

අපි දැක්කා, ඊටීඅයි ආයතනයේ සිදු වූ දේ. එම ආයතනයේ තැන්පත්කරුවන් 30,000කට ආසන්න පිරිසක් අද මහ පාරේ ඉන්නවා. සමහරු ජීවත් වෙන්න බැරුව වකුගඩුව විකුණා ලබාගත් මුදල් ඒ ආයතනයේ තැන්පත් කළා. සමහරු ඉඩම් කඩම් විකුණා කුලී ගෙදරකට ගිහින් දරුවන්ට අධ්‍යාපනය දෙන්න ඕනෑ නිසා ඒ මුදල් ඊටීඅයි ආයතනයේ තැන්පත් කළා. අද ආණ්ඩුවේම ඇත්තෝ, ආණ්ඩුවේම සියලුදෙනා එකතුවෙලා ඒ මුදල් මං කොල්ල කාලා තිබෙනවා. මුදල් ඇමතිතුමා ළඟ ඉන්න උපදේශකයෝ එදා ඊටීඅයි ආයතනයේ අධ්‍යක්ෂවරුන් හැටියට වැඩ කළා. මේ අත යට ගනුදෙනු සියල්ල හෙළිවෙමින් පවතිනවා. මා හිතන හැටියට මේ ආණ්ඩුව මේ අය වැය තුළ මොන පිම්බිල්ලක් පිම්බුවත් රටේ යන්ත්‍රණය කඩා වැටිලායි තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අය වැය ගැන කථා කරද්දී, වැඩිදෙනෙක් හම්බන්තොට වරාය ගැන කථා කරලා එය බාල්දු කළා. තමුන්නාන්සේලා මේ අවුරුදු හතර තුළ රජයේ දේපොළක් විධියට හම්බන්තොට වරාය හරිහැටි පරිහරණය කළා නම්, අද මේ ඇඩිල්ල අඬන්න වෙන්නේ නැහැ; මේ නොහැකියාව කියන්න වෙන්නේ නැහැ; මේ ණය කන්ද ගැන කියන්න වෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට කොළඹ වරාය තරමට හම්බන්තොට වරාය දියුණු කරන්න පුළුවන්. ඒ සඳහා සියලු වටපිටාව හැදිලායි තිබුණේ. දැන් හම්බන්තොට වරාය දීලා ඉවරයි. අවුරුදු 99කට තමුන්නාන්සේලා හම්බන්තොට වරාය බදු දීලා දීලා ඉවරයි. තමුන්නාන්සේලා රටේ සම්පත් විනාශ කළා.

කෘෂි කර්මාන්තය පැත්තෙන් ගත්තාම, තමුන්නාන්සේලා කෘෂි කර්මාන්තයට ඕනෑ කරන පහසුකම් දුන්නේ නැහැ. පොහොර සහනාධාරය හරිහැටි දුන්නේ නැහැ. වී අලෙවි මණ්ඩලය හරහා වී මිලදී ගත්තේ නැහැ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දියුණු කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් පොලොන්නරුවේ කුඩා වී මෝල් කොපමණ කඩා වැටිලාද කියලා ඔබතුමා දන්නවා. ඒ ගැන කථා කළාම ජනාධිපතිවරයාගේ සහෝදරයා ගැන, එහෙම නැත්නම් තව කෙනෙක් ගැන කියනවා. එක් එක් කෙනාට ඇඟිල්ල දික් කරන එක නොවෙයි කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා. විනාඩි දෙකකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විවාදය පස්වරු 7.00 වනතෙක් පවත්වාගෙන යනවා. ඒ නිසා තව පොඩි වෙලාවක් ලබාදෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ. විවාදය පස්වරු 6.30ට අවසන් කරනවා. ඔබතුමාට වෙන්කරලා තිබෙන්නේ විනාඩි 12යි. නමුත් විනාඩි 14ක කාලයක් දීලා තිබෙනවා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
කියන්න තිබෙන දේ කියා ගන්න මට පොඩි කාලයක් දෙන්න. තමුන්නාන්සේලාට කියන්න තිබෙන්නේ, සෑම පැත්තකින්ම ගසාකන තත්ත්වයට මේ ආණ්ඩුව පත්වෙලා ඉවරයි කියන එකයි.

අපට කථා කරන්න නොදී, අපේ කටවල් වැහුවාට කමක් නැහැ; අපිට කථා කරන්න තිබෙන වෙලාව නැති කළාට කමක් නැහැ. අද පස් වරු 7.00 වනතුරු මේ විවාදය ගෙන යන්න පක්ෂ නායක රැස්වීමේදී තීන්දු කළාය කියා කියනවා අපි අහගෙන හිටියා. ඒ කියන්නේ, මේ විවාදය පැවැත්වෙන වෙලාව පැය භාගයකින් වැඩි කරන්න තීන්දු කර තිබෙනවා. මේ කථා අහගෙන ඉන්න පාර්ලිමේන්තු සභා ගර්භයේ කවුරුවත් නැහැ. ඒ නිසා රටේ ජනතාව කෙසේ හෝ මේ දේවල් අහ ගන්න ඕනෑ. ඔවුන්ට අපි මේ ඇත්ත කියන්න ඕනෑ. හැම දාම මේවා වහගෙන ඉන්න බැහැ; නොකියා ඉන්න බැහැ. මට විනාඩි 12ක කාලයක් ලබාදුන් බව ඇත්තයි. නමුත් විනාඩි 8ක් වෙන් කර තිබියදී, සමහර අය මේ සභාවේ විනාඩි 16ක් කථා කරනවා මම දැක්කා. ඒ නිසායි, 7.00 වනතුරු විවාදය පවත්වන්න කියා මම කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාටවත් එහෙම කාලය දුන්නේ නැහැ. ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමාට ලබා දුන්නේ වඩිවේල් සුරේෂ් රාජ්‍ය අමාත්‍යතුමාගේ කාලයයි.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
රැස්වීම් පවත්වන වෙලාව ගැන තීන්දුවක් ගත්තා නම්, ඒ වෙලාව අපට ලබා දෙන්න.

ඇතැම් මන්ත්‍රීවරු වතු කම්කරු නායකයෝ විධියට කථා කරමින් කිව්වා, වතු කම්කරුවන්ට අනෙක් ආණ්ඩු මොනවත් කළේ නැහැය කියා. අනෙක් ආණ්ඩු මොකුත් නොකළාට, මේ ආණ්ඩුව ඒ අය වෙනුවෙන් වැඩ කරනවාය කිව්වා නේ. මේ ආණ්ඩුවේ ඉන්න උදවිය තමයි, වතු කම්කරුවාගේ වැටුප සම්බන්ධයෙන් වගකීම භාර ගත්තේ. අද වතු කම්කරුවන්ගේ දුවලා, පුතාලා කොළඹට ආවේ දේශපාලන නායකයෝ නැතිවයි. ඒ අය ස්වාධීනව ඇවිල්ලා කිව්වේ, "අපේ අම්මලාට, තාත්තලාට පඩි ගෙවපල්ලා" කියායි. එතැන පොඩි පිරිසක් ඉන්නේ. හැබැයි මේ අය වැයට ඒ මිනිසුන්ව ඇතුළත් කර ගන්න ඔය නායකයෝය කියන එක් කෙනෙකුටවත් බැරිව ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇස්බැස්ටෝස් ෂීට් ලංකාවට ගෙන්වන එක 2018 වෙනකොට නවත්වනවා, ඒවා හදන එක නවත්වනවා, ඒ අමු ද්‍රව්‍ය ගෙන්වන එක නවත්වනවාය කියා ජනාධිපතිවරයා කියනවා. මේ ආණ්ඩුව මේ වන විට නිවාස ව්‍යාපෘති 150ක් විතර කර තිබෙනවා. හැබැයි, මම නියෝජනය කරන ප්‍රදේශවල, පුත්තලම දිස්ත්‍රික්කයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ උළු මෝල් කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබෙනවා. ඒ උළු ටික ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවට මිලදීගෙන, ඒවා නිවාස ව්‍යාපෘති සඳහා පාවිච්චි කරන්න තරම් මානසිකත්වයක් තිබෙන නිවාස ඇමති කෙනෙක් නොවෙයි මේ ආණ්ඩුවේ ඉන්නේ. අපි දන්නවා ඇස්බැස්ටෝස් ෂීට් කියන්නේ, පිළිකා කාරකයක් බව. තමුන්ගේ ගිනි පෙට්ටි නිවස හදා ගන්න පුළුවන් නම්, කෙනෙකුට ණයට ගිනි පෙට්ටි නිවසක් දෙන්න පුළුවන් නම්, පිළිකාව හැදුනත් කමක් නැහැය කියන මතයේයි එතුමන්ලා ඉන්නේ.

මංගල සමරවීර ඇමතිතුමා, එතුමාට හොඳ ටොක්කක් ඇන්න ආකාරය අපි දැක්කා. මොකක්ද ටොක්ක? "ගෙවල් හැදුවාට වැඩක් නැහැ, ගෙවල්වලට වැසිකිළි නැහැ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පමණක් පවුල් ලක්ෂ ගණනකට වැසිකිළි නැහැ" කියා එතුමා කිව්වා. ඔන්න, වර්තමාන නිවාස ඇමතිවරයාට එතුමා දුන්නු තෑග්ග.

දැන් සමෘද්ධිලාභීන් ප්‍රමාණය ලක්ෂ 6කින් වැඩි කරන්න හදනවා. ඒ ප්‍රමාණය ලක්ෂ 6කින් වැඩි කරන්න හදන ආණ්ඩුව මතක් කර ගන්න ඕනෑ, මේ රට 2025 වෙනකොට පොහොසත් රටක් බවට පත් කරන්න නේද ලැහැස්ති වුණේ කියන එක. 2020 වනවිට සමෘද්ධි ප්‍රතිලාභීන් ප්‍රමාණය ලක්ෂ 6කින් වැඩි කිරීමෙන් අපි පොහොසත් වෙනවාද? ලක්ෂ 6ක් අලුතින් හිඟන්නෝ වෙලා; දිළිඳු වෙලා; නන්නත්තාර වෙලා. ඉස්සර නම් කිව්වේ, "පාර හදද්දි හොරකම් කළා", "මිග් යානා ගේනකොට හොරකම් කළා", "වාහන ගේනකොට හොරකම් කළා" කියායි. මහා උජාරුවට කෑ ගැහුවාට, එහෙම හොරකමක් කළ එක්කෙනෙකුවත් අල්ලා ගන්න බැරිව ගියා. ඒ කථා බේගල් බවට පත් වුණා. නමුත්, අද වන විට යම් යම් කටයුතු සම්බන්ධයෙන් අතේ මාට්ටු වෙන ආකාරය අපි දැක්කා. "ශ්‍රීලන්කන් එයාර්ලයින්ස්" එකට ගේන්න නියමිත ගුවන් යානා ඇණවුම අවලංගු කරන්නම ඇමෙරිකානු ඩොලර් මිලියන 150ක් විතර ආපහු දුන්නා. එහෙම කරන ආණ්ඩුවක් මේක. Port City ව්‍යාපෘතිය අවලංගු කරන්න මිලියන ගණන් චීනයට දුන්නා. අම්මා අප්පාගේ බුදලය වාගේ ඒවාට සල්ලි දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය තුළින් රාජ්‍ය සේවකයාට රුපියල් 2,500ක් වැඩි කළාය කිව්වා. රාජ්‍ය සේවකයාට හරි සතුටු ඇති කියා මෙතුමන්ලා හිතාගෙන ඉන්නවා. රාජ්‍ය සේවකයාට රුපියල් 2,500ක් වැඩි කරලා මොකක්ද කර තිබෙන්නේ? ඔහු කඩවතින් express way එකේ බස් එකට නැඟලා කොට්ටාවෙන් බහින විට ඉන් රුපියල් 200ක් ගලවා ගත්තා. ඔහුට යන්න රුපියල් 100කුත්, එන්න රුපියල් 100කුත් යනවා. එතකොට දිනකට රුපියල් 200ක් වශයෙන් ගණන් බැලුවාම, මාසයකට රුපියල් 5,000ක් විතර යනවා. රුපියල් 2,500ක් දීලා 5,000ක් ගන්නවා; මං කොල්ල කනවා. මේ සරල ක්‍රමයට තමයි තමුන්නාන්සේලා සමස්ත ජනතාවම ඇබ්බැහි කළේ.

ජනතාවට පොඩි දෙයක් දෙන බව පෙන්වනවා. පෙන්වලා ජනතාවගේ සාක්කුවට අත දමලා බලහත්කාරයෙන් මුදල් මං කොල්ල කනවා. අද වෙද්දී සියලුදෙනා මැතිවරණ ඉල්ලන්නේ ඇයි? ඒ අය මැතිවරණ ඉල්ලන්නේ වෙන දෙයකට නොවෙයි. මේ ආණ්ඩුවේ කටයුතු ජනතාවට විඳ දරාගන්න බැහැ. ඒ නිසා ඔවුන් මැතිවරණ ඉල්ලනවා. ජනතාවට විඳින්න දෙයක් මේ ආණ්ඩුව දීලා නැහැ. ජනතාවට විඳවන්න සිදු වන කටයුතු තමයි මේ ආණ්ඩුව කර තිබෙන්නේ. ජනතාව විඳවමින් සිටින නිසා අපට මරණ ගෙදරදී, මඟුල් ගෙදරදී, කඩ මණ්ඩියේදී හමුවන පුද්ගලයන් -ඒ අය අපි ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියලා දන්නේ නැහැ, අපේ පාට භේද දන්නේ නැහැ, අපිව හඳුනන්නේ නැහැ,- අපි දැක්ක ගමන් අපෙන් අහන්නේ මොකක්ද? "මහත්තයෝ, මේ ගොල්ලන්ව එළවන්නේ කවදද?" කියායි ඒ අය අපෙන් අහන්නේ. එම නිසා, මේ රටට ආදරය කරන, ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුදෙනාගෙන් මම මෙන්න මේ ඉල්ලීම කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
තව විනාඩියකින් මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජනතාවගේ වරප්‍රසාදවලින්, ජනතාවගේ බදු මුදල්වලින්, ජනතාව ලබා දුන් ඡන්දයෙන් ජීවත් වන පිරිසක් විධියට, ජනතාවට ආදරය කරන පිරිසක් විධියට අපි 225දෙනාම මේ අය වැය පරද්දන්න කටයුතු කරන්න ඕනෑ. සිහින මාළිගා තිබෙන අය වැයක් ඕනෑම පොඩි ළමයෙකුට හදන්න පුළුවන්. හැබැයි, යථාර්ථයක් වන අය වැයක් නිර්මාණය කරන්න මේ ආණ්ඩුවට කවදාවත් බැහැ. අපි හතර වතාවක් බලාගෙන සිටියා හොඳ අය වැයක් හදලා දෙයි කියලා, වර්ණනා කරන්න. නමුත් අපට එහෙම අය වැයක් ලැබුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. වැය ශීර්ෂ ගැන කථා කරද්දී; එක් එක් අමාත්‍යාංශය පිළිබඳව කථා කරද්දී ඒ ඒ අමාත්‍යාංශවලින් සිද්ධ වන හොරකම්, වංචා ගැන, පාඩු සහ විනාශයන් ගැන අපි පැහැදිලිවම කියන්නම්; ඒ සියල්ල හෙළි කරන්නම්. එදාට මේවා හදපු සියලුදෙනාට වන්දි ගෙවන්න සිද්ධ වෙයි. එම නිසා මේ අය වැය පරාජය කිරීම සඳහා සහයෝගය ලබා දෙන්නය කියා ඔබ සියලුදෙනාට නැවතත් ආරාධනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "විවාදය දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.***
***එතැන් සිට විවාදය 2019 මාර්තු මස 11වන සඳුදා පවත්වනු ලැබේ.***
*அதன்படி அலுவல்கள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம் 2019 மார்ச் 11, திங்கட்கிழமை மீளத் தொடங்கும்.*
*The Debate stood adjourned accordingly.*
*Debate to be resumed on Monday, 11th March, 2019.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.35ට, 2019 පෙබරවාරි 21වන දින සභා සම්මතිය අනුව, 2019 මාර්තු 11වන සඳුදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பாராளுமன்றம், பி.ப. 6.35 மணிக்கு அதனது 2019 பெப்ருவரி 21ஆம் திகதிய தீர்மானத்துக்கிணங்க, 2019 மார்ச் 11, திங்கட்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned accordingly at 6.35 p.m. until 9.30 a.m. on Monday, 11th March, 2019, pursuant to the Resolution of Parliament of 21st February, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.